# බස්නාහිර පළාතේ පළාත් සභාව
# மேல் மாகாண மாகாண சபை
# WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2016දෙසැම්බර් 08 වන බ්‍රහස්පතින්දා**
2016 மார்கழி 08 வியாழக் கிழமை
Thursday 08th December 2016

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.00ට පළාත් සභාව රැස් විය.**
*மு.ப.09.00 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.00 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [Sunil Wijerathne] in the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබ සැමට සුභ උදෑසනක් වේවා. 2016.12.08 වැනි දිනට නියමිත න්‍යාය පත්‍රය. මම ඇත්ත වශයෙන්ම අගය කරනවා, කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රකාශයට. මේක මේ විහිළුවක්. විනාඩි 04 යි. විනාඩි 03 යි. මේ වැඩේ මොකක්ද? කථාව ආරම්භ කරන්නවත් බැහැ නේ? මූලාසනයෙන් අවසර අරගෙන කථාව පටන් ගන්න කොට විනාඩි 04 ඉවරයි. ඉතින් මේ කාටවත් කාලය කළමනාකරණය කරන්න බැහැ. මටත් බැහැ. ඊට පස්සේ මට කියනවා, මම කාලය නැවැත්තුවා කියලා. ඒ නිසා මම ගරු සංවිධායකවරු දෙන්නාගෙන්ම ඉල්ලනවා. අඩු වශයෙන් විනාඩි 10 ක්වත් ගරු මන්ත්‍රීවරුන්ට වෙන් කරන්න. බොරුවට මේ කථික ලැයිස්තු හදන්න එපා. මේක තේරුමක් නැහැ. ලැයිස්තුවක් දෙනවා, විනාඩි 04 යි. විනාඩි 05 යි. විනාඩි 7 ½ යි. එහෙම කරන්න එපා. ගරු ඇමැතිවරුන්ටත් එක්ක කියන්නේ. ගරු ඇමැතිතුමා ඇවිල්ලා ඉන්නේ.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ගරු සභාපතිතුමා, කාරුණිකව ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ පිළිබඳව අපේ ගරු අමාත්‍යවරුන්ටත් අවබෝධය දෙන්නය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔක්කොටම කියන්නේ. ඔක්කොටම තමයි මම මේ මතක් කරන්නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, උපදේශක කාරක සභාවේ ඉන්න මන්ත්‍රීතුමන්ලාට ඒ තිබෙන කාලය බෙදලා දීලා, අනික් අයට අවශ්‍ය නම්,කාලය අඩුවෙන් දුන්නාට ප්‍රශ්නයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ඊයේ බරපතළ චෝදනාවක් කළා. දක්ෂ කථිකයන් ඉන්නවා. උගත් අය ඉන්නවා. ඒ අයට අවස්ථාවක් දෙන්නේ නැහැයි කියලා. ඉතා වැදගත් ප්‍රකාශයක් එතුමාත් කළේ. කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාත් හොඳ ප්‍රකාශයක් කළා. ඒක සභාවේ හැන්සාඩ් නම් වෙන්නේ නැහැ. මොකද මුලින් ඔබතුමා කළේ. සභාව පටන් ගන්න ඉස්සෙල්ලා. කොහොම වුණත් මම බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ගරු ඇමැතිතුමන්ලාගේත් අවධානය යොමු කරනවා. හැමෝටම කථා දීලා සන්තෝෂ කරලා වැඩක් නැහැ. සමහරු පළාතේ එන්නේ නැහැ. ආරම්භ කරන වෙලාවටවත් පිරිස නැහැ. නමුත් ඇවිල්ලා ඊළඟට කථා ඉල්ලනවා. කථා කරලා ඊට පස්සේ යනවා යන්න. ආයේ පළාතක නැහැ. මේ වැරැදි ක්‍රමයක් යන්නේ. ඒ නිසා කරුණාකරලා,මේ ටික අවබෝධ කර ගන්න ඕනෑ.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, දැන් දවස් 04 කට අයවැය විවාදය නිම කරන්න ඕනෑ කියලා තීරණයක් ගත්තා කියලා අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්වා. එහෙම වුණා නම් එහෙම, විනාඩියක්වත් කථා කරන්න ලැබෙන්නේ නැහැ නේ?අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා තමයි එතැනදී විරුද්ධ වෙලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. මුලින් එහෙම යෝජනාවකුත් ආවා. ඒක ඉතින් ක්‍රියාත්මක වුණේ නැහැ. හරි. අද දිනයට නියමිත න්‍යාය පත්‍රය.

# සභාපතිවරයාගේ නිවේදනය
ANNOUNCEMENT OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"ප්‍රධාන අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂයන් සම්බන්ධව සභාවේ එකඟතතාවය විමසීම පෙරවරු 11.00 ට පැවැත් වෙනවා. කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් සම්බන්ධව සභාවේ එකඟතාවය විමසීම පස්වරු 05.00 ට සිදු වෙනවා. ඒ නිසා මම විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. ඒ ඡන්ද විමසන වේලාවට අනිවාර්යයෙන්ම සභාවේ රැඳී සිටින්නය කියලා. ඒ සම්බන්ධයෙන් වගකීම ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමයි, විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමයි ගන්න."*

ඊළඟට 2017 මුදල් ප්‍රකාශයේ සඳහන් ප්‍රදාන පිළිබඳව සලකා බැලීම සඳහා මෙම සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් කිරීමේ අවස්ථාව. ඒ අනුව සෙංකෝලය ස්ථාන ගත කරන්න.

***ඊට අනුකූලව පළාත් සභාව පූර්ණ කාරක සභාව බවට පරිවර්තනය විය.***

*Accordingly, the Provincial Council resolved itself into a Committee of the whole Council.*

# වාර්ෂික මුදල් ප්‍රකාශය - 2017
# පූර්ණ කාරක සභාව
ANNUAL FINANCIAL STATMENT - 2017
COMMITTEE OF THE WHOLE COUNCIL
**(ප්‍රගතිය - 2016.12.07)**

| | | |
|---|---|---|
| **ශීර්ෂ අංක 104** | **-** | **පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශය** |
| **ශීර්ෂ අංක 109** | **-** | **ප්‍රධාන ලේකම් කාර්යාලය** |
| **ශීර්ෂ අංක 110** | **-** | **ඉංජිනේරු කාර්යාංශය** |
| **ශීර්ෂ අංක 111** | **-** | **ආදායම් දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 112** | **-** | **පළාත් පාලන දෙපාර්තමේන්තුව** |
| Head No 104 | - | Ministry of Local Government, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs. |
| Head No 109 | - | Chief Secretary's Office |
| Head No 110 | - | Engineering Organization |
| Head No 111 | - | Department of Revenue |
| Head No 112 | - | Department of Local Government |

***ශීර්ෂ අංක 104, 109, 110, 111 හා 112 යන ශීර්ෂයන්ගෙන් රුපියල් 10/- ක සංකේත කපා හැරීමක් කළ යුතු යැයි සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධනය පිළිබඳ ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී. (ප්‍රගතිය : 2016.12.07)***

*The question on the amendment that a token cut off of Rs. 10/- from each vote Nos. of 104, 109, 110, 111 & 112 moved by Hon. Sirikamal Filician de Silva was proposed again. - (Continuation: 07.12.2016)*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ අනුව මේ අවස්ථාවේදී සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් වුණා. ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන, පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලපවාහන, සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් සම්බන්ධව ඊයේ නතර කළ තැන් පටන් නැවත විවාදය ආරම්භ කරනවා. විවාදය ආරම්භ කිරීමට මම ඉතාමත් ගෞරවයෙන් මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමාට ආරාධනා කරනවා. ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, උදෙන්ම 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමාට සඳහන් කරන්න ඕනැ, මේ ඉතිහාසයේ පළාත් සභාවේ හැමදාම අයවැය තිබෙන අවස්ථාවක ගරු මන්ත්‍රීවරුන්ටත්, ඒ වාගේම නිලධාරීන්ටත්, ඒ වාගේම රියැදුරන්ටත් වෙනම කෑම බීම ලැහැස්ති කරලා දුන්නා. ඊයේ දවල් අපි කෑම කන්න යන වෙලාවේ රියැදුරන් විසින් කෑම හොඳ නැහැයි කියලා චෝදනාවක් කෙරුවේ නැහැ. කෑම අඩුපාඩුවක් තිබෙනවා කියලා තමයි චෝදනාවක් කෙරුවේ. මම හිතන්නේ ඒක අපි ලේකම්තුමාගෙන් විසඳන්න බැලුවාම, අපි දැකපු දේ තමයි පෙරේදා කෑම පාර්සලය හොඳ නැහැයි කිව්වාම ගරු ප්‍රධාන ඇමැතිතුමා මැදිහත් වෙලා මන්ත්‍රීවරුන්ට සහ නිලධාරීන්ට දෙනවා වාගේ කෑම බුෆේ දාන්න කියලා ඉල්ලීමක් කෙරුවා. එතකොට බුෆේ එකට සාමාන්‍යයෙන්

කෑම ගෙනෙන කොට ඒ කෑම ගෙනෙන පිළිවෙළට අනුව තමයි කෑම මේසය පිළියෙල කරන්නේ. රියැදුරන් ඒ වෙලාවේ දැකලා තිබෙන්නේ, කෑම ජාති දෙකක් තිබෙන විධියට තමයි. ඒ කියන්නේ, අල සහ පරිප්පු. නමුත් අපි ටික වෙලාවක් යන කොට දැක්කා, Menu එකේ ජාති පහක් තිබුණා. මාළු තිබුණා. ඒ වාගේම මැලේ අච්චාරු තිබුණා. පපඩම් තිබුණා. ඒක දාන්න පරක්කු වීම නිසා තමයි මේ රියැදුරන් කලබල වෙලා තිබෙන්නේ. ඒ කලබල වීම තුළ සභාපතිතුමාටත්, ගරු මහ ඇමැතිතුමාටත් කිව්වා මේ කෑම හරි නැහැයි කියලා. ඒ වාගේම තව පැත්තකින් නිලධාරීන් සහ මන්ත්‍රීවරුන්ගේ කෑම හරි නැහැයි කිව්වා. නිලධාරීන් චෝදනා කළා කෑම හරි නැහැයි කියලා. නමුත් මම පැහැදිලිව කියන්න ඕනෑ. අපි කෑම කෑවා. කෑමවල එහෙම අඩුපාඩුවක් තිබුණේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, කෑම හොඳ නැහැයි කියලා ප්‍රකාශයකුත් කළා නේ? නිලධාරීන්ගේ කෑමත් හරි නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔව්. එහෙම එකක් නැහැ. මොකද, නිලධාරීන්ටත්, අපටත් දෙගොල්ලන්ටම තිබෙන්නේ එකම කෑම. නමුත් සභා කටයුතු එකේ තීන්දුවක් අරගෙන සාකච්ඡා කරන්න ගිහිල්ලා තීන්දුවක් අරගෙන තිබෙනවා, අද උදේ ඇතුල් වන කොට මම බැලුවා, නිලධාරීන් විසින් ලියුම් කවරයක් දෙනවා. මම ඇහුවා, මොකක්ද මේ කියලා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මමත් මේ ලියුම් කවරය අරගෙන ආවේ පෙන්වන්න. මමත් මේක භාර ගන්න බැහැයි කිව්වා. මේක මහ ලැජ්ජා නැති වැඩක්. මොකක්ද මේ? මම භාර ගන්න බැහැයි කිව්වා. ඊට පස්සේ නිලධාරීන් කිව්වා, දෙන්න බැහැ. මන්ත්‍රීතුමා ගන්න කියලා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

නිවේදනයක් කරලා කිව්වා, අද මේක කරනවා කියලා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒක තමයි. මුලසුනේ කිව්වාට ඒක මන්ත්‍රීවරයෙකුට අත්සන් කරලා ගන්න බැහැ, ගරු සභාපතිතුමා. මන්ත්‍රීවරයෙක් කොහොමද අත්සන් කරලා ගන්නේ. හෙට වෙන කොට පත්තරේ යයි මේ රියැදුරන්ට දෙන කෑම වේලේ මුදල් ටික මන්ත්‍රීවරයා ගත්තා කියලා. එහෙමනම් දෙන්න ඕනෑ රියැදුරාට.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේක පෙන්නන්න ඕනෑ නිසා ගරු සභාපතිතුමා මාත් අරගෙන ආවේ. මම භාර ගන්න බැහැයි කිව්වා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මොකද රුපියල් 550/- ක් දවල් කෑමට සහ උදේට සහ හවසට තේ සංග්‍රහය දෙන කොට ඒ මුදල් එකතුව ගත්තොත් රුපියල් අටසිය ගණනක් වෙනවා. අට සිය ගණන සභා කටයුතු එකේ අඩු කරලා රියැදුරන්ට රුපියල් 500/- ක් දෙන්නය කියලා තීන්දු කරලා ඒක මන්ත්‍රීවරයා අත්සන් කරලා ගන්න පුළුවන්කමක් නැහැ. මේ සභාවේ තවත් කියන්න ඕනෑ. කාලයක් තිබුණා, කාර්ය මණ්ඩලයේ අවශ්‍ය වෙක් ටිකත් මන්ත්‍රීවරුන් අත්සන් කරලා එක්කෙනා නම් දාලා ගන්නවා කියලා. හෙට අනිද්දා යයි දවස් හයේ රියැදුරාට කෑම දෙන සල්ලිත් මන්ත්‍රීවරයා ගත්තා කියලා. මේක වහාම නවත්වන්න ඕනෑ. මොකද, ඊයේ ඔබතුමා නැති වෙලාවේ හෙක්ටර් බෙත්මගේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මෙතැන ප්‍රකාශ කළා. ප්‍රකාශ කළාට අපි දන්නේ නැහැ, මන්ත්‍රීවරයාට අත්සන් කරලා දෙනවා කියලා. මන්ත්‍රීවරයාට අත්සන් කරලා ඒක ගන්න පුළුවන්කමක් නැහැ. ඒක වැරදියි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

වැරදියි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මේක සම්පූර්ණයෙන්ම වැරදි සහගතයි. එක්කෝ රියැදුරාට දෙන්න. නැත්නම් තිබුණා වාගේ කෑම ටික ලබා දෙන්න. සභා කටයුතු එකේ ඊයේ ගත්තු තීන්දුවට මන්ත්‍රීවරුන්ට චෝදනා කරනවා.

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.)

සමහර මන්ත්‍රීවරුන්ට රියැදුරොත් නැහැ. තනියෙන් එන්නේ. බරපතළ ප්‍රශ්නයක්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේක බැහැයි කියලා අරගෙන ආවේ. මේක ආපසු භාරගන්න කියලා නිලධාරීන්ට භාර කරනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

වැරැදියි. වැරැදියි.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ඒක වැරැදි තීන්දුවක්.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, ඇත්තටම ගරු මන්ත්‍රීවරුන්ගේ අභිමානයට මේක මහත් ප්‍රශ්නයක්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මන්ත්‍රීවරුන්ට තිබෙන අභිමානයත් නැති කරන වැඩ සටහනක් මේක. ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරයෙක් හැටියට, මන්ත්‍රීවරුන්ට අභිමානයක් තිබෙනවා. ඒකත් නැති කරන්න යන වැඩක්. හෙට වෙන කොට පත්තරේ යයි රියැදුරන්ගේ රුපියල් 500/- ත් අරගෙන මන්ත්‍රීවරයා සාක්කුවේ දාගෙන කියලා. රියැදුරන් නැති මන්ත්‍රීවරු කී දෙනෙක් මෙතැනට එනවාද? එතකොට රියැදුරා නැති මන්ත්‍රීවරයා සාක්කුවේ දාගෙන රියැදුරාට නොදුන්නාම ඒකේ චෝදනාව එන්නේ මන්ත්‍රීවරයාට. ඒක ගත්ත මන්ත්‍රීවරයා, නොගත්ත මන්ත්‍රීවරයා කියලා අපට තිබෙන අභිමානය මොකක්ද? මේ තත්ත්වය උඩ අපට පාරේ බැහැලා යන්න හම්බ වෙන එකක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි. ඒ සම්බන්ධව තව මොනවද කියන්න තිබෙන්නේ. ඔබතුමා දැන් මොකක්ද කියන්නේ?

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, දැන් අනික් කාරණාව මේ රියැදුරන්ට මේ අහළ පහළ ගිහිල්ලා කෑම කාලා එන්න තැනක් නැහැ. ඒ නිසා ඒ අයගේ ආහාර වේල අපි මේ ස්ථානයේ දෙන්න ඕනෑ. ආහාර ලබා දෙන ක්‍රමවේදයේ මොකක් හරි අඩුවක් තිබෙනවා නම් එය හරිගස්සලා අපි එය ක්‍රියාත්මක කරමු. අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඊයේ වුණේ බුෆේ එකට කෑම ටික එන්න ප්‍රමාද වුණ එකේ හදිස්සියක්. අද දවසේ අපි එය නිවැරැදි කරමු. ගරු සභාපතිතුමනි, මුදල් ගරු මන්ත්‍රීවරුන් අතට දෙන එක කොහොමත් ගැලපෙන්නේ නැහැ. ඒක තුළ විවිධ කථා පැතිරෙන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒ හැම එකක්ම පිළිගන්නවා. මමත් ඒ සම්බන්ධයෙන් විනාඩියක් කථා කරන්නම්. ඒ වෙලාවේ කාරක සභාවේ මූලාසනයේ හිටියේ මම. මටයි ඒ වගකීම එන්නේ. මටයි චෝදනාව එන්නේ. කෑම ප්‍රශ්නය අද ඊයේ එන එකක් නොවෙයි. හැමදාම එන එකක් මේක. ප්‍රසන්න රණතුංග ගරු මහ ඇමැතිතුමා ඉන්න කාලයේත් කෑම පැකට් එක ගෙනැල්ලා පෙන්නුවා. කන්න බැහැ. එතකොට ඔන්න මහ ඇමැතිතුමා නියෝග කරනවා. එහෙම කාලාන්තරයක් තිස්සේ මේ කෑම ප්‍රශ්නය, රියැදුරන්ගේ කෑම ප්‍රශ්නය එන එකක්. නිලධාරීන්ගෙන් ප්‍රශ්නයක් ආවේ නැහැ. මන්ත්‍රීවරුන්ගේත් පොඩි පොඩි ප්‍රශ්න ආවත් අපි ඒවා බේර ගන්නවා. නමුත් රියැදුරුන් හැමදාම මේ කෑමට මොනවා හරි ප්‍රශ්නයක් ඇති කරනවා. ඒක තමයි ඇත්ත කතන්දරය. නිලධාරින්ට බණිනවා. අපට බණිනවා. මන්ත්‍රීතුමන්ලාටත් බණිනවා. ඒ අය එක එක ප්‍රකාශ කරනවා. ඉතින් ඒ නිසා මන්ත්‍රීතුමාගේත් වගකීමක් තිබෙනවා. තමුන් යටතේ ඉන්න රියැදුරාව පාලනය කිරීමේ හැකියාවක් තිබෙන්නට ඕනෑ. තමුන්ගේ රියැදුරා මේ. පිට අය නොවෙයි නේ?

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, සමාවෙන්න. පෙරෙයිදාත් මේ ප්‍රශ්නය පැමිණි වෙලාවේ, මේ කෑම පැකට් එක හරි නැහැයි කිව්වාම. ගරු මහ ඇමැතිතුමා මට කිව්වා, අපි මොකක් හරි කරමු සභාපතිතුමා කියලා. අපි සාකච්ඡා කරලා, ඒ කේටරින් කරන අයත් එකඟ වුණා. මුලින් ඒ මුදලට දෙන්න බැහැයි කිව්වා. ඊට පස්සේ අපි කිව්වා, රුපියල් 520/- කට මේ කෑම එක දෙන්න. ඒ අය එකඟ වෙලා රුපියල් 520/- ට බුෆේ එක ඇරියා.

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

සෙන්සාල් එකෙන් රුපියල් 250/- ට කෑම එක ගන්න පුළුවන් නම් ඒ කෑම අරගෙන දෙමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි ගරු ඇමැතිතුමා. ඒකට තමයි එන්න හදන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මේ ගැන කථා කරලා තේරුමක් නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා දැන් ඉතින් පොඩ්ඩක් පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. මම ගරු ඇමැතිතුමාටත් ගරු කරලා බුෆේ දාමු කියලා තීරණය කළා. ඊළඟට මට ලේකම්තුමා ඇවිල්ලා කිව්වා, මේ කට්ටිය කන්නේ නැහැයි කියලා. කෑම ස්ට්‍රයික් එකක් කියලා. නිලධාරීන්ට බණිනවාලු. මේක පාලනය කරන්න හරි අමාරුයි. එක හට්ටියේ, එක මුට්ටියේ හොදි වෑංජන උයන්නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අර මන්ත්‍රී අත්සන් කරලා සල්ලි දෙන එක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි. එක හට්ටියේ, එක මුට්ටියේ මේ වෑංජන, බත් ඔක්කෝම උයන්නේ. ගරු මහ ඇමැතිතුමාත් එක්ක කථා බහ කරන කොට තව එක්කෙනෙක් ඇවිල්ලා කිව්වා. මේ කෑම හරිම නැහැයි කියලා. නිලධාරීන්ගේ කෑම සවුත්තුයි කිව්වා. මම මේ ඇත්ත කතන්දරය කියන්නේ. අපේ කණට ඇහුණු දේවල්. අපේ ලේකම්තුමාත් හිටියා. ඔබතුමාත් හිටියා. ඒ අනුව ගරු මහ ඇමැතිතුමා තීරණය කළා, අපි මේක පිටින් දෙමු කියලා. අපි කාරක සභා රැස් වෙනවා. පෙත්සම් කාරක සභාව. සභා කටයුතු කාරක සභාව, ගෘහ කාරක සභාව රැස් වන කොට ඒවාට කෑම එක ගේන්නේ එක්කෝ සෙන්සාල් එකෙන්. නැත්නම් පෙරේරා ඇන්ඩ් සන්ස් එකෙන්. රුපියල් 250/- කෑම මන්ත්‍රීවරු කන්නේ. හොඳ කෑම එකක් රුපියල් 250/- ට තිබෙනවා. මේ කෑම එක රුපියල් 520/ යි. ඉතින් මේකත් එපා කියන නිසා තමයි අන්තිමට අපි තීරණය කළේ, මේ නිලධාරීන්ට Audit ප්‍රශ්න එන නිසා ඒවාත් බේරාගන්න ඕනෑ. අපි කාරක සභාව රැස් වුණා. මන්ත්‍රීවරු දෙන්නයි ආවේ නැත්තේ. හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමයි. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමයි එතැනට ආවේ නැහැ. අනික් මන්ත්‍රීවරු නව දෙනාම හිටියා. අපේ ඇමැතිතුමාත් හිටියා. හැබැයි, ගරු ඇමැතිතුමා ලස්සන ප්‍රකාශයක් කළා. රියැදුරන්ට එයාලගේ කෑම හොඳ නැත්නම් අපේ කෑම එක රියැදුරන්ට දීලා, රියැදුරන්ගේ කෑම එක අපි කමු කිව්වා. මම එතුමාව හරි අගය කරනවා. අපේ සුමිත් ලාල් මැන්දිස් ගරු ඇමැතිතුමා. එතුමා පැහැදිලිව කිව්වා. අපි එහෙමනම් ඒ කෑම එක කමු. අපට ඒ කෑම එක හොඳයි. හැම කෙනෙක්ම කිව්වා, කෑම එක හොඳයි කියලා. කිසිම අඩුවක් කිව්වේ නැහැ. නියෝජ්‍ය සභාපතිතුමාත් ගිහිල්ලා ඇවිල්ලා කිව්වා, කෑම එක ඉතා හොඳ කෑම එකක් කියලා. ඉතින් මේක මෙහෙම කරන්න බැහැ. රියැදුරු මහත්වරු මේ විධියට එක එක ප්‍රකාශ කරන කොට අපට ඒකට යට වෙන්නත් බැහැ. කාලයක් රියැදුරු මහත්වරුන්ට කෑම දුන්නෙත් නැහැ. පාර්ලිමේන්තුවේ කෑම දෙන්නෙත් නැහැ. මම ඒවා කියන්න යන්නේ නැහැ. පාර්ලිමේන්තුවේදී මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුව ගාවින් බස්සලා එළියේ ඇවිල්ලා ඉන්නේ. කන්න තියා වතුරවත් නැහැ. වතුරවත් දෙන්නේ

[ගරු සභාපතිතුමා]

නැහැ. අපි මේ මනුස්සකම් බලලා, අපි හැම දෙයක්ම කරනකොට අපේ රියැදුරා, අපව ආරක්ෂා කරන කොල්ලා කියලා අපි හැම දෙයක්ම කරනවා. උදේ කිව්වා, ඒ අයට සල්ලි දෙන්න එපා. උන් බොනවා කියලා. ඒක අපට කරන්න බැහැ. බිව්වා කෑවා කියලා අපට ප්‍රශ්නයක් නොවෙයි. ඒක ඉතින් පාලනය කරන්න ඕනෑ. දැන් ගරු මහ ඇමැතිතුමාත් කිව්වා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මාධ්‍යයට දාන්න එපා කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. මාධ්‍යය කවුරුත් නැහැ. එක්කෙනෙක් ඉන්නවා. අපේ එක්කෙනා දායි.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

හොඳම දේ තමයි, රුපියල් 500 ට වඩා අර කෑම පැකට් එක අඩු වෙනවා නේද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

රුපියල් 250/- ට සෙන්සාල් එකෙන් කෑම පැකට් එකක් අරන් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව එකඟයිද ඒකට.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

එකඟයි.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

තේ එක හැන්දෑවට දෙමු. තේ එකට ප්‍රශ්නයක් නැහැ නේ?

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ඔබතුමා කරපු ප්‍රකාශයට අපි බොහොම ගරු කරනවා. නමුත් මේකට මොකක් හරි විසඳුමක් දෙන්න. ගරු සභාපතිතුමනි, පෙරේරා ඇන්ඩ් සන්ස් එකෙන් කෑම එකක් ගෙනත් දුන්නත් කමක් නැහැ. නමුත් මේ මන්ත්‍රීවරුන්ට දෙන මුදල් නැවත භාර අරගෙන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මන්ත්‍රීවරු දෙන්නෙක් ඇරෙන්න කාරක සභාවේ නව දෙනාම මේ අදහසට, යෝජනාවට එකඟ වුණා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කාරක සභාව එකඟ වුණාට, කාරක සභාවේ ඉන්න අයට මන්ත්‍රීකමේ අභිමානයක් නැති වුණාට අපට අභිමානයක් තිබෙනවා. දැන් ඔබතුමා සභාපති හැටියට ඉන්නවා. සභා කටයුතු කාරක සභාවේ මන්ත්‍රීවරු දැන ගන්න ඕනෑ - මොකද, මම පැහැදිලිව භය නැතිව කියනවා. කාර්ය මණ්ඩලය තියා ගන්නේ නැතිව ඒ චෙක් එක සාක්කුවේ දා ගන්නවා වාගේ අපට මේ ඩ්‍රයිවර්ගේ සල්ලි සාක්කුවට දාගන්න බැහැ. අපට ලැජ්ජාවක් තිබෙනවා. අපි පාරේ බැහැලා යන්නේ කොහොමද? පළාත් සභාවේ මන්ත්‍රීවරු පාරේ බැහැලා යන්නේ කොහොමද? රියැදුරාට දෙන රුපියල් 500/- ත් සාක්කුවේ දාගෙන ද යන්න කියන්නේ. ඒක කරන්න බැහැ, ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි, හරි. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමා, හෙට සිට මේ දීපු කෑම එක දෙන්න. ඒක දෙන්න බැරි නම් නිකන් ඉන්න. ආයේ කෑම දෙන්න එපා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමා, අපට මේ ඩ්‍රයිවර් කෙනෙක් ගෙනැල්ලා කන්න දෙන්න බැරි කමක් නැහැ. මොකද, අපි මේ දවස් 20 ටම කොළඹ ආවත් අපි තමයි ඩ්‍රයිවර්ට කන්න දෙන්නේ. අපේ අතින් කන්න දෙන්නේ. මේ රුපියල් 500/- අවශ්‍ය නැහැ. නමුත් ඒකේ අභිමානයක් තිබෙනවා. ඩ්‍රයිවර්ගේ රුපියල් 500/- ත් මන්ත්‍රීවරයා අත්සන් කරලා ගත්තාම, කොළේ තිබෙන්නේ අපේ අත්සන.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

දීපු කෑම එක හෙට දෙන්න. ගරු සභාපතිතුමා, දීපු කෑම එක හෙට ලෑහස්ති කරන්න. ඒක කන්න බැහැයි කියනවා නම් නිකන් ඉන්න. කෑම දෙන්නම එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව තීරණය කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමා, තව එකක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මහ ඇමැතිතුමා කියනවා සෙන්සාල් එකෙන් හරි අපි කෑම එකක් ගෙනත් දෙමුයි කියලා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමා, රියැදුරු ප්‍රශ්නයක් ඇති කරනවා නම් ඒ රියැදුරාගෙන් අහන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, තත්පරයක් දෙන්න. රියැදුරු ප්‍රශ්නයක් ඇති කරනවා නම් රියැදුරා කවුද කියලා බලන්න. මොකද, ඒක උවමනාවෙන් කරන දෙයක්ද දන්නේ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, ඒක අවශ්‍ය නැහැ. අපේ ළමයින් දෙන්නෙකුට කුණු හරුපයෙන් බැණලා තිබුණා.

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.)

විනාඩි 20 ක් ගියා. දැන් වෙලාව නැතිව යනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සෙන්සාල් එකෙන් හරි අපි කෑම පැකට් එකක් ගෙනැල්ලා දෙමු. සභාව ඒකට එකඟයි නේද? හරි. විපක්ෂ නායකතුමාගේ කාලය අපරාදේ. දැන් පෙ.ව. 09.15 යි. ගරු විපක්ෂ නායකතුමා,-

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

හෙට පත්තරේ දැම්මාම කාටද ලැජ්ජාව?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, මම පිළිගන්නවා. මගේ තීරණයක් නොවෙයි. මේ කෑම ප්‍රශ්නයට මටත් ලැජ්ජයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

හෙට උදේට රෙද්දක් ඇඳගෙන එන්න හම්බ වෙන්නේ නැහැ. ගෙදර ඉඳලා හෙට රෙද්ද ගලෝලා එන්න ඕනෑ. ඇඳුම ගලෝලා එන්න ඕනෑ. මේක පත්තරේ ගියොත් එහෙම. රුපියල් 500/- ය මන්ත්‍රීවරයා සාක්කුවේ දා ගත්තා කියලා. අත්සන් ලේඛනය පත්තරේ දැම්මොත් එහෙම. මම නම් අත්සන් කරන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, මේක මගේ මතයක්, මගේ තීරණයක් නොවෙයි නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමාට නොවෙයි, දොස් කියන්නේ. සභා කටයුතු එකේ මන්ත්‍රීවරු දැනගන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි. සභා කටයුතු ගරු ඇමැතිතුමා ඉන්නවා. ඔබතුමාත් උත්තරයක් දෙන්න. කට්ටියත් එක්ක මාවම කන්න හදනවා.

**ගරු සුමිත් ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumith Lal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

ගරු සභාපතිතුමනි, ඊයේ තීන්දු වුණේ, මේ මුදල රියැදුරන්ට දෙන්නය කියලා. රියැදුරන්ට දෙන්නය කියලා තීන්දු වුණේ. පොඩ්ඩක් වැරැදීමක් වෙලා තිබෙනවා, මන්ත්‍රීවරුන්ට දෙන්නය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලය ප්‍රශ්නයකුත් තිබෙනවා. ගරු විපක්ෂ නායකතුමා ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 09.18]

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ මෙවර අයවැය ලේඛනයේදී ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අයවැය ලේඛනය වෙනුවෙන් වචන කිහිපයක් කථා කරන්න ලැබීම පිළිබඳව මම ඉතාම සන්තෝෂයට පත් වෙනවා. අපි දන්නවා, මේ වර්ෂයේ දෙවැනි අයවැය ලේඛනය අවස්ථාවේදී ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙන අමාත්‍යවරුන්ට වැඩිය යම් සුභ සාධනයන් සලසා දෙන්න මේ දෙපැත්තේම මන්ත්‍රීවරුන්ට පුළුවන් උදව් උපකාර කළයි කියන එක මම මතක් කරන්න ඕනෑ. ඒ නිසා ඉතාම සතුටට පත් වෙනවා. මට වෙන්න පුළුවන්. වෙන මන්ත්‍රීවරයෙකුට වෙන්න පුළුවන්. එහෙම නැත්නම් මේ දෙපැත්තේම ඉන්න මන්ත්‍රීවරුන්ට තමන්ට කරන්න පුළුවන් උදව් උපකාර වැඩියෙන් කරන එක තමයි අපි කාටත් තිබෙන එකම සන්තෝෂය. නමුත් අපි දන්නවා, මේ අද ඇති වෙලා තිබෙන දේශපාලන ප්‍රශ්නය තුළ දී දැන් මේකේ සමහර වෙලාවට මුදල් ඇමැතිවරයා අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමේදී, සමහර වෙලාවට මුදල් ඇමැතිවරයාට චෝදනාවල් එනවා. මුදල් ඇමැතිවරයාගේ මේ තත්ත්වය පිළිබඳව අපට සතුටට පත් වෙන්න බැහැයි කියලා. අපි දන්නවා, මුදල් ඇමැතිවරයා කියලා කිව්වාට ආණ්ඩුවේ ප්‍රධානියා තමයි ජනාධිපති. ජනාධිපතිතුමා තමයි මේ ආණ්ඩුව අද මෙහෙය වන්නේ. ඒ නිසා මේ ආණ්ඩුව ඉදිරිපත් කරන අයවැයේ ප්‍රධානියාත් ජනාධිපතිවරයා හැටියට තමයි අපි දකින්නේ. ඒ නිසා මේ අවස්ථාවේදී මම මේ කාරණය කල්පනා කළේ, ඊයේ දවස තුළ ගරු ප්‍රධාන අමාත්‍යවරයාගේ අයවැය ලේඛනය තුළදී, ඒ කථා කිරීමේදී දෙපැත්තේම සමහර අය තමන්ගේ කථාව කරගෙන යද්දී මේ කථාව පිළිබඳව අපට චෝදනා මුඛයෙන් කථා කළා. ඒ නිසා තමයි මම මේ කාරණය මතක් කළේ. මේක එක ආණ්ඩුවක එක අයවැයක්. ආණ්ඩුවේ ප්‍රධානියා ජනාධිපති. අනික් අය මැති ඇමැතිවරු හැටියට තමයි මේ කටයුතු කරන්නේ. මම මතක් කරන්න කැමැතියි. අයවැය ලේඛනය තුළදී විශේෂයෙන්ම ප්‍රාදේශීය සභාවල්වල ක්‍රියාකාරීත්වය. අද මේ ප්‍රාදේශීය සභාවල්වල තිබෙන ක්‍රියාකාරීත්වය දිහා බැලුවාම අන්තිම ජරා ගස්සන තත්ත්වයකට තමයි පත් වෙලා තිබෙන්නේ. අද සමහර ප්‍රාදේශීය සභාවල් තිබෙනවා, වැඩක් කරගන්න හිටපු මන්ත්‍රීවරු ලියුම් අරින්න ඕනෑ. ඉතින් මේ ප්‍රාදේශීය සභාවල ඉතාම අසතුටුදායක තත්ත්වයන් තිබෙන්නේ. අනික් පැත්තෙන් නාගරික සංවර්ධන අධිකාරියත් දවසින් දවස අද විවිධ නීති දමමින් නාගරික සංවර්ධන අධිකාරියට තිබෙන බලතල නාගරික සංවර්ධන අධිකාරිය පාවිච්චි කරන්න උත්සාහ කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා සමාවන්න. ඉතාමත්ම කනගාටුයි. කාලය ඉවරයි.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

හරි. ඒ නිසා විශේෂයෙන්ම ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ මේ අයවැය ලේඛනයේදී වචනයක් හරි මම ප්‍රකාශ කරන්නට ඕනෑය කියලා කල්පනා කළේ මම මේ උපදේශක කාරක සභාවේ ඉන්න නියෝජිතයෙක් හැටියට. ඒ නිසා අපි මහ ඇමැතිතුමාගෙන් විශේෂයෙන්ම

ඉල්ලනවා. මේ වැඩ පිළිවෙලේදී දැනට ප්‍රාදේශීය සභාවන්වල කරන ක්‍රියාකාරීත්වය ඉතාම දුර්වල තත්ත්වයකින් පවතින්නේ. ඔබතුමාගේ මැදිහත්වීමමත මේක නිවැරැදි කරලා මිනිස්සුන්ට වඩා වැඩි සහනයක් සලසා දෙන්න අවශ්‍ය කටයුතු කරන්නය කියලා ඉල්ලා සිටිමින්, සුභ ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 04 යි. මට තේරෙන්නේ නැහැ මේක කරන්නේ කොහොමද කියලා. මේ විනාඩි 04 න් කථා කරන්න බැහැ නේ?වෙලාවට කථාව නවත්වන්න ගරු මන්ත්‍රීතුමා. මට කාලය දෙන්න බැහැ.

[පූ.භා. 09.24]

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු සභාපතිතුමනි, විනාඩි 04 ක හරි කාලයක් ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂයේ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා - මේකේ නීතිය හා සාමය දාලා නැහැ. පොතේ නම්. ඒකත් ඔබතුමාට අයිතියි. අපි ඉතාමත් සන්තෝෂයට පත් වෙනවා. මැතිවරණ කාලයේ මහරගමින් මහ ඇමැති කියලා ලොකුවට තොරන් ගහලා තිබුණා. දෙයියෝ දැකලාද කොහේද මහරගමට මහ ඇමැතිකම ලැබුණා. ඉල්ලුවේ එක්කෙනෙක්. ලැබුණේ තව එක්කෙනෙක්ට. කොහොම හරි මහරගමට මහ ඇමැතිකම ලැබීම තුළ අපට විශාල වරප්‍රසාද ප්‍රමාණයක්, මම හිතන්නේ මහරගම පාරවල් 90% ක් දැන් කාපට් කරලා ඉවරයි. ඒ වරප්‍රසාද අපට ලැබුණේ මහ ඇමැතිකම ලැබුණු නිසා. කාපට් කරන්න තව පොඩ්ඩයි තිබෙන්නේ. රෑට මළ ගෙදරකට ගියාම උදේට පාරවල් ටික කාපට් කරනවා. ඒ නිසා අපට වාසනාවකට පහළ වුණේ, මහ ඇමැතිකම. ඉල්ලුවේ කාට වුණත් ලැබුණේ තව එක්කෙනෙක්ට. ඒක වෙනම දෙයක්. හැබැයි, ඇලපිලි නැති, ඉස්පිලි නැති, පාපිලි නැති එකම නගරය මහරගම. අකුරු පහක් තමයි තිබෙන. ඒකට මහ ඇමතිකම ලැබුණේ. අර දෙයියෝ බැලුවා, අර ගහලා තිබුණු කටවුට් ටිකේ ප්‍රමාණය. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ඒ පැත්තට ගිය දවසේ සිට මට එතුමා නිකන් හරියට තිත්ත කසායක් වගේ තමයි. නමුත් එතුමාට පැණි රහ ටිකක්, ලුණු ටිකක් දෙන්න පුළුවන් කාරණා දෙකක් එතුමා කළා. පළමුවැනි කාරණාව තමයි අපේ මහරගමට මහ ඇමැතිකම දීම. මහරගමට ඉල්ලා සිටියා.

ඒ වාගේම මහ ඇමැතිකම මහරගමට දීම තුළ මට එතුමා ගැන පොඩි පැහැදීමක් ආවා. පොඩි මිනිහෙක් දිහා බලලා එතුමා මේ මහ ඇමැතිකම මේ ඉසුර දේවප්‍රිය මැතිතුමාට දීම පිළිබඳව මට එතුමා ගැන ගෞරවයක් තිබෙනවා. අනික් ඒවා සියල්ලම මට එතුමාගේ තිත්තයි. නමුත් තව එක හොඳ පැණි රහ දෙයක් එතුමා කළා. ඒ පැණි රහ දේ තමයි අර්ජුන මහේන්ද්‍ර මහත්තයාව එළියට ඇදලා දාපු එක. එතුමා මේ මහා බැඳුම්කර වංචාව කරලා, බේරි බේරි හිටියා. අමතක කරන්න එපා. රනිල් වික්‍රමසිංහ මහත්මයා කමිටුවක් දාලා ඒ කමිටුවෙන් නිදොස් කොට නිදහස් කළා අර්ජුන මහේන්ද්‍රන්ව. පාර්ලිමේන්තුවේ කථා කරන්නෙත් නැහැ. අර්ජුන මහේන්ද්‍රන්ව නිදහස් කරන්න රනිල් වික්‍රමසිංහ මහත්මයා දාපු කමිටුව ගැන කථාවක් නැහැ. ත්‍රි පුද්ගල කමිටුවක් දාලා එතුමා නිදොස් කොට නිදහස් කළා. එතකොට වක්‍රාකාරව මේ හොරකමට අගමැතිතුමා අනුබල දී තිබෙනවා. නැත්නම් මොකද, කමිටුවක් දාලා නිදහස් කළේ. එහෙම නිදහස් කරපු අර්ජුන් මහේන්ද්‍රන් මහත්මයා කෝප් කමිටුවෙන් වැරැදිකරු වෙනවා. ඉතා බරපතළයි. මේ ප්‍රශ්නයේදී කෙළින් තීරණයක් ගත්තා අපේ මෛත්‍රීපාල ජනාධිපතිතුමා. ඒ පිළිබඳවත් මම එතුමා ගැන ස්තුති කරනවා. මට කාරණා දෙකයි එතුමා ගැන සතුටු වෙන්න පුළුවන්.අනික් ඒවා සියල්ල අද කණපිට ගහලා තිබෙන්නේ. එතුමා එනකොට කිව්වා, ජනාධිපති දිවුරුම් දීමට ගියේ රුපියල් 6000/- යි කියලා. එහෙමයි ආවේ. රුපියල් 6000/- යි ජනාධිපති දිවුරුම් දීමට. දැන් මාස ගණනක සිට පත්තරවල දානවා, මේ පත්තරේ මම අහම්බෙන් දැකලා අරගෙන ආවේ. මේ ඇඩ් එකට ලක්ෂ 2 ½ යි. සැමට සෙවණ - මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය. මේ තියන්නේ, හෝමගමහත් වැනිදා. මේ පත්තර කොළේ මට අහම්බෙන් හම්බ වුණේ. සතියක තිස්සේ මෙය පත්තරවල දානවා. දවසකට පත්තරවල ඇඩ්වලට විතරක් ලක්ෂ 30 ක් යනවා. නිවාස ව්‍යාපෘතිය සඳහා මුල්ගල තියන්න advertisement වලට කෝටිය පනිනවා. ඊට පස්සේ රාජිත සේනාරත්න ගරු ඇමැතිතුමා දානවා, ගුරාට බැරි වුණු දේ ගෝලයා කරනවා. ගුරාට බැරි වුණා. ගෝලයා තමයි මේ අලුත් සෞඛ්‍ය පනත ගෙනාවේ

[ගරු සලෝචන ගමගේ]

කියලා එක ඇඩ් එකකට ලක්ෂ 1 ½ ක් යනවා. මේ වාගේ හතක් එක චැනල් එකක දානවා. කෝටියක් විතර ඇඩ්වලට වියදම් කරනවා. ඉතින් මේ වාගේ දේවල් දාලා සමහර බෙහෙත්වල මිල පොඩ්ඩක් අඩු කරලා තිබෙනවා. මම ඉන්නේ පිළිකා රෝහලට අල්ලපු වත්තේ. ඩොලර් එක වැඩිවීම තුළ, 126 ට තිබුණු ඩොලර් එක 150 වීම තුළ අද ආනයනය කරන බෙහෙත් වල මිල ඉතාම විශාල ලෙස ගණන් ගිහිල්ලා තිබෙනවා. දරාගන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. විදේශ රටවලින් ගෙනෙන බෙහෙත් මෙසේ විශාල ලෙස ගණන් ගිහිල්ලා තිබෙනවා. කිහිපයක මිල අඩු කළාට ඩොලර් එක වැඩිවීම තුළ බරපතළ තත්ත්වයක් උද්ගත වෙලා තිබෙනවා. නීතිය හා සාමය තිබෙන්නේ මෙතුමා යටතේ. අද නීතිය වල් වැදිලා තිබෙන්නේ. අද නීතිය බල්ලට ගිහිල්ලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබතුමාගේ කාලය අවසන්. කථාව අවසන් කරන්න.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

විනාඩියක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විනාඩියක් දෙන්න බැහැ. මම මුලින්ම කිව්වා නේ දෙන්න බැහැයි කියලා. සමාවෙන්න. මට ඒ වැඩේ කරන්න බැහැ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

සමාවෙන්න. මේ විජේවීර මහත්මයාව කකුල් දෙකෙන් අල්ලලා විසි කළා කියලා මෙන්න පත්තරේ දාලා තිබෙනවා. අර රගර් ක්‍රීඩකයාට, තාජුඩීන්ලාට පරීක්ෂණ පවත්වනවා වාගේ රෝහණ විජේවීර සහෝදරයා මරපු හැටි දාලා තිබෙනවා. මේකට ආණ්ඩුවක් වශයෙන් මැදිහත් වෙන්න ඕනෑ. කමිටුවක් පත් කරන්න ඕනෑ. ජනතා විමුක්තිය පෙරමුණට බැරි නම් මේ ටික මේ ආණ්ඩුව කරන්න ඕනෑ. මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි. මෙය කරගන්න යන්න ලැබේවා කියලා අපි ගරු මහ ඇමැතිතුමාට සුභ පතනවා. මම පාවිච්චි කරන අවසාන ඡන්දය මෙය. පළාත් පාලන මැතිවරණය නොතිබුණොත් ලබන ඡන්දය නියත වශයෙන්ම විරුද්ධව පාවිච්චි කරලා මේ ආණ්ඩුව පළාත් සභාවේ පෙරළලා අපි ඡන්දයක් ඉල්ලලා මෙය පරිවර්තනය කරනවා කියන එක මතක් කරමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා, එතුමා නැහැ. පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා. එතුමාත් නැහැ. යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා. ඔබතුමාට විනාඩි 07 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 09.28]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මම හිතුවේ ආණ්ඩු පක්ෂයට වැඩිය දීලා අපේ කණ්ඩායම අඩු නිසා එහෙම වෙයි කියලා බලාපොරොත්තු වුණේ. ඒකයි මම එහෙම නම් ටික දුන්නේ. ඔබතුමා වක් ගාලා කියාගෙන කියාගෙන ගියා. කමක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කිව්වා නේ කමක් නැහැයි කියලා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් කථා කරන මේ අවස්ථාවේ ඇත්තටම අපි සතුටු වෙනවා. අපේ කිත්සිරි කහටපිටිය හිටපු ගරු විපක්ෂ නායකතුමා කිව්ව ආකාරයට උපදේශක කාරක සභාවේ ඉන්න මන්ත්‍රීවරුන්ට අපි ප්‍රමුඛත්වය දෙනවා. ඇත්තටම ඉන්න මන්ත්‍රීවරුන්ට දෙනවා. ඉතින් ඒ අයත් මෙතැනට එන්නේ නැත්නම් අපි කාටද කථා කරන්නේ?අපි ඉන්න මන්ත්‍රීවරු වශයෙන් අපේ හිටපු ගරු විපක්ෂ නායකතුමාට ඒ අන්තිම අවස්ථාව ලබා දෙනවා. අපේ ගරු විපක්ෂ නායකතුමා අසනීප තත්ත්වයේ සිටියත් එතුමා විනාඩියක් හරි ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් කථා කිරීම පිළිබඳව අපි අගය

කරනවා. ඇත්තටම අපි දකිනවා, මේ බස්නාහිර පළාත් සභාවේ තිබෙන වැදගත්ම වැය ශීර්ෂය තමයි අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට තිබෙන්නේ. අද කවුරුත් දන්නවා, ප්‍රාදේශීය සභා, නගර සභා, මහ නගර සභාවල මහජන නියෝජිතයන් නොමැති වෙලාවක පාලනය වෙන්නේ ඇත්තටම ගරු ප්‍රධාන අමාත්‍යතුමා, නැත්නම අපේ කොමසාරිස්තුමිය, නැත්නම් පළාත් පාලන ලේකම්තුමිය යටතේ. ඒ නිසා අද ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය වැදගත් අවස්ථාවක් බවට පත් වෙලා තිබෙනවා. එයට හේතු ගණනාවක් තිබෙනවා. මෙතුමාගේ යටතේ තමයි බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ක්ෂේත්‍රයේ ඇති පළාත් පාලන ආයතන 48 ක් පාලනය වෙන්නේ. එවැනි අවස්ථාවක ඉතාමත්ම සාධාරණව - ගරු ප්‍රධාන අමාත්‍යතුමා නොකරනවා කියලා මම කියන්නේ නැහැ. ඇත්තටම යම් යම් අවස්ථාවල යම් යම් දේවල් කෙරෙනවා. ඒත් යම් යම් දේවල්, යම් යම් ප්‍රාදේශීය සභාවල, නගර සභාවල, මහ නගර සභාවල ලේකම්වරුන්ගේ තිබෙන අකර්මන්‍ය තත්ත්වය නිසා ඒවා ක්‍රියාත්මක නොවීම සම්බන්ධව අපි කනගාටුවෙන් හරි ප්‍රකාශ කරන්න ඕනෑ. මෙතුමා තුන් හතර පාර ලේකම්වරුන්ට කථා කරන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ තත්ත්වයට නිලධාරීන් පත් වෙලා තිබෙනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ ක්‍රියාකාරීත්වය තිබෙනවා. එතුමාගේ ක්‍රියාකාරීත්වයට අපි ප්‍රශංසා කරනවා. ඒ තුළ තමයි අද බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතන අද මේ විධියට හරි ශක්තිමත් වෙලා තිබෙන්නේ. ඒ විශේෂයෙන් අපේ කොමසාරිස්තුමියගේ මැදිහත්වීමත් තුළ.

ඇත්තටම අපි දකිනවා, ගරු සභාපතිතුමනි යම් යම් අවස්ථාවල, යම් යම් නිලධාරීන් වසර 10 කට වඩා අධික කාලයක් යම් යම් ක්ෂේත්‍රවල ප්‍රාදේශීය සභා, නගර සභා, මහ නගර සභා තමුන්ගේ බූදල් බවට පත් කරගෙන තිබෙනවා. මම ඊයේ කොමසාරිස්තුමිය, දැන් එතුමිය තමයි පළාත් පාලන ලේකම්තුමිය වශයෙන් කටයුතු කරන්නේ. එතුමියට මම එක ආයතනයක් සම්බන්ධයෙන් පැවසුවා. මම මෙතැන නම කියන්නේ නැහැ. මම වගකීමෙන් කියනවා. මා ළඟ කැළෑ පත්තර තිබෙනවා. මා ළඟට ලිපි ලේඛන ඇවිල්ලා තිබෙනවා. ඒ උදවිය යම් යම් අයගේ අතකොලු බවට පත් වෙලා තිබෙනවා. මම ඒ දේශපාලන පක්ෂ ගැන කියන්න යන්නෙත් නැහැ. නැත්නම් වෙන විධියකට මගේ කථාව යනවා. හැබැයි, ඒ තත්ත්වය ඇති කරන්න එපා. අපි සාධාරණව කටයුතු කරමුයි කියලා ඉල්ලීමක් කරනවා. යම් යම් ආයතන තවමත් ඒ දේශපාලන තත්ත්වයට, ඒ ක්‍රියාකාරී තත්ත්වයට අනුව තමයි කටයුතු කරන්නේ. කොන්ත්‍රාත් දීමේදී පවා හිටපු සභාපතිවරුන්ගේ, මහජන නියෝජිතයින්ගේ සහෝදරයන්, නැත්නම් සභාපතිතුමා මැදිහත් වෙලා තමයි කටයුතු කරන්නේ. ඒ ක්‍රියාදාමය වෙනස් කරන්නය කියලා ඉල්ලීමක් කරනවා. ඒ වාගේම මම ඉල්ලීමක් කරනවා. අපේ කැලණිය ප්‍රාදේශීය සභාවට අයත් පිලපිටිය සුසාන භූමිය ආදර්ශවත් සුසාන භූමියක් බවට පත් කරන්න අපි කටයුතු කරලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමා මට පොරොන්දු වෙලා තිබෙනවා. පරණ ආදාහනාගාරය වෙනුවට නව ආදාහනාගාරයක් 2017 දී ලබා දෙනවා කියලා. ටේ‍්‍ර දෙකක් සහිත නවීන පන්නයේ ආදාහනාගාරයක්. එය ලබා ගැනීමට ඔබතුමාගේ මැදිහත්වීම ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට මම මතක් කරනවා.

ඒ වාගේම කැලණිය මානෙල්ගම කුණු කන්ද සම්බන්ධව කථා කරන්න ඕනෑ. අද මීතොටමුල්ල වාගේ කුණු කන්දක් කැලණියෙත් තිබෙනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ මැදිහත්වීම තුළින් අපි ඉල්ලීමක් කරනවා. අපේ ආසනයේ සංවර්ධන කමිටුවේ ගරු සභාපති ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මැතිතුමාගේ මැදිහත්වීම තිබෙනවා. මෙතුමාට දුරකථනයෙන් එතුමා කථා කළා. මෙයට මැදිහත් වෙලා අපේ ඝන අපද්‍රව්‍ය කළමනාරණ ආයතනය මගින් යම්කිසි විසඳුමක් හැකි ඉක්මණින් ලබා දෙන්නය කියලා මම මේ වේලාවේ මතක් කරනවා. ඒ වාගේම මම කථා කරන්න ඕනෑ, අපේ ගුණසිරි ජයනාත් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ ආසනයේදීමම අකරතැබ්බ පත් වුණා කියලා කවුරුත් දන්නවා. බියගම ආසනයේ බියගම ප්‍රාදේශීය සභා බහු කාර්යය ගොඩනැගිල්ල විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වෙලා වසර 26 ක් දේශපාලනය කරලා මම ලබපු ඉහළම අත්දැකීම ලැබුවේ, එදා තමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉහළම ගෞරවය.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

අභූත චෝදනාවලට මම යම් යම් අවස්ථාවල හිරබත් කාලා තිබෙනවා. ඒ වුණත් ඊට වඩා අත්දැකීමක් එදා දවසේ මම

[ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක]

ලැබුවා. ඇත්තටම කියන්නේ, හූ හඬ මැද්දේ හිතා ගන්න බැහැ. මමයි, අපේ බියගම ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී වසන්ත විමලචන්ද්‍ර මන්ත්‍රීතුමයි. අපි දෙන්නා තනි වෙලා හිටියේ. ඇත්තටම ඒ ආරාධනාව තිබුණේ, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ මහපෙන්වීම යටතේ කියලා. ඒ වචනය කියන්න දෙන්නේ නැහැ. පුර නැඟුම කියන්නේ බස්නාහිර පළාත් සභා අමාත්‍යාංශයෙන් දෙන මුදලක්. ඉතින් මේ වෙලාවල් අර ගත්තේ අපේ ඇමැතිවරුන්ගෙන්. වෙලාවල් අරගෙන ඒ කාඩ් නිර්මාණය කරලා අපේ කොමසාරිස්තුමිය -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මම දන්නෙත් නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

අපේ කිව්වාම ඔබතුමා ගන්න එපා. අපේ කිව්වාම තව ගරු ඇමැතිවරු ඉන්නවා. දන්නවා නේ?අපේ කොමසාරිස් චන්ද්‍රානි මැතිනියගේ නමත් තිබෙනවා. ආරාධනය කරන්නේ එතුමිය. එතුමියයි, ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමියයි. ඒක වගකීමෙන් කියන්නේ. මගේ කාඩ් එක ගෙනාවේ නැහැ. ඕනෑ නම් ගෙනැල්ලා මම සභාගත කරන්නම්. එතකොට මේ දෙපළගේ ආරාධනයෙන් අපි ආවේ. මගේ නම පෙන්නුවා. ඒකට ෆයිසර් මුස්තාපා ඇමැතිතුමා.ඒ වාගේම රුවන් විජේවර්ධන ඇමැතිතුමා. ඒ වාගේම ඩුලිප් විජේසේකර ගරු ඇමැතිතුමා. අපේ ගුණසිරි ජයනාත් මැතිතුමා. අපේ ප්‍රසන්න සම්පත් ගරු මන්ත්‍රීතුමා. මේ අයගේ නම් සඳහන් වෙලා තිබුණා. හැබැයි, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ නම තිබුණේ එතුමාගේ මඟ පෙන්වීම යටතේ කියලා. ඒකේ වරදක් නැහැ. මගේ කථාව මම කරන්න උත්සාහ කළේ, එතැනයි. ඒකට මේ ඒකාබද්ධ විපක්ෂය ඉඩ දුන්නේ නැහැ. මෙතුමාගේ නම කියවන්න දුන්නේ නැහැ. මෙතුමාට අපහාස විධියට කථා කළේ. අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා. මම සටහන් කළේ එතැනයි. ඒක දකින්න ඇති. කෙසේ වෙතත් තමුන්නාන්සේලා දකින්න ඇති යම් යම් අවස්ථාවල ඒ කාන්තාවන් මට සෙරප්පු වලින් ගහන්න උත්සාහ කළා. මගේ ටෝන් එක වෙනස් කළේ ඒ අවස්ථාවේදී. නැත්නම් මට සෙරප්පු 25 ක්, 50 ක් වදිනවා. ඒක හිතාගන්න බැරි අත්දැකීමක්. මේක බෙදාගන්න ඕනෑ. මේක තමයි ඇත්ත සිද්ධිය. මේක දැකපු එක්කෙනා මම විතරයි. කෙසේ වෙතත් ඒ අවස්ථාවට මුහුණ දීපු මම ඉල්ලීමක් කරනවා. ඒ අවස්ථාවේ අසාධාරණ ක්‍රියාකාරකම් වුණා. නාම පුවරුව වෙනස් කළා. ඒක වැරැදියි. රජයේ මුදල් අවභාවිතා කිරීමක් එතැන සිදු වුණා. එතකොට පීත්ත පටි කැපීම, ඒ සම්බන්ධව අපේ පළාත් පාලන අමාත්‍යවරයා වශයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් යම්කිසි පරීක්ෂණයක් කරලා එයට ශක්තියක් දෙන්නය කියලා ඉල්ලීමක් කරනවා. ලේකම්තුමිය පරීක්ෂණයක් කරන්නය කියලා පොලීසියෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා. පොලීසියෙන් පරීක්ෂණයක් කරගෙන යනවා.

ඒ වාගේම මම කියන්න කැමැතියි. රුසියා, පින්ලන්ත අධ්‍යාපන චාරිකාව සම්බන්ධයෙන් අපි කථා කරන්න ඕනෑ. ඒක සාර්ථක චාරිකාවක්. අපි දකිනවා. යම් යම් අමාත්‍යවරු කියලා තිබෙනවා, අපේ මුදල් කපලා තිබෙන්නේ, මේ පිටරට යන නිසා කියලා. අපි ඒ රටවල්වලට ගියාම දැක්කා, ඒ රටවල්වල තිබෙන පළාත් පාලන ක්ෂේත්‍රයේ කටයුතු කරන ආකාරය. ඒ නිලධාරී මහත්ම මහත්මීන් හම්බ වුණා. අපේ බස්නාහිර පළාත් සභාවේ ඉන්න ප්‍රධානම නිලධාරී දෙපළක්, තුන්පළක් ගියා. දැන් සිටින ප්‍රධාන ලේකම්තුමා. ඒ වාගේම සභා ලේකම්තුමා ඇතුළු නිලධාරී මණ්ඩලයක් මේ අවස්ථාවට සහභාගි වුණා. මේ සම්බන්ධයෙන් අපි ස්තුතිවන්ත වෙනවා වාගේම ආණ්ඩුකාරතුමා අපට පොරොන්දු වුණා, අනික් කණ්ඩායමත් ඒ ආකාරයෙන්ම යවනවා කියලා. එතුමා දක්ෂ විධියට, උත්තර දුන්න ආකාරයත් අපට ආණ්ඩුකාරතුමා කිව්වා. එම නිසා මම ඉල්ලීමක් කරනවා, ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්නය කියලා.

ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය යටතේ කථා කරන අවස්ථාවේදී මම පෙත්සම් කාරක සභාව සම්බන්ධයෙන් කථා කරනවා. පෙත්සම් කාරක සභාවේ යම් යම් තීන්දු ගත්තාම, ඒ ප්‍රාදේශීය සභාවල ලේකම්වරු නැත්නම් නිලධාරී මණ්ඩලය ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ඒවා පිළිගන්නේ නැහැ. උදාහරණයක් ගත්තොත් පෙත්සම් අංක 08. පෙත්සම් අංක 08 කියන්නේ, දැන් අවුරුදු 1 ½ ට 2 කට ඉස්සෙල්ලා ක්‍රියාත්මක වුණු පෙත්සමක්. අපේ හිටපු පළාත් සභා මන්ත්‍රී දිවංගත මැතිව් පෙරේරා මැතිතුමාගේ ආදරණීය බිරිඳ තමයි ඒ පෙත්සම දාලා තිබුණේ. එතුමියගේ පාරක් වහලා තිබෙනවා කියලා. තීන්දුව දුන්නා, ප්‍රාදේශීය සභාවෙන්

ක්‍රියාත්මක කරන්නය කියලා. හැබැයි, තව වනතුරු එය ක්‍රියාත්මක කරලා නැහැ. මම එම පෙත්සම සභාගත කරනවා. ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්නය කියලා ඉල්ලීමක් කරනවා. එතුමියගේ නම අශෝකා මාලිකා පීරිස්. අපේම පළාත් සභාවේ හිටපු මන්ත්‍රීවරයෙකුගේ සිද්ධියක්. අපේ පළාත් සභාවේ අපි වාගේම සේවය කරපු මන්ත්‍රීවරයෙක් තමයි මැතිව් පෙරේරා කියන්නේ. එතුමාගේ ආදරණීය බිරිඳ ඉදිරිපත් කරපු පෙත්සමක්. එතුමිය මට අඬ අඬා කිව්වේ, දැන් මගේ මහත්තයාත් නැති වුණා. අපි පෙත්සමට දවස් කීපයක් ඇවිල්ලා රස්තියාදු වෙලා මේ තීන්දුව අපට දුන්නා. නමුත් මේ තීන්දුව ක්‍රියාත්මක වුණේ නැහැයි කිව්වා. එහෙමනම් මම ඉල්ලීමක් කරනවා. මේ වාගේ අනික් ඒවාත් වෙන්න පුළුවන්. මමත් පෙත්සම් කාරක සභාවේ හිටපු මන්ත්‍රී කෙනෙක් වශයෙන් මම දන්නවා. ඒවා ක්‍රියාත්මක කරන්නය කියන එක ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම මම කියන්න ඕනෑ. අපේ ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මැතිතුමා කැලණියේ සංවර්ධන කටයුතු සම්බන්ධව ගරු ප්‍රධාන අමාත්‍යතුමා සමඟ දුරකථන සංවාදවල යෙදුණා. මමත් ඒ අවස්ථාවේ හිටියා. එතුමා දන්නවා, ඒ දුරකථන සංවාද මොනවාද කියලා. එම නිසා මම ඉල්ලීමක් කරනවා. පක්ෂ භේදයෙන්, පාට භේදයෙන් තොරව අපට කටයුතු කරන්න ඒ අවස්ථාව ලබා දෙන්න. මම මෙතුමාට චෝදනා කරන්නේ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායක තිලක් වරාගොඩ මැතිතුමාත්, අපේ සරත් ෆොන්සේකා මැතිතුමාත් යහපාලනයත් එක්ක ගමනක් යන කොට යම් යම් මතිමතාන්තර හැදෙන විධියට සිද්ධීන් හා කටයුතු මේ ප්‍රාදේශීය සභාවන් නිසා වෙලා තිබෙනවා. ඒක මම විවෘතව ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ තත්ත්වය ඇති කරන්න එපා. යහපාලනය තව ශක්තිමත් කරනවා වාගේම ඉදිරියේදී ඔබතුමාගේ වැය ශීර්ෂයට වාගේම බස්නාහිර පළාත් සභාවේ සියලුම වැය ශීර්ෂවලට - අපේ ගරු විපක්ෂ නායකතුමාගේ මැදිහත්වීම තුළ ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා මැදිහත් වෙලා පාර්ලිමේන්තුවට කැඳවලා මේ සඳහා ශක්තිය දෙන්නය කියලා අපෙන් ඉල්ලීමක් කළා. ඒ දෙන ශක්තිය අනුව අපටත් සාධාරණයක් - සියලුම ගරු මන්ත්‍රීවරුන්ට එක හා සමානව සලකන්න ඔබතුමා කටයුතු කරනවා වාගේම ඒක ප්‍රායෝගිකව නිලධාරීන් මාර්ගයෙන් කරලා දෙන්නය කියලා ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම මම ඉල්ලීමක් කරනවා. මෙතැන අපේ කොමසාරිස්තුමිය ඉන්නවා. අද ලේකම්තුමිය බවට පත් වෙලා තිබෙනවා. මීට ඉස්සෙල්ලත් තනතුරු තිබෙන අය හිතපු නැති විධියට බුදල් වාගේ තියන් හිටපු අයත් ගියා. මතක තියාගන්න. සමහර ඇමැතිවරු මන්ත්‍රීවරුන් බවට පත් වුණා. මහ ඇමැතිවරු මන්ත්‍රීවරුන් බවට පත් වුණා. හිටපු ජනාධිපතිවරු නිකන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් බවට පත් වුණා. මේ තනතුරු කවදාවක්වත් ස්ථිර නැහැ. එය හිතාගෙන කටයුතු කරන්නය කියලා ඉල්ලීමක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[පූ.භා. 09.39]

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව මම ස්තූතිවන්ත වෙනවා. විශේෂයෙන්ම බස්නාහිර පළාත් සභාවේ මේ රටේ ප්‍රධාන පළාත් සභාව විධියට, පාර්ලිමේන්තුවට දෙවැනි වන ආයතනය විධියට, ඒ වාගේම ඒ පළාත් සභාවේත් ප්‍රධාන වැය ශීර්ෂය විධියට ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් අදහස් දක්වන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මම ගරු ප්‍රධාන ඇමැතිතුමා ඇතුළු ඒ සියලුම දෙනාට ස්තූතිවන්ත වෙනවා. ඒ වාගේම එතුමාට මම සුභපතනවා. ඒ වාගේම මෙතුමා මගේ ඉස්කෝලේ වන ආනන්ද ශාස්ත්‍රාලයේ ආදි ශිෂ්‍යයෙක්. අපේ ඉහළ පන්තියක සහෝදරයෙක් විධියට වාගේම වර්තමානයේ ගරු ප්‍රධාන අමාත්‍යවරයා විධියට, යම් ප්‍රායෝගික ප්‍රධාන අමාත්‍යවරයෙක් විධියට කටයුතු කරන්න එතුමා උත්සාහ කරනවා. නමුත් ඒ සඳහා යම් බාධාවන් තිබෙනවා කියලා අපට පේනවා. විශේෂයෙන්ම වර්තමාන රජය සමඟ එතුමන්ලාට මොනතරම් සම්බන්ධතා තිබුණත්, මුදල් ඇමැතිතුමාගෙන් පළාත් සභාවට අරමුදල් ලබා ගැනීමේදී කෙනහිලිකම්, කුහකකම් ඇති වුණු බව පැහැදිලිව පෙනෙනවා. විශේෂයෙන්ම මේ අරමුදල් කප්පාදු කිරීම සම්බන්ධයෙන් හිතන කොට මේ පළාත් සභා සියල්ල තවමත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ කණ්ඩායමට තිබෙන නිසාද කියලා සැකයක් ඇති වෙනවා. විශේෂයෙන්ම මුදල් ඇමැතිතුමා ප්‍රකශ කරලා තිබුණා, මේ මුදල් කපන්නේ මෙතැන නිතර කියැවුණ විධියට මේ විදේශ සංචාර වාගේ අනවශ්‍ය වියදම් නිසාය කියලා. අපට පෙනෙනවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, පාර්ලිමේන්තු මැති ඇමැතිවරු නිරන්තරයෙන් සති පතා, මාස් පතා විදේශගත වෙනවා.

[ගරු ජගත් කුමාර]

ඒ තුළ අද රට පාලනය කරගෙන යන විධිය බලන කොට ඡන්දය දුන්න ජනතාව තමන්ටම ඉළපතකින් ගහගන්න තත්ත්වයට පත් වෙලා තිබෙනවා, ජනතාවට සේවය වෙනවාද කියලා. නමුත් ඒ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, මැති ඇමතිවරු විදේශ ඇමතිවරු වාගේ විදේශගත වෙලාම ඉන්න තත්ත්වයක් තුළ ඒ අයගේ වියදම් ගැන විමසන්නේ නැතිව අද බස්නාහිර පළාත් සභාවේ වියදම් කප්පාදු කරන කොට අර වාගේ විදේශ සංචාර ගැන කියනවා. නමුත් පළාත් සභාවේ ජනතා නියෝජිතයන් විධියට මේ රටේ ජනතාවට සේවය කිරීම සඳහා මේ මහජන නියෝජිතයන්ට ඒ අත්දැකීම්, ඒ පළපුරුද්ද සහ ඒ අවබෝධයන් ලබා ගත යුතුව තිබෙනවා. ඒ සේවය කිරීමට තිබෙන අවස්ථාව ලබා නොදෙනවා නම් ඒක කුහක කමක්. ඒ වාගේම ඒ තුළ මුදල් කප්පාදු වෙන්නේ මේ විදේශ සංචාර විතරක් නොවෙයි. ඒක නම් වෙනම පුංචි මුදලක්. හැබැයි, මේ රටේ අධ්‍යාපනය, ඒ වාගේම සෞඛ්‍යය, පළාත් පාලනය, සේවක පඩිනඩි ඇතුළු අනිකුත් සියලු කටයුතු සඳහා, තිබෙන අරමුදල් සඳහා තමයි මේ මුදල් යොදවන්නේ. ඒ සියලු මුදල් එක්ක තමයි මේ කප්පාදු කෙරෙන්නේ. ඒ තුළ පළාත් සභාව සාමාන්‍යයෙන් ස්වභාවික මරණයකට ලක් කරන්න ආණ්ඩුව උත්සාහ කරනවා. බලය බෙදන එක ගැන කථා කරන ගමන් බස්නාහිර පළාත් සභාව මේ රටේ ප්‍රධාන පළාත් සභාව විධියට, වැඩි රාජ්‍ය සේවක සංඛ්‍යාවකට පඩිනඩි ගෙවන ආයතනය විධියට මේ පළාත් සභාවට වැඩ කරගෙන යන්න ඉඩ දෙන්නේ නැත්නම් ඒ තුළ පැහැදිලිව පෙනෙන්නේ, මේ රජයේ එක් පැත්තකින් කියන දේ නොවෙයි, අනික් අතට සිද්ධ කරන්නේ කියලා. ඒ නිසා මෙය වහාම නවත්වන්න රජය පැත්තෙන් කටයුතු කළ යුතුයි කියන කාරණාව කියනවා. ඒ සම්බන්ධයෙන් අපි මීට වඩා වගකීමෙන් මැදිහත් වෙනවා. මොකද, මේක අපට පුද්ගලිකව බලපාන කාරණාවක් නොවෙයි. ඒක පොදුවේ සමස්ත රටට බලපාන කාරණාවක් නිසා. රටේ ජනතාවට බලපාන කාරණාවක් නිසා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, අද මේ පළාත් පාලන විෂයයේදී විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. අපේ සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමාත් කිව්ව විධියට පළාත් පාලන ඡන්දය නොතිබීම තුළ අද මහජන නියෝජිතයන් විසින් වැඩ කළ යුතු ආයතන ජනතාවගේ කැමැත්තෙන් කළ යුතු කටයුතු සිද්ධ වෙන්නේ නැති තැනට ඇති වෙලා තිබෙනවා. අද පළාත් පාලන ආයතන අක්‍රීය වෙමින් තිබෙනවා. ගරු මහ ඇමැතිතුමා යම් මැදිහත්වීමක් කරන්න උත්සාහ කළා වුණත්, නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය තුළ සිද්ධ වන්නේ, ජනතාවගේ කැමැත්ත, ජනතාවගේ නියෝජිතයා හරහා ඉෂ්ට සිද්ධ කර ගැනීමයි. ඒක රාජ්‍ය සේවකයෙක් හෝ වෙනත් අය හරහා කරන්න බැහැ. ඒ අය ලවා ඒක කරන්න පුළුවන් නම්, ඒක මේ කාලය තුළ සිද්ධ වෙන්න ඕනෑ නේද? එහෙමනම් පාර්ලිමේන්තුවටත් මන්ත්‍රීවරු ඕනෑ නැහැ. ඒකත් අමාත්‍යාංශ ලේකම්වරු හරහා කරන්න පුළුවන්. නමුත් නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය හරහා මේ කටයුතු කරනකොට ඒ ප්‍රදේශයේ ජනතාවගේ හද ගැස්ම, ඕනෑකම හඳුනාගෙන වැඩ කරන්න මහජන නියෝජිතයන් ඕනෑ. හැබැයි, ඒවා අද සම්පූර්ණයෙන් නවත්තලා ප්‍රජාතන්ත්‍රවාදය වළ පල්ලට යවලා, නීතිය සාමය විතරක් නොවෙයි. සම්පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදය, ජනතා කැමැත්ත මේ ආණ්ඩුව විසින් වළ පල්ලට යවමින් තිබෙනවා. ඒ නිසා අපි වහාම මැතිවරණ පවත්වලා ඒ ජනතා කැමැත්ත ඉෂ්ට කරන්න අවශ්‍ය පසුබිම සකස් කරන්නය කියලා කියනවා. ඒ වාගේම පළාත් පාලන ආයතනවල කටයුතු කරන කොට අපි ගරු මහ ඇමැතිතුමාගෙන් ඉල්ලනවා. මේ පළාත් පාලන ආයතනවල තවමත්, සමහර විට යහපාලනයට උදව් කරන නිසා වෙන්න පුළුවන්. සමහර තැන්වල මේ පළාත් පාලන ආයතන කාලා විනාශ කරපු අය, තවමත් හොල්මන් වාගේ වැඩ කටයුතු කරනවා. මම ඊයේත් දැක්කා, ඒ වාගේ හොල්මන් කඩුවෙල ප්‍රදේශයේ වාගේම මේ පළාත් සභාව ඇතුළටත්ඒවා ඇවිල්ලා හොල්මන් කරන තත්ත්වයක්. පළාත් සභාවේ ආයතනයකින් ඔබතුමන්ලා කටයුතු කරනවා නම්, මේ ආයතන මෙතෙක් කල් කටයුතු කරපු අයට බලය දුන්නොත් යම් විධියකට, ඔවුන්ගේ වංචාවන්, දූෂණයන් වහගෙන කටයුතු කරන්න ඔවුන් මේ වන කොට උත්සාහ කරනවා. ඒ නිසා ගරු මහ ඇමැතිතුමාට යම් බලයක් පළාත් පාලන අමාත්‍යාංශයේ කොමසාරිස් හරහා ඉෂ්ට කරනවා නම් ඒවා නිවැරදි ආකාරයෙන් කරන්න කියලත් බොහොම ගෞරවයෙන් ඉල්ලනවා.

ඒ වාගේම මේ රටේ ජනතාව බලාපොරොත්තු වන්නේ ඒ නිලධාරීන් හරහා මේ කටයුත්ත කරගෙන යන්න නොවෙයි. ජනතාවගේ ප්‍රාර්ථනාව, බලාපොරොත්තුව මහජනතාවගේ හද ගැස්ම දන්න මහජන නියෝජිතයන් හරහා ඒක ඉෂ්ට කරගන්න. ඒ සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීමේ මැතිවරණ පැවැත්වීම වර්තමාන රජයේ ප්‍රමාදවීම

වළක්වන්න අපි සියලු දෙනා කටයුතු කරන්න ඕනෑ. විශේෂයෙන්ම මේ මැතිවරණ නොපැවැත්වීම නිසා අද සමහරවිට කුණු ටික අදින්න කියන්න ආයතනවල නිලධාරීන්ට කථා කළාම, ඒ අය තව කෙනෙකුට පවරනවා. තවත් කෙනෙක් තව කෙනෙකුට පවරනවා. සමහරවිට කියනවා, ලේකම් නැහැ. කොමසාරිස් නැහැ. ඒ අය විවිධ තැන්වල. ඒ නිසා වැඩ කටයුතු කරන්නේ නැහැ. නමුත් පෙරදී මහජන නියෝජිතයන් ඒ කොට්ඨාශවලට, ප්‍රදේශවලට සිටිය නිසා ඔවුන් දුවලා, පැනලා සොයලා බලලා තමන්ට මනාප ගන්න, ඡන්ද ගන්න, ජනතාවගේ කැමැත්ත නැවැත ගන්න ඕනෑ නිසා ඒ කටයුතු කරනවා. හැබැයි, රාජ්‍ය සේවකයින් එතැන සිටියාම ඒ අයට පඩිනඩි කොහොමත් ගෙවනවා. ඒ නිසා ඒ අයට ඒ සම්බන්ධයෙන් වගකීමක් නැහැ. ඒ නිසා මේ තත්ත්වය අවබෝධ කරගෙන වර්තමාන රජය කටයුතු කරන්න ඕනෑ. පක්ෂ ඇතුළේ මොන අර්බුද තිබුණත් ජනතා ඡන්දය ලබා දීම හැම කෙනෙකුගේම වගකීමක්, යුතුකමක් වෙනවා. ඒ නිසා එම කටයුතු කරන්නය කියන ඉල්ලීම අපි විශේෂයෙන් කියනවා. ඒ වාගේම මේ නීතිය සාමය ගැන කථා කරන කොට අද රටේ යම් ප්‍රමාණයකට නීතිය සාමය පිළිබඳ ප්‍රශ්නය මතු වෙලා තිබෙන බව පැහැදිලියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, සමාවෙන්න. ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මේ අවස්ථාව ලබා දීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මම නැවතත් සුභ පතමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තුතියි. යසපාල කෝරළගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා, ඔබතුමාට විනාඩි 06 ක කාලයක් තිබෙනවා. වෙලාවට අවසන් කරන්න ඕනෑ.

[පූ.භා. 09.46]

**ගරු යසපාල කෝරළගේ -** නියෝජ්‍ය සභාපතිතුමා
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය යටතේ කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන බොහොමත්ම ස්තුතිවන්ත වෙනවා. අද මේ රටේ ආණ්ඩුව විශාල අර්බුදයකට පත් වෙලා. විශේෂයෙන් ආර්ථික වශයෙන්, සමාජයීය වශයෙන් බොහොම අවුලෙන් අවුලට පත් වෙලා ඉන්න වකවානුවක රටේ තිබෙන විශාලතම පළාත් සභාව වශයෙන් බස්නාහිර පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ ආකාරයෙන් පළාත් සභාව ඒකරාශී කරගෙන, ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගේ ප්‍රශංසාවට ලක් වෙමින් මේ ගෙන යන වැඩ පිළිවෙළ පිළිබඳව අපි පළාත් සභාවේ මන්ත්‍රීවරු වශයෙන් මම හිතන්නේ, බහුතරයක් නොවෙයි, 90% ක්ම අද ගරු ප්‍රධාන අමාත්‍යතුමා ගෙන යන වැඩ පිළවෙළට බොහෝසෙයින් එකඟ වෙලා තිබෙනවා.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

99% ක්.

**ගරු යසපාල කෝරළගේ -** නියෝජ්‍ය සභාපතිතුමා
Hon . Yasapala Koralage - Deputy Chairman

99% ක්. ඒකට එක හේතුවක් තිබෙනවා. එතුමා මේ පළාත් සභාවට පල්ලෙහා සිට ඇවිල්ලා අපේ රැහේ එකෙක් වශයෙන්, එහෙම නැත්නම් අපේ පන්තියේ එකෙක් වශයෙන් මේ ප්‍රධාන පුටුවට පත්වීම තුළ එතුමාට තේරුම් ගන්න පුළුවන් වුණා, සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස්. එලෙස ඒ සිතුම් පැතුම් තේරුම් අරගෙන ඒ අනුව වැඩ කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් තමයි අද ආණ්ඩු පක්ෂයේ විපක්ෂයේ සියලු මන්ත්‍රීතුමන්ලා ඒකාරාශී වෙලා ඉන්නේ. ඒ නිසා එතුමා තෝරාගත්තු නිලධාරී මණ්ඩලය ප්‍රධාන ලේකම්තුමා ඇතුළු සමස්ත නිලධාරී මණ්ඩලය ඒ මන්ත්‍රීවරුන්ගේ සිතුම් පැතුම් එක්ක ක්‍රියා කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් තමයි අද මේ සියලු දෙනාම ඒකරාශී වෙලා ඉන්නේ. එහෙම නැතිව පසුගිය අවුරුද්දේ වාගේ, 2016 වාගේ යම්කිසි පෙරළියක්, යම්කිසි විපර්යාසයක් වෙන්න මේ පළාත් සභාවෙත් තිබුණා. නමුත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා ගෙන යන වැඩ පිළිවෙළ තුළ ගරු ප්‍රධාන අමාත්‍යතුමා කෙරෙහි තිබෙන විශ්වාසය මත, එතුමාගේ කීම

[ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා]

මත මම හිතන්නේ, සමස්ත අයවැයම අපට බොහොම කරදරයක් නැතිව ජයග්‍රහණය කරන්න පුළුවන්කමක් ඇති වෙලා තිබෙනවා. ඒකට හේතු කාරණා තිබෙනවා. කාල වේලාව කෙසේ වෙතත් හේතු කාරණා අපට පෙන්වන්න උවමනා වෙලා තිබෙනවා.

මම මුලින්ම පටන් ගත්තේ, මේ ආණ්ඩු විශාල අර්බුදකාරී තත්ත්වයකට පත් වෙලා තිබෙනවා කියලා. විශේෂයෙන් ආර්ථික වශයෙන් මධ්‍යම රජයේ ආණ්ඩුව අද අර්බුදකාරී තත්ත්වයට පත් වෙලා තිබෙනවා. රුපියල් 129 ට, 130 ට තිබුණු ඩොලරය අද රුපියල් 151 දක්වා වැඩි වෙලා තිබෙනවා. මේ තත්ත්වයට පත් වුණේ විධිමත් ආකාරයේ රජයක ක්‍රමානුකූලව ආර්ථිකයක් පරිහරණය නොකරන නිසා කියන එකයි මම විශ්වාස කරන්නේ. මේකට විශේෂ වූ කාරණා කිහිපයක් විතරක් මම පෙන්වා දෙනවා. මේකට කාරණා තුනක් මම පෙන්වා දෙනවා. දේශපාලන අවශ්‍යතා, දේශපාලන ඉල්ලීම්, දේශපාලන උවමනාවල්, දේශපාලන පොරොන්දු තුනක් විශේෂයෙන් ඉෂ්ට කරන්න ගිහිල්ලා තමයි මේ රජය අද ඇණ ගත්තේ. ඒක තමයි, රුපියල් 10000/- ක වැටුප් වැඩි වීමක් මේ රටේ ජනතාව ඉල්ලුවේ නැහැ. හිටපු ජනාධිපතිතුමා කිව්වේ, රුපියල් 2500/- ක් දෙන්නම් කියලා. තමන් බලයට එන්නේ නැහැයි කියලා හිතාගෙන රුපියල් 10000/- ක් දෙන්න මෙතුමන්ලා පොරොන්දු වුණා. ඒ පොරොන්දුව ඉෂ්ට කළා. ඒ පොරොන්දුව බොහොම හොඳයි. ඒ ආකාරයෙන් රජයේ මුදලක් විශාල ආකාරයෙන් යන කොට - ඒ වාගේම තෙල් මිල අඩු කරන්නය කියලා කවුරුවක්වත් කෑ ගැහුවේ නැහැ. තෙල් මිලෙන් රජයට එන විශාල ධනය,විශාල ආර්ථිකය එක පැත්තකින් විනාශ කර ගත්තා. ඒ පැත්තෙන් ආර්ථිකය විනාශ කර ගත්තා. අනික් පැත්තෙන් විශාල මුදලක් රජයෙන් දෙන්න වුණා. මේ දෙක blance කර ගන්නවාත් එක්කම මහා දවල්, මහා බැංකුවේ මහා මංකොල්ලය, හොරකම පටන් ගත්තා.

මෙන්න මේ කාරණා තුනත් එක්ක මැදිවීම තුළ තමයි අද ආණ්ඩුව විශාල ආර්ථික අර්බුදයකට පත් වෙලා තිබෙන්නේ. ඒ ආර්ථික අර්බුදයට පත් වෙලා තිබෙන එකේ ප්‍රතිඵලය තමයි අද අපි භුක්ති විඳින්නෙත්. එදා පළාත් සභාවට ලැබුණු බිලියන ගණනින් අද 45% ක් අපට අහිමි වෙලා තිබෙනවා. අපට විතරක් නොවෙයි. සමස්ත පළාත් සභා පද්ධතියම කඩා වැටෙන්න හේතු කාරණා වුණේ, මේ දේශපාලන උවමනාවල් මත මේ වර්තමාන ආණ්ඩුව ක්‍රියා කරන්න යාමේ ප්‍රතිඵලයක් වශයෙන්. එවැනි තත්ත්වයක් තිබිලත් පළාත් සභාවේ සියලු ගරු මන්ත්‍රීතුමන්ලාගේ සිතුම් පැතුම් එක්ක ක්‍රියා කරලා, අද තමන්ට තිබෙන මුදලෙන් මේ ආකාරයෙන් මේ පළාත් සභාව ගෙනියන්න ඕනෑය කියලා මේ ගෙනි යන වැඩ පිළිවෙළට අපි බස්නාහිර පළාත් සභාවේ ගරු ප්‍රධාන ඇමැතිතුමාට බොහොමත්ම ස්තුතිවන්ත වෙනවා. බොහොම ප්‍රශංසා කරනවා.

ඒත් එක්කම එතුමාට කාරණා කිහිපයක් පෙන්වා දෙන්න ඕනෑ. අපි පළාත් පාලන ආයතනවල හිටපු සභාපතිවරු. අද වන කොට පළාත් පාලන ක්ෂේත්‍රය තුළ මහජන නියෝජිතයන්ගේ හඬක් නැහැ. මහජන නියෝජිතයන්ගේ අදහස් එතැන නැහැ. නමුත් අද සමහර පළාත් පාලන ආයතනවල ලේකම්වරු සහ නිලධාරීන් හිතුමතේ - සමහර පළාත් පාලන ආයතන අද අයාලේ යන ගතියක් තිබෙනවා, ගරු ප්‍රධාන අමාත්‍යතුමනි. ඒ නිසා මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලනවා. මහජන අදහස් ඇතුව, මහජනතාවගේ ඉල්ලීම් මත වන යෝජනාවලට පළාත් පාලන ආයතනවල තිබෙන මුදල් පරිහරණය කිරීමේදී සෘජුවම ඔබතුමා අද සභාපතිවරු නැති ඒ පළාත් පාලන ආයතනවල නායකයා වෙලා තිබෙන්නේ, ගරු ප්‍රධාන ඇමැතිතුමා. ඒ නිසා සෘජුවම ඔබතුමා මැදිහත් වෙලා මහජනතාවගේ අදහස් සහ ඉල්ලීම්වලට ගරු කරන ඒ යෝජනාවන් විතරක් පළාත් පාලන ආයතනවල ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්නය කියලා ඉල්ලා සිටිමින්, ඔබතුමා මේ ගෙන යන වැඩ පිළිවෙළට නැවත නැවතත් බොහොම සුභ පතමින් මම නිහඬ වෙනවා. බොහොමත්ම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. මීළඟට උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙන්නේ. අනේ කරුණාකර විනාඩි 05 ටම නවත්වන්න. මාව මහන්සි කරන්න එපා.

[පූ.භා. 09.53]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය යටතේ ශීර්ෂ අංක 104, 109, 110, 111 හා 112 යටතේ කථා කරන්න ලැබීම ගැන සතුටු වෙනවා. විශේෂයෙන්ම අපේ ගමේ ඉපැදිලා, මමත් එක්ක ප්‍රාදේශීය සභාවට තරග කරලා, එතුමා උප සභාපති හැටියට වැඩ කරලා මහරගම ප්‍රාදේශීය සභාවේ අපත් එක්ක වැඩ කළා. නමුත් ජනවාරි 08 වැනිදා අපේ මෛත්‍රීපාල සිරිසේන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් පැනලා ගිහිල්ලා අපට, මේ රටට කරපු පාපකර්මයට ඒකේ සාමාජිකයෙක් හැටියට ගරු මහ ඇමැතිතුමා භුක්ති විඳින ඒ කරුමක්කාරකමට වැටුණු එක ගැන මම ප්‍රථමයෙන්ම කනගාටු වෙනවා. මොකද, යහපාලන ආණ්ඩුව ගෙනෙන්න මේ තර්ක විතර්ක හොරු කියලා දාපු ජනතා විමුක්ති පෙරමුණ, TNA එක, අනිකුත් සංවිධාන 47 ක් ඒකරාශි වෙලා කටයුතු කළා. දැන් මේ යහපාලන ආණ්ඩුව ගේන කොට මේ රටේ කිව්වා, මහින්ද රාජපක්ෂගේ ණය, රාජපක්ෂගේ ජීනිවා බැංකුවල, ස්විස් බැංකුවල සල්ලි ගැන රාජපක්ෂගේ ගෙදර දවසකට කන්න දෙන ප්‍රමාණයට මිලියන 06 ක් යනවා කිව්වේ. ඒ කියන්නේ, ලක්ෂ 60 ක් විතර යනවා.

ඉතින් මේ වාගේ වියදම් ඔක්කොම අඩු කරලා, මේ රටේ රාජ්‍ය සේවකයාට පඩි වැඩි කරනවා. දින 100 න් මෙන්න මේ වාගේ දේවල් කරනවා කියලා විශාල අභියෝගාත්මක දේවල් මේ රටේ මිනිස්සුන්ට දිග හැරියා. දැන් පෙරෙයිදා පාර්ලිමේන්තුව බලන්න. මේ පාර්ලිමේන්තුවේ අපේ අනුර කුමාර දිසානායක මැතිතුමා, අනුරාධපුරයේ අපේ ජේවීපී මන්ත්‍රීතුමා කියනවා, යහපාලන ආණ්ඩුව ගෙනාවේ හොරකම් කරන්න නම්, පාරට බහින්නේ නැතිව ඇයි මේගොල්ලෝ තවත් බලාගෙන ඉන්නේ කියලා. එතකොට ඊයේ ජනතා විමුක්ති පෙරමුණේ අපේ ලාල්කාන්ත වෘත්තීය සමිති අංශයේ ප්‍රධාන සංවිධායකතුමා කියනවා, 2020 වන කොට මේ වෙලා තිබෙන මහා ණය බරත් එක්ක, අද මේ රටේ තිබෙන ආර්ථික අර්බුදයත් එක්ක අපි යන්නේ කොහොමද? උතුරේ ඉන්න TNA සංවිධානය, එතකොට පක්ෂයේ නායකතුමා පාර්ලිමේන්තුවේ පෙරෙයිදා කිව්වා, තමුන්නාන්සේ එහෙම කථා කරන්න එපා. තමුන්නාන්සේ තමයි ගිනි තිබ්බේ, තමුන්නාන්සේගේ ආණ්ඩුව තමයි ගිනි තිබ්බේ යාපනයේ පුස්තකාලයට. මේ පළාත් සභා ක්‍රමය, 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කරන්න -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

අයවැයට කථා කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අපි මේ පළාත් සභාව ගැන කියන්නේ. ඒ පුස්තකාලයට සිරිනාල් ද මෙල් ගියා. අපේ විපක්ෂ නායකතුමා නම් ගියේ නැහැ. මේකට ගියේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

මේකට ගිනි තියන්න ගියා. අපේ කැලණියේ හිටපු සභාපතිතුමා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

බොරු කියන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

(බාධා කිරීම්) මෙතුමාගේ තාත්තා ගියා. ඒක ලැයිස්තුවේ තිබෙනවා. දැන් අපේ ගරු මහ ඇමැතිතුමාට තිබෙන්නේ කඩා වැටුණු ආර්ථිකයක් සහිත ආණ්ඩුවක්. දැන් මේ අය යහපාලනයේ කෑ ගහලා, කෑ ගහලා ගෙනාවා. දැන් බලන්න. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව 2014 දේශීය ණය මිලියන 4778 යි. විදේශීය ණය 3113 යි. දෙකම එකතු කළාම 7391 යි. දැන් මේකට ඔක්කොම කෑ ගැහුවා. කෑ ගහන කොට ඇමරිකාවේ මොනවද වුණේ? ගිය සුමාන දෙක තුනකට ඉස්සෙල්ලා ඇමරිකාවේ ඒ පැරදුණු නායිකාවට ලංකාවේ ආණ්ඩුවෙන් කෝවිල්වලට ගිහිල්ලා පූජාවන් තිබ්බා. පන්සල්වලට ගිහිල්ලා තිබ්බා. අම්මට සිරි දිනන්න කියලා පූජා ටික තිබ්බා. කොහෙවත්ම හිටියේ නැති අලුත්ම කෙනෙක් ආවා. කවුද? අපේ ට්‍රම්ප් ඇවිල්ලා පෙරෙයිදා ඇමරිකාවේ තානාපතිවරයා එව්වා, මහින්ද රාජපක්ෂව හම්බ වෙන්න. වහාම ඇමරිකාවට එන්න. මේ යහපාලනය ගෙනියන ක්‍රියාවලිය වෙනස් කරන්න. චීනයට මහින්ද රාජපක්ෂව ගෙන්නුවා. චීනයේ ගියා. චීනයේ හිටපු විදේශ කටයුතු අමාත්‍යවරයා කිව්වා, ශ්‍රී ලංකාව අපේ මිත්‍ර රට. බණ්ඩාරනායක මැතිනිය ශ්‍රී ලංකාවේ චයිනා ගිවිසුම අත්සන් කරලා රටට බොහොම

[ගරු උපාලි කොඩිකාර]

ශක්තිමත් විධියට අපේ රටවල් දෙක මිත්‍රත්වයෙන් පාලනයන කළා. රාජපක්ෂ මහත්මයා කිව්වා, මේ යහපාලන ආණ්ඩුවට කිසිම ආධාරයක් නැහැ. මහින්ද රාජපක්ෂ ගෙනෙන යෝජනා ගේන්න, We spout you at the Sri Lanka. Only proposal Rajapaksha. Not yahapalanaya. Tie pocket man is Council and parliament. Priminister is the our friend. කෝට් එක දාලා කථා කරනවා. උදේට එකක් කියනවා. දවල්ට එකක් කියනවා. රෑට එකක් කියනවා. ඒකට හාත්පසින්ම වෙනස් අපේ ඉසුර දේවප්‍රිය ගරු මහ ඇමැතිතුමා කරුමෙට අනික් පැත්තට පැන්නා. බැසිල් රාජපක්ෂ මහත්මයා දුන්න ලක්ෂ 10 ත් අරන්. අපේ පක්ෂයෙන් දුන්නා, පක්ෂයට වියදම් කරලා දිනවන්න කියලා. ඒ ලක්ෂ 10 ත් අරගෙන පැනලා ගියා මෛත්‍රීපාල සිරිසේන ගාවට. අපේ රටේ ආරක්ෂකතුමා, නායකතුමා අද පත් කර ගත්ත නිසා තමයි මේ කරුණු ඔක්කොම අවුස්සන්නේ. ගරු සභාපතිතුමනි, මේ මුදල් කැපුවා කිව්වාම අපේ මන්ත්‍රීවරු සියලු දෙනාම කෑ ගහලා මුදල් ඉල්ලනවා. ඉස්සර අපේ ප්‍රසන්න රණතුංග ගරු ඇමැතිතුමා චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග මහ ඇමැතිතුමිය, රෙජිනෝල්ඩ් කුරේ, සුසිල් ප්‍රේමජයන්ත යන ගරු මහ ඇමැතිවරු මේ කට්ටිය මෙතැන ඉන්න කාලයේ එක කෝල් එකක් දුන්නාම අපේ හිටපු රාජ්‍ය නායකවරුන් සල්ලි බෙදලා දුන්නා. ගාමිණී තිලකසිරිත් ඒකේ සාක්ෂියට ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමා, විනාඩියක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විනාඩියක් දෙන්න බැහැ. කරුණාකර වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

නහින දෙහින කාලයේ ගාමිණී තිලකසිරිවයි, ඉසුර දේවප්‍රිය අපේ ගරු මහ ඇමැතිතුමයි දෙන්නම ගෙදර අරින්න යහපාලනයට එකතු වුණු එක ගැන අපි කනගාටු වෙනවා. මට අවස්ථාව ලබා දීම ගැන මගේ ගෞරවය ස්තුතිය, භක්තිය ඔබතුමාට පුද කරනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මගේ තාත්තා මේ පළාත් සභාවේ හිටපු යූ.එස්. පෙරේරා. කවුරුත් දන්නවා. දැන් දිවංගත වෙලා. යාපනය පුස්තකාලය ගිණි තියන්න මගේ තාත්තා ගියේ නැහැ. අපේ හිටපු ඇමැතිතුමා මේ වාගේ ජරා වචනයක් කිව්වා. ඒක හැන්සාඩ් එකෙන් ඉවත් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒක හැන්සාඩ් එකෙන් ඉවත් කරනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

යූ.එස්. පෙරේරා මහත්මයා නිසා තමයි අද මම මෙතැන ඉන්නේ. ගරු මන්ත්‍රීතුමා, ඔය වාගේ ජරා තුප්පහි වචන කියන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි විවාදයකට යන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි. වාඩි වෙන්න. අනවශ්‍ය විවාදවලට යන්න දෙන්න බැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මෙතුමා ගැන නොවෙයි කිව්වේ. මෙතුමාගේ තාත්තා. ගියාද? නැද්ද? කියලා දැන් අහන්න නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පුතා දන්වා නේ ඉතින්. තාත්තා ඉන්න ඕනෑ නැහැ. පුතා දන්නවා, ගියාද නැද්ද කියලා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, ඔබතුමා මගින් පොඩි පැහැදිලි කිරීමක් අහන්නේ. මෙතුමා විසින් කිව්වා, රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් ඇමරිකාවේ ට්‍රම්ප් ජනාධිපතිතුමා මහින්ද රාජපක්ෂ මහත්මයාට එන්න කියනවා කියලා ලංකාවේ ආණ්ඩුව වෙනස් කරන්න. ඒක රාජ්‍ය තාන්ත්‍රිකව කරපු ප්‍රකාශයක්ද? එහෙම නැත්නම් එතුමාගේ -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒක මගේ දේශපාලන මතය.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

දේශපාලන මතය නොවෙයි. ඔබතුමාට එන්න කියලා තිබෙනවාද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මගේ දේශපාලන මතය මම කිව්වේ.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

මේ හිටපු ජනාධිපතිතුමාගේ උපදේශකතුමා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, ඒක මගේ දේශපාලන මතය. මේ සභාවේ ඔක්කෝම මතක තියා ගන්න. 104 දෙනාගේම දරුවන්ට කියවන්නත් මෙය හැන්සාඩ් එකේ තියන්න. ඊළඟ අවුරුද්දේ මේ වන පෙරළියත් එක්ක.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා මොනවා කිව්වද කියලා මට තේරෙන්නේ නැහැ. එතුමාගේ මතය එතුමා ඉදිරිපත් කළා. මෙතුමාගේ තාත්තාට කරපු අගෞරවය මම හැන්සාඩ් එකෙන් ඉවත් කරනවා. ගුණසිරි ජයනාත් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, ඔබතුමාට විනාඩි 08 ක කාලයක් ලබා දෙනවා.

[පූ.භා. 10.02]

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ගරු සභාපතිතුමනි, අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂයන් වන ශීර්ෂ අංක 104, 109, 110, 111 හා 112 යන වැය ශීර්ෂයන් පිළිබඳව සාකච්ඡා කරන වෙලාවේ අදහස් ප්‍රකාශ කරන්න ලැබීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන් මම පොදු සාකච්ඡාවේදීත් සඳහන් කළා. අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා - විශේෂයෙන් මේ පළාත් පාලන ක්ෂේත්‍රය පිළිබඳව සාකච්ඡා කිරීමේදී හිටපු සභාපතිතුමෙක් විධියට පළාත් පාලන ක්ෂේත්‍රයේ තිබෙන ගැටලු, ප්‍රශ්න, ඇතිවන සිද්ධීන් පිළිබඳව හොඳ අවබෝධයක් තිබෙන ප්‍රායෝගික සභාපතිවරයෙක් හැටියට, බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ඇමැතිවරයා හැටියටත්, ප්‍රධාන ඇමැතිවරයා හැටියට පත්වීම සම්බන්ධයෙනුත් පෞද්ගලිකව විශේෂයෙන් මම සතුටු වන කෙනෙක්. ඒ වාගේම එතුමා මේ කාලය තුළ මේ දෙවැනි අයවැය ඉදිරිපත් කිරීමේදී, බස්නාහිර පළාත් සභාවේ තිබෙන සියලු ප්‍රශ්න පිළිබඳව මනා අවබෝධයකින් කටයුතු කිරීම නිසාම අද මේ සභාවේ විපක්ෂය, විශේෂයෙන් එක්සත් ජාතික පක්ෂයේ පාර්ශවයෙන් අදහස් ප්‍රකාශ වීමේදී සඳහන් වුණු ප්‍රධාන කාරණාව තමයි, මේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යතුමා පිළිබඳව එතුමන්ලා ඇති කරගෙන තිබෙන විශ්වාසය. ඒ නිසාම මේ අයවැයට එතුමන්ලාගේ සහාය ලබා දෙනවා කියන කාරණාව සඳහන් කළා. ඒක ඉතාම සුවිශේෂී අවස්ථාවක්. ඒකෙන් මම ගම්‍ය කර ගන්නේ, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ තිබෙන දක්ෂතාවය, හැකියාව සහ මනා කළමනාකාරීත්වයයි. ඒ නිසාම මේ පළාත් සභාවේ ජනතාවට ඒ හරහා සිද්ධ වන සේවාවන් අගය කිරීමක් හැටියට තමයි අද විපක්ෂයේ ඒ අදහස් ප්‍රකාශ කිරීම සිද්ධ වෙන්නේ කියන කාරණාව, මම විශ්වාස කරනවා.

විශේෂයෙන්ම අද මේ වකවානුව දිහා බලන කොට බරපතළ කනගාටුවට කාරණාවක් ඊයේ දවසේ සඳහන් වුණා. විශේෂයෙන් මේ පළාත් පාලන විෂයය සාකච්ඡා කිරීමේදී අද අපේ බස්නාහිර පළාත නියෝජනය කරන පළාත් පාලන ආයතන 48 ත්, මුළු රටේම පළාත් පාලන ආයතනත් විසුරුවලා අවුරුදු දෙකකට ආසන්න කාලයක් තුළ ඒ ප්‍රදේශයේ ජනතාවගේ සිතුම් පැතුම් ඒ ආකාරයෙන් ඉෂ්ට සිද්ධ කරගන්න තිබෙන අවස්ථාව මේ ආණ්ඩුව විසින් මඟ හැරලා තිබීම සම්බන්ධයෙන් බලවත් විරෝධයක්,

[ගරු ගුණසිරි ජයනාත් - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක]

බලවත් කනගාටුවක් මම මේ වේලාවේ මතක් කරන්න කැමැතියි. විශේෂයෙන් මහජන නියෝජිතයින් නොමැති ආයතනයක් අයාලේ යන එක ඊයේ දවසේත්, අද දවසේත් අපේ ගරු මන්ත්‍රීවරු බොහෝ සෙයින් අදහස් ප්‍රකාශ කරන්න ගත්තා. සියලුම පාර්ශව වලින්.

මේ යහපාලන ආණ්ඩුව ප්‍රජාතන්ත්‍රවාදය උතුම්කොට සලකලා, ප්‍රජාතන්ත්‍රවාදය දෝරේ ගලාගෙන යන්න ඉඩකඩ සලසනවා කියලා තමයි යහපාලන ආණ්ඩුව එනකොට කිව්වේ. එහෙම ආපු ආණ්ඩුව මේ පුංචි මන්ත්‍රීවරු, ගමේ අවශ්‍යතා ඉෂ්ට කරන මන්ත්‍රීවරුන්ට පත් වෙන්න තිබුණු අවස්ථාව මග හැරලා, දැනට අවුරුදු 2 කට ආසන්න කාලයක් කල් මරමින් තිබෙනවා. හැබැයි, අද දවස වන කොට මාධ්‍ය හරහා අහන්න කාරණාවක් ලැබුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මාධ්‍ය ප්‍රකාශක හැටියට කිව්වා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තීරණයක් ගත්තාය කියලා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයෙක් හැටියට මම සතුටු වෙනවා. නව පළාත් පාලන මැතිවරණ ක්‍රමය පාර්ලමේන්තුවේ පනතකින් සම්මත වුණු කොට්ඨාශ මැතිවරණ ක්‍රමයට ඉදිරියේදී මැතිවරණය පවත්වන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තීරණය කළයි කියන කාරණාව අද දවසේ මාධ්‍ය හරහා අහන්න ලැබුණා. ඒක ඒ ආකාරයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සැබෑවටම ඒ තීරණය ගත්තා නම් ඒක සුභවාදී හොඳ තීරණයක් කියන කාරණාව මම මේ වේලාවේ මතක් කරන්න කැමැතියි.

හැබැයි, ඒ එක්කම පාර්ලිමේන්තුව තුළ විපක්ෂය නියෝජනය කරන ඇතැම් දේශපාලන පක්ෂ විශේෂයෙන් ජනතා විමුක්ති පෙරමුණ, මම ඊයේ දවසෙත් මේක සඳහන් කළා. මම කනගාටු වෙනවා. එතුමන්ලා පෙර පැවැතුණු මැතිවරණ ක්‍රමයට සමානුපාතික මැතිවරණ ක්‍රමයට ගෙනියන්න කටයුතු කරන්නය කියලා ඉල්ලුවයි කියන කාරණාව සඳහන් වුණා. ඒ පිළිබඳව සැබවින්ම කනගාටු වෙනවා. එහෙම මතයක් ඇති වුණා නම්, බොහොම කනගාටුවට කාරණයක්. කෙසේ වෙතත් -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සාමාජිකයෙක් කියලා කියන්න බයක් නැද්ද?

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

කිසිම හයක් නැහැ. දැනට ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෙක්. දැනට බොහොම පැහැදිලිව කියනවා, අදත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සාමාජිකයෙක්. ඒක හැබැයි හෙට දවසේ වෙනස් වෙන්න පුළුවන්. හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා ඒක හෙට දවසේ වෙනස් වෙන්න පුළුවන්. අද වනතුරු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයෙක් කියන කාරණාව බොහොම පැහැදිලිව අපි සඳහන් කරනවා. පළාත් පාලන මැතිවරණය නොතිබීම සම්බන්ධයෙන් බලවත් කනගාටුව ප්‍රකාශ කරනවා.

ඒ වාගේම බස්නාහිර පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අයත් විෂයයන් එක්ක ගත්තාම, විශේෂයෙන් අද අපේ පළාත් සභාව හරහා 2017 දීඅපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රාග්ධන ආයෝජන හැටියට සමස්ත අයවැයේම රුපියල් මිලියන 7112 ක් ප්‍රාග්ධන වියදම හැටියට දරන්න බලාපොරොත්තු වෙනවා. මේ කාරණා සිද්ධ කරන කොට අපි දැක්කා, බොහෝ සෙයින් විවේචන ඉදිරිපත් වුණා. අපේ අමාත්‍යාංශවල මේ වසරේ ප්‍රගතිය අඩුයි කියන කාරණාව සඳහන් වුණා. ඒක සඳහන් නොවුණු ආකාරය සත්‍ය නොවුණත්, යම් ප්‍රමාණයකට ප්‍රගතියේ යම් ගැටලුවක් තිබුණු බව අපි මීට ඉහත දිනකදී අමාත්‍යාංශවල පැවැතුණු සාකච්ඡාවලදී හඳුනාගත්තා. ඒ නිසා විශේෂයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය යොමු කරනවා. එතුමාගේ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභා අවස්ථා දෙකකදී අපි දීර්ඝව සාකච්ඡා කළා. මේ ප්‍රගතිය අඩු වෙනවා නම් අඩු වෙන්න ප්‍රධාන හේතුවක් තමයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ පළාත් සභාවේ ව්‍යාපෘති සම්බන්ධයෙන් නිසි සාකච්ඡාවක් කවදාවක්වත් සිද්ධ නොවීම. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සාකච්ඡා කරන්න අවස්ථාවක් නැහැ වාගේම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් මේ සාකච්ඡාව සිද්ධ වෙන්නේ නැහැ. ඒ නිසා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානයට එය යොමු කරනවා. අපි උපදේශක කාරක සභාවේදී යෝජනා කළා,පළාත් සභා සංවර්ධන සැලැස්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ මාස තුනකට වරක්වත් සාකච්ඡාවක් පවත්වන්නය කියන කාරණාව. එය මීට ඉහත දී අපි යෝජනා කළා. ඒක 2017 වසරේදීවත් ක්‍රියාත්මක කරලා විශේෂයෙන් අපි හඳුනාගත්ත අමාත්‍යාංශවල ප්‍රගතිය සාකච්ඡා කරද්දී, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් අමාත්‍යාංශවල ක්‍රියාත්මක වන ව්‍යාපෘති පිළිබඳව මේ සභාව

නියෝජනය කරන මහජන නියෝජිතයන් දන්නේ නැහැ. අඩු වශයෙන් මාස තුනකට වතාවක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මේ සාකච්ඡාව සිදු වුණා නම්, පළාත් සභාව නියෝජනය කරන මහජන නියෝජිතයන් මේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සම්බන්ධයෙන් අවබෝධයක් තිබෙනවා. ගැටලුවක් තිබෙනවා නම්, ප්‍රගතිය අඩු නම් ඒකට අපේ මහජන නියෝජිතයන්ට මැදිහත් වෙන්න පුළුවන්. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී පළාත් සභා පිළිබඳ වචන දෙක තුනක් කථා කරනවා. කිසිම ප්‍රගතියක් විමසන්නේ නැහැ. ඒ නිසා මේක අපේ ප්‍රගතිය අඩු වෙන්න බරපතළ කාරණාවක්. ඒ නිසා ගරු සභාපතිතුමා මාර්ගයෙන් අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමාට යෝජනා කරනවා. 2017 වසරේවත් මාස තුනකට වතාවක්වත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සම්බන්ධීකරණ රැස්වීමක් පවත්වලා, මේ සියලු නිලධාරීන් එක්ක, සියලු ව්‍යාපෘති එක්ක යම් විමසීමක් කරන්නට පුළුවන් අවස්ථාවක් ඇති කරන්න කියලා.

ඒ වාගේම තමයි අද පළාත් පාලන ආයතන පිළිබඳව යම් යම් චෝදනා තිබෙනවා. පළාත් පාලන ආයතන ප්‍රධානීනුත් ඒ සාකච්ඡාවට ගෙනැල්ලා ඒ තිබෙන ගැටලුත් එතැන විසඳගන්න පුළුවන් ඉඩකඩ ලැබෙනවා. ඒ නිසා මෙය ක්‍රියාත්මක කරන්නය කියන කාරණාව මම මේ වේලාවේ මතක් කරනවා. විශේෂයෙන් පළාත් පාලන ආයතන ගැන සාකච්ඡාකිරීමේදී අපේ යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා සඳහන් කළා, බියගම කොට්ඨාශයේ විවෘත කිරීමකදී ඇති වුණු ප්‍රශ්නය සම්බන්ධයෙන්. මම ඒකේ යම් පැහැදිලි කිරීමක් කරන්නට ඕනෑ. මොකද, ගරු සභාපතිතුමනි, ඔය පුර නැඟුම කියන ව්‍යාපෘතිය අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ යෝජනාවක් අනුව හිටපු ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා පළාත් පාලන අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක කරපු වැඩ පිළිවෙළක්. ඒ හරහා තමයි ඔය මාවරමණ්ඩිය බහු කාර්යය ගොඩනැගිල්ල ඉදි කිරීම සිද්ධ වුණේ. ඒක විවෘත කිරීමේදී ඇත්තටම ඒ මාවරමණ්ඩිය නගරයේ ජීවත්වන පුද්ගලයා තමයි එවකට ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපති ආනන්ද ගනේපොල මැතිතුමා. එතුමාගේ යෝජනාවක් අනුව, එතුමාගේ ඉල්ලීමක් අනුව එතුමාගේ ගමේ හදපු මේ ගොඩනැගිල්ල විවෘත කිරීමේදී එතුමාට කිසිඳු ආරාධනාවක් නැතිව එතුමාගේ නමක් සඳහනක් නැතිව මේ ගොඩනැගිල්ල ඉදි කරන්නට කිසිම ආකාරයකින් සම්බන්ධතාවයක් නැති පුද්ගලයන් මැදිහත් වෙලා කරන්න ගිය නිසා තමයි ඒ ආරවුල සිද්ධ වුණේ කියන කාරණාව මම මේ වේලාවේ මතක් කරන්න කැමැතියි. අපි දෙයක් ඉල්ලා හැදුවා නම් ඒක විවෘත කරන කොට නිකන් හරි සම්බන්ධ වෙන්න අවස්ථාව තිබ්බේ නැත්නම් අපි පෘතග්ජන පුද්ගලයන් හැටියට අපට බලවත් කනගාටුවක් ඇති වෙනවා. අන්න ඒක තමයි ඒ අවස්ථාවේ සිද්ධ වුණේ. ඒකේ සිදු වුණු සියලු සිදුවීම් මම හරියි කියලා කියන්නේ නැහැ. ඒක වෙනම කාරණාවක්. නමුත් මූලිකව සිද්ධ වුණු කාරණාවේ වරද නිසා තමයි එවැනි තත්ත්වයක් ඇති වුණේ කියන කාරණාව මම මේ වේලාවේ මතක් කරන්න කැමැතියි.

ඒ නිසා ගරු සභාපතිතුමනි, විශේෂයෙන් මේ පළාත් පාලන ආයතන ගැන සඳහන් කිරීමේදී මම උදාහරණයක් හැටියට කියන්නම්. බියගම ප්‍රාදේශීය සභාවේ මෑතකදී ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වුණා. දෙල්ගොඩ මහජන ක්‍රීඩාංගණය තාප්පයකින් වට කිරීමක් සම්බන්ධයෙන්. මම මේක දැනගත්තු වෙලාවේ මේ ව්‍යාපෘතිය කරන්නට එපා කියලා කිව්වා. මන්ද, විශේෂයෙන් දෙල්ගොඩ මහජන ක්‍රීඩාංගණය එල්ලේ ක්‍රීඩාව සඳහා යොදා ගන්නා ක්‍රීඩාංගණයක්. එල්ලේ ක්‍රීඩාව සඳහා යොදා ගැනීමේදී ක්‍රීඩාංගණය වටේට තාප්පය ගහලා වට කළාට පස්සේ, ඊට පිට යන පන්දුවක් රැක ගන්න අවස්ථාවක් නැහැ. නමුත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ පාලනයේ තිබුණත් සියල්ල එකින් එක එතුමාට සොයන්න බලන්න බැරි නිසා හිතුවක්කාරී විධියට කාගේ හරි උවමනාවකට අද සම්පූර්ණයෙන් තාප්පය ගහලා. බරපතළ ගැටලුවක්. මම වෙන කාරණා කියන්න යන්නේ නැහැ. සිද්ධ වුණු -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඩීල් එකක්.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ගරු සභාපතිතුමා කියනවා, ඩීල් එකක් කියලා. මම දන්නේ නැහැ, මේ දෙල්ගොඩ මහජන ක්‍රීඩාංගණයට මේ සිද්ධ කරපු කාරණය බරපතළ කාරණාවක්. මේ සම්බන්ධයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය යොමු කරන්න කියන කාරණාව මතක් කරනවා. මොකද, මමත් එල්ලේ ගහපු ක්‍රීඩකයෙක් නිසා. ඒ නිසා ගරු ප්‍රධාන අමාත්‍යතුමාට 2017 වසර හොඳින් ක්‍රියාත්මක කරන්න ශක්තිය, ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනය කරමින් මා නිහඬ වෙනවා. බොහොමත්ම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තුතියි. උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට කාලය නම් බොහොම පොඩ්ඩයි තිබෙන්නේ. ඔබතුමාට විනාඩි 04 යි මට දෙන්න පුළුවන්. විනාඩි 04 න් ඉවර කරන්න. ඕනෙත් නැහැ. කථා කරන්න අවශ්‍ය නැහැ නේ?

[පූ.භා. 10.12]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ඒ විනාඩි 04 කාට හරි දෙන්න. මට එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට කථාවක් දෙන්න ඕනෑ නිසා ගරු මහ ඇමැතිතුමාගේ විනාඩි 40 න් විනාඩි 05 ක් තමයි ඔබතුමාට දුන්නේ. හරි. බොහොම ස්තුතියි. කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 15 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.12]

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂයන් යටතේ කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මම මුලින්ම ඔබතුමාටත්, අපේ පක්ෂයේ කණ්ඩායම් නායකතුමාටත් මගේ ස්තුතිය ප්‍රකාශ කරන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ ශ්‍රී ලංකාවෙන් 5.6 ක භූමි ප්‍රමාණයක ජීවත්වනලක්ෂ 58 කින් යුතු ජනගහනයක්,සමග සංවිධාන වැඩ කටයුතු ක්‍රියාත්මක කරන්න ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අමාත්‍යාංශවල තිබෙන වැය ශීර්ෂයන් යටතේ වැය ශීර්ෂයන් 104, 109, 110, 111 හා 112 යටතේ එතුමා සැලසුම් කරපු කාරණා අපට ලබා දීලා තිබෙනවා, අමාත්‍යාංශ ලේකම්වරුන් සකස් කරපු අයවැය ලේඛනය යටතේ. ගරු සභාපතිතුමනි, ප්‍රධාන ලේකම්තුමා ඉදිරිපත් කිරීමක් අපට දීලා තිබෙනවා. ඒකේ ඉතාමත්ම හොඳ වචනයක් දාලා තිබෙනවා. ඔබ සැම සාදරයෙන් පිළිගනිමු. මේක ඉතාමත් හොඳ වැඩ සටහනක්. හොඳ වැඩ පිළිවෙළක්. අධ්‍යයනය කරලා මේ සභාවට කරුණු කාරණා ගෙනෙන්න, අපට අවශ්‍ය ලේඛන එතුමා සකස් කර දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.

ගරු සභාපතිතුමනි, අපි මේ සංඛ්‍යා ලේඛන අරගෙන බැලුවාම, අපට පෙන්නුම් කරනවා.පළාත් පාලන ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලපවාහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශයේ මෙහෙවර මොකක්ද? කියන එක පැහැදිලිවම අපට ලබා දීලා තිබෙන මේ අයවැය කථාවේ සටහන් කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, එනම් නිපුණතා හා සුහදශීලී මානව සම්පතක් තුළින් ප්‍රශංසාත්මක ජනතා සේවාවක් සැලසීම. මේ වැඩ පිළිවෙළ යටතේ එතුමා ප්‍රධාන කාර්යයන් හැටියට සටහන් කරලා තිබෙනවා, ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීමට වග බලා ගැනීම, අමාත්‍යාංශයට යටත් ව්‍යාපෘතිවලට අදාළ සැලසුම් පිළියෙළ කිරීම සහ ක්‍රියාත්මක කරවීම මේ වාගේ ප්‍රධාන ලේකම්තුමාගේ වැය ශීර්ෂය යටතේ 109, 110, 111 හා 112 යටතේ කරුණු ගණනාවක් සඳහන් කරලා තිබෙනවා. මේකේදී අපි දැක්ක එක කාරණයක් තමයි පළාත් සභා සහ පරිපාලනය පිළිබඳව ව්‍යාපෘති අරමුණු ගැන ප්‍රධාන අමාත්‍යවරයාට පැවරී ඇති කාර්යයන් හරහා අමාත්‍යාංශය ක්‍රියාත්මක කරවීම තුළින් පළාත තුළ වෙසෙන මහජනතාවට උපරිම සේවයක් සලසා දීම. අනික් පැත්තෙන් අරගෙන බැලුවාම, ප්‍රධාන කාර්යයන් හැටියට ප්‍රතිපත්ති සකස් කිරීම, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරවීමට අදාළ අධීක්ෂණ කටයුතු.

ගරු සභාපතිතුමනි, මේ කරුණු කාරණා අරගෙන බැලුවාම අපි සතුටින් ප්‍රකාශ කරන්න ඕනෑ. මේ අමාත්‍යාංශය යටතේ කථා කරපු අපේ මහජන නියෝජිතයින් තමන්ට පැවරී ඇති වගකීම පිළිබඳව තේරුම් අරගෙන කථා කළා නම්, අර ඔබතුමා කිව්වා වාගේ මේ කාලය වෙන් කිරීම පිළිබඳව ගැටලු - එක අමාත්‍යාංශයක උපදේශක කාරක සභාව සඳහා මන්ත්‍රීවරු 20 ක් ලබා දී තිබෙනවා. ඒ 20 ලබා දී තිබෙන ආකාරයට, මේ කාල වෙන් කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට ගරු සභාපතිතුමනි, සභා කටයුතු පිළිබඳ කාරක සභාවේ ප්‍රධානියා හැටියට ඔබතුමාට හැකියාව තිබෙනවා. මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඊළඟ අයවැය සකස් කරන අවස්ථාවේදීවත් ඒ උපදේශක කාරක සභාවේ සිටින සියලු ගරු මන්ත්‍රීවරුන්ගේ මේ විෂයය අංකයන් යටතේ වෙන් කරලා තිබෙන වෙලාවන් අධීක්ෂණය කරලා ඒ අයට

කාලය වෙන් කිරීම, දවස් වෙන් කිරීම කරගන්න කටයුතු කළොත් හොඳයි කියන එක.

ගරු සභාපතිතුමනි, අපි දැක්කා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂයන් යටතේ සකස් කරලා තිබෙන ප්‍රධාන කාරණයක් තමයි දෙවැනි වැඩ කටයුත්ත සඳහා, ප්‍රධාන ලේකම් කාර්යාලයේ කාර්යභාරය තුළ වාර්ෂික අයවැය පිළියෙල කිරීම සහ මූල්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීම, ගිණුම් පරිපාටි හඳුන්වාදීම සහ පළාත් භාණ්ඩාගාරය ලෙස කටයුතු කිරීම. අනික් එක, මම දකින තවත් දෙයක් තමයි, පළාත් සභා කාර්ය මණ්ඩල පුහුණු කිරීම සහ වැඩ සටහන් මෙහෙය වීම. ගරු සභාපතිතුමනි, මෙන්න මේ කරුණු කාරණා දිහා අරගෙන කථා කරන කොට අපි දකිනවා, ව්‍යාපෘතිවල අරමුණ පැහැදිලි කරලා තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය ප්‍රකාරව මෙම පළාත් සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරවීම, කළමනාකරණ උපාය මාර්ග සැලසුම් කටයුතු පසු විපරම් සිදු කිරීම කියලා ප්‍රධාන කාර්යයන් හැටියට තවත් කරුණු කාරණා ගණනාවක් මෙහි සඳහන් කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන දේවල් අපි උපයෝගී කරගෙන ක්‍රියාත්මක කරනවාද කියන එක පිළිබඳව කථා කළොත් එහෙම, මට පැහැදිලිවම කියන්න වෙනවා. මම එදා මූලික කථාව කරපු අවස්ථාවේදී මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, මධ්‍යම ආණ්ඩුවෙන් කපා හරින ලද මුදල් ප්‍රතිපාදන ගැන. ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමාට මේ වේලාවේ මම මතක් කර දෙන්න අවශ්‍යයි. අපි 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තමයි මේ ආයතනය පිහිටුවලා තිබෙන්නේ. මේ ආයතනය අනුන්ගෙන් සල්ලි ඉල්ලගෙන, අනුන්ගෙන් ලැබෙන දේවල් බලාපොරොත්තුවෙන් වැඩ කටයුතු කරනවා නම්, මේ පළාත් සභාව අපට කවදාවක්වත් ගෙනියන්න පුළුවන්කමක් ඇති වෙන්නේ නැහැ. මේ පළාත් සභාවල්වලට බලය ලබා දීලා, බෙදා දීලා තිබෙන ක්‍රමය තුළ එදා එක්සත් ජාතික පක්ෂයෙන් මේ පළාත් සභාවල් හදන කොට වැරැද්දක් කළා. ඒ වැරැද්ද තමයි, ඒ පළාත් සභාවේ හිටපු ජාතික ආණ්ඩුවේ ඇමැතිවරු ඊට කැමැති වුණේ නැහැ.බලය බෙදලා දීලා පල්ලෙහා ඉන්න ඇමැතිවරුන් ඒ කාර්ය භාරය ක්‍රියාත්මක කරන කොට, එක අවස්ථාවක සමගාමී ලැයිස්තුව දාලා,13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තිබෙන දේවල් අර ගත්තා. ඊට පස්සේ තවත් එකක් තමයි, 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අපට ලැබෙන මූල්‍ය ප්‍රතිපාදන BTT, අපට ලැබුණු දේ පසුගිය මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩු පාලනය යටතේ ඒක බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ ආර්ථික ප්‍රතිපත්තියකට අරගෙන අපේ තිබුණු ආදායම මධ්‍යම ආණ්ඩුවට ගත්තා.

එහෙමනම් මේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අද මම සතුටු වෙනවා. මේ ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂයන් යටතේ ප්‍රධාන කාර්යයන් හැටියට, අපි ආදායම එකතු කරන ක්‍රමවේදය, මේකේ අංක දාලා සටහන් කරලා තිබෙනවා. එහෙමනම් එතුමන්ලා පෙන්වනවා, අලුත් ආදායම් මාර්ග උපයා ගන්නා ක්‍රමවේද. නිශ්චල දේපළ පැවරීමේදී ගෙවිය යුතු මුද්දර බදු අය කර ගැනීම සඳහා මුදල් ප්‍රඥප්තියේ 62 වගන්තියේ විධිවිධාන පරිදි දේපොළ විකිණීම පිළිබඳව තක්සේරුව මත ප්‍රකාශ ලබා දීම. මේක එක ආදායම් මාර්ගයක්. දෙක, අඩු වටිනාකමකින් ප්‍රකාශ කර ඇති ඔප්පුවල දේපළ නැවත තක්සේරු කර අතිරේක මුද්දර ගාස්තු අය කර ගැනීම. තුන, උසාවි ලේඛන මත අයවිය යුතු මුද්දර ගාස්තු රැස් කර ගැනීම. හතර, තෑගි තරග බදු අය කර ගැනීම. පහ, පළාත තුළ ඇති ඛනිජ ද්‍රව්‍ය වලින් බදු අය කර ගැනීම. හිඟ පිරිවැටුම් බදු අය කර ගැනීම. වාර්ෂික බලපත්‍ර ගාස්තු ආදායම් රැස් කර ගැනීම, උසාවි දඩ මුදල් සකස් කර ගැනීම. බස්නාහිර පළාත තුළ පිහිටි ව්‍යාපාර සඳහා වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීමේදී ගාස්තු අය කර ගැනීම. ආයතන නියාමනය කිරීම පිළිබඳව කරුණු කාරණා තිබෙනවා.

එහෙමනම් ගරු සභාපතිතුමනි, මේ විවාදයට සම්බන්ධ වුණු ගරු මන්ත්‍රීතුමන්ලා චෝදනා අවලාද නැඟුවේ මොකක් නිසාද? මේ චෝදනා අවලාද නගන්නේ අද ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ රටේ ඇති කරලා තිබෙන අලුත් දේශපාලන වාතාවරණය තුළ මේ අයට තේරුම් ගන්න බැරි ක්‍රමවේද නිසයි. තේරුම් ගත්ත අය එක විධියකට කථා පවත්වනවා. නොතේරෙන අය පටලවලා, ගොතලා නොයෙකුත් දේවල් ප්‍රකාශ කරලා මේ සභාවේ කථා පවත්වන්න පටන් ගන්නවා. එහෙමනම් මේ අපේ අමාත්‍යාංශවල ඉන්න ලේකම්තුමන්ලාට, නිලධාරීන්ට මම ස්තුතිවන්ත වෙන්න ඕනෑ. අපි අයාලේ, අනුන්ගේ කකුල් අරගෙන ඇවිදපු මිනිස්සු හැටියට අපි අපේ කකුල් දෙක ශක්තිමත් කරලා ආදායම් මාර්ග වැඩි කරගන්න කරුණු කාරණා එකතු කරන්න ඕනෑ. ඒ සඳහා 2017 අයවැය ඉදිරිපත් කරන අවස්ථාවේදී, අපේ ආදායම වැඩි කර ගන්නේ කොයි ආකාරයෙන් ද කියන එක අපේ පළාත්

[ගරු කිත්සිරි කහටපිටිය]

ආදායම් ප්‍රඥප්තිය යටතේ ඒ නිලධාරී මහත්වරු පෙන්නලා තිබෙනවා. අපි කොහොමද ආදායම එකතු කරගෙන වැඩ කටයුතු කරන්නේ කියලා.

ගරු සභාපතිතුමනි, ඊළඟට මම 110 වැය ශීර්ෂය යටතේ ඇති ඉංජිනේරු කාර්යංශය ගැන කථා කරන්න කැමැතියි. ගරු සභාපතිතුමනි, මෙන්න මේක මේ සභාවේ මන්ත්‍රීවරුන් ඉතාමත් උවමනාවෙන් කළ යුතු දෙයක්. මේ ඉංජිනේරු කාර්යංශයේ එතුමන්ලා 110 යටතේ ප්‍රධාන කාර්යයන් සඳහන් කරලා තිබෙනවා. බස්නාහිර පළාත් සභාවට අයත් ගොඩනැගිලි නිර්මාණය කිරීම, ඉදි කිරීම, වැඩි දියුණු කිරීම සහ නඩත්තු කිරීම. ඒක එක හැටියට සඳහන් කරනවා. දෙක හැටියට එතුමන්ලා පෙන්වනවා, බස්නාහිර පළාත් සභාවට ආයතන සඳහා වාස්තු විද්‍යාත්මක සහ ඉංජිනේරු උපදේශක සේවාව සැපයීම. ගරු සභාපතිතුමනි, මම දැක්කේ නැහැ මේ සභාවේ අපේ මන්ත්‍රීවරුන්ගේ මේ ඉංජිනේරු කාර්යංශය පිළිබඳව කරුණු කාරණා ඉදිරිපත් කරනවා. මම මේ කරුණු කාරණා ඉදිරිපත් කරන්නේ එතුමන්ලා ඔබතුමාට ලබා දීලා තිබෙන දත්ත සංඛ්‍යා ලේඛන එකතු කරගෙනයි. ඒ එකතු කරගත්තු කරුණු කාරණාවලින් සොයා ගත්තු පුංචිකරුණු ටිකක් විතරක්, කාලය උපයෝගී කරගෙන මම ඔබතුමා ඉදිරිපත් කරන්න කැමැතියි.

ගොඩනැගිලි, මාර්ග සහ සුළු වාරිමාර්ග කටයුතු සඳහා ඉදි කිරීම් ඇස්තමේන්තු සකස් කිරීමට පාදක කර ගන්නා මිල ගණන් අලුත් ගාස්තු ලේඛන පිළියෙල කිරීම. ගරු සභාපතිතුමනි, මේ ගරු මන්ත්‍රීවරුන් දැන ගතයුතු කාර්යයක් මේක. මේ ගරු මන්ත්‍රීවරුන් 104 දෙනා ලක්ෂ 58 ක් ජනතාව නියෝජනය කරන ජනතා නියෝජිතයෝ. මේක ඇතුළේ අපට ප්‍රශ්න නැහැ. ජේ.වී.පී. ද, ශ්‍රී ලංකාද, යු.ඇන්.පී ද, දෙමළ පක්ෂද, සිංහල පක්ෂද කියලා අපට ඒවා අවශ්‍ය වෙන්නේ නැහැ. මෙන්න මේ වචනයට, මේ කාර්ය භාරයට තිබෙන්නේ, මේ ගොඩනැගිලි පිළිබඳව ඉංජිනේරු කාර්යාංශයට තිබෙන පසුබෑම. මේ පසුබෑමට හේතුව මන්ත්‍රීවරුන් දකින්නේ නිලධාරීන්ගේ වැරැද්දක් හැටියට. ගරු සභාපතිතුමනි, මම දේශපාලඥයෙක් හැටියට දකින්නේ මෙය නිලධාරීන්ගේ වැරැද්දක් හැටියට නොවෙයි. මේක දේශපාලඥයින්ගේ වැරැද්ද. මේ දේශපාලඥයින් හිතනවා, අපට ජනතාව දීපු බලයත් එක්ක නිලධාරින්ව පාගෙන, යට කරගෙන, බැණගෙන වැඩ කටයුතු කරන්න පුළුවන් කියලා. අපි ඒක අගමැතිතුමාගෙන් ඉගෙන ගත්ත කාර්යයක්. අගමැතිතුමා අපට හැමදාම උපදෙස් දීලා තිබෙන්නේ, ප්‍රශ්නය විසඳනවා මිසක් මිනිහා මරන්න යන්න එපා කියලා. මේ ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා ඉංජිනේරු කාර්යංශයේ තිබෙන අඩුපාඩු ගැන අපි කථා කළොත් එහෙම අපි දන්නවා, අපි මුදල් කොපමණ උපයෝගී කරලා යොදවලා දැම්මත්, TO ලා නැත්නම් මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නේ කොහොමද? මෙතැන ගරු අධ්‍යාපන අමාත්‍යතුමා ඉන්නවා. ගරු අධ්‍යාපන අමාත්‍යතුමාට විශාල මුදල් ප්‍රතිපාදනයක් මේ මාස 12 ට මධ්‍යම ආණ්ඩුවෙන් ආවා. ආවාම මේ ටික කරගන්න බැරි වුණේ ඇයි? මේක ඇමැතිවරයාගේ වැරැද්දවත්, නිලධාරියාගේ වැරැද්ද නොවෙයි. ජාතික ආණ්ඩුවෙන් කරපු අපරාධයක්. ජාතික ආණ්ඩුව මේ මූල්‍ය ප්‍රතිපාදනය ලබා දෙන්න වැඩ කටයුතු කරන්නේ කවදාද? මාස 12 ක් තිබෙන අවුරුද්දේ මාස 06 ක් ගියාට පස්සේ. මේ මාස 06 ක් ගියාට පස්සේ ආපු මූල්‍ය ප්‍රතිපාදනය ජනතා සේවයට යොදවන්න යන කොට ඒ ඉංජිනේරු කාර්යංශයේ තිබෙන අඩුපාඩුව උඩ අපට ක්‍රියාත්මක කරගන්න බැහැ ගරු මහ ඇමැතිතුමනි. එහෙමනම් ඔබතුමා විශේෂ අවධානය යොමු කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, 2013 චක්‍රලේඛය මත ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයට මම කථා කරලා බැලුවා, ඉදි කිරීම් ක්ෂේත්‍රය පිළිබඳව. මම මීට කලිනුත් ලේකම්තුමාට කථා කළා. ගරු ඇමැතිතුමාඒ චක්‍රලේඛය ගෙනත් දුන්නා. ඒක මධ්‍යම ආණ්ඩුවෙන් නිකුත් කරලා තිබෙන චක්‍රලේඛයක්. මොකක්ද? ග්‍රාමීය මට්ටමේ වැඩ පිළිවෙළවල් ඉදි කිරීම් සඳහා මිලියන 02 ක මුදලක් තමයි ඒ සංවිධානවලට බලය දීලා තිබෙන්නේ. ඊට පසුව මධ්‍යම ආණ්ඩුව මිලියන 05 දක්වා මෙය වෙනස් කළා. නමුත් අපි දැනගෙන හිටියේ නැහැ. ඒ ඇති වුණු මූල්‍ය ආර්ථික අර්බුදයක් නිසා නොවෙයි. ඒ යොදවපු මුදල් ටික ක්‍රියාත්මක කරවා ගන්න බැරි දැනුම අපි ළඟ තිබුණේ නැති නිසා, ඒ වැඩ පිළිවෙළ අපට ක්‍රියාත්මක කරගන්න බැරි වුණා. අනික් පැත්තෙන් ඉංජිනේරු වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන කොට මිල ගණන් පිළිබඳව අපි කථා කරනවා. ඒ මිනිස් ශ්‍රමයට, බාසුන්නැහැ කෙනෙකුට ගෙවන මිල ගණන් අපි තවම - ඔබතුමාගේ කෘෂිකර්ම අමාත්‍යාංශය සම්බන්ධයෙන් ඔබතුමා සොයා බලන්න. ඒකේ ඇස්තමේන්තු එනවා 2013 වර්ෂයේ ලබා දීලා තිබෙන මුදල් ප්‍රතිපාදන යටතේ තමයි ඒ දෙන්න ඕනෑ කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, කරුණු කාරණා ගණනාවක් සාකච්ඡා කරන්න තිබුණත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම දන්නවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අපේ අඩුපාඩුව නිසා අපට මේකට අවස්ථාව ලැබුණේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඒකත් කියන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔබතුමාට මම ආපසු කියනවා, මීට පස්සේ අයවැය හදන කොට අපට මාස තුනක් වුණත් කල් ගන්න පුළුවන්. සභා කටයුතු කාරක සභාව රැස් වුණා. මන්ත්‍රීවරුන්ට මේක කරන්න ඕනෑය කියලා. හරියට බලලා වැඩ කටයුතු කරන්නය කියන එක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, අපි කථික ලැයිස්තුව හදන කොට -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මතක් කරමින් මගේ අදහස් ගොඩක් තිබුණත් මට කියා ගන්න බැහැ. උපදේශක කාරක සභාවේදී හරි කියලා මේක නිවැරදි කරනවා. එහෙමනම් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට, ගරු සභාපතිතුමාට, ඒ වාගේම සියලුම නිලධාරීන්ට මගේ ස්තුතිය, ප්‍රණාමය පුද කරනවා. ගරු අගමැතිතුමා අපිව ගෙන්නලා කරුණු කාරණා පෙන්වා දීලා කිව්වා, බෙදීමකින් තොරව සියලුම අමාත්‍යාංශවල වැය ශීර්ෂයන්වලට පසුව ඡන්දය භාවිතා කරන්න අපේ පක්ෂයෙන් තීරණයක් අරගෙන තිබෙනවා. රටේ ජනතාව වෙනුවෙන් ඔබතුමන්ලාට සහයෝගය දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බොහොම ස්තුතියි. ඉසුර දේවප්‍රිය - ගරු ප්‍රධාන අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 30 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.28]

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ ප්‍රධාන අමාත්‍යාංශයීය වැය ශීර්ෂය යටතේ අපේ ගරු මන්ත්‍රීවරු තමන්ගේ අදහස් ප්‍රකාශ කළා. ඇත්තටම කියන්න ඕනෑ, පටු පරමාර්ථවලින් තොරව, හුදු විවේචනවලින් තොරව පළාතේ යහපත වෙනුවෙන් යම් කෙනෙක් යම් ඉදිරිපත් කිරීමක් කළා නම් ඒක මේ පළාත තුළ, මේ මහ පොළවේ යථාර්ථයක් කරන්න මම කවදාවක්වත් පසුබට වන්නේ නැහැයි කියන එක මේ සභාවට ප්‍රකාශ කරන්න කැමැතියි. විශේෂයෙන්ම අපගේ පළාත් සභා ඉතිහාසය තුළ අප දැකපු අත්දැකීම තමයි, අයවැය කේන්ද්‍ර කරගෙන, පාදක කරගෙන කොළඹින් බැහැරව අපි සංචාරයක යෙදුණා. එහිදී අපි අයවැය පිළිබඳව විවිධ සාකච්ඡා පැවැත් වූවා. එසේ පැවැත් වූ සාකච්ඡා අතර ගරු පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ අරමුණ සාක්ෂාත් කරන්න පුළුවන් වුණේ, අප මේ 2017 වර්ෂයට ඉදිරිපත් කරන අයවැය ලේඛනය සම්බන්ධවයි කියන එක අපි කියන්න ඕනෑ. ඒ අනුව මෙතෙක් මේ පළාත් සභාව ඒ රාජකාරී කරපු මන්ත්‍රීවරුන්ගේ අදහස්වලට අනුව ප්‍රධාන ලේකම්තුමා ප්‍රමුඛ නිලධාරීන්ගේ එකඟතාවය පළ වුණු ප්‍රථම අවස්ථාව හැටියටත්, ත්‍රිකුණාමලයේ අපේ සම්මන්ත්‍රණය අපට මේ අවස්ථාවේදී මතක් කරන්න පුළුවන්. ඒ අනුව 2016 වර්ෂයේදී විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී වුණු අඩුපාඩුකම් අපට 2017 වර්ෂයේදී එසේ නොවන සේ කටයුතු කරන්න අවශ්‍ය පසුබිමක් අපි ඒ තුළ සකස් කරලා එකඟතාවයට ඇවිල්ලා, මෙවර අයවැය ලේඛනයට එය ඇතුළත් කරලා මන්ත්‍රීවරුන්ට අවශ්‍ය වන විධියට තමන්ගේ පළාතේ ජනතාවගේ සේවය ලබා දීමට අවශ්‍ය පසුබිමක් මේ අයවැය ලේඛනයෙන් අපි ලබා දුන්නාය කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර පෞද්ගලික ප්‍රකාශවල යෙදෙන්න එපා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා කථා කරන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

විශේෂයෙන්ම මම හිතන්නේ දේශපාලන ඉතිහාසයේ සුවිශේෂ වැදගත්කමක් තිබෙනවා. මොකද, පළාත් පාලන ආයතන මම පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා ලෙස පත් වන කොට විශාල ප්‍රමාණයක් අත්හිටුවලා තිබුණා. කාලය ඉකුත් වෙලා තිබුණා. ඒ වාගේම පළාත් පාලන ආයතන කිහිපයක් ක්‍රියාත්මක වෙලා තිබුණා. ඒ අනුව අපේ රටේ සහ අපේ පළාතේ සියලුම පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයන්ගේ සහභාගීත්වයක් නැහැ. හැබැයි, ගරු සභාපතිතුමනි, මම හිතන්නේ මේ සභාව නියෝජනය කරපු සුසිල් මුණසිංහ මහ ඇමැතිතුමාගේ සිට ප්‍රසන්න රණතුංග මහ ඇමැතිතුමා දක්වා වූ ප්‍රධාන අමාත්‍යවරු ගත්තොත් මම හිතන්නේ, ඒ මහ ඇමැතිවරුන් අතර පළාත් පාලන ආයතනයක සභාපති ධූරයක් දරපු එකම මහ ඇමැතිවරයා මම. මම හිතන්නේ පළාත් පාලන ආයතන විසුරුවලා තිබෙන වෙලාවකඑය වාසනාවක් වුණා. මොකද, කවුරු මොනවා විවේචනය කළත් ගරු සභාපතිතුමනි, මේ පළාත් සභාවේ මන්ත්‍රී කෙනෙක් හරි, එහෙම නැත්නම් මගේ පළාතේ කිසියම් බදු ගෙවන්නෙක් හරි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මහ ඇමැතිතුමා සමාවෙන්න. සුසිල් ප්‍රේමජයන්ත ප්‍රධාන ඇමැතිතුමා සභාපතිවරයෙක් වශයෙන් සිටියේ නැද්ද?

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නැහැ. එතුමා කෝට්ටේ නගර සභාවේ උප නගරාධිපති. එතකොට මම මහරගම සභාපති.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

කවුරු මොන විවේචනය කළත් මේ පළාතේ බදු ගෙවන ජනතාවට දෙන්න පුළුවන් උපරිම සහනයක් අපි ලබා දීලා තිබෙනවා. මහජන නියෝජිතයන්ගේ සහභාගීත්වය නොමැති වීම මම අගය කරන්නේ නැහැ. මොකද, මමත් පළාත් පාලන ආයතනයෙන් බිහි වුණු දේශපාලඥයෙක්. හැබැයි, අපට තිබෙන අත්දැකීම තමයි පසුගිය දවස්වල පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයන් ඉන්න කොට විවිධ චෝදනා තිබුණා. හිටපු ජනාධිපතිතුමාගේ පරාජයටත් පළාත් පාලන ආයතනවල ඇතැම් ක්‍රියාකාරකම් හේතු වුණාය කියන එක මම දකිනවා.

ඒ නිසා ගරු සභාපතිතුමනි, හැබැයි මම ඊට වඩා සාධාරණත්වයක් පළාතේ ජනතාවට ඉෂ්ට කරලා තිබෙනවා. අද මේ පළාත් සභාවේ ඇතැම් මන්ත්‍රීවරු කිව්වාට, මට යම් පළාත් පාලන ආයතනයක් ගැන යමක් කිව්වොත්, මම ඒකට මැදිහත් වෙලා ඒ සම්බන්ධව ක්‍රියා කරලා තිබෙනවා. අද මම හිතන්නේ, සමහර වේලාවට මහජන නියෝජිතයන් ඉන්න කොට අනුමත කරගන්න බැරි සැලසුම් අපි දවසින් දෙකෙන් අනුමත කර දීලා තිබෙනවා. හැබැයි අපි දන්නවා, සමහර සැලසුම් - දැන් ඊයේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා අනුබෙදුමක් ගැන මේ සභාවට ඉදිරිපත් කළා. ඒ කාලයේ අනුබෙදුමක් අනුමත කරගන්න ගියොත් එහෙම, ඒ සංවර්ධනකරුට වෙන දේ අපි දන්නවා. මම නගර සභාවේ ඉන්න කාලයේ කවදාවක්වත් මගේ ලාච්චුවේ කිසිම සැලසුමක් දාගෙන හිටියේ නැහැ. ඉඩම් කට්ටි හතර පහ තිබෙන කිසිම සැලසුමක්. දැනට වුණත් ගිහිල්ලා අහන්න පුළුවන්. සමහර වෙලාවට ඒ කාලයේ පුරුද්දක් තිබුණා, කාගේ හරි සැලසුමක් ප්‍රමාද වෙනවා නම්, අපේ පියන්ලා ඒ රස්තියාදු වෙන කෙනාට කියනවා, ඕකට තමුන්නාන්සේ රස්තියාදු වෙන්න එපා. සභාපතිතුමාට ගිහින් කියන්න. සභාපතිතුමා දැන් ඒක අනුමත කරලා දෙයි කියලා. අපි එහෙමයි කළේ. එහෙම හිටපු සභාපති කෙනෙක් තමයි අද පත් වෙලා තිබෙන්නේ. අද සංවර්ධනකරුවන් සතුටු වෙනවා. මොකද, ඒ අය සැලසුමක් දැම්මාම ඒක ඉක්මණින් අනුමත කරලා අපි දීලා තිබෙනවා. අර අත්තනගල්ලේ ඉඩම පර්චස් 08 ට කැඩුවේ අපි නොවෙයි. ඒක කඩලා අනුමත කරලා තිබුණේ, හිටපු ප්‍රාදේශීය සභා පාලනය. අපි කැඩුවේ නැහැ. අපි තමයි ඒක පර්චස් 12 ½ ක් කරලා දුන්නේ. ඒ කාරණාව අපේ පෙත්සම් කාරක සභාවටත් ඇවිල්ලා තිබුණා.

අපි තමයි ඒ අනවසරයෙන් සංවර්ධනය කරන්න ගිය එක නැවැත්තුවේ. මම ප්‍රධාන ඇමැතිවරයා ලෙස පත් වුණාට පස්සේ. ඒ සම්බන්ධයෙන් අපි මැදිහත් වෙලා තිබෙනවා. අපි සංවර්ධනකරුත් ආරක්ෂා කරලා, පළාත් පාලන බල ප්‍රදේශයේ ඉන්න බදු ගෙවන අයත් ආරක්ෂා කරලා තමයි සැලසුම් අනුමත කරන්නේ. සැලසුම් අනුමත කරන එකේ බලය මට ගන්න කියලා කිව්වේ, කවුරුත් නොවෙයි. ගිය අයවැය විවාදයේදී නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා ඇතුළු ගරු මන්ත්‍රීවරු කිව්වා, සැලසුම් අනුමත කිරීමේ අවසන් බලධාරියා ප්‍රධාන ඇමැතිවරයා වෙන්නය කියලා. මේ සභාව තීන්දු කළේ. හැබැයි, මම පෙරෙයිදා පළාත් පාලන ආයතන ප්‍රධානීන් වන ලේකම්වරුන් සහ කොමසාරිස්වරුන් ගෙනැල්ලා උපදෙස් දුන්නා. ජනවාරි 01 වැනිදා සිට යම් පළාත් පාලන ආයතනයක් කිසියම් ව්‍යාපෘතියක් කරනවා නම් ඒ ව්‍යාපෘතියේ අනුමැතිය මට ඉදිරිපත් කරලා මගෙන් අනුමැතිය ලැබුණාට පස්සේ ක්‍රියාත්මක කරන්නය කියලා. ගරු සභාපතිතුමනි, පුදුම ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ? දැන් මේ රජයේ ඇතැම් ඇමැතිවරු මේ පළාත් පාලන ආයතනවල බලතල ක්‍රියාත්මක කරන්න ඇවිල්ලා. අපේසමහර ලේකම්වරුන්ව භය කරගෙන. සංවර්ධන කමිටුවලට ගිහිල්ලායි මේ නගර සභාවේ ව්‍යාපෘති අනුමත කරන්නේ. කොහෙන් බලයක්ද? පළාත් පාලන ආයතන පාලනය කරන්න පුළුවන් වන්නේ පළාතේ ප්‍රධාන ඇමැතිවරයාට විතරයි. හැබැයි, ඒකත් 100% ක් කරන්න පුළුවන් වන්නේ මහජන නියෝජිතයන් නොමැති වීම පමණයි. නැත්නම් අපට තිබෙන්නේ, අධීක්ෂණය කිරීම පමණයි. පළාත් පාලන ආයතනයේ සභාපතිතුමා නැති නිසා සභාපතිතුමාගේ බලතල තමයි පළාත් පාලන ඇමැතිවරයාට පැවරිලා තිබෙන්නේ. ඇතැම් ඇමැතිවරු ඒවා පාලනය කරන්න යනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගම්පහ දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේදී ඔය තත්ත්වය ඇති වුණා නේ? ඔබතුමා කථා කළේ නැහැ. මම ඒ ගැන කථා කළා. හිටපු ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය පවා එතැන හසුරුවන්න පටන් ගත්තා, LRC ඉඩම් සම්බන්ධව පවා.

[සභාවේ සෝෂා]

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. ගරු ඇමැතිතුමා උත්තර දෙයි. අනික් අය කථා කරන්න අවශ්‍ය නැහැ. එතුමා දැන් කථා කරනවා නේ?ගරු මහ ඇමැතිතුමා ඒවාට පිළිතුරු දෙයි.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, වර්තමාන රජයේ ප්‍රතිපත්තියට අනුව හිටපු ජනාධිපතිතුමියට අත්තනගල්ල සම්බන්ධීකරණ කමිටුවටත්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවටත් සහභාගි වෙන්න අයිතියක් තිබෙනවා. ඒක ගැන ගැටලුවක් නැහැ. හැබැයි, එදා මම ඒ රැස්වීමේ හිටියා. හැබැයි ඒ රැස්වීමේදී අපි දැකපු දේ තමයි - මම කියන කාරණාව තමයි මේ වෙන්නේ.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

LRC ඉඩම් සම්බන්ධව ඔබතුමන්ලා ඔය මතය නොවෙයි නේ දෙන්නේ.ජනාධිපතිතුමිය -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මම දැකපු දේ තමයි හිටපු ඇමැතිවරු -

[සභාවේ සෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් නිශ්ශබ්ද වන්න කෝ. ගරු මහ ඇමැතිතුමාට කථා කරන්න දෙන්න කෝ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මම කියන්නේ සමහර අය සම්බන්ධීකරණ කමිටුවලට ඇවිල්ලා, ඒ අය ඒ අයගේ බලතල ගැන දන්නේ නැතුව කටයුතු කිරීමේ ගැටලුවක් තිබෙනවා. අද මීට වඩා කාරණාවක් තිබෙනවා. පොඩ්ඩක් නිහඬ වෙන්න කෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වන්න කෝ. මෙතුමාට අවස්ථාව දෙන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒ නිසා මම පැහැදිලිව පළාත් පාලන කොමසාරිස්තුමිය, ප්‍රධාන ලේකම්තුමා ඇතුළු සියලු දෙනා ඉන්න රැස්වීමකදී සියලුම පළාත් පාලන ආයතනවල ප්‍රධානීන්ට උපදෙස් දුන්නා, ජනවාරි 01 වැනිදාට පසුව සියලුම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්නේ මගෙන් අනුමැතිය ලබා ගැනීමෙන් පසුව කියලා. ඒ වාගේම අද මේ මෙගා පොලිස් එක, බස්නාහිර පළාත් සංවර්ධන අමාත්‍යාංශයේ UDA එක අද බරපතළ ලෙස පළාත් පාලන ආයතනවල තිබෙන බලතල උදුරා ගැනීමකට ලැහැස්ති වෙනවා. නාගරික සංවර්ධන අධිකාරියේ වර්තමාන සභාපතිතුමා, එතුමාට එතුමාගේ වෘත්තීය ජීවිතයේදී ගන්න බැරි වුණු දේ අද නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා හැටියට පත් වෙලා ගන්න අද ලොකු උත්සාහයක් අරගෙන තිබෙනවා. ගරු සභාපතිතුමනි, මේ වන කොට අපට ආරංචි වෙනවා, පර්චස් 40 කට වැඩි සැලසුම් අනුමත කිරීමේ බලය නාගරික සංවර්ධන අධිකාරිය ලබා ගන්න යනවා කියලා. මේක බරපතළ ලෙස පළාත් පාලන ආයතනවලට කරන පහරදීමක්. පළාත් පාලන ආයතනවල තිබෙන අයිතියක් උදුරා ගැනීමක්.

ගරු සභාපතිතුමනි, නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමාගේ තිබෙන බලය තමයි පළාත් පාලන ආයතනවලට විමධ්‍යගත කරලා තිබෙන්නේ. හැබැයි, අපි නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමාට කියනවා. පර්චස් 40 නොවෙයි, තමුන්නාන්සේට ඕනෑ නම් පර්චස් 06 එකත් ගන්න. අපට මොකටද? හැබැයි, පළාත් පාලන ආයතනවලට තිබෙන අයිතිය උදුරා ගන්න එපාය කියන පණිවුඩය අපි මේ අයවැය අවස්ථාවේදී නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමාට කියන්න කැමැතියි. ඒ වාගේම පළාත් පාලන ආයතන ගැන කථා කරන කොට අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කිව්වා, සියලුම පළාත් පාලන ආයතනවලට කම්පැක්ටර් ලොරි ලබා දෙන්න ඕනෑය කියලා. මම හිතනවා ඒක හොඳයි. හිටපු ගරු මහ ඇමැතිතුමා අපේ මුද්දර ගාස්තු ආදායමෙන් වැඩ පිළිවෙළක් හදලා කැබ් රථ අරන් දුන්නා අපට මතකයි. අද පළාත් පාලන ආයතනවලට ලොකුම ගැටලුවක් තමයි, ට්‍රැක්ටර් එළවන්න රියැදුරන් නැහැ. සාමාන්‍ය පෙළ හයයි දෙකක් තිබෙන අය ට්‍රැක්ටර් එළවන්න එන්නේ නැහැ. ඒ නිසා කම්පැක්ටර් එකක් ගත්තොත් ට්‍රැක්ටර් තුන හතරක ලෝඩ් එකක් පරිසර හිතකාමී විධියට අදින්න පුළුවන්. ඒ නිසා මම යෝජනා කරනවා, අපි පළාත් සභාව මැදිහත් වෙලා අපේ තිබෙන සෑම පළාත් පාලන ආයතනයකටම කම්පැක්ටර් ලොරි ලබා දෙන්න ඕනෑය කියලා.

ඒ වාගේම තමයි අද මේ වීදි ලාම්පු ගැන කථා කළා. මම හිතන්නේ මීට වඩා අලුත් තාක්ෂණයත් එක්ක ලෝකයේ දියුණු රටවල්වල පාවිච්චි කරන පරිසර හිතකාමී, විදුලිය ආරක්ෂා වන නව වීදි ලාම්පු පද්ධති අපේ පළාත් පාලන ආයතන බලප්‍රදේශවල තිබෙන නාගරික ප්‍රදේශවල සවි කරන්න ඕනෑය කියලා මම විශ්වාස කරනවා. ඒ වාගේම පළාත් පාලන ආයතන ගත්තොත් ඕනෑම පළාත් පාලන ආයතනයකට චෝදනා එල්ල කරන්න පුළුවන්. ඒක සාමාන්‍යයෙන් සාධාරණයි. මන්ත්‍රීවරු හිටියත්, සභාපති කෙනෙක් හිටියත් එන චෝදනාවල ප්‍රශ්නයක් නැහැ. කුණු ඇද්දේ නැහැයි කියන චෝදනාව මන්ත්‍රීවරු ඉන්න කාලයේත් තිබුණා. සැලසුම් අනුමත කරන්නේ නැහැයි කියන චෝදනාව මන්ත්‍රීවරුන් ඉන්න කාලයේ තිබුණා. ලයිට් එක දාන්නේ නැහැයි කියන චෝදනාව මන්ත්‍රීවරු ඉන්න කාලයේත් තිබුණා. හැබැයි, මම කියනවා. අද ඊට වඩා කඩිනම් විධියට පළාත් පාලන ආයතන ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම පසුගිය ගං වතුර අවස්ථාවේදී අපට විශාල හයියකට සිටියේ අපේ පළාත් පාලන ආයතන. නිලධාරීන් සිටියත් ඒ ජාතික පීඩාවට පත් වුණු වෙලාවේදී සියලු පළාත් පාලන ආයතන එකතු වෙලා, විශේෂයෙන්ම කොටිකාවත්ත - මුල්ලේරියාව වාගේ ප්‍රදේශවල එකතු වුණු කැළි කසළ අදින්න පළාත් පාලන ආයතන අපට සහයෝගය දුන්නේ නැත්නම් අපට අදත් එහෙමනම් ඒ කුණු කසළ ඒ ප්‍රදේශවලින් ඉවත් කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

මේ ගැන කියන කොට විශේෂයෙන්ම උපාලි ගුණරත්න ගරු මන්ත්‍රීතුමාට පැහැදිලිව කියන්න ඕනෑ. අද දොම්පේ සනීපාරක්ෂක බිම් පිරවුම. සැනිටරි ලෑන්ඩ් ෆිල් එක. ගරු සභාපතිතුමනි, ඒක මහා ජාතික අපරාධයක්. උපාලි ගුණරත්න ගරු මන්ත්‍රීතුමාත්, මේ පළාත් සභාවේ හිටපු හර්ෂණ රාජකරුණා ගරු මන්ත්‍රීතුමාත් ඒ සඳහා ක්‍රියාත්මක වන දේශපාලන අධිකාරිය රටේ කැළි කසළ

ප්‍රශ්නයට බරපතළ තර්ජනයක් කරන්නේ. කොරියන් රජය මේ සඳහා විශාල ප්‍රතිපාදනයක් වෙන් කරලා තිබෙනවා. හැබැයි, ඒකේ නියම ප්‍රතිඵලය ගන්න ලැබෙන්නේ නැහැ. ඒ නිසා මම උපාලි ගුණරත්න ගරු මන්ත්‍රීතුමාටත්, ඒ වාගේම මේ සභාවේ නොසිටින පාර්ලිමේන්තුවේ සිටින හර්ෂණ රාජකරුණා ගරු මන්ත්‍රීතුමාටත් මම කරුණාවෙන් මතක් කරනවා. මේ දොම්පේ තිබෙන කසළ රඳවනයේ උපරිම ප්‍රයෝජනය ගන්න ප්‍රදේශය නියෝජනය කරන දේශපාලඥයින් හැටියට කටයුතු කරන්නය කියලා. හැබැයි මම කනගාටු වෙනවා. මොකද, උපාලි ගුණරත්න ගරු මන්ත්‍රීතුමා තමයි මේකට තමන්ගේ දේශපාලන ජීවිතය පූජා කළේ. අවස්ථාවාදී දේශපාලඥයෝ තමයි එතුමාව පරාජයට පත් කළේ. හැබැයි, අවස්ථාවාදී එවැනි දේශපාලඥයින් මේ තිබෙන කැළි කසළ ප්‍රශ්නයට වග කියන්න ඕනෑ. එදා මම මහරගම නගර සභාවේ සභාපතිවරයා හැටියට නොරාඬි ආධාර යටතේ මිලියන 02 ක් අරගෙන මේ බයෝ ගෑස් හදන්න ගිය වෙලාවේදී එදත් දේශපාලඥයන් තමයි මහජනයාව උසි ගන්වලා ඒ ව්‍යාපෘතිය කඩාකප්පල් කළේ. අද ඇතැම් දේශපාලඥයන් කසළ ගැන කථා කරනවා.

හැබැයි, මේ කසළවලට විසඳුම් දෙන හැම වෙලාවේදීම දේශපාලඥයන් තමයි ඉස්සරහාට ආවේ. අදත් අපට තිබෙන අභියෝගය ඒකතමයි. අද මම මහ ඇමැතිවරයා හැටියට පත් වෙලා මේ සියලු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ඇතිව අපි මාස හයකින් මෙයට විසඳුම සොයා ගත්තා. නමුත් අදටත් අපට ක්‍රියාත්මක කරන්න බැරි වුණේ, සාමාන්‍ය මිනිස්සු නිසා නොවෙයි. මේ රටේ වගකිවයුතු දේශපාලඥයින් නිසා කියන එක පැහැදිලිව කියන්න ඕනෑ. වගකිවයුතු දේශපාලඥයින් නිසා තමයි අපට මෙය කරන්න බැරි වුණේ. හැබැයි, අපේ කකුළෙන් ඇද්දත්, අපට මොන බාධා කළත් මේ ව්‍යාපෘතිය 2017 දී ක්‍රියාත්මක කරන්න අපි පසුබිම සකස් කරලා තිබෙනවා. හැබැයි, කැළි කසළ සම්බන්ධයෙන් මේ ප්‍රධාන ඇමැතිවරයා කිසිම විදේශ රටකට මේ පළාත් සභාවේ ප්‍රතිපාදන පාවිච්චි කළේ නැහැ. අපේ මන්ත්‍රීවරු ඒ වෙනුවෙන් විදේශගත වුණා. මේ පළාත් සභාවේ ප්‍රතිපාදන අපි පාවිච්චි කළේ නැහැ. මට වෙන් වෙලා තිබෙන විදේශ ගමන්වල ප්‍රතිපාදන අද ඉතුරු වෙලා තිබෙනවා. හැබැයි, මම මධ්‍යම රජයේ මුදල් ඇමැතිතුමා ගැන කනගාටු වෙනවා. එතුමා මේ බිලියන 09 කපන්නේ, මේ බස්නාහිර පළාතේ මන්ත්‍රීවරු මේ බිලියන 09 විදේශ ගත වීම සඳහා පාවිච්චි කරනවා කියලා. එවැනි මට්ටමක කෙනෙක් අද මුදල් ඇමැතිවරයා හැටියට පත් වීම ගැන මම කනගාටු වෙනවා. අද මේ රටේ ජනතාවගේ විශ්වාසය නැති වෙලා තිබෙනවා. මොකද, මම ඔබතුමා මගින් ජනාධිපතිතුමාට යෝජනා කරනවා. මේ රටේ වගකිවයුතු අමාත්‍යාංශ පවරන කොට මේ රටේ මිනිස්සු පිළිගන්න ඇමැතිවරු පත් කරන්න ඕනෑ. එහෙම නැතිව මහජනයා පිළිගන්නේ නැති, අඩු වශයෙන් එතුමා නියෝජනය කරන පක්ෂයේ මන්ත්‍රීවරු හරි පිළිගන්න කෙනෙක් පත් කළේ නැත්නම් මිනිස්සු පිළිගන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, අපි කොළඹ නගරයේ තිබෙන තරු පහේ හෝටලයක් ළඟ පුන්නක්කු කාලා දත් හාර හාර හිටියත් මිනිස්සු කියන්නේ, අපි ඒ හෝටලයෙන් කාලයි දත් හාරන්නේ කියලා. ඒ වාගේ තමයි ගරු සභාපතිතුමනි, මේ රටේ මිනිස්සු විශ්වාස කරන්නේ නැති ඇමැතිවරු දැම්මාම ඉදිරිපත් කරන අයවැය ලේඛනයක් පිළිගන්නේ නැහැ.

ඒ වාගේම අපි පරිසරය ගැන කථා කරමු. අද පරිසර අමාත්‍යාංශය හැටියට අද විශාල වැඩ කොටසක් අපි ඉෂ්ට කරලා තිබෙනවා. පසුගිය දවසක මධ්‍යම රජයේ ආර්ථික කමිටුවත් එක්ක අපි එකඟ වුණා, මීතොටමුල්ල ව්‍යාපෘතිය, කරදියාන සහ මුතුරාජවෙල කියන ප්‍රධාන ව්‍යාපෘති තුන ආර්ථික කමිටුව හරහා ක්‍රියාත්මක කරන්න. මේ රටේ තිබෙන අනික් සියලුම කැළි කසළ ප්‍රශ්නයට අවශ්‍ය විසඳුම් සොයන්න අනික් ව්‍යාපෘති කිරීමේ බලය පළාත් සභාවට පැවරී තිබෙනවා. එහෙත් මීතොටමුල්ල, කරදියාන සහ මුතුරාජවෙල ව්‍යාපෘතිවල අවසාන බලධාරීත්වය පැවරෙන්නේ පරිසර අමාත්‍යාංශය හැටියට, අපට. ඒ නිසා එම කරදියාන, මීතොටමුල්ල සහ මුතුරාජවෙල ව්‍යාපෘති මධ්‍යම රජය එක්ක සහයෝගයෙනුත්, අනික් ව්‍යාපෘති පළාත් සභාව හැටියටත් ක්‍රියාත්මක කරන්න, අපි දැන් කටයුතු කරලා තිබෙන බව, මේ සභාවට මතක් කරන්න ඕනෑ.

මේ වෙන කොට බොබ් කට් මැෂින් අටක් අපි ලබා දීලා තිබෙනවා. ඒ වාගේම මේ රටේ එකතුවන ඉටි කොළ, ප්ලාස්ටික් ආදිය ප්‍රතිචක්‍රීකරණය කරන්නට බේලින් මැෂින් 31 ක් අපි පළාත් පාලන ආයතනවලට ලබා දීලා තිබෙනවා. ඒ වාගේම ඊයේ සාකච්ඡාවේදී මතු වුණා. මේක අපි 1994 දී ක්‍රියාත්මක කරපු ව්‍යාපෘතියක්. ඒ කියන්නේ, ටින් වෙනම, ප්ලාස්ටික් වෙනම, පොල් කටු ආදිය වෙනම, ලිපි ද්‍රව්‍ය වෙනම එකතු කරන වැඩ පිළිවෙළක් තමයි ලෝකයේ දියුණු රටවල ක්‍රියාත්මක වන්නේ. මම හිතනවා,

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

අර Bin System එක ගම්වල ප්‍රායෝගිකව කරන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා අපි ඉදිරි කාලය තුළදී ඔබතුමා මගින් අපේ පළාත් පාලන ලේකම්තුමියට මම යෝජනා කරනවා. කසළ කළමනාකරණ අධිකාරිය හරහා එම මළු අපි නිෂ්පාදනය කරලා, යම් සාධාරණ මුදලකට ඒවා අලෙවි කරලා වඩාත් ඵලදායි ලෙස කසළ කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතියකට එකතු වෙන්නය කියලා. ඒ වාගේම අද අපි තරුණ කණ්ඩායම් එකතු කරලා මුහුණ පොත එක්ක, එහෙම නැත්නම් Facebook එකත් එක්ක අපි අද පරිසර වැඩ සටහනක් ක්‍රියාත්මක කරනවා, Warn කියලා. අද ඒක සාර්ථක වෙලා තිබෙනවා. ඒක අද තරුණයන් අතර ජනප්‍රිය වෙලා තිබෙනවා. ඒ නිසා අපි දියුණු තාක්ෂණයත් මේ කැළි කසළ ප්‍රශ්නයට විසඳුමක් ලෙස පාවිච්චි කරලා තිබෙනවා කියන පණිවුඩය මම මේ සභාවට මතක් කරනවා.

ඒ වාගේම අපේ සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා මතු කරපු කාරණයක් තමයි, කැලණි ගඟ සම්බන්ධව. එතුමා ඒක මතු කළා. පරිසර අමාත්‍යාංශය හැටියට අපි ඒකට මැදිහත් වෙලා මේ රටේ ඉන්න උගත්, බුද්ධිමත් කණ්ඩායම් ගෙනැල්ලා අද සාකච්ඡා කරලා, අපි 2017 වර්ෂයේදී කැලණි ගඟ පවිත්‍ර කිරීමේ ව්‍යාපෘතියට ප්‍රතිපාදන වෙන් කරන්නට කටයුතු කරලා තිබෙනවා කියන එකත් මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. ඒ වාගේම අපි මුතුරාජවෙල සහ බොල්ගොඩ සීමා ලකුණු කරන්නට කටයුතු කරලා තිබෙනවා. එහි පරිසරය ආරක්ෂා කරලා ක්‍රියාත්මක කරන්නට අපි ප්‍රතිපාදන වෙන් කරනවා. අපේ අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමා ඒ ගැන අපට පැහැදිලි කිරීම පිළිබඳව අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ සම්බන්ධයෙන් අපි අපේ අවධානය යොමු කළ බව මේ අවස්ථාවේදී එතුමාට ගෞරවයක් හැටියට මම ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, සංචාරක ව්‍යාපාරය තුළ අපි දන්නවා. ඊයේ මන්ත්‍රීවරයෙක් කිව්වා, මේ මීගමුවේ Water Park එක ගැන. මේ Water Park එක මම ඉන්න කාලයේ හදපු එකක් නොවෙයි, ගරු සභාපතිතුමනි. මම පත් වන කොට මේ සංචාරක අධිකාරියෙන් කරලා තිබෙන්නේ ඇමර්සන් කියන පොත හැදීමයි. ඒක හදලා තිබෙන්නේ, පළාත් සභාවේ සල්ලිවලින් නොවෙයි. ඒක හදලා තිබෙන්නේ, මේ සංචාරක ව්‍යාපාරයේ ඉන්න අයගෙන් මුදල් එකතු කරලා. එච්චරමයි සංචාරක අමාත්‍යාංශයෙන් මම එනකොට කරලා තිබුණේ. ගරු සභාපතිතුමනි, මම Water Park එක බලන්න ගියා. ඒක සුදු අලියෙක්.

**ගරු රොයිස් විජිත ප්‍රනාන්දු**
Hon. Roise Vijitha Fernando

Beach Park එක.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මීගමුවේ Beach Park එක. ඉතින් ඒක නිසා මෙතුමා මේක ඇවිල්ලා කියන්න ඕනෑ නැහැ. මෙතුමාට ඒක නතර කරන්න තිබුණා. ඒ ගැන උද්ඝෝෂණය කරන්න. මොකද එතුමා එතකොට මේ මීගමුව මහ නගර සභාවේ උප නගරාධිපති කෙනෙක්. එහෙම නොකර මේ සභාවේ ඇවිල්ලා ජනප්‍රිය වෙන්න කරපු කථා ගැන මම කිසිසේත්ම අගය කරන්නේ නැහැ. මොකද එතුමා කරපු කථාවෙන් පැහැදිලි වුණේ, ඒක මගේ වැරැද්දක් හැටියට. ඒ නිසා ඒ ගරු මන්ත්‍රීතුමාට මගේ කනගාටුව මම ප්‍රකාශ කරන්න කැමැතියි.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, අපි අමාත්‍යාංශයක් හැටියට මේ ළඟදී පළාත් නවයේම ඉන්න සංචාරක අධිකාරිවලට කථා කළා. මුළු පළාත් සභා නවයම අපි කැඳෙව්වා. උතුරු පළාතත් කළුතරට ආවා. අපි විතරක් නොවෙයි. අනික් පළාත් ගත්තත් සංචාරක ව්‍යාපාරය වෙනුවෙන් පුළුල් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා නැහැ. මේක තමයි ඇත්ත. අපි පෞද්ගලික අංශයත් කැඳෙව්වා. පෞද්ගලික අංශයේ සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයන් අපි කැඳෙව්වා. ඒ අයගේ අත්දැකීම් අපි ගත්තා. එහෙම බැලුවාම, අපේ මේ සංචාරක කර්මාන්තය තුළ මධ්‍යම රජයේ සංචාරක අමාත්‍යාංශයත්, අපිත් ඉන්නේ පල්ලෙහා මට්ටමක. අපි කාටවත් ඇඟිල්ල දික් කරලා වැඩක් නැහැ. අපි පළාත් නවයම එකතු වෙලා අලුත් සැලැස්මක් හැදුවා. ඒ අනුව ඒ අය කිව්ව දෙයින් පැහැදිලි වුණු දෙයක් තමයි, ගරු සභාපතිතුමනි දැන් අපි මේ සංචාරක කර්මාන්තය හරහා ගොඩනැගෙන ව්‍යාපාරිකයන් පවා දැනුවත් කරන්න ඕනෑ. මේ රටේ සංචාරක ව්‍යාපාරකයින්ට යම් යම් දේ අළෙවි කරන මධ්‍යස්ථාන අපි උදාහරණයකට ගත්තොත්, අපි ලී වලින් හදපු නිර්මාණ සංචාරකයින්ට විකුණනවා. අපි මැටිවලින් හදපු නිර්මාණ සංචාරකයින්ට

විකුණනවා. හැබැයි ගරු සභාපතිතුමනි, ඒවා ඔවුන්ගේ රටවල්වලට, විශේෂයෙන්ම යුරෝපා මහද්වීපයට යන කොට ඒවා ඔවුන්ට එයාර්පෝට් එකෙන් ගෙනි යන්න බැහැ. ඒ වාගේ මේ සංචාරක ව්‍යාපාරයේ පොඩි මනුස්සයාගේ සිට ඉහළ ඉන්න ව්‍යාපාරිකයන් පවා ඒ අයගේ නිර්මාණ සම්බන්ධයෙන් දැනුවත් කරන්න ඕනෑ. මේක මහා විශාල කාරණාවක්. අපි දැන් මේකට අතගහලා තිබෙනවා. මම හිතන්නේ ඉදිරි කාලය තුළදී අපට එය ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙනවා.

ඒ වාගේම අපේ පාහියන්ගල.ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට පැමිණෙන මේ ලෙන ආශ්‍රිතව අපි කෞතුකාගාරයක් ඉදි කරලා එතැන සංචාරක කලාපයක් බවට පත් කරන්න හදනවා. සමහර ගරු මන්ත්‍රීවරු චෝදනා කළා, අපි විහාරස්ථානවල වැසිකිළි ඉදි කරනවා කියලා. ගරු සභාපතිතුමනි, කැලණි විහාරය බලන්න සංචාරකයන් එනවා. මේ සභාවේ ඉන්න කවුරු හරි මන්ත්‍රීවරයෙක් කියනවාද සංචාරකයන් එන කැලණි විහාරයේ වැසිකිළි පද්ධතියක් අපට හදන්න එපාය කියලා. මුහුදු වෙරළේ වැසිකිළි හදන්න එපාය කියලා කවුරු හරි මන්ත්‍රීවරයෙක් මේ සභාවේදී කියනවාද? කවුරු හරි මේ සභාවේ මන්ත්‍රීවරයෙක් මට කියනවාද? සංචාරක කලාපවල බංකු සහ වැසිකිළි ඉදි කරන්න එපාය කියලා. අද අපේ රටට තිබෙන චෝදනාව - මම හිතන්නේ කොරියාවේ සංචාරයේ යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට අත්දැකීමක් තිබෙනවා. යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට සහ අනෙක් පිරිසට කොරියාවේදී ලංකාවේ තරුණ පිරිසක් හම්බ වුණා. ඒ අය කිව්වේ, මේ රටේ මහජන නියෝජිතයන්ට කියන්න. කයිය ගහන්නේ නැතිව අඩුම වශයෙන් ප්‍රසිද්ධ ස්ථානවල වැසිකිළි ටිකක්වත් හදන්න කියලා කිව්වේ. අද ප්‍රධාන නගරවල වැසිකිළි සහ කැසිකිළි තිබෙනවාද? අද ඒවා ගැන අපි හිතලා නැහැ. මේ ආසියාව සනීපාරක්ෂාව ගැන තවම හිතන්නේ නැහැ. ඒ නිසා අද අපට සිද්ධ වෙලා තිබෙනවා, මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න. ඒ වාගේම සංචාරකයන් ආකර්ෂණය වන ප්‍රදේශවල බංකු සහ වැසිකිළි ඉදි කරලා සංචාරකයන්ට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න. අද සංචාරයේ යෙදෙන්නේ, විදේශිකයන් විතරක් නොවෙයි. මේ යුද්ධය නිමා වීමෙන් පස්සේ අද දේශීය අයත් සංචාරයේ යෙදෙනවා. ඒ නිසා සංචාරක ව්‍යාපාරයෙන් අලුත් ගමනක් අපි ආරම්භ කරලා තිබෙනවා.

ඒ වාගේම අපි ලබන අවුරුද්දේ සිට පොත් පිංචක් නිකුත් කරනවා. ඒක තමයි මම හිතන්නේ අපේ ලංකාවට එන සංචාරකයින්ට දෙන්න පුළුවන් හොඳම වස්තුව. ඒ වාගේ දෙයක් කවුරුත් හිතලා නැහැ. ඒ පොත් පිංච නිසා සංචාරකයින්ට තැරැව්කරුවන්ගෙන්, අවස්ථාවාදීන්ගෙන්, වංචනිකයන්ගෙන් බේරිලා තමන්ගේ සංචරනයලංකාව තුළ කරන්න පුළුවන් කමක් ඇති වෙනවා. ගරු සභාපතිතුමනි, ඕනෑම සංචාරකයෙක් කොළඹට ආවොත් බස්නාහිර පළාතට එන්නේ. යන්නෙත් බස්නාහිර පළාතෙන්. දවස් දෙකක් අපේ පළාතේ ඉන්නේ නැහැ. හැබැයි, අපි කවුරුත් හිතුවේ නැහැ, සංචාරකයෙකුට ගම්පහ දිස්ත්‍රික්කයේ දවස් පහක් නැවතිලා බලන්න දේවල් තිබෙනවා. කොළඹ දිස්ත්‍රික්කයේ දවස් පහක් නැවතිලා බලන්න දේවල් තිබෙනවා. කළුතරත් ඒ වාගේම තිබෙනවා. සංචාරකයෙක්ව දවස් 15 ක් බස්නාහිර පළාතේ රඳවාගන්න පුළුවන්. හැබැයි, ඒකට වැඩ පිළිවෙළක් මේ පළාත් සභාව මීට පෙර හදලා නැහැ. අද ඒක හදන්න මම පටන් අරගෙන තිබෙනවා කියන එක මේ සභාවට මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, ජලය සහ විදුලිය ගැන කථා කරනකොට අපි විදුලිය නොමැති සියලුම ස්ථානවලට මන්ත්‍රීවරුන්ගෙන්, මහජන නියෝජිතයන්ගෙන් පැමිණි යෝජනාවලට අපි ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. තව ප්‍රතිපාදන දෙකයි වෙන් කරන්න තිබෙන්නේ. අර චමින්ද ගරු මන්ත්‍රීතුමාගේ ව්‍යාපෘතියකටයි, අපේ උදේන විජේරත්න ගරු මන්ත්‍රීතුමා ජලය සම්බන්ධයෙන් යෝජනාවක් ඉදිරිපත් කරලා ඒ දෙකට තමයි අපට මේ අවුරුද්දේ ප්‍රතිපාදන වෙන් කරන්න බැරි වුණේ. ඒ සඳහා ප්‍රතිපාදන අපට ලැබිලා තිබෙනවා. ලබන අවුරුද්දේ ඒකට වෙන් කරනවා. ඒ වාගේම විශේෂයෙන්ම නළ වලින් ජලය දෙන්න බැරි තැන්වලට ප්‍රජා ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න අපි මේ අවුරුද්දේ සල්ලි දීලා තිබෙනවා. ලබන අවුරුද්දෙත් අපි ප්‍රතිපාදන වෙන් කරනවා. ඒ වාගේම විදුලිය නොමැති ප්‍රදේශවලට සූර්ය බලශක්ති සවි කරන්න අවශ්‍ය ප්‍රතිපාදන අපි 2017 දී වෙන් කරන්න අපි කටයුතු කරලා තිබෙනවා. වෙලාව හරිද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තව විනාඩි 03 ක් තිබෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒ වාගේම පැහැදිලිව කියන්න ඕනෑ, ආර්ථික කටයුතු අමාත්‍යාංශය හරහා - මම මෙය පත් වුණු දවසේ සිටම කියනවා. මම පත් වුණු දවසේ සිටම මම මේ රටේ තරුණයන්ට කිව්වා, අපිට පුළුවන් සහනදායි විධියට උකුළු පරිගණක ලබා දෙන්න කියලා. ඒවායෙන් e – Business කරන්න. අපි දන්නවා, සමහර අය ඉන්නවා, සාමාන්‍ය වෘත්තියක් කරන්න කැමැති නැහැ. හැබැයි, ළමයින්ට උසස් අධ්‍යාපනය නැතත් තාක්ෂණය පිළිබඳව අවබෝධයක් තිබෙනවා. එවැනි තාක්ෂණික අවබෝධයක් තිබෙන දරුවන්ට උදව් කරන්න අපි කැමැතියි. ඒ වාගේම මේ රටේ ඉන්න කාන්තාවන්ට තමන් දන්න වෘත්තියකට යොමු කරලා, ස්වයං රැකියාවක් හරහා ඒ අය ශක්තිමත් කරන්න අපට ප්‍රතිපාදන වෙන් කරන්න පුළුවන්කමක් තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අලුත් තාක්ෂණය.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අලුත් තාක්ෂණය. ඒ වාගේම ගරු සභාපතිතුමනි, ගරු අධ්‍යාපන ඇමැතිතුමාට මම යෝජනා කරනවා. සාමාන්‍ය පෙළ අසමත් වන දරුවන්ට, ඒ වාගේම උසස් පෙළ සමත් වන, අසමත් වන දරුවන්ට අපි වෘත්තීය අධ්‍යාපනය අනිවාර්ය කළ යුතු යුගයක් ඇවිල්ලා තිබෙනවා. වෘත්තීය අධ්‍යාපනය අවුරුද්දක් අනිවාර්ය කරන්න කියන යෝජනාව අපි සම්මත කරනවා. ඒ නිසා මේ රටේ ඉන්න වෘත්තීය ආයතනත් එක්ක කථා කරලා, ඒ සාමාන්‍ය පෙළ අසමත් වන දරුවන්ට ගැලපෙන වෘත්තීය අධ්‍යාපනයක්, ඒ වාගේම උසස් පෙළ සමත්වන අයට අපි වෙනම වෘත්තීයන් හඳුනාගෙන අනිවාර්ය කළ යුතු වෙනවා. එහෙම නැත්නම් අපට 2020 බලන්න වෙන්නේ, තනිකරම තරුණයන්ගෙන් සමන්විත ත්‍රීවිල් බලකායක් විතරයි. අපි තරුණයන් ත්‍රීවිල් රියැදුරන් වීමේ ගමනට අපි දැන් තිත තියලා තිබෙනවා. අපි මොනම හේතුවක් නිසාවත් වෘත්තීය අධ්‍යාපනයක් නොලබන අවුරුදු 25 ට වඩා අඩු කිසිම කෙනෙක්ට මින් ඉදිරියට මේ පළාත් සභාවේ කිසිම ත්‍රීවිල් බලපත්‍රයක් ලබා දෙන්නේ නැහැ. ඒ වෙනුවෙන් ගරු ඇමැතිතුමා ගත්තු ක්‍රියා මාර්ගය මම ප්‍රධාන ඇමැතිවරයා හැටියට අගය කරන බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ නිසා මම මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, මේ පළාත් සභාවේ පක්ෂ දේශපාලනයෙන් තොරව ප්‍රධාන ඇමැතිවරයා හැටියට මම මගෙන් ඉල්ලීමක් කරපු සෑම කෙනෙක්ට මම ප්‍රතිපාදන වෙන් කරලා දීලා තිබෙනවා. මගේ ළඟට පැමිණි කිසිම මන්ත්‍රීවරයෙක් මම ආපසු හරවලා යවලා නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මට ඇරෙන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඔබතුමාගේත් කරලා තිබෙනවා නේ ගරු මන්ත්‍රීතුමා. දැන් කරගෙන යනවා නේ?සියලු දෙනාටම මම කරලා තිබෙනවා. මම පක්ෂයක් බැලුවේ නැහැ. පාටක් බැලුවේ නැහැ. මට හොඳට නින්ද යනවා. මට ආතතිය නැහැ. මට කිසිම tension එකක් නැහැ. මොකද, මගේ ළඟට ආපු කිසිම මන්ත්‍රීවරයෙක් හැරිලා ගියේ නැහැ. මම හැමෝටම ප්‍රතිපාදන දීලා තිබෙනවා. මේ ගිය සැරෙත් ආණ්ඩුවෙන් දුන්නේ ලක්ෂ 25 යි. මම ඔක්කෝටම ලක්ෂ 50 ක් දුන්නා. හැබැයි, මේ සැරේ දීලා තිබෙන්නේ ලක්ස 24 යි. මම දෙන ගණන කියන්නේ නැහැ, ගරු සභාපතිතුමනි. හැබැයි, මේ ඉන්න ඕනෑම මහජන නියෝජිතයෙක්ට වගකීමක් තිබෙනවා. මේ පළාත් සභාවේ අද සිට පැවැත්වෙන ඡන්දවලට ඡන්දයක් දෙන්න. මේ සභාවට ඇවිල්ලා ඡන්දයක් නොදී සිටියත් ඒක මට ප්‍රශ්නයක් නැහැ. ඒක ඒ අයගේ දේශපාලන ප්‍රතිපත්තිය. ඒක වෙනම කාරණාවක්. මම දන්නවා, ජනතා විමුක්ති පෙරමුණ බැරි වෙලා නොදී ඉන්න පුළුවන්. හැබැයි, එතුමන්ලා මහ ඇමැතිතුමාත් එක්ක ප්‍රශ්නයක් නැහැ. මම දන්නවා. ඒ අයගේ දේශපාලන ප්‍රතිපත්තිය නිසා ඒ අය සමහර වෙලාවට ඡන්දයක් නොදී ඉන්න පුළුවන්. මම හිතන්නේ නැහැ, ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා එහෙම කරයි කියලා. හැබැයි, එහෙම ප්‍රශ්නයක් නැහැ. හැබැයි, මේ සභාවේ මේ අයවැයට ඡන්දය නොදෙන කිසිම මන්ත්‍රීවරයෙක්ට ලක්ෂ 24 න් එහාට රුපියලක්වත් මම දෙන්නේ නැහැයි කියලා කියනවා. එහෙම දුන්නොත් එහෙම මේ සභාවට හැමදාම එන, කාරක සභා රැස්වීම්වලට, කණ්ඩායම් රැස්වීම්වලට - අපේ පක්ෂයේත්

වෙන්න පුළුවන්. විපක්ෂයේත් වෙන්න පුළුවන්. ඔබතුමන්ලාගේ report එක මට දෙන්න. ඔබතුමන්ලාගේ කණ්ඩායම් රැස්වීම්වලට එන එක. මට කමක් නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මම වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මට වරප්‍රසාද ප්‍රශ්න වැඩක් නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒ ප්‍රකාශය වහාම ඉල්ලා අස් කරගන්න කියන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒ ප්‍රකාශය මම ඉල්ලා අස් කර ගන්නේ නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඉල්ලා අස් කරගන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. කාලය අවසන්.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒ ප්‍රකාශය මම ඉල්ලා අස් කර ගන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, -

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ගරු මන්ත්‍රීතුමා, පක්ෂව හෝ විපක්ෂව. ඕනෑ විධියකට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලය ප්‍රශ්නයක් තිබෙනවා. කාලය දික් කරන්න බැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, මම කිව්වේ මේ සභාවට ඇවිල්ලා -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒක සම්පූර්ණ වැරදි ප්‍රකාශයක්. ප්‍රජාතන්ත්‍ර විරෝධී ප්‍රකාශයක්.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මම කිව්වේ සභාවට ඇවිල්ලා විරුද්ධ වෙන්න පුළුවන්. හැබැයි, සභාවට නොපැමිණෙන කිසිම මන්ත්‍රීවරයෙක්ට ලක්ෂ 24 න් එහාට කිසිම ප්‍රතිපාදනයක් දෙන්නේ නැහැ. බොහොම ස්තූතියි.

***පූ.භා. 11.00 ට, අංක 104, 109, 110, 111 හා 112 යන ශීර්ෂ පිළිබඳ සාකච්ඡාව අවසාන විය.***
*Discussion on the Expenditure Head Nos 104, 109, 110, 111 and 112 concluded at 11.00 a.m.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. බොහොම ස්තූතියි. ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ අංක 104, 109, 110, 111 හා 112 යන වැය ශීර්ෂයන් සම්බන්ධ විවාදය මෙයින් අවසන් වෙනවා. ඒ පිළිබඳව සභාවේ බෙදීමක් තිබෙනවාද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

බෙදීමක් නැහැ.

***ඊට අනුකූලව,***

***ශීර්ෂ අංක 104 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*The question of the amount stated in Head No. 104 was proposed and adopted.*

***ශීර්ෂ අංක 109 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*The question of the amount stated in Head No. 109 was proposed and adopted.*

***ශීර්ෂ අංක 110 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*The question of the amount stated in Head No. 110 was proposed and adopted.*

***ශීර්ෂ අංක 111 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*The question of the amount stated in Head No. 111 was proposed and adopted.*

***ශීර්ෂ අංක 112 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*The question of the amount stated in Head No. 112 was proposed and adopted.*

| | | |
|---|---|---|
| **ශීර්ෂ අංක 106** | **-** | **කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශය** |
| **ශීර්ෂ අංක 117** | **-** | **කෘෂිකර්ම දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 118** | **-** | **ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 119** | **-** | **වාරිමාර්ග දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 120** | **-** | **සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව** |
| Head No 106 | - | Ministry of Agriculture, Land, Irrigation, Fisheries, Animal Production and Health and Agrarian Development |
| Head No 117 | - | Department of Agriculture |
| Head No 118 | - | Land Commissioner's Department |
| Head No 119 | - | Department of Irrigation |
| Head No 120 | - | Department of Animal Production and Health |

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට න්‍යාය පත්‍රානුකූලව තිබෙන්නේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය, ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ අංක 106, 117, 118, 119 හා 120 යන වැය ශීර්ෂ සම්බන්ධ විවාදය ආරම්භ කිරීමට, සංකේත කපා හැරීම සඳහා විපක්ෂයට ආරාධනා කරනවා.

**ගරු එස්.එම්. සකාවුල්ලා**
Hon. S.M. Sakaulla

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් වාඩි වෙන්න.

***[සංකේත කපා හැරීම ]***
*[Symbolic write-off]*

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු සභාපතිතුමනි, *"බස්නාහිර පළාත් සභාවේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය, ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ අංක 106, 117, 118, 119 හා 120 යන එක් එක් වැය ශීර්ෂයෙන් රුපියල් 10/- ක් අඩු කළ යුතු යැයි"* මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බොහොම ස්තුතියි. එම වැය ශීර්ෂයන් සම්බන්ධයෙන් -

**ගරු එස්.එම්. සකාවුල්ලා**
Hon. S.M. Sakaulla

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම එම වැය ශීර්ෂයන් පිළිබඳ විවාදයට -

**ගරු එස්.එම්. සකාවුල්ලා**
Hon. S.M. Sakaulla

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා 36 (1) කියන්න.

**ගරු එස්.එම්. සකාවුල්ලා**
Hon. S.M. Sakaulla

ගරු සභාපතිතුමනි, ඊයේ මට විනාඩි 04 ක කාලයක් තමයි ලැබුණේ. ඒ විනාඩි 04 ක කාලය තුළ මට මගේ සම්පූර්ණ කථාව කරන්න බැරිව ගියා. නමුත් ගරු මහ ඇමැතිතුමා විසින් පිළිතුරු කථාවේදී මාව සඳහන් කරලා, අර මීගමුවේ pool එකක් සම්බන්ධව කථා කරපුවාම වැරදි අවබෝධයක් එතුමා වටහාගෙන තිබෙන්නේ. මොකද මම දන්නවා, එතුමාගේ කාලයේ නොවෙයි මේ pool එකේ ඉදි කිරීම් කෙරුවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා හැබැයි දැන් නැහැ. එතුමා ඉන්න වෙලාවට ප්‍රශ්නය යොමු කරන්න.

**ගරු එස්.එම්. සකාවුල්ලා**
Hon. S.M. Sakaulla

මම නියෝජ්‍ය නගරාධිපති වෙලා හිටියා. නමුත් ඒ කාලය තුළදී අපි ඒකට විරුද්ධ වුණේ නැහැ. නමුත් මේ ව්‍යාපෘතිය සම්බන්ධව කිසි ගැටලුවක් නැහැ. නමුත් මිනිස්සු අපෙන් අහනවා. මේකේ ටයිල් කඩාගෙන වැටිලා. මේ ව්‍යාපෘතියට මෙපමණ මුදලක් සංචාරක අමාත්‍යාංශයෙන් වියදම් කරලා තිබෙනවා. මේක ආරම්භ කරන්නේ නැත්තේ ඇයි කියලා. ඒ නිසා මම එතුමාගේ අවධානයට යොමු කරන්න කියන එක තමයි කිව්වේ. ගරු සභාපතිතුමනි, එතුමා ඒක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හොඳම දේ තමයි ප්‍රධාන ඇමැතිතුමා ඉන්න වෙලාවක ඔබතුමා ඔය ප්‍රශ්නය යොමු කරන්න.

**ගරු එස්.එම්. සකාවුල්ලා**
Hon. S.M. Sakaulla

අපට නියමිත කාලයවත් ලැබුණා නම් අපට ඒක සම්පූර්ණයෙන් පාහදා දෙන්න තිබුණා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඕක ලන්සා පවුලත් එක්ක බේරාගන්න.

**ගරු එස්.එම්. සකාවුල්ලා**
Hon. S.M. Sakaulla

එතුමාට ඒක නිවැරදි කර ගන්න කියන එක තමයි මම මේ සභාවට දැනුම් දෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තූතියි. පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. ඔබතුමාට විනාඩි 15 ක කාලයක තිබෙනවා. ඒත් එක්කම මේ අවස්ථාවේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

[පූ.භා. 11.07]

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන, සත්ව සෞඛ්‍ය, ගොවිජන සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වෙනුවෙන් කථා කරන අවස්ථාවේ කියන්න කැමැතියි අපේ රටේ ජනතාවට බෙහෙවින් බලපාන අමාත්‍යාංශයක් හැටියට මේ අමාත්‍යාංශය ඉතාම වැදගත් තැනක් ගන්න බව. ඒ වාගේම අපේ ඇමැතිතුමා මේ අමාත්‍යාංශය භාර අරගෙන පසුගිය කාලය තුළ වේගවත් සංවර්ධන වැඩ කිහිපයක් දියත් කළා වාගේම ඉදිරි වැඩ සටහන් ගැනත් එතුමාගේ අදහස් දක්වලා තිබෙනවා. විශේෂයෙන්ම මේ අමාත්‍යාංශයේ තිබෙන වී ගොවිතැන ගැන අපි විශේෂ අවධානය යොමු කරන්න කැමැතියි. අපේ රටේ ජනතාවගේ ප්‍රධාන ආහාරය වන බත සපයන වී ගත්තාම, අපේ රටේ වී නිෂ්පාදනය කරන ප්‍රධාන අමාත්‍යාංශය හැටියට මේ අමාත්‍යාංශය තමයි ගැනෙන්නේ. බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කය දිහා බැලුවාම වැඩියෙන් වී නිෂ්පාදනයට යොමු වූ පළාතක්.

[ගරු පී.බී. අබේරත්න]

ඒ වාගේම කෘෂි කර්මාන්තය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට අපේ රටේ ගොවියාට තිබෙන ප්‍රශ්න කිහිපයක් ගැන කථා කරන්න බලාපොරොත්තු වෙනවා. අපේ රටේ වී ගොවිතැන අතීතයේ ඉඳලා පවත්වාගෙන ආපු ව්‍යාපාරයක්. මේ රටේ ඉතාම සශ්‍රීක විදේශ රටවල - රජ කාලේ ඉඳන් වී පිටරට යැවූ ඉතිහාසයක් අපට තිබෙනවා. බතින් පෝෂණය වන ජනතාවක් ජීවත් වෙන්නේ. නමුත් අද වී වගාව දිහා බැලුවාම වී වගාවට පුහුණු ශ්‍රමය මදිකම බෙහෙවින් බලපානවා. ඒ නිසා අද යන්ත්‍රෝපකරණ මාර්ගයෙන් බොහෝ දෙනෙක් වී ගොවිතැනට යොමු වෙලා තිබෙනවා. යන්ත්‍රෝපකරණ තිබුණත් කුඹුරක් අස්වද්දන්න ගියාම කුඹුරේ නියරවල් ටික රැක ගන්නවත් කෙනෙක් නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

ඒ වාගේම ශ්‍රමයට විශාල මුදලක් ගෙවන්න වෙලා තිබෙනවා. අද මේ කන්නය වනකොට ගොවිතැන ගැන අවබෝධයක් තිබෙන කෙනෙකුගේ මිල රුපියල් 1500 දක්වා වැඩි වෙලා තිබෙනවා. මේ නිසා ලංකාව දිහා බැලුවාම වී ගොවිතැනින් අඩු අස්වැන්නක් ලබන ප්‍රදේශයක් තමයි බස්නාහිර පළාත. අපේ පළාතේ වැසි ජලයෙන් තමයි ගොවිතැන කරන්නේ. නියම කාලයට වැස්ස නැති වෙනවා. අනවශ්‍ය වෙලාවට පායනවා. මේ වාගේ ස්වභාවික තර්ජනවලට මුහුණ දෙමින් වී ගොවියා විශාල අපහසුතාවයකින් කටයුතු කරනවා. පසුගිය යල කන්නයේ අපේ ප්‍රදේශවල විශාල වශයෙන් වැඩ කෙරුණේ නැහැ. ගරු ඇමැතිතුමා මාත් එක්ක එකඟ වෙනවා ඇති. මම හිතන්නේ 10% ක් වත් කුඹුරු වැඩ කළේ නැහැ. ඒ නිසා අද අපේ හාල් මිල වැඩි වෙලා තිබෙනවා. ඒකට ප්‍රධාන හේතුවක් තමයි නිෂ්පාදනය අඩු වීම. වෙනදාට මහ කන්නයේ සියයට සියයක් කුඹුරු වැඩ කරනවා. නමුත් අපට පේනවා 10% ක් 15% ක් වැඩ කරලා නැහැ. සමහර තැන්වල යායවල් පිටින් වැඩ කරලා නැහැ. මේකට ප්‍රධාන හේතුව තමයි පුහුණු ශ්‍රමයට යන විශාල මුදල. ඒ වාගේම අලුත් පිරිසක් බිහි වෙන්නේ නැහැ. ඔබතුමා මගින් මම ගරු ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා තරුණ පිරිස් ගොවිතැනට පුහුණු කිරීමේ වැයමක් යොදන්න කියලා. අද අපට විවිධ ක්ෂේත්‍රයන් හම්බ වෙනවා. අපි දන්නවා පුහුණු මධ්‍යස්ථාන තිබෙනවා. හොරණත් පුහුණු මධ්‍යස්ථානයක් තිබෙනවා. විවිධ ක්ෂේත්‍රයන් ගැන පුහුණු කළාට, වී ගොවිතැන ගැන පුහුණු කරන්නේ නැහැ. ඒ නිසා අද තරුණ පරපුර සම්පූර්ණයෙන් සම්බන්ධ වෙන්නේ නැහැ. අපට විවිධ පුහුණු තිබෙනවා. මම ගරු ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා, ඉදිරියේදී තරුණ පරපුරට වී ගොවිතැන පුහුණු කරන්න ආධාර ගන්න කියලා. ඒකෙන් එක පැත්තක් අපි දකිනවා. පාසල්වල ගොවිපොළවල් පවත්වාගෙන යෑමේ වැඩ පිළිවෙළක් ගෙනියනවා. සමහර තරුණ පිරිස් සාමාන්‍ය ගොවිතැනට පුරුදු වෙනවා. අද බැලුවාම හොඳ ආදායමක් ලබන ක්‍රමයක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හුඟක් අය ඇඟළුම් කර්මාන්තයට ගිහිල්ලා, රුපියල් 16,000/- ක 20,000/- ක පඩියක්ම. අද ගොවිතැනට යන තරුණ කෙනෙකුගේ වැටුප කන්න බොන්න දීලා දවසට රුපියල් 1500/- යි. වැඩ කරනවා නම් රුපියල් 45,000/- ක මාසික වැටුපක් තිබෙනවා. ඒ වාගේම හැමදාම මේ ක්‍රියාදාමයට සම්බන්ධ වෙන්න පුළුවන්කම තිබෙනවා. මොකද, මිනිස් ශ්‍රම හිඟකම නිසා. ඒ නිසා මේකට පුහුණුවක් දෙනවා වාගේම ශ්‍රම අභිමානයක් තිබිය යුතුයි. ඒක තමයි අපට තිබෙන විශාලම පාඩුව. අද ගොවිතැන් කරන මිනිහා ගණන් ගන්නේ නැහැ. දහඩිය මහන්සිය හෙළන මිනිහාව ගණන් ගන්නේ නැහැ. පුටු රත් කරන අය තමයි සමාජයේ ගණන් ගන්නේ. සමාජයේ වෙනසක් විය යුතුයි. ශ්‍රමයට අභිමානයක් ඇති වන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. ගොවියා රජා කියලා කථා කරනවා. නමුත් සමාජයට ගියාම ගොවියා ගණන් ගන්නේ නැහැ. අපට බත සපයන ගොවියාට සමාජයේ උසස් තත්ත්වයක් ලබා දෙනවා නම්, මම හිතනවා තරුණ පරපුර මේ ගොවිතැනට යොමු කර ගන්න පුළුවන් වෙයි කියලා.

ඒ වාගේම අපේ ප්‍රදේශවල බිත්තර වී හිඟය. බිත්තර වීවලට විශාල මුදලක් ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. ආදි කාලයේ එහෙම දෙයක් තිබුණේ නැහැ. ගමේ බිත්තර වී ටික මාරු කර ගන්න පුළුවන්කමක් තිබුණා. අද බිත්තර වීවල විශාල හිඟයක් තිබෙනවා. අපේ බස්නාහිර පළාතේම බිත්තර වී බුසල් 121867 කඅවශ්‍යතාවයක් තිබෙනවා. අපි නිෂ්පාදනය කරන්නේ බිත්තර වී බුසල් 68000 යි. 50% කට අඩු ප්‍රමාණයක් තමයි බිත්තර වී නිෂ්පාදනය කරන්නේ. නමුත් අපට බිත්තර වී නිෂ්පාදනය කරන්න පුළුවන්කම තිබෙනවා. අපේ කුඹුරුවල ගොවීන් උනන්දු කරලා බිත්තර වී මිලදී ගන්න විධියේ වැඩ පිළිවෙළක් තිබෙනවා නම් මේක ක්‍රියාත්මක කරන්න පුළුවන්. අද ගොවිතැනට විශාල නිලධාරී පිරිසක් ඉන්නවා.

මම ගරු ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා කෘෂි පර්යේෂණ නිලධාරීවරු ඉන්නවා. කිසි කෙනෙක් කුඹුරට බහින්නේ නැහැ. ඒ අය ඉන්නේ කාර්යාලවල. ගිහිල්ලා, ලෙඩක් ගැන කිව්වාම කියනවා, ගොයම් ගහ ගලවාගෙන එන්න කියලා. මම මේ අත්දැකීමෙන් කියන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. කුඹුරේ ලෙඩක් තිබෙනවා කියලා කෘෂි පර්යේෂණ නිලධාරියාට කිව්වාම, ගොයම් ගහ ගලවාගෙන එන්න කියනවා. ගොවියම් ගහ ගලවාගෙන ගියාම බලලා තමයි බෙහෙත් දෙන්නේ. මොනවා හරි බෙහෙතක් නියම කරන්නේ. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. කුඹුරු වැඩ කළාම සතියකට දින දෙකක්වත් යායවල්වල ඇවිදින්න යොමු කරන්න කියලා. ගිහිල්ලා බලලා අඩුපාඩු සකස් කරන්න කියන්න. ඉස්සර වගා නිලධාරීන් ඉන්න කාලේ කුඹුරට බැහැලා බලලා වැඩ කළා. විශේෂයෙන්ම වැඩියෙන්ම ඉන්නේ කාන්තා කෘෂි පර්යේෂණ නිලධාරීන්. ඒ අයට සාරියක් ඇඳගෙන කුඹුරේ යන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා කුඹුරට බහින්නේ නැහැ. ගියත් ඈත ඉඳලා පෙන්නනලා මොනවා හරි කථා කරනවා. කුඹුරට බැහැලා වැඩ කරන්න පුළුවන් තත්ත්වයක් කෘෂි පර්යේෂණ නිලධාරීන් මාර්ගයෙන් ඇති කරලා මේ ගොවියන්ට සහයෝගය ලබා දීමේ වැඩ පිළිවෙළක් සකස් කරන්නය කියලා මම ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම දේශීය වී නිෂ්පාදනය ගැන වචන කිහිපයක් කථා කරන්න ඕනෑ. දේශීය වී නිෂ්පාදනය ගැන ලොකු උනන්දුවක් දැන් ජනතාව තුළ තිබෙනවා. නමුත් මම වගකීමක් ඇතිව කියනවා. දේශීය වී නිෂ්පාදනය කරලා නියම මිලක් ලබා ගන්න අමාරුයි. සුළු ප්‍රමාණයක් විකුණා ගන්න පුළුවන්. මොකද, හේතුව දේශීය වී නිෂ්පාදනයේදී අපට ආදායම් අඩුයි. අස්වැන්න අඩුයි. අස්වැන්න අඩු වුණත් මිල වැඩියි. විශාල මිලක් තිබෙනවා. නමුත් වෙළඳ පොළත් අඩුයි. ඒ නිසා සාමාන්‍ය ගම්බද ජනතාවට ඒ වෙළඳ පොළ සොයා ගන්න විධියේ වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. නිදර්ශනයක් වශයෙන් ගත්තොත් දේශීය වී වල බිත්තර වී විකුණන්න ඕනෑතරම් අය ඉන්නවා. බිත්තර වී ගෙනැල්ලා දෙන්න. නමුත් වපුරලා ගොයම් ටික කපලා වී ටික ගෙට ගත්තාම විකුණා ගන්න කෙනෙක් නැහැ. මේකයි තත්ත්වය. නමුත් ලොකුවට වෙළඳ පොළක් තිබෙනවා. ඒ නිසා ඔබතුමා මැදිහත් වෙලා මේකට වැඩ පිළිවෙළක් සකස් කරන්න. අද සුපර් මාර්කට්වල දේශීය වී හාල් කිලෝ එකක් රුපියල් 250 යි, 260 යි. වෙළඳ පොළක් තිබෙනවා. නමුත් මේ මිල තිබෙන්නේ කිහිප දෙනෙක් අතේ. ඒ නිසා සාමාන්‍ය ගොවියාට මේ මිල යන්නේ නැහැ. ඒ නිසා ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළොත් අපට එය ඉතා සාර්ථක කර ගන්න පුළුවන් කියලා මම විශ්වාස කරනවා. ඒ වාගේම දැන් රසායනික පොහොර භාවිතය අඩු කිරීමට ජනතාව පෙළ ගැසී ඉන්නවා. ජනතාව සූදානම් වෙලා ඉන්නවා. නමුත් හොඳ ප්‍රමිතියක් තිබෙන කාබනික පොහොර අවශ්‍යයි. අපි දන්නවා ප්‍රාදේශීය සභාවලින් පොහොර නිෂ්පාදනය කරනවා. නමුත් මේකේ ප්‍රමිතිය ගැන ජනතාවට හොඳ විශ්වාසයක් නැහැ. අපේ පර්යේෂණායතන තියෙනවා. ඒ ගැන පර්යේෂණ කරලා මේ පොහොර මිටියේ තියෙන්න ඕනෑ,පොටෑස් මෙපමණයි. මේවායේ මෙපමණ තියෙනවා. යොදන්න පුළුවන් ප්‍රමාණය මෙපමණයි කියලා පැහැදිලිව හරියට තිබුණොත් කාබනික පොහොරවලට ජනතාව නැඹුරු කර ගන්න පුළුවන් වෙනවා.

ඒ වාගේම බිත්තර වී බෙදා දීම ගැන මම විශේෂයෙන් මතක් කරනවා. ඔබතුමා බිත්තර වී බෙදා දෙනවා. මම පසුගිය දවස්වල අගලවත්තේ ගොවිජන සේවා කාර්යාලයට ගියා. යනකොට, දැනුයි දේශීය බිත්තර වී ඇවිල්ලා තියෙන්නේ. වපුරලා ඉවරයි. මම ඇහුවා කොහොමද බෙදන්නේ කියලා. කොහොම හරි බෙදනවා කිව්වා. නමුත් ඒකෙන් නියමිත ඵල ගන්න පුළුවන් වෙන්නේ නැහැ. ගොවිජන නිලධාරීතුමා කිව්වා, දැන් කොහොම හරි මේක බෙදන්න ඕනෑ කියලා. නමුත් එතකොට හුඟක් අය වපුරලා ඉවරයි. නියම කාලයට බිත්තර වී ටික ගිහිල්ලා නැහැ. ඒ වාගේම සමහර තැන්වල බිත්තර වී ටික බෙදන කොට ගොවිජන සංවිධානයෙන් අරගෙන නෑදෑයින්ට, හිතවත් අයට දෙනවා. වපුරන්නේ නැති අයටත් දෙනවා. ඒ අය අරගෙන විකුණනවා. මේවා සාමාන්‍යයෙන් වන දේවල්. ඒ නිසා මම ගරු නියෝජ්‍ය සභාපතිතුමාගේ මාර්ගයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරනවා. බිත්තර වී බෙදා දුන්නාම, ඒ නම් ලැයිස්තු අරගෙන ඔබතුමාගේ නිලධාරීන් ඒ යායට ගිහිල්ලා බලන්න මේවා වපුරලා තියෙනවාද කියලා. එතකොට හරියට නියම කෙනාට බෙදනවා. වැඩ කරන අයට බෙදනවා. සමහර ගම්වල අපට අහන්න තිබෙන දෙයක් තමයි. අපි කුඹුරු වැඩ කරනවා. අපට බිත්තර වී දෙන්නේ නැහැ. පිට අයට නිකන් දෙනවා කියලා. ඒ ගැනත් මම ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. ඒ වාගේම කෘෂිකර්මාන්තය පමණක් නොවෙයි. යායට යන පාරවල් ගැනත් ඔබතුමාගේ වැඩ පිළිවෙළක්

[ගරු පී.ඩී. අබේරත්න]

තිබෙනවා. ට්‍රැක්ටර් පැන්නුම්, යායට පාරවල් දාන එක ගැන. අද දෙමව්පියෝ, ඉඩම් කට්ටි වෙන් කරලා. දරුවෝ බෙදාගෙන. කම්බි ගහලා කොටු කරලා. කුඹුරු යාය සම්පූර්ණයෙන් වැහිලා තියෙන්නේ. ඒ නිසා මේ ගැන අධීක්ෂණයක් කරලා සෑම යායකටම ට්‍රැක්ටරයක් යන්න පුළුවන් පාරක් යොදා ගැනීමට ඔබතුමා යෝජනා කරලා තිබෙනවා. මේක මීට වැඩිය ප්‍රචලිත විය යුතුයි කියලා මම මේ අවස්ථාවේදී ගරු ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා.

ඒ වාගේම පළතුරු. පළතුරු වගාව අපේ රටට විදේශ විනිමය ලබා ගන්න පුළුවන් වැඩ පිළිවෙළක්. රඹුටන් වගාව අපේ ප්‍රදේශවල විශාල වශයෙන් ව්‍යාප්ත වෙලා තිබෙනවා. අන්නාසි වගාව විශාල වශයෙන් ව්‍යාප්ත වෙලා තිබෙනවා. නමුත් මම දන්නවා. පසුගිය කාලයේ ලංකාවට පිටරටින් අන්නාසි ගෙනාවා. ලංකාවේ නිෂ්පාදනය මදි වුණා. මේවාට හරියට වැඩ පිළිවෙළක් නැහැ. මෙවර රඹුටන්වලට වාරයක් නැහැ. හැම තැනම ටික ටික හැදිලා. ඊළඟ පාර රඹුටන් හැදෙන්නේ නැහැ. ඊට කලින් පාර හොඳට හැදුනා. හොඳට හැදුනාම විකුණා ගන්න පුළුවන්කමක් නැහැ. අපේ ශීතාගාර ඇති කරලා, මේවා පරිස්සම් කරලා තියා ගන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක්, ටින් කරන වැඩ පිළිවෙළක් තියෙනවා නම් නියම මිලක් ලබා ගන්න පුළුවන්. දැන් මේ කන්නයේ නියම වෙලාවට නැතුව රඹුටන් ගස්වල ගෙඩි තියෙනවා. පෙලක් ඒවායේ මල් තියෙනවා. මේකෙන් වෙන්නේ, ඊළඟ කන්නයේ රඹුටන් නැහැ. එතකොට ගණන් යනවා. ආයෙත් ඊළඟ කන්නයේ වැඩියෙන් හැදුනාම මිලක් නැහැ. විකුණා ගන්න බැහැ. ඒ වාගේ තත්ත්වයක් තිබෙනවා. රඹුටන්, අන්නාසි, කෙසෙල් මේ සෑම දෙයක්ම. ඊළඟට ගස්ලබු. මම දැක්කා ගස්ලබු වගාව ගැන ඔබතුමාගේ පොතේත් සඳහන් කරලා තිබෙනවා. අද රෙඩ් ලේඩි වවනවා මිසක් අපේ අනෙක් ගස්ලබු අඩුයි. නමුත් රෙඩ් ලේඩි කියන ජාතිය ජාන සම්බන්ධ කරලා හදපු එකක්. මම හිතන්නේ අපේ දේශීය ගස්ලබු තරම් ගුණයක් නැහැ. නමුත් අද හුඟ දෙනෙක් භාවිතා කරන්නේ ඒක. ඒ වාගේම අපේ රටේත් නැති වීගෙන යනවා. අර පිටිමකුණා කියන රෝගය දැන් මේ ගස්ලබුවලටත් වැළඳිලා. රඹුටන්වලටත් ගිහිල්ලා. පළතුරු වගාව විනාශ වන වැඩ පිළිවෙළක්. මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. අපේ රටේ තිබුණු පෙයාර්ස් අද එක ගෙඩියක් දකින්න නැහැ. සම්පූර්ණයෙන් විනාශ වෙලා. ඇපල් තමයි ඔක්කෝම කන්නේ. අපේ සල්ලි ටික පිටරට යනවා.

අපි ඊළඟ තර්ජනයට මුහුණ දීලා තිබෙනවා. දොඩම්. ඉස්සර ගෙයක් ගෙයක් ගානේ දොඩම් තිබුණා. බිබිලේ දොඩම් වතු තිබුණා. අද කොහේද තියෙන්නේ? නැහැ. අද පිටරටින් දොඩම් ගේන්නේ. ඔක්කෝම සල්ලි පිටරටට යනවා. අපේ දේශීය පළතුරු විනාශ වීමේ උපක්‍රමශීලී වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙලා.අපේ රටේ දේශීය නිෂ්පාදනය නැති කරලා.විදේශයෙන් ගෙන එන පළතුරුවලට අපි ඇබ්බැහිවීම තුළින් අපේ කෝටි ගණනක් මුදලක් විදේශ රටවලට යනවා. එහෙම නම් අපේ රටේ නිෂ්පාදනයක් කරනවා නම්, අපේ රටේ මුදල් ඉතිරි වෙනවා. අපේ දේශීය නිෂ්පාදනය වැඩි කරලා, ආදායම් වැඩි කරගන්න පුළුවන්කමක් ලැබෙනවා. අපේ රටේ මුදල් පිටරටට යෑම තුළින් අපේ ජීවන රටාව තව තවත් පහළට වැටෙන වැඩ පිළිවෙළක් යන්නේ. ඒ නිසා අපේ දේශීය පළතුරු වර්ග ආරක්ෂා කර ගන්න විශේෂ අවධානය යොමු කරන්න කියලාඔබතුමාගේ දැඩි අවධානය යොමු කරනවා.

ඒ වාගේම එළවළු වගාව. විශේෂයෙන්ම අපි බස්නාහිර පළාතම බැලුවොත් එළවළු වගාව අඩුයි. අපි හුඟක් දඹුල්ලෙන් එළවළු ගේනවා. නුවර එළිය පැත්තෙන් ගේනවා. පිට පළාත්වලින් ගේන්නේ. අපේ බස්නාහිර පළාතට විශාල එළවළු ප්‍රමාණයක් ගෙන එනවා. නමුත් අපේ බස්නාහිර පළාතේ ඕනෑ තරම් එළවළු වවන්න පුළුවන්. කොළඹ, ගම්පහ, කළුතර වවන්න පුළුවන්. අද අපට ආවේණික එළවළු විතරක් නොවෙයි. කැරට්, බෝංචි, ගෝවා, රාබු මේවා ඔක්කෝම අපේ ප්‍රදේශවල වැවෙනවා. හොඳට වවන්න පුළුවන්කම තිබෙනවා. මේ වැඩ පිළිවෙළ වැදගත් විධියට සලකනවා. අද ඔබතුමාගේ වැඩ පිළිවෙළක් තිබෙනවා. ගොවි සංවිධාන ඇති කරනවා. ගොවි කමිටු ඇති කරලා තිබෙනවා. ගෙවතු වගා වැඩ පිළිවෙළක් තියෙනවා. සෑම ග්‍රාම සේවක කොට්ඨාශයකම විස්සක් ඇදන් තිබෙනවා. මේක ඉස්සෙල්ලාත් තිබුණා අපි දැක්කා. ඒකට එකතු වුණේ, පිරිමි අය. අද ගෙවිලයෝ තමයි වැඩියෙන් ඉන්නේ. ඒක සාර්ථකයි. මම දැක්කා. සාර්ථක වැඩ පිළිවෙළක්. සෑම ග්‍රාම සේවක කොට්ඨාශයකම ගෙවිලියෝ 20 ක් එකතු කරලා ගෙවතු වගා වැඩ සටහනක් යනවා. ඒක ප්‍රාදේශීය

මට්ටමෙන් තෝරනවා. දිස්ත්‍රික් මට්ටමෙන් තෝරනවා. මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් පත් වන පළමුවැනි තුන්දෙනාට තෑග්ගක් දෙන්න. තවත් දිරිමත් වෙන්න. දිස්ත්‍රික් මට්ටමේ අයට තෑග්ගක් දෙන්න. තවත් දිරිමත් වෙන්න. මේක හොඳ වැඩ පිළිවෙළක්.

ගෙදරක එළවළු හිටවා ගන්නවා කියන්නේ, අපේ ප්‍රදේශය තුළ මුදල් සංසරණය විශාල වශයෙන් වැඩි කරන්න පුළුවන්. එක සති පොළකට මාසයකට කෝටියකට වැඩිය එළවළු ගෙන එනවා. හොරණ නගරය බැලුවොත් අපේ ගරු නියෝජ්‍ය සභාපතිතුමාත් දන්නවා. කෝටියකට වැඩිය එළවළු හොරණ නගරයට ගෙන එනවා. හොරණ නගරයේ වෙළෙන්දෝ අපට අවශ්‍ය එළවළු ටික වැව්වොත් කෝටි ගණනක් අපට ඉතුරු වෙනවා. අපේ මුදල් ප්‍රදේශයේ සංසරණය වීමේ වේගය වැඩි වෙනවා. ඒ කියන්නේ අපේ සාක්කුවට වැඩියෙන් සල්ලි ලැබෙනවා. මේක හොඳ වැඩ පිළිවෙළක්. මේ වැඩ පිළිවෙළ තවත් තීව්‍ර කරන්න අපට අවශ්‍ය එළවළු ටික වවා ගත්තොත් බස්නාහිර පළාතේ විශාල ලෙස මුදල් සංසරණය වැඩි කරන්න පුළුවන්, වැඩ පිළිවෙළක් වෙනවා. මේක බැරි වැඩක් නොවෙයි. පුළුවන් වැඩක්. මේකට යොමු කරවන්න. අනෙක් එක තමයි කාබනික පොහොර යොදලා එළවළු වවනවා නම් අද රුපියල් 1000 යි එළවළු කිලෝ එකක්. රුපියල් 1000 ට ගන්න අය ඉන්නවා. අපේ ගමේ අහිංසක ගොවියෙක් කාබනික පොහොර දාලා වවන එළවළු ටිකක් රුපියල් 200 ට 250 ට දුන්නොත් විශාල වශයෙන් එළවළු වැවීම පටන් ගන්නවා. ඔබතුමා විධිමත් වැඩ පිළිවෙළක් යොදලා සුපර් මාර්කට්වල අයත් එක්ක කථා කරලා කාබනික පොහොර යොදලා වගා කිරීම පටන් ගත්තොත් ග්‍රාමීය මිනිස්සුන්ට විශාල ආදායම් මාර්ගයක් ලබන්න පුළුවන්. මේක හොඳ වැඩ පිළිවෙළක්. හොඳ ව්‍යාපෘතියක්. දුගී දුප්පත් මිනිස්සුන්ගේ සල්ලි - අක්කර කාලක් තිබුණත් ඇති එළවළු වවන්න. එළවළු වගාවත් එක්ක සත්ව පාලනයත් යන්න ඕනෑ. අක්කර කාලක් භාගයක් තිබෙන මිනිහෙකුට එළදෙන්නු දෙන්නෙකුත් දුන්නොත් එහෙම, තමුන්ගේ ජීවන රටාව ගෙනියන්න වෙන මොනවත් අවශ්‍ය වෙන්නේ නැහැ. වී ටික විකුණන්න පුළුවන්. පොහොර ටික ගන්න පුළුවන්. එළවළු ටික වගා කරන්න පුළුවන්. විශාල ආදායමක් ලබන්න පුළුවන්. ඒ වාගේ ව්‍යාපෘතියක් සකස් කරලා අපි ගම්මාන හදමු. අපේ ප්‍රදේශවල ඉඩකඩම් තිබෙන මිනිස්සු ඉන්නවා. මම ඔබතුමාට යෝජනා කරනවා. මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා අගලවත්ත මැතිවරණ කොට්ඨාශයේ ඕනෑතරම් ඉඩම් තිබෙනවා. අපි සම්පූර්ණ ගමක් එකතු කරලා එළවළු වගාවත් එක්ක කිරි ගම්මානයක් හදමු. මුළු ගමටම ආදර්ශයක් දුන්නොත් එහෙම විශාල සංවර්ධනයක් කරන්න පුළුවන්කම ලැබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

මට තව විනාඩියක් දෙන්න. මම විශේෂයෙන් මතක් කරනවා. මගේ අගලවත්ත මැතිවරණ කොට්ඨාශයේ පාලින්ද නුවර ගොවිජන සේවා මධ්‍යස්ථානයේ මුරකරුවෙක් නැහැ. කම්කරුවෙක් නැහැ. ඉතාම අමාරුවෙන් ගෙනියන්නේ. නමුත් දිස්ත්‍රික්කයේ පළමුවැනි තැනට ආවේ පාලින්ද නුවර ප්‍රාදේශීය සභාවේ ගෙවත්ත. විශාල වෙහෙස මහන්සියක් ගන්නවා. ඊළඟට පොහොර ගබඩාවේ වහළය කැඩිලා. ගොවිජන සේවා මධ්‍යස්ථානයේ වහළය කැඩිලා. මේ වාගේ දුෂ්කරතා තිබෙනවා. නමුත් ඒ අය වැඩ කරනවා. මේවායේ අඩුපාඩු සකස් කරලා දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම මිරිදිය වගාව. මම මිරිදිය මසුන් වගාව ගැනත් කියනවා. අපි වියට්නාමයේ ගියා. රට අභ්‍යන්තරයේ පාවිච්චි කරන්නේ මිරිදිය මසුන් විතරයි. මොකද, පෝෂණය වැඩි නිසා. අපේ රටේ ඕනෑතරම් මිරිදිය මසුන් වවන්න පුළුවන්කම තිබෙනවා. ඒ වාගේම සුරතල් මත්ස්‍ය ව්‍යාපාරය. අපේ කළුතර දිස්ත්‍රික්කයේ බොල්ගොඩ මිටියාවතේ වහුරු බිම් ප්‍රමාණය අක්කර 35,000 යි. නිකන් කැලේ වැවිලා තිබෙන්නේ. මිරිදිය මසුන් හදන්නත් පුළුවන්. සුරතල් මසුන් හදන්නත් පුළුවන්. ලක්ෂ ගණනක රස්සාවල් ලබා දෙන්න පුළුවන්. ඔබතුමාට මම යෝජනා කරනවා වැඩ පිළිවෙළක් සකස් කරන්න. අපේ කළුතර දිස්ත්‍රික්කයේ හොඳ වැඩ පිළිවෙළක් සකස් කරන්න පුළුවන්. මිරිදිය මසුන් හදන්න පුළුවන්. ඒ වාගේම සුරතල් මසුන්ට ලොකු ඉල්ලුමක් තිබෙනවා.මම හිතන්නේ, ලෝකයේ සුරතල් මසුන් ඉල්ලීමට 8% කවත් සැපයුමක් නැහැ. අපට හොඳ වෙළඳ පොළක් තිබෙනවා. හොඳ ආදායමක් ගන්න පුළුවන්. මේවාට විශේෂ වියදමක් කරලා සුරතල් මසුන්

[ගරු පී.ඩී. අබේරත්න]

ව්‍යාපාරය, ඒ වාගේම මිරිදිය මසුන් ව්‍යාපාරය ක්‍රියාත්මක කරන්න අපේ දේශීය ජනතාවට පෝෂණීය ආහාර වේලක් ලබා දෙනවා වාගේම හොඳ මිලක් ලබා ගන්න පුළුවන්කම තිබෙනවා. එතුමාගේ මේ පොතේ සඳහන් වන වැඩ පිළිවෙළ, මීට වැඩිය ප්‍රදේශය ගැන අවබෝධයක් ලබා ගෙන කටයුතු කළොත්, මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න පුළුවන් කියලා මම විශ්වාස කරනවා. කාලය ඉකුත් වෙලා තිබෙන නිසා මම මීට වැඩිය කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ගරු ඇමැතිතුමා වෙහෙස මහන්සිය ගැන ස්තුතිවන්ත වන අතර, එතුමාගේ මේ වැඩ පිළිවෙළ ඉදිරිපත් කරලා ලබන වර්ෂයේ මීට වැඩිය අපේ ප්‍රදේශ තුළ ආර්ථික සංවර්ධනයක් ඇති කරන්න එතුමාගේ අමාත්‍යාංශයට හැකි වේවා කියලා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

[පූ.භා. 11.23]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම කෘෂිකර්ම, ඉඩම්, වාරි මාර්ග, ධීවර හා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය, ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශ වැය ශීර්ෂය වෙනුවෙන් කථා කරන්න විනාඩි 10 ක් ලබා දීම ගැන ඔබතුමාටත්, ඒ වාගේම ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා. අපි සන්තෝෂ වෙනවා. විශේෂයෙන්ම, ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා කියන්නේ අවුරුදු 20 කට ආසන්න කාලයක් පළාත් සභාව තුළත්, ඒ වාගේම ප්‍රාදේශීය සභාවේ සභාපති හා විපක්ෂ නායක හැටියට අවුරුදු ගණනාවක් වැඩ කරපු කෙනෙක් හැටියටත් ඒ වාගේම පාර්ලිමේන්තුව නියෝජනය කරපු මන්ත්‍රීවරයෙක් හැටියටත් අත්දැකීම් සම්භාරයක් තිබෙන, ඒ වාගේම මේ පළාත් සභාව තුළ අමාත්‍යවරයෙක් හැටියට විෂයයන් ගණනාවක වැඩ කරපු කෙනෙක් හැටියට - මොකද, අපි 2004 දී පළාත් සභාවට එනකොටත් අපි දැක්කා, එතුමා සමූපකාර, ක්‍රීඩා වාගේ අමාත්‍යාංශ ගණනාවක, වසර ගණනාවක අත්දැකීම් තිබෙන අමාත්‍යවරයෙක්. ඒ නිසා අපි මේ මොහොතේ කියන්න ඕනෑ. 2016 එතුමාට PSDG - පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හැටියට රුපියල් මිලියන 250 ක් ලැබුණා. ඒ වාගේම පළාත් සංවර්ධන හැටියට රුපියල් මිලියන 110 ක් ලැබුණා. හැබැයි අපි කනගාටු වෙනවා. මොකද, පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා කථා කරන වෙලාවේ මේ වැඩ සටහන් ක්‍රියාත්මක කරන්න යෝජනා ගණනාවක් සහ මේ වාගේ තත්ත්වය පැහැදිලි කරන කොට අපි දැකපු දේ තමයි, මධ්‍යම ආණ්ඩුවෙන් ගියපාර පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදානවලට රුපියල් මිලියන 250 ක් ලබා දුන්නා වගේම මේ වසරේ ලබා දීලා තිබෙන්නේ, රුපියල් මිලියන 41 යි. ඒ කියන්නේ, ලක්ෂ 410 යි. මේ අවුරුද්දේ 2016 ට ලක්ෂ 2500 ක් ලබා දුන්නු එක, ලක්ෂ 410 ක් තමයි මධ්‍යම ආණ්ඩුවෙන් ලබා දීලා තිබෙන්නේ. අපි ඉතිහාසය ගත්තොත් 2012 පළාත් නිශ්චිතවලට රුපියල් මිලියන 137 ක්, 2013 රුපියල් මිලියන 45 ක්, ඒ වාගේම 2014 රුපියල් මිලියන 54 ක්, 2015 රුපියල් මිලියන 83 ක්, 2016 රුපියල් මිලියන 250 සහ 2016 රුපියල් මිලියන 41 ක් නැවත විශාල වශයෙන් මුදල් අඩුවීමක් තිබෙනවා.

ඒ වාගේම පළාත් සංවර්ධන ප්‍රදාන ගත්තොත් මේ වසරේ 110 ක් ලැබුණා.ඒ වාගේම ලබන වසරේ මම හිතන්නේ ප්‍රධාන ඇමැතිතුමාත්, අමාත්‍ය මණ්ඩලයත් කථා කරලා පළාත් නිශ්චිත සංවර්ධන මුදල් අඩු වුණු නිසා විශේෂයෙන්ම පළාත් සංවර්ධන මුදල්වලින් එතුමාට රුපියල් මිලියන 200 ක් ඒ කියන්නේ ලක්ෂ 2000 ක මුදලක් මේ වනකොටත් ලබා දීමට කටයුතු කරලා තිබෙනවා. 2012 ඉඳලා ඉතිහාසය බැලුවොත් පළාත් සංවර්ධන මුදල්වලින් 2012 දී රුපියල් මිලියන 200 ක්, 2013 දී රුපියල් මිලියන 250 ක්, 2014 දී රුපියල් මිලියන 165 ක්, 2015 දී රුපියල් මිලියන 110 ක් සහ 2016 දී රුපියල් මිලියන 110 ක් ලබා දී තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා අපි ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමාට මතක් කරලා දෙනවා මේ අවුරුද්දේ වැඩිපුර මුදල් තිබෙන්නේ, පළාත් සංවර්ධන මුදල්. අපි මීට ඉහත අයවැය සම්බන්ධයෙන් සාකච්ඡා කරන අවස්ථාවේදීත්, ඒ වාගේම ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අයවැය සාකච්ඡාවේදීත් එතුමා පොරොන්දුවක් වුණා, ලබන අවුරුද්දේ පළාත් සංවර්ධන මුදල්වලට අවුරුද්ද මුල මේ ව්‍යාපෘති අනුමත කරලා, පළමු මාස 06 දී අපි ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න පටන් ගත්තොත් අපට මීට වැඩිය ප්‍රගතියක් ලබා ගන්න පුළුවන් කියලා. මොකද, මේ අවුරුද්දේ රුපියල් මිලියන 250 මාස 10 ප්‍රගතිය බැලුවොත් රුපියල් මිලියන 88 ක් තමයි වියදම් කරලා තිබෙන්නේ. අමාත්‍යාංශයේ ප්‍රගතිය 35% යි. ඒ වාගේම පළාත් සංවර්ධන මුදල් රුපියල් මිලියන 110 ක් ලැබුණු

එකේ මාස 10 ක් වනකල් වියදම් කරලා තිබෙන්නේ, රුපියල් මිලියන 22 යි. 21% යි ප්‍රගතිය. හැබැයි, අපි එක පැත්තකින් අමාත්‍යතුමාට දොස් කියන්නේ නැහැ. මොකද, වියදම් වුණු මුදල කිව්වාට සමහර විට අනුමත වුණු ව්‍යාපෘති සංඛ්‍යාව ක්‍රියාත්මක කරලා ඉවර වෙලා මුදල් ලබා ගන්න කොට ගරු ප්‍රධාන ඇමැතිතුමා ප්‍රකාශ කළ පරිදි සාමාන්‍යයෙන් දෙසැම්බර් මාසේ 31 වෙනවා. ඒක අපි පිළිගන්නවා. නමුත් ලබන අවුරුද්දේ ඔබතුමාට පළාත් සංවර්ධන මුදල්වලින් රුපියල් මිලියන 200 ක් වෙන් වෙලා තිබෙන නිසා අපි විශ්වාස කරනවා, අපි යෝජනා කරපු පරිදි අමාත්‍යාංශ මට්ටමින් ව්‍යාපෘති අනුමත කරලා, පළමු මාස 06 දී මේ මුදල වියදම් කරන්න පුළුවන් අවස්ථාවක් ඔබතුමාට ලැබෙයි කියලා. මොකද, අපි කවුරුත් දන්නවා මුල් මාස 06 දී වැඩ කිරීම මේ පළාත් සභාව තුළත්, මධ්‍යම ආණ්ඩුවේත් මඟ හැරලා, ඉතුරු මාස 06 තමයි වැඩ කටයුතු කරන්නේ. නමුත් අපි පළාත් සභාවක් හැටියට ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ අපි සියලු දෙනාම එදා සාකච්ඡාවේදී ඉල්ලීමක් කළා, මේ මුල් මාස 06 තුළ වැඩ කළොත් අපට වැඩි වැඩ කොටසක් කරන්න පුළුවන් කියලා.

නමුත් තමුන්නාන්සේට මතක් කරන්න ඕනෑ. තමුන්නාන්සේගේම අමාත්‍යාංශයේම මුදල් සොයා ගැනීමේ පිළිවෙළක් තිබෙනවා. ඒක තමයි ඉඩම් සම්බන්ධව තිබෙන වැඩ පිළිවෙළ. මොකද, මම ගිණුම් කාරක සභාවේ සභාපතිවරයා හැටියටත්, මේකේ ඉන්න අනෙක් කාරක සභිකයෝ හැටියටත් අපි සියලු දෙනා ඒකරාශී කරගෙන - අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා ඉන්නවා. අපි හැමදාම කථා කරන දෙයක්. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 40 බැලුවොත් රුපියල් මිලියන 1000 කට වැඩි ප්‍රමාණයක් මුදල් වශයෙන් ඒකරාශී වෙන්න තිබෙනවා. ඉඩම් වල බදු මුදල් හැටියට. ඒකෙන් වැඩි කොටසක් තිබෙන්නේ, එනම් 85% ක් තිබෙන්නේ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ. හැබැයි ඔබතුමාගේ මාර්ගයෙන් අපි ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා මේ ගැන අවධානය යොමු කරන්න. මේකට කමිටුවක් පත් කරලා, මන්ත්‍රීවරුත් ඒකට ඒකරාශී කරගෙන ඔබතුමා යම්කිසි වැඩ පිළිවෙළක් 2017 දී ක්‍රියාත්මක කළොත් ඔබතුමාට මේ මුදල් ලැබුණාම ගරු ප්‍රධාන ඇමැතිතුමාත් එක්ක සාකච්ඡා කරලා මීටත් වැඩි මුදල් ලබාගෙන තමුන්නාන්සේගේ අමාත්‍යාංශය ශක්තිමත් කරන්න පුළුවන්. මොකද, එක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක රුපියල් මිලියන 800 කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. මොකද, මම දැක්කා. මේ පොතේත් දාලා තිබෙනවා, ඕර්ටස් ක්‍රීඩා සමාජයෙන් අවශ්‍ය මේ මුදල් ටිකට, ඒ නිලධාරීන් කැඳවලා, අමාත්‍යාංශ නිලධාරීන් ගෙනැල්ලා, ඒ වාගේම ගෙවන්න තිබෙන ආයතන ගෙන්නලා -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

රජයේ ආයතනත් තියෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

රජයේ ආයතනයත් තියෙනවා. ඒ සියලු ආයතන ගෙනැල්ලා විශේෂයෙන්ම මන්ත්‍රීවරු එක්ක සාකච්ඡා කරලා ඔබතුමා කමිටුවක් පත් කළොත්, ඔබතුමාට ලබන වසරේ මීට වැඩි මුදල් සම්භාරයක් එකතු කර ගන්න පුළුවන්. ඒ මුදල් ටික ප්‍රධාන ඇමැතිතුමට, පළාත් සභාවට හොයලා දුන්නාම ඔබතුමාටත්, ඔබතුමාගේ අමාත්‍යාංශය ශක්තිමත් කරන්න මුදලක් ලබා ගන්න පුළුවන් කියලා ලොකු විශ්වාසයක් තිබෙනවා. මොකද, මේක කරන්න පුළුවන් දෙයක්. බැරි දෙයක් නොවෙයි. මේ ගෙවන්න පුළුවන් ආයතන. ඒ වාගේම සාකච්ඡා මාර්ගයෙන් ගන්න පුළුවන් ආයතන. ඒකට උදාහරණයක් තිබෙනවා. ඔබතුමාට මතකයි. අපේ ගිණුම් කාරක සභාවේ නියෝගයක් අනුව එයිටි ක්‍රීඩා සමාජය ඔබතුමා කැඳවූවා. ඒ වාගේම ඔබතුමා ආයතනය කැඳවූවා. නිලධාරීන් කැඳවූවා. එකඟතාවයකට ඇවිල්ලා අද හිඟ මුදලුත් එක්ක ගෙවාගෙන යනවා. ඒ නිසා අපි ගරු ඇමැතිතුමාට යෝජනා කරනවා. අනෙක් ආයතන ගැනත් වැඩි අවධානයක් යොමු කරලා, මේ ගැන ක්‍රියාත්මක වෙන්න කියලා.

ඒ වාගේම තමයි සුළු වාරිමාර්ග. ඔබතුමා දන්නවා. මීට ඉහත පැවති රජයේදී විශේෂයෙන්ම ගම්පහ දිස්ත්‍රික්කයේ හිටපු නායකයෙක් හැටියටත්, ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා හැටියටත් බැසිල් රාජපක්ෂ මැතිතුමා ගංවතුර උවදුරෙන් ඒ ප්‍රදේශ බේරා ගන්න යන්ත්‍රෝපකරණ දාලා, විශේෂයෙන්ම බැකෝ යන්ත්‍ර, එක්ස්කැවේටර් යන්ත්‍ර, බාච් වාගේ උපකරණ අරගෙන මේ සුළු වාරිමාර්ග පවිත්‍ර කිරීමෙන් සහ වැඩි දියුණු කිරීමෙන් තමයි ගංවතුර උවදුර පාලනය කර ගත්තේ. මේ වසරේත් ඔබතුමා අමාත්‍යාංශයේ මුදල්වලින් මිනි එක්ස්කැවේටර් යන්ත්‍ර දෙකක්, බාච් දෙකක් අරගෙන

[ගරු මෙරිල් පෙරේරා]

තිබෙනවා. 2017 වසරටත් මේ වාගේ එක්ස්කැවේටර් යන්ත්‍ර සහ බාව් අරගෙන ඒ වාගේම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ අද වැඩ කරන්නේ නැතුව නිකරුණේ බැකෝ මැෂින් ගණනාවක් තිබෙනවා. ඔබතුමා විශේෂයෙන්ම අපේ පළාත් මාර්ග සම්බන්ධයෙන් කටයුතු කරන ලලිත් වනිගරත්න ගරු ඇමැතිතුමාත් එක්ක සාකච්ඡා කරලා, ඒ අවශ්‍ය යන්ත්‍රෝපකරණත් ලබාගෙන මේ අවුරුදු ගණනාවක් සුළු වාරිමාර්ග පාළුවට ගිය ඒවා. ඒ දවස්වල සුද්ධ පවිත්‍ර කරලා වැඩි දියුණු කළා වාගේම නැවතත් දිස්ත්‍රික්ක තුනට බෙදලා සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩ සටහනක් නැවත ක්‍රියාත්මක කරන්න කියලා ඉල්ලීමක් කරනවා. මොකද, ඒක අත්‍යවශ්‍යම නිසා. අපි දකිනවා සුළු වාරිමාර්ගවල පාරවල් වැහිලා. ඒ වාගේම වල් බිහි වෙලා. අවහිර වෙලා. ඒ වාගේ සුළු වාරිමාර්ග ගණනාවක් තිබෙනවා. මේ සුළු වාරිමාර්ගවලට වග කියන්න ඕනෑ, අපේ පළාත් අමාත්‍යාංශය නිසා. පළාත් අමාත්‍යවරයා හැටියට ඔබතුමාට වගකීමක් තිබෙනවා, දිස්ත්‍රික්ක තුනේම සුළු වාරිමාර්ග වැඩි දියුණු කිරීමට අවශ්‍ය පියවර ගැනීමට.

ඒ වාගේම තමයි මම මේක ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ වැය ශීර්ෂයේදී කථා කරන්න හිටපු එකක්. නමුත් ඒ වෙලාවේ වෙලාව ලැබුණේ නැති නිසා අද ඔබතුමාගේ අමාත්‍යාංශයටත් ඒක අයිති නිසා ඔබතුමාගේ වැය ශීර්ෂ සාකච්ඡාවේදී මේක කියනවා. මම හිතනවා මේ වෙලාවේ ප්‍රධාන ලේකම්තුමා හිටියා නම් හොඳයි කියලා. මොකද, ප්‍රධාන ලේකම්තුමා නැති වුණත්, ප්‍රධාන ලේකම් කාර්යාලය නියෝජනය කරන නිලධාරීතුමියන් ඉන්න නිසා මේක මතක් කරන්න කියලා ඉල්ලීමක් කරනවා. මොකද, අද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මේ පළාත් රාජ්‍ය සේවයට අයත් නිලධාරීන් 7 දෙනෙක් එතැන සේවය කරනවා. ප්‍රධාන අමාත්‍යාංශයෙන් ගත්තොත් සැලසුම් නිලධාරිතුමිය.

ඒ වාගේම කෘෂිකර්ම අමාත්‍යාංශය හැටියට ගත්තොත් ඉඩම් සංවර්ධන සහකාර.

අධ්‍යාපන අමාත්‍යාංශය ගත්තොත් ක්‍රීඩා නිලධාරී.

අධ්‍යාපන ක්‍රීඩා අමාත්‍යාංශය ගත්තොත් සංස්කෘතික නිලධාරී.

සෞඛ්‍ය අමාත්‍යාංශය ගත්තොත් සමාජ සේවා නිලධාරී.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නිලධාරීන් හත් දෙනෙක් මේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වැඩ කටයුතු කරනවා. නමුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගියාම අපි දකින දෙයක් තමයි ක්‍රීඩා නිලධාරී ඉන්නේ, එක දිහාවක.සංස්කෘතික නිලධාරී ඉන්නේ තවත් දිහාවක. මේ නිලධාරීන් හත් දෙනා ඉන්නේ ස්ථාන හතක. මම විශේෂයෙන්ම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී, ප්‍රාදේශීය ලේකම්තුමාගෙන් ඉල්ලීමක් කළා. මේ නිලධාරීන් හත් දෙනාවම එක තැනකට ස්ථානගත කරලා දෙන්න. පළාත් සභාව වෙන් කරලා, පළාත් සභාවේ නිලධාරීන් හැටියට නම් කරලා දෙන්න. ඒ අවශ්‍ය උපකරණ පහසුකම් ටික අපි පළාත් සභාව තුළින් අමාත්‍යාංශය හරහා ලබා දෙන්නම් කියන ඉල්ලීම කළා. සන්තෝෂයෙන් කියන්න ඕනෑ. එතුමා ඒක අනුමත කරලා මට මේ ලිපිය එවලා තිබෙනවා.

*"2016.10.10 වන දින පැවැති ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී ඔබතුමා විසින් කරන ලද යෝජනාව අනුව බස්නාහිර පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත පළාත් රාජ්‍ය සේවා නිලධාරීන් ගණනාවක් සිටින බැවින්, වඩා ඵලදායී සහ කාර්යක්ෂම සේවයක් සැපයීමට අවශ්‍ය වන කාර්යාලය උපකරණ පළාත් සභාව මගින් ලබා දිය හැකි බවත්, අවශ්‍ය උපකරණ ලැයිස්තුව 2017 වර්ෂයේ ව්‍යාපෘති ලේඛනයට ඇතුළත් කිරීම සඳහා ලබා දෙන ලෙසත් කරන ලද ඉල්ලීම කාලෝචිත බවත් රාජ්‍ය නිලධාරීන්ට දැනුම් දෙමි. අවසාන වශයෙන් මෙම යෝජනාව ඉතා අගය කරමි"* කියලා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් ඉල්ලීමක් කරනවා. මේ අමාත්‍යාංශය පහේම නිලධාරීන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉන්නවා. මේ හැම අවුරුද්දේම

කාර්යාල උපකරණ සඳහා මුදල් වෙන් කරනවා. ඒ මුදල් වෙන් කිරීමේදී ප්‍රධාන ලේකම්තුමාගේ වගකීමක් තමයි අමාත්‍යාංශ පහේම ලේකම්වරු දැනුවත් කරලා මේ අවශ්‍ය උපකරණ, අවශ්‍ය ලැයිස්තුව 2017 වර්ෂයේ ලබා දුන්නොත් අපට ඒක ලොකු ශක්තියක් වෙනවා. මොකද, හේතුව ජනතාව මේ නිලධාරීන් හොයන්න ගියාම, එක් එක් තැන්වලට යන්න ඕනෑ. ලොකු අපහසුතාවයකට පත් වෙනවා. ඒ නිසා එක තැනකට ස්ථානගත කිරීමෙන් අපේ වැඩ කටයුතු ක්‍රියාත්මක කරන්නත්, අපේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්නත් -විශේෂයෙන් ජනතාවට ඵලදායී සේවාවක් ලබා දෙන බවට විශ්වාසය තිබෙන නිසා මම විශ්වාස කරන මේක - මේ වෙලාවේ ගරු ප්‍රධාන ඇමැතිතුමා නැති වුණත් ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරයෙක් හැටියට ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා ඉන්න නිසා ප්‍රධාන ඇමැතිතුමා සමග සාකච්ඡා කරලා කැබිනට් එකේ අනුමැතිය අරගෙන අමාත්‍යාංශ පහේම නිලධාරීන්ට අවශ්‍ය පහසුකම් ටික ප්‍රධාන ලේකම්තුමා හරහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබා දෙන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[පූ.භා. 11.35]

**ගරු රොයිස් විජිත ප්‍රනාන්දු**
Hon. Roise Vijitha Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගෞරවනීය මන්ත්‍රීවරුනි, කෘෂිකර්ම, ඉඩම්, ධීවර, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශ වැය ශීර්ෂය වෙනුවෙන් මට කථා කරන්න ලැබීම පිළිබඳව මගේ ගෞරවනීය ස්තූතිය පුද කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා නියෝජනය කරන මැතිවරණ කොට්ඨාශයට, නැත්නම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට කෘෂිකර්මාන්තය දැඩි ලෙස බල නොපෑවත් ඒ ගැනත් යමක් කියමින් ධීවර විෂයය පථය ගැන මම කථා කරන්න අදහස් කරනවා.

මම දකිනවා, කෘෂිකර්මාන්තය තුළින් අද මේ රටේ තරුණ කොටස් ඉවත් වෙමින් පවතිනවා කියලා. ඒ තරුණ කොටස් ඒ කෘෂිකර්මාන්තය සඳහා යොදවා ගන්නවා නම්, මේ අමාත්‍යාංශය තුළින් ආකර්ෂණීය වැඩ පිළිවෙළක් සකස් කරලා ඒ ආකර්ෂණීය වැඩ පිළිවෙළ තරුණ කොටස්වල සිත් දිනා ගැනීම සඳහා ව්‍යාප්ත කළ යුතුයි කියන යෝජනාව මම ගරු නියෝජ්‍ය සභාපතිතුමා මගින් ගරු ඇමැතිතුමාට කරනවා. එසේ නොවුණොත්, ඉදිරියේදී කෘෂිකර්මාන්තය දැඩි අර්බුදයකට ලක් වන ස්වභාවයක් මේ රටේ පවතිනවා කියන එකත් මම මේ අවස්ථාවේ මතක් කරනවා. තරුණ කොටස්වල සිත් දිනා ගැනීම සඳහා ආකර්ෂණීය වැඩ පිළිවෙළවල් දියත් කරනවා වාගේම ඔවුන්ගේ නිෂ්පාදනවලට නිසි වෙළඳ පොළක් සහ ඔවුන්ට යම් ආදායමක් ලැබෙන, තරුණ කොටස්වල වියදමට සරිලන ආදායමක් ලැබෙන වෙළඳ පොළක් ඒ කෘෂිකර්මාන්තය තුළින්ම සකස් කළ යුතුයි කියලාත් මම විෂයය භාර අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරනවා.

ඒ වාගේම පසුගිය කාලයේ ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා මීගමුව මැතිවරණ කොට්ඨාශයට, මට ලක්ෂ 7 ½ ක මුදලක් ලබා දුන්නා. ඒ ලබා දුන්නේ වාරිමාර්ග හරහා ජලය සැපයෙන මාර්ගයක් පිළිසකර කරලා එහි අවසාන ප්‍රතිඵලය කෘෂිකර්මාන්තයේ නියැලෙන ගොවීන්ට පරිහරණය කරලා, ඒ අයට කෘෂිකර්මාන්තය තුළින් යම් මුදලක් උපයන ව්‍යාපෘතියක් ලෙස සකස් කරන්න කියලා. නමුත් අවාසනාවකට මීගමුව කරදිය වළල්ලෙන් සීමා වන මැතිවරණ කොට්ඨාශයක්, ප්‍රාදේශීය සභා ගම්මානයක් නිසා එම මුදල වෙනත් විධියකට මට වැය කරන්න බැරි වුණු නිසා මම ඒ මුදල පරිහරණය කරන්න උත්සාහ කළත් ඒ මුදල ලබා ගන්නට බැරි වුණා.

අද ඔබතුමාට ධීවර අමාත්‍යාංශය ලැබිලා තිබෙනවා. මම හිතන්නේ මම පළාත් සභාවට පත් වුණාට පස්සේ, ඔබතුමා තුන්වන ධීවර අමාත්‍යවරයා. නිමල් ලාන්සා ගරු ඇමැතිතුමා හිටියා. ලලිත් වනිගරත්න ගරු ඇමැතිතුමා හිටියා. අද ඔබතුමාට ලැබිලා තිබෙනවා. මම ඉල්ලීමක් කරනවා. පුළුවන් නම් ඒ මුදලත් එකතු කරලා, ලබන අවුරුද්දේ ධීවර කර්මාන්තය සඳහා ධීවර ගම්මානවලට ලබා දෙන්න කියලා. එයින් මම කෘෂිකර්මාන්තයෙන් ඉවත් වෙමින් මම ධීවර කර්මාන්තය සඳහා ඔබතුමාගේ ගෞරවනීය අවධානයට යොමු කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු ඇමැතිතුමාගේ පණිවුඩයේ තිබෙනවා,

*"ධීවර විෂයය අමාත්‍යාංශටය එක් වී කෙටි කාලයක් වුවත් ලබන වසරේ සිට එහි ඉදිරි කටයුතු නව මුහුණුවරකින් කරගෙන යාමට අවශ්‍ය සැලසුම් මේ වනවිට සකස් කර අවසන් කියලා."*

[ගරු රොයිස් විජිත ප්‍රනාන්දු]

මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඔබතුමාගේ අමාත්‍යාංශ වැය ශීර්ෂයේ අමාත්‍යවරයා හැටියට ඔබතුමා දෙන පිළිතුරු කථාවේදී නව මුහුණුවරකින් කරගෙන යැමට සකස් කර තිබෙන සැලසුම් බිදක් හෝ මේ සභාවේ අවධානයට යොමු කරන්න කියලා මම ඉතාම ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලනවා. ඒ වාගේම ලේකම්තුමාගේ පණිවුඩයේ තිබෙනවා,

*"ධීවර අංශය මෙම වසර මැද භාගයේදී අප අමාත්‍යාංශයට එක් වූ අතර, ධීවර අංශය නඟා සිටුවීම සඳහා 2017 වසරේදී ධීවර නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කරමින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ"* කියලා.

ධීවර මත්ස්‍ය සම්පතේ ගුණාත්මකභාවය පිළිබඳව එතුමන් ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් කිරීමට බලාපොරොත්තු වන දේත් මම ඔබතුමාගේ පිළිතුරු කථාවේදී ඉතාමත් ගෞරවනීය ලෙස බලාපොරොත්තු වෙනවා. මීගමුව මැතිවරණ කොට්ඨාශය ගත්තාම ජීවිතය පරදුවට තියලා මහ සාගරයට ගිහිල්ලා මත්ස්‍ය සම්පත නෙලාගෙන එන එක් කොටසකුත්, කලපුව ආශ්‍රිතව එදිනෙදා ඔවුන්ගේ ජනජීවිතය, එහෙම නැත්නම් ජීවත් වීම සඳහා කරන ධීවර කර්මාන්තයකුත්, මේ අතරින් මතු වුණු මුදලාලිලා කල්ලියකුත් එක්ක තමයි මේ ධීවර කර්මාන්තය කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. මහ ආණ්ඩුවත්, පළාත් ආණ්ඩුවත් අතර විෂයය භාර අමාත්‍යවරයා හැටියට ඔබතුමාට තිබෙන බලතල මොනවාද කියන්නට මම දන්නේ නැහැ. ඒකත් මම ඔබතුමාගෙන් බලාපොරොත්තු වෙනවා. විෂයය භාර අමාත්‍යවරයා හැටියට ධීවර අංශය පිළිබඳව, ධීවර කර්මාන්තය පිළිබඳව ඔබතුමාට කොතරම් දුරට මේ අමාත්‍යාංශය හරහා ධීවර ජනතාවගේ හදවත්වලට, ඔවුන්ට යටිතල පහසුකම් සපයද්දී, ඔවුන්ට පහසුකම් සපයද්දී ඔවුන්ගේ ප්‍රශ්නවලදී කුමන ආකාරයකට ඔබතුමාට මැදිහත් වෙන්න පුළුවන්ද කියන තත්ත්වයත් මේ සභාවට පැහැදිලි කරන ලෙස මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

අද අතංගු රස්සාව, කට්ටුදැල් රස්සාව, විසිදැල් රස්සාව මේ කලපුව ආශ්‍රිතව කරන රස්සාවල්. මීගමු කලපුව කියන්නේ, පෝෂිත කලපුවක්. එක්තරා අවස්ථාවකදී පසුගිය රජය තුළ Seaplane බස්සන්න ගිහිල්ලා, ධීවරයෝ වීදි බැහැලා, උද්ඝෝෂණය කරලා ඒ පෝෂිත කලපුව ආරක්ෂා කළා. ඒකේ තමයි මත්ස්‍යයින් විජලනය වන බොක්ක තියෙන්නේ. ඉස්සන්, වැලිගොව්වන්, පෝරාවන්, පරව් මෙවැනි මත්ස්‍ය සම්පත බිහි වන කලපුවක් තමයි මීගමුවට අයිති ඒ පෝෂිත කලපුව. පසුගිය කාලයේ පාර්ලිමේන්තුවේ ඉන්න නිසා නම කියන්න පුළුවන්ද මම දන්නේ නැහැ. නිමල් ලාන්සා ඇමැතිතුමා අක්කර 10 ක කඩොලානක් එළිවෙද්දී අවසන් කළා. එක රැයින්. ඒ කඩොලාන කියන්නේ මත්ස්‍යයින් බෝ වන, ඒ මත්ස්‍ය සම්පත ජීවත් වන පරිසරයට හරි සංවේදී ශාඛයක්. ඒවා ඩෝසර් දාලා අවසන් කළා. ජලාපවහන මණ්ඩලයෙන් කරදිය ජලය පිරිසිදු කරන මැෂිමක් හයි කරන්න, නැත්නම් ඒ පොම්පාගාරයක් හයි කරන්න පර්චස් 10 ක 15 ක ඉඩමක් අවශ්‍යයි කියලා. මිනින්දෝරු දෙපාර්තමේන්තුව ගෙනැල්ලා මන්නලා එළිවෙද්දී අක්කර 10 ක් කපලා විනාශ කරලා දැම්මා. මේ විධියට තමයි එදා හිටපු ධීවර අමාත්‍යවරු මීගමුවේ ධීවරයින්ට සැලකුවේ.

ඒ වාගේම වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට, කලපු අධිකාරියට ඔබතුමා බස්නාහිර පළාතේ විෂයය භාර අමාත්‍යවරයා හැටියට ඒ ආයතනවලට මොන ආකාරයෙන් ඔබතුමා නියෝග දෙන්න, නායකත්වය දෙන්න පුළුවන්ද කියන දේත් ඔබතුමාගේ කථාවේදී මම බලාපොරොත්තු වෙනවා. මොකද, මාදැල්කරුවන්, කරවල වේළන්නන්, මත්ස්‍ය සම්පත නෙලාගෙන ඇවිල්ලා, වෙරළේ දැල් බේරන ධීවරයින්ට අද වෙරළ සංරක්ෂණ අධිකාරිය හරහා දැඩි ප්‍රශ්න ලැබිලා තිබෙනවා. සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධනය හරහා ඒ සංචාරක හෝටල් හදන්නන්ට ධන කුවේරයින්ට එක විධියකටත්, අහිංසක ධීවරයෝ මාදැල් වාඩියක් හදපුවාම එක විධියකටත් කරලා අද අධිකරණයට ගෙනිහිල්ලා දඬු ගස්සන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. වෙරළ අපි ආරක්ෂා කළ යුතුයි. අපි පරිසරය ආරක්ෂා කළ යුතුයි. ඔප්පු තිරප්පුවලින් මේ කලපුව, මේ වෙරළ ධීවරයින්ට අයිති නොවුණාට භුක්තියෙන්, උරුමයෙන්, උප්පත්තියෙන් ඔවුන්ට ඒ දේ අයිතියි. ඒක අපි කවුරුත් පිළිගත යුතුයි. මම එහෙම කියන්නේ, මේ ධීවරයෝමේ කලපුව මුහුද ආශ්‍රිතව තමයි ඔවුන්ගේ ජන ජීවිතය ගොඩ නැඟිලා තියෙන්නේ. ඔවුන් ඒකෙන් නෙලා ගෙන එන සම්පත වෙළඳ පොළට අරගෙන යන්නේ ඔවුන්ගේ බිරින්දෑවරුන් තමයි. ඒ මච, බිරිඳ අරගෙන එන ආදායමෙන් තමයි දරු පැටවුන් කන්නේ. මහ දැවැන්ත

ආදායමක් නොවෙයි. උදේ කලපු ගියේ නැත්නම් දවල්ට කන්න නැහැ. රෑට කන්න නැහැ. අපේ අමාත්‍යාංශයෙන් දැකපු දේවල් තමා, යකා දැල් දෙකක් දෙනවා. ඉස්සෝ දැල් දෙකක් දෙනවා. ධීවර ප්‍රජාවගේ යටිතල පහසුකම් සපයනවා කියනවා. වැසිකිළි ආධාර කියලා වැසිකිළි පෝච්චියක්, කම්බි දෙකක්, සිමෙන්ති කොට්ට දෙකක් දෙනවා. මේ විධියට තමයි අපි ආධාර කළේ. මම දැක්ක දේ.

ඒ නිසා ඔබතුමගේ මෙම අමාත්‍යාංශය යටතේ මම බලාපොරොත්තු වෙනවා. මේ ධීවර ප්‍රජාවට ඒ අයගේ යටිතල පහසුකම් සපයනවා වාගේම ඒ දරුවන්ගේ ජන ජීවිතය ගොඩ නඟන්න.ඒ දරුවන් ධීවර කර්මාන්තයේ නියැලෙනවා නම්, ඉදිරියේදී නව තාක්ෂණය වැළඳගෙන නවීන ලෝකයට උචිත විධියේ ධීවර කර්මාන්තයක යෙදෙන්න පුළුවන් වැඩ පිළිවෙළක් සකස් කරන්න. අධ්‍යාපනය හදාරන දරුවන් තුළින්ම ඒ ධිවර ගම්මානවල ජීවත් වන පාසල් හරහා යම්කිසි වැඩ පිළිවෙළක් දියත් කරන්න. ඒ වාගේම ඔවුන්ගේ මංමාවත් පිළිසකර කරලා දෙන්න. ගම්මානවල පදිංචි ධීවරයින් බහුතරයකට වැසිකිළි, පානීය ජලය, පාලම් වැනි දැවෙන ප්‍රශ්නවලින් එදා ඉඳලා පීඩා විඳිනවා. ඒ සම්බන්ධවත් ඔබතුමාගේ අවධානය මම යොමු කරනවා.

ඒ වාගේම නෙලාගෙන එන මත්ස්‍ය සම්පත නිසි වෙළඳ පොළක විකුණා ගන්න පුළුවන් රටාවක්, පසුබිමක් සකස් කරන්න කියලා මේ පළාත් සභාව හරහා විෂයය භාර අමාත්‍යවරයාගේ අවධානයට යොමු කරනවා. ඒ වාගේම පාරම්පරික මෙවලම් ඔවුන් පරිහරණය කරනවා. ඒ පාරම්පරික මෙවලම් මොනවාද කියලා හඳුනාගෙන ඒ අයට ඒ පැත්තෙන් සහයෝගය දීලා, ජන ජීවිතය ගොඩ නඟන්නට අත්වැලක්, රුකුලක් වෙන්න කියලත් ඔබතුමාගේ අවධානයට මම යොමු කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වැදගත් කාර්ය භාරයක් තිබෙනවා. විෂයය භාර අමාත්‍යවරයා හැටියට ඔබතුමාගේ දැඩි අවධානයට යොමු කරනවා.

මීගමුවේ අද මත්ස්‍ය අලෙවි සැල්වලින් කප්පම් ගන්න කප්පම් කල්ලි බිහි වෙලා තිබෙනවා. ජැයිකා ආයතනය හරහා මීගමුව නගර සභාවෙන් හදපු මීපුර සිනමා ශාලාව අසල තිබෙන මාළු වෙළඳ පොළ අද කප්පම්කරුවන්ගේ රාජධානියක් වෙලා තිබෙනවා. ඒ වාගේම ධීවරයින්ට පරිහරණය කරන්න හදපු, ජැයිකා ආයතනය හරහා ගත්තු ජැටිය මීගමු නගර සභාව අද ගුරුගේ ආයතනයට බදු දීලා තිබෙනවා රුපියල් 55,000/- ක වාර්ෂික බද්දට. අද එක ධීවරයෙකුට ඒ ජැටිය පාවිච්චි කරන්න බැහැ. ඒ ජැටියට කෙලින් කඩොලානක් මැද්දේ ගහලා තිබෙන ගුරුගේ හෝටලයට රාත්‍රී සමාජ ශාලාවලට සහභාගී වන අයට පාවිච්චි කරන්න, ඒ ජැටිය අද බදු දීලා තිබෙනවා. කිසිම ධීවරයෙකුට යන්න බැහැ. ධීවරයෙක් ගියොත්, ධීවරයෙක් ඒක පරිහරණය කළොත් ඒ අයිතිකරුවන්, බදු ගත්තු අය පොලීසියට දැනුම් දීලා පැමිණිලි කරලා, ඒ ධීවරයින්ව අධිකරණයට ඉදිරිපත් කරන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ අහිංසක ධීවරයාව තලා පෙළලා නැති කරනවාට වඩා මේ ධීවරයාව ඇති කරලා, මේ ධීවරයා ගෙන එන මාළු කෑල්ල, මත්ස්‍ය සම්පත අපි ආහාරයට ගන්නවා නම්, අපේ දරුවන්ට දෙනවා නම්. අපි ඒ ධීවරයා ආරක්ෂා කරන්න අපි දැන ගන්න ඕනෑ. අපි බැඳිලා ඉන්නවා කියන එකත් මම මේ අවස්ථාවේ ඔබතුමාට මතක් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය කාලයේ ධීවරයින් තාඩන පීඩනවලට ලක් වුණා. ඔබතුමා දන්නවා ධීවරයින් ඔවුන්ගේ ජීවිත පරදුවට තියලා ගිහිල්ලා ගේන මත්ස්‍ය සම්පත මුදලාලි අතට ලබා දෙන්නේ. මේ මුදලාලිලා 10% ක් ඉන්නවා. මහ සාගරයත් එක්ක සටන් කරන ධීවරයෝ 60% ක් ඉන්නවා. ඉතුරු 30% ඉන්නේ මම පෙර කිව්වා වාගේ කට්ටු දැල්, විසි දැල් ඒ වාගේ අතංගු රස්සාව කලපු ආශ්‍රිතව. එහෙම නැත්නම් මොද්දුන්ගේ කොටු හදලා මාස ගණනක් බලාගෙන ඉඳලා ඒ මොද පැටවු දාලා, මොද්දුන්ව පෝෂණය කරලා ඒ සම්පත නෙලාගෙන ඇවිල්ලා ජීවත් වන අය. මේ අයට මේ අමාත්‍යාංශය හරහා යම්කිසි වැඩ පිළිවෙළක් දියත් කරනවා නම් මම හිතනවා උචිත කාර්ය භාරයක් කියලා. කාලෝචිතයි කියලා.

ඒ වාගේම ධීවර දරුවන්ගේ අධ්‍යාපනය. ධීවර තාත්තාගෙන් පස්සේ දරුවා හැදී වැඩීගෙන එද්දී, දරු නාම්බෙක් බවට පත් වෙද්දී, පාසල අවසන් වෙලා ත්‍රීරෝද රථයට යනවා වාගේ මේ දරුවෝ යොමු වෙන්නේත් ධීවර කර්මාන්තයටමයි. ඒ නිසා පාසලේදී පස්වන හයවන වසර සමත් වේගෙන එද්දී, මේ දරුවා නිසි අධ්‍යාපනයක් කරා යනවා නම්, ඒ ක්ෂේත්‍රය තුළ යන්නත්. එහෙම නොවෙයි නම්, මේ දරුවන් හඳුනාගෙන ධීවර කර්මාන්තයට යොමු වන ආකාරයට, සුළඟ, වෙරළ, මුහුද, සුළි කුණාටු සහ මත්ස්‍ය සම්පත හඳුනාගෙන නිසි ක්‍රමවේදයක් තුළ නව තාක්ෂණය වැළඳගෙන, නව ධීවරයෙක් බවට ලෝකයට

[ගරු රොයිස් විජිත ප්‍රනාන්දු]

හඳුනාගන්න පුළුවන් තරගකාරී මත්ස්‍ය සම්පත නෙලා ගන්න මුහුදත් එක්කලා සටන් කරන්න පුළුවන් ධීවරයෙක් බිහි වන අධ්‍යාපනයක් සකස් කරන්න, මම හිතනවා මේ අමාත්‍යාංශය යොමු වෙනවා නම් උචිතයි කියලා. ධීවර කියලා මේ අමාත්‍යාංශය මහ දැවැන්ත නැහැ. පානදුර, කළුතර, මීගමුව මේ ටික පමණයි ඔබතුමාට තිබෙන්නේ. අමාත්‍යාංශය හරහා ඔබතුමා කෘෂිකර්මාන්තයට අවධානය යොමු කරනවා වාගේ මේ අමාත්‍යාංශය හරහා ධීවර ජන කොටස්වලට යම්කිසි සේවයක් කරන්න පුළුවන් නම් මම හිතනවා මම පළාත් සභාවට පත් වුණාට පස්සේ පත් වුණු තුන්වන ධීවර අමාත්‍යවරයා හැටියට - ඔබතුමාගේ උපදේශක කාරක සභාවේදී මම දැකලා තිබෙනවා. ඔබතුමා බොහොම අවධානය යොමු කරලා, කල්පනාකාරීව වැඩ කටයුතු කරන අමාත්‍යවරයෙක්. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මීගමුව මැතිවරණ කොට්ඨාශයේ, මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මේ දැවෙන ධීවර ප්‍රශ්න හොයලා බලලා දැලක් ඔරුවක් දීම පමණක් නොවෙයි. ගම්මානවල ඉන්න ධීවරයින් හඳුනාගෙන, කළ හැකි දෙයක් තිබෙනවා නම්, ඉදිරි කාලයේදී කරලා, ඒ අය පීඩාවෙන් ගලවාගෙන ඒ අයට ජීවත් වෙන්නට පුළුවන් වටපිටාවක්, පරිසරයක් සකස් කරන්න ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා වැඩ පිළිවෙළක් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. කාලය ලබා දීම පිළිබඳව ගෞරවනීය ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.50]

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. කෘෂිකර්ම, ඉඩම්, ධීවර, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශය පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්න ලැබීම පිළිබඳව. මට මතක් වෙනවා. එක වකවානුවකදී කෘෂිකර්ම අමාත්‍යවරයෙක් තමන්ගේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය කියන විෂයය තමන් බෞද්ධයෙක් කියන සංකල්පය තුළ ඒක බැහැර කරලා, වෙනත් අමාත්‍යාංශයකට යොමු වුණා. ඒ අමාත්‍යවරයා ඒ සඳහා පරිසර අමාත්‍යාංශය ආදේශ කර ගත්තා. පරිසර විෂයය. පරිසරය විෂයය ලබාගෙන මීහිතක හෝරාව කියලා හෝරාවක් පවත්වලා රටම අඳුරු කරලා පොල් තෙල්වලින් පොල් කෝම්බවල පහන් පත්තු කරලා ලක්ෂ ගණනක් මුදල් වියදම් කරලා විශාල මුදල් නාස්තියක් කළා. නමුත් වර්තමාන අපේ ගරු අමාත්‍යවරයා තමන්ට ලැබුණු ඒ අමාත්‍යාංශයට අදාළ, ඒ කෘෂිකර්ම අමාත්‍යාංශයත් එක්ක සමගාමීව යන විෂයයන් සියල්ලම ඒකරාශී කරගෙන කටයුතු කිරීම ගැන අපි විශේෂයෙන්ම ප්‍රශංසා මුඛයෙන් කථා කරන්න ඕනෑ.

කෘෂිකර්මය කියන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටටම ආවේණික වුණු පොදු, සුන්දර විෂයයක්. හැමතැනම කථා කළොත් නොයෙක් තැන්වල අටුවා, ටීකා, ටිප්පනි සහිතව ශ්‍රී ලංකාව කියන්නේ, කෘෂිකාර්මික රටක්. ඒ නිසා කෘෂිකර්මාන්තයෙන් ස්වයං පෝෂිත කළ යුතුයි කියලා හඬගා දොඩනවා. ඒක මධ්‍යම රජයේ මැති ඇමැතිවරුත් කරනවා. අපිත් කථා කරන කොට කරනවා. හැබැයි අපට ප්‍රශ්නයක් තිබෙන්නේ, ඒ සඳහා සැබවින්ම හදවතේ ගැඹුරුම තැනින්ම අපි ඒකට හයිය, ආශිර්වාදය දෙනවාද කියන කාරණයයි. අපේ අද කථාවලදී විශේෂයෙන්ම මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා මේ කෘෂිකර්ම අමාත්‍යාංශයට ලැබුණු ප්‍රතිපාදන පිළිබඳව විග්‍රහයක් කළා. ඒ විග්‍රහය දිහා බැලුවාම කෘෂිකර්මාන්තයට කුඩම්මාගේ සැලකිල්ලද කරලා තිබෙන්නේ කියන කාරණාව පිළිබඳව අපට හිතන්න වෙනවා.

මම විශ්වාස කරනවා ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමා කෘතහස්ථ දේශපාලඥයෙක්. පාර්ලිමේන්තුව නියෝජනය කරපු කෙනෙක්. ඒ වාගේම පළාත් පාලන ආයතනයක් නියෝජනය කරලා, හසල අත්දැකීමක් තියෙන කෙනෙක්. එතුමාට හොඳට වැඩ කරන්න පුළුවන්. බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශ අතරින් හොඳට වැඩ කරන්න පුළුවන් අමාත්‍යාංශයක් වුණත්, ඒ අමාත්‍යාංශයට මේ මුදල් අඩුවෙන් ලැබීම පිළිබඳව මම හිතනවා එතුමාට නිර්මාණශීලී වැඩක් කරන්න තිබෙන අවස්ථාව හුඟක් අඩුයි කියලා. නමුත් මට විශ්වාසයක් තිබෙනවා එතුමාට හොඳ ලේකම්වරයෙක් ඉන්නවා. ඒ වාගේම හොඳ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයෙක් ඉන්නවා. ඒ නිසා අඩු මුදලකින් වුණත් වැඩි යමක් ජනතාවට කරන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා. එතුමාගේ කෘෂිකර්ම විෂයය ගැන මම කථා කරන්න යන්නේ නැහැ. පසුගිය කාල පරාසය තුළ එතුමාට පුළුවන් ශක්තියෙන් බස්නාහිර පළාත තුළ ඉන්න ජනතාවට, කාෂිකර්මාන්තයෙන් විය යුතු යම් යම් කාරණා

ඉෂ්ට සිද්ධ කරන්න විශාල කැපවීමක් කරපු බව අපි දන්නවා. විශේෂයෙන් එතුමා ජනතාවත් එක්ක කටයුතු කරනවා වාගේම කෘෂිකර්මාන්තයේ තිබෙන වටිනාකම පහදලා දෙන්න බස්නාහිර පළාත් සභාවේ උපදේශක කාරක සභාවේ මන්ත්‍රීවරු ඒ වාගේම කෘෂිකර්ම විෂයයට අදාළ මන්ත්‍රීවරු සහ කැමැත්තක් දක්වන මන්ත්‍රීවරුන්ව අරගෙන ගිහිල්ලා තමන්ගේ අමාත්‍යාංශය පිළිබඳව ඉතාම පෘථුල, පළල් අවබෝධයක් ලබා දුන්නා. ඒක වැදගත් වෙනවා. මොකද, එහෙම අවබෝධයක් ලැබුණොත් තමයි අපට මේ සාකච්ඡා මණ්ඩපය, එහෙම නැත්නම් මේ බස්නාහිර පළාත් සභාවේ සභා ගර්භයේ වහළය යට ඉඳන් හොඳට කථා කරන්න පුළුවන් වෙන්නේ.

ඉතින් මම මේ අවස්ථාවේදී ඉඩම් විෂයය පිළිබඳව වචනයක් කථා කරන්න ඕනෑ. බස්නාහිර පළාත් සභාවට අයිති ඉඩම් නැහැ. නමුත් බස්නාහිර පළාතෙන් කෙරෙන්නේ රජයට අයිති ඉඩම්වල සියලුම පරිපාලන කටයුත්ත. එහිදී මේ ඉඩම් අමාත්‍යාංශයට, ඉඩම් දෙපාර්තමේන්තුවට අපේ බදු ආදායම හරියට රැස් කර ගන්න වගකීම පැවරිලා තිබෙනවා. ඒ බදු ආදායම හරියට රැස් කර ගත්තොත් තමයි අපට බස්නාහිර පළාත් සභාවට ආදායමක් එන්නේ. නමුත් මේ ආදායම හරියට රැස් කරනවාද, රැස් වෙනවාද කියන කාරණාව පිළිබඳව අපි අවධානය යොමු කරන්න ඕනෑ. අපි දන්නවා පුළුපුළුවන් විධියට ඉඩම් අමාත්‍යාංශය, ඉඩම් දෙපාර්තමේන්තුව ඒ ආදායම් එකතු කරගෙන යනවා. නමුත් මේ රටේ තිබෙන සමහර බල පුළුවන්කාර වාණිජ ආයතන ඒවා ගෙවීම පැහැර හැරලා තිබෙනවා. ඒ නිසා ඔබතුමාගේ මාර්ගයෙන් මම ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒවාවලට කිසි බුරුලක් දෙන්න එපා. ඒවායේ ආදායම රැස් කර ගන්නය කියලා.

විශේෂයෙන්ම එතුමාගේ අමාත්‍යාංශයෙන් නිකුත් කරලා තිබෙන 2016 වාර්ෂික වාර්තාව කියන මේ පොතේ සුවිශේෂත්වයක් තිබෙනවා. 2015 අයවැය විවාදයේදී සාකච්ඡා කරපු විශේෂ කරුණු පිළිබඳව සමාලෝචනයක් කරලා, ඒ කථා කරපු මන්ත්‍රීවරුන්ගේත් නම් සඳහන් කරලා. සම්පිණ්ඩනයක් කරලා අපට ඒ යටගිය මතකයන් අලුත් කරලා අද කථා කරන්න පුළුවන් අවස්ථාවක් සලසලා දීලා තිබෙනවා. ගිය අයවැය කථාවේදී මම සඳහන් කරපු යම් යම් කාරණා පිළිබඳවමේ පොතේ සඳහන් වෙලා තිබෙනවා. විශේෂයෙන් ඕර්ටස් ක්ලබ් කියන රජයේ ඉඩමේ, බස්නාහිර පළාත් සභාවට බදු දිය යුතු ආයතනයක් වන ඕර්ටස් ක්ලබ් එකෙන් බස්නාහිර පළාත් සභාවට රුපියල් මිලියන 530 ක මුදලක හිඟ තිබෙනවා. රුපියල් මිලියන 530 ක් කියන්නේ ලක්ෂ 5300 ක්. හැබැයි ඒ 5300 මේ පළාත් සභාවට ලබා ගන්න කොයි විධියේ බලපෑමක් වෙලා තිබෙනවාද කියන කාරණාව පිළිබඳව අපට ප්‍රශ්නයක් තිබෙනවා. මම එවකට ඉඩම් අමාත්‍යවරයා හැටියට මේ හිඟ මුදල පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළා. ඔවුන් මේවා ගෙවන්නේ නැතුව ඉන්න අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ඔවුන්ට සම්බාධක පැනවූවා. නිදර්ශනයක් හැටියට යොදපු සම්බාධකයක් තමයි මේ ඕර්ටස් ක්‍රීඩා සමාජයේ මත්පැන් බලපත්‍රයක් තිබෙනවා. මේ මත්පැන් බලපත්‍රයෙන් මත්පැන් විකුණලා තමයි සුවිශාල ආදායමක් ගන්නේ. අපේ සම්බාධකය මොකක්ද? ඒ මත්පැන් බලපත්‍රය ගන්නවා නම්, අපේ බස්නාහිර පළාත් සභාවේ ඉඩම් දෙපාර්තමේන්තුවෙන් නිසි අවසර සහිත ලිපියක් දෙන්න ඕනෑ. අපි ඒ අවසර සහිත ලිපිය නිකුත් කළේ නැහැ. ඒ නිසා ඔවුන්ට ඔවුන්ගේ ක්‍රීඩා සමාජය තුළ මත්පැන් අලෙවිය කරන්න බැරි වුණා. ඒ නිසා ඔවුන් අසීරු තත්ත්වයකට පත් වුණා. ඒ නිසා අපත් එක්ක සාකච්ඡා කරලා ඔවුන් එදා තීන්දුවකට ආවා යම්කිසි මුදලක් අපි ගෙවන්නම් කියලා. ඒ අපි එදා කරපු කාරණාවක් කිව්වේ. නමුත් අද එහෙම නැති වෙලා තිබෙන්නේ, මම විශ්වාස කරන්නේ, මොවුන්ට මේ මත්පැන් බලපත්‍රයට අපි ඒ විධියේ සම්බාධකයක් පනවන්නේ නැතුව ඒ ලිපිය නිකුත් වෙලා ඇති. ඒ නිසා තමයි ඔවුන් මේ පිළිබඳව නිකම්ම නිකන් සැහැල්ලුවෙන් ඉන්නේ. ඉතින් මේ විශේෂ අවස්ථාවේදී ඔබතුමා මගින් මම ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. කෙසේ හෝ රුපියල් මිලියන 530 මුදල ලබාගෙන ඒ මුදල බස්නාහිර පළාත් සාභාවට බැර කරගෙන, බස්නාහිර පළාත් සභාවේ අරමුදලෙන් මේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ යම් යම් කාරණාවලට එය ආයෝජනය කර ගන්න කියලා මා ඉල්ලීමක් කරනවා.

ඊළඟට මම කෙටියෙන් කථා කරන්න ඕනෑ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ බස්නාහිර පළාත් සභාවේ තිබෙන සුවිශේෂී ඉඩමක් තමයි බාරාවේ ඉඩම. මේ පළාත් සභාවේ බරාවේ ඉඩම ගැන හුඟක් කථා වෙලා තිබෙනවා. හිටපු කෘෂිකර්ම අමාත්‍යවරයා මේ බරාව ඉඩමේ ව්‍යාපෘතිය සම්බන්ධව මම හිතන්නේ වීම් හතර පහක් රට රටවල්වල අරගෙන ගිහිල්ලා තිබෙනවා. ඒ දවස්වල කථාවක් තිබුණා, එතුමාගේ ළඟ හිටපු පෞද්ගලික ලේකම්වරියත් එක්කත්

[ගරු හෙක්ටර් බෙත්මගේ]

ඒ සාකච්ඡාවලට ගිහිල්ලා තිබෙනවා කියලා. කමක් නැහැ එහෙම ගියාට. හැබැයි මේ බරාවේ ඉඩම අපේ බස්නාහිර පළාත් සභාවේ ලක්ෂ ගණන් මුදල් වියදම් කරලා, රට රටවල්වල ගියාටබරාව ඉඩමට වුණු දෙයක් නැහැ. ඒ විධියමයි. මම එදා යෝජනාවක් ගෙනාවා. මේ බරාවේ රජයේ ඉඩම බස්නාහිර පළාත් සභාව යටතේ පාලනයේ තිබෙන නිසා, ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා යටතේ තිබෙන නිසා ඉඩම් දෙපාර්තමේන්තුව මගින් මේ බරාවේ ඉඩම අපේ මල් වවන්නන් සඳහා කොටස් කඩලා ඔවුන්ට බද්දට දීලා මේ විසිතුරු මල් වැවීමේ ව්‍යාපෘතියට හයියක් දෙන්න කියලා. ඒක -

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මල් වවන්න හෝමාගම උත්සවයක් තියලා මාර වියදමක් කළේ. ඇමැතිතුමා හොඳ මනුස්සයා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඒ මල් වැවීමට නොවෙයි. කෘෂිකර්ම උත්සවය. මම මේ කාරණා කිහිපය මතු කළේ, සද්භාවයෙන්. අපේ ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමාට තිබෙන හිතවත්කම උඩ. අඩුවක් කිව්වා කියලා හිතන්න එපා. ඒ නිසා ප්‍රධාන කාරණාව තමයි ඔර්ටස් ක්‍රීඩා සමාජයට සම්බාධක පනවලා මේ මුදල අය කර ගන්න කටයුතු කරන්න. ඊළඟ අයවැයේදී මේක නැවත කථා කරන්න ඉඩ තියන්න එපා. ඒ වාගේම බරාව ඉඩම පිළිබඳව නැවත කථා කරන්න ඉඩ තියන්න එපා. අපි දන්නවා ඔබතුමා නිකම් පිටරටවල සංචාරය කරන්නේ නැහැ. සංචාරය කළත් රට අතුළේ අපවත් එක්කරගෙන ගිහිල්ලා මොනවා හරි පෙන්නලා - අපව රවට්ටලා නොවෙයි. අපට මොනවා හරි අවබෝධයක් දෙනවා. ඒ පිළිබඳව ස්තුතිවන්ත වෙමින් තමුන්නාන්සේට 2017 වර්ෂයේ කෘෂිකර්ම අමාත්‍යවරයා හැටියට ඉතාමත් සාර්ථක මහජන සේවයක් කරන්න හැකියාව ධෛර්ය ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.01]

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ 2017 අයවැය ලේඛනය ඉදිරිපත් කරන මේ මොහොතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය, ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මේ පළාත් සභාවට ඇවිල්ලා අවුරුද්දක් වැනි කෙටි කාලසීමාවක් තුළ මේ පළාත් සභාව තුළ වන සිද්ධි බලාගෙන ඉන්න කොට මම හිතනවා, අපේ ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා කෘතහස්ථ දේශපාලන නායකයෙක් බව. එය අපි පසුගිය අවුරුද්දේදී දැක්කා. එතුමාට වැඩ කරන්න විශාල ශක්තියක් තිබෙනවා. විශේෂයෙන්ම අපි විපක්ෂයේ වුණත්, එතුමාගේ උපදේශක කාරක සභාව නියෝජනය කරන අවස්ථාවේදී අපි දැක්කා, තිලකසිරි ඇමැතිතුමාට මේ කෘෂිකර්ම අමාත්‍යාංශය තුළින් පසුගිය කාලසීමාව තුළ විශාල රාජකාරියක් කරන්නට විශාල ශක්තියක් ලබා දුන්නේ, එතුමාගේ අමාත්‍යාංශයේ ලේකම්තුමා ප්‍රධාන කාර්ය මණ්ඩලය. අපි ඇත්ත කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමහර අමාත්‍යාංශවල ඇමැතිවරුන්ට ලේකම්වරු වැඩ කරන්න දෙන්නේ නැහැ. සමහර අමාත්‍යාංශවල ඇමැතිවරුන් වැඩ කරන කොට නිලධාරීන් බාධ කරනවා. නමුත් අපි දැක්කා ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමාගේ අමාත්‍යාංශයේ ඉන්න ලේකම්තුමා ප්‍රමුඛ සියලුම කාර්ය මණ්ඩලය එතුමා ගන්න ඒ වැදගත් උත්සාහයන්ට විශාල ශක්තියක් ලබා දුන්නා. අපි දැක්කා, පසුගිය කාලය තුළ මේ කෘෂිකර්මාන්තය පිළිබඳව අපේ උපදේශක කාරක සභාවේ මන්ත්‍රීවරු මේ රටේ නොයෙක් ප්‍රදේශවලට අරගෙන ගිහිල්ලා ඒ පිළිබඳ දැනුමක් ලබා දෙනවා. මට නම් එකකටවත් එන්න හම්බ වුණේ නැහැ. නමුත් අපි දැක්කා, ඔබතුමා විශාල උත්සාහයක් දරනවා. ඒ විශේෂයෙන්ම මේ අවස්ථාවේදී අපි ඔබතුමාට සහ ඔබතුමාගේ කාර්ය මණ්ඩලයට ස්තුති කරනවා. විශේෂයෙන්ම වර්තමානයේ කෘෂිකර්මාන්තය කියන්නේ, බස්නාහිර පළාතේ ඉතාමත්ම අඩුවෙන් සිදු වන සිද්ධියක්. ලංකාවේ සියලුම පළාත්වල කෘෂිකර්මාන්තය දියුණු කරන කොට, බස්නාහිර පළාතේ තිබෙන ඉඩම් ප්‍රමාණය සසඳන කොට අපේ පළාතේ කෘෂිකර්මාන්තය සිදු කෙරෙන්නේ ඉතාම අවම වශයෙන්. ඒ අවම වශයෙන් වන කෘෂිකර්මාන්තය දියුණු කරන්නට ඔබතුමා මේ පළාත් සභාව හරහා ගන්නා වූ උත්සාහය අපි දැක්කා.

විශේෂයෙන්ම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා වර්තමානයේ අපේ රටේ කෘෂිකර්මාන්තයෙන් තරුණ පිරිස ඈත් වෙනවා. අවුරුදු 60 කට වැඩි පිරිස තමයි මේක තවම රඳවාගෙන ඉන්නේ. මේ අවුරුදු 50, 60 පිරුණු කට්ටිය තව අවුරුදු ගණනකින් නැති වුණාට පස්සේ,

මේ කෘෂිකර්මාන්තය අපේ රටේ රැඳෙන්නේ නැහැ. ඒ නිසා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අපේ රටේ තරුණ පිරිස - අපේ රටේ පාසල් පද්ධතියේ දූවා දරුවන් මේ කෘෂිකර්මාන්තයට නංවා ගැනීමේ වැඩ පිළිවෙළක් ඔබතුමා ආරම්භ කරලා තිබෙනවා. ඒක තවදුරටත් ශක්තිමත් කරන්නට ඔබතුමාට විශේෂයෙන්ම පාසල් පද්ධතියේ කෘෂිකර්මාන්තයට අවශ්‍ය කරන විවධ පහසුකම් ලබා දීලා, ඒ අවශ්‍ය කරන ගුරුවරු ලබලා දීලා කෘෂිකර්මාන්තය දියුණු කරන්න ඔබතුමාට විශාල ශක්තියක් ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

ඒත් එක්කම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය කාලසීමාව තුළදී ගරු ඇමැතිතුමා අපට විවිධ මුදල් ප්‍රතිපාදන ලබා දුන්නා. මම හිතන්නේ, අපේ උපදේශක කාරක සභාවේ මන්ත්‍රීවරුන්ට ලබා දීපු මුදල් ප්‍රතිපාදනවලින් අපි උපරිම ප්‍රයෝජන ලබා ගත්තා. අපි 2016 ට යෝජනා දුන්නත් සමහර ව්‍යාපෘතිවලට අපට ඒ මුදල් ප්‍රමාණවත් වුණේ නැහැ. ඒක ඔබතුමාගේ වැරැද්දක් නොවෙයි. ප්‍රතිපාදන හම්බ වුණේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමාගේ මාර්ගයෙන් ගරු ඇමැතිතුමාගෙන් අපි ඉල්ලීමක් කරනවා. සමහර ව්‍යාපෘති ආරම්භ කරන කොට ඒ ව්‍යාපෘතිවලට මුදල් ප්‍රතිපාදන නොමැති නිසා ඒවා 2017 වර්ෂයට කල් දැම්මා. ඒ නිසා 2017 වර්ෂයේදී ඒ සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන්නය කියලා ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාතේ විශාල වැව් ප්‍රමාණයක් තිබෙනවා. මම නියෝජනය කරන බියගම මැතිවරණ කොට්ඨාශයේ විශාල වැව් ප්‍රමාණයක් තිබෙනවා. මම දැක්කා, ඒ වැව්වල කරදිය සහ මිරිදිය ධීවර මත්ස්‍ය වර්ධනය කරනවාත් එක්කම, මේ වැව්වල ඉන්න මාළු ප්‍රමාණය වර්ධනය කිරීමේ විශාල වැඩ පිළිවෙළක් ඔබතුමාට තිබෙනවා. අපි දැක්කා, පසුගිය අවුරුදු 10, 15 තුළදී ධීවර අමාත්‍යාංශයෙන් සමහර වැව්වලට මාළු දානවා. මම හිතන්නේ ඒ තුළින් මත්ස්‍යයින් වර්ධනය කරනවා. ඒ වාගේ වැඩ පිළිවෙළක් ඔබතුමාට ආරම්භ කරන්නට අපි යෝජනා කරනවා.

ඒත් එක්කම මේ බස්නාහිර පළාතේ තිබෙන වාරිමාර්ග පද්ධතිය සුද්ධ කරන්නට ඕනෑ. සමහර තැන්වල වාරිමාර්ගවල අනවසර තැන් තිබෙනවා. අපි දැක්කා. බියගම, දොම්පේ, කැලණිය මැතිවරණ කොට්ඨාශවල ඒ වාරිමාර්ග අසලම අනවසර ඉදි කිරීම් කරනවා. ගෙවල් හදනවා. ව්‍යාපාරික මධ්‍යස්ථාන හදනවා. විවිධ හෝටල් හදනවා. ඒ නිසා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ බස්නාහිර පළාත් සභාව තුළ වාරිමාර්ග පද්ධතියේ තිබෙන Reservation කැළිවල කිසිම ඉදි කිරීමක් කරන්නට දෙන්න එපා. ඔබතුමා තදින්ම ක්‍රියාත්මක කරන්න.

ඒත් එක්කම ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් ගරු ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා ඉඩම් ගොඩ කිරීමේ ප්‍රශ්නය සම්බන්ධව. මේ ඉඩම් ගොඩ කිරීමේ ප්‍රශ්නයේදී ඔබතුමාට මැදිහත් වෙන්නට බැහැ. නමුත් ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ ගොවිජන සංවර්ධන පනත සංශෝධනය කරලා හරි, ජනාධිපතිතුමාත් එක්ක සාකච්ඡා කරලා හරි - අපි දැක්කා. අතිගරු ජනාධිපතිතුමා පත්තලගෙදරට ඇවිල්ලා එතුමා කිව්වේ, ඉස්සෙල්លාම ඉඩම් ගොඩ කිරීම තහනම් කරන්නය කියලා. ඊට පහුවදා ඉඳලාම ඉඩම් ගොඩ කළා. ඒ කිව්වාට පස්සේ, මේක වැඩි වුණා. ඒ නිසා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඉඩම් ගොඩ කිරීම පිළිබඳව ඔබතුමාට කාර්ය භාරයක් නොමැති වුණත්, ඉදිරි කාල සීමාවේදී ඔබතුමා ප්‍රායෝගිකව මැදිහත් වෙලා, රේඛීය අමාත්‍යාංශයත් එක්ක සම්බන්ධ වෙලා මේ බස්නාහිර පළාත් සභාවේ ඉඩම් ගොඩ කිරීමට විරුද්ධව ඔබතුමා ක්‍රියාමාර්ග ගන්නය කියලා ඉල්ලීමක් කරනවා.

ඒත් එක්කම ගරු නියෝජ්‍ය සභාපතිතුමානි, ඔබතුමා හරහා ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. පසුගිය කාල සීමාව තුළදී අපට ශක්තියක් ලබා දුන්නා වාගේම ඉදිරි 2017 වර්ෂයේදීත් ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා - මුළු බස්නාහිර පළාතේ ගංවතුරට ලක් වන ප්‍රදේශ තිබෙනවා. විශේෂයෙන්ම දොම්පේ මැතිවරණ කොට්ඨාශය. බියගම මැතිවරණ කොට්ඨාශය.කැලණිය මැතිවරණ කොට්ඨාශය, ඒ කොට්ඨාශවල තිබෙන පළාත් සභාව සතු වාරිමාර්ග පද්ධතිය වෙනුවෙන් පළාත් සභාව හරහා ප්‍රතිපාදන වෙන් කරලා, ඒ වාරිමාර්ග පද්ධතිය හැකි ඉක්මණින් ප්‍රතිසංස්කරණය කරන්න කියලා ඉල්ලීමක් කරනවා. විශේෂයෙන්ම පළතුරු වගාව ගැන කියන්න ඕනෑ. බියගම මැතිවරණ කොට්ඨාශයේ රඹුටන් වගාව තිබෙනවා. ලංකාවේ රඹුටන්වලට ප්‍රසිද්ධම නගරය තමයි මල්වාන නගරය. ඒ මල්වාන නගරය පසුගිය ගංවතුරෙන් සම්පූර්ණයෙන්ම යට වුණා. රඹුටන් වගාව විශාල වශයෙන් විනාශ වුණා. අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ රඹුටන් වගා කරන ගොවීන්ට රඹුටන් ව්‍යාපාරය දියුණු කරන්නට ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා විවිධ සහයෝගයන් ලබා දෙන්න,2017 වර්ෂයේදී කටයුතු කරන්න.

[ගරු මංජුල ප්‍රසන්න සම්පත්]

ඒත් එක්කම විවිධ ණය සහනාධාර, විශේෂයෙන්ම අන්නාසි වගාව. විවිධ පළතුරු වගාවල් තිබෙනවා. ඒවායේ සංවිධාන ගොඩ නඟන්නට - බුලත් වගාව කියන්නේ, ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රධාන වගාවක්. බුලත් ගොවීන්ගේ සංවිධානයක්, රඹුටන් ගොවීන්ගේ සංවිධානයක්, කෙසෙල් ගොවීන්ගේ සංවිධානයක් පිහිටුවන්න. ඒ සංවිධාන බිහි කරලා, ඒ සංවිධාන තුළින් ගොවීන්ගේ අදහස් ලබාගෙන ඒවා සංවර්ධනය කිරීමේ වැඩ පිළිවෙළක් 2017 වර්ෂයේදී ඔබතුමා ආරම්භ කරන්න කියලා ඉල්ලීමක් කරනවා. ඒත් එක්කම මේ 2016 වර්ෂයේදී ඔබතුමාත් සමග මේ උපදේශක කාරක සභාවේ වාඩි වෙලා ඔබතුමා ගන්න ක්‍රියා මාර්ගවලට විපක්ෂය වශයෙන් අපි සම්බන්ධ වුණා. ඔබතුමාගේ කාර්යක්ෂමතාවය අපි දැක්කා. ඔබතුමාගේ නිලධාරී මණ්ඩලයේ කාර්යක්ෂමතාවය. ඒ නිසා ඔබතුමා වාසනාවන්ත ඇමැතිවරයෙක්. පළාත් සභාවේ සමහර ඇමැතිවරුන්ට, සමහර නිලධාරී මහත්වරු වැඩ කරන්න දෙන්නේ නැහැ. කකුලෙන් අදිනවා. නමුත් ඔබතුමාගේ අමාත්‍යාංශයේ නිලධාරී මහත්වරු ඉතාමත්ම සක්‍රීයව ඔබතුමාට දායකත්වය ලබා දෙනවා. ඉතින් මේ අවස්ථාවේදී ඔබතුමාට ස්තූති කරනවා. මම හිතන්නේ, පසුගිය වර්ෂයට වඩා 2017 වර්ෂයේදී කෘෂිකර්ම, ඉඩම්, සත්ව නිෂ්පාදන අමාත්‍යාංශය තුළින් ඔබතුමාට විශාල කාර්ය භාරයක් කරන්න ශක්තිය ධෛර්ය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවාත් එක්කම, ගිය වර්ෂයට වඩා මේ වර්ෂයේදී අපට යම්කිසි වැඩි මුදල් ප්‍රතිපාදන ප්‍රමාණයක් ලබා දෙන්න කියලා ගෞරවයෙන් මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතිය.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට ඩෝල්ටන් ජානක ගරු මන්ත්‍රීතුමාට විනාඩි 10 ක කාලයක් ලබා දෙනවා. ඒත් එක්කම මේ අවස්ථාවේදී හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Hector Bethmage M.P.C took the Chair*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ජානක සූරියබණ්ඩාර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[අ.භා. 12.10]

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්ම, ඉඩම්, ධීවර, කර්මාන්ත, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය හා ගොවිජන සංවර්ධන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ මට කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන ප්‍රථමයෙන්ම විෂයය භාර ඇමැතිතුමා විධියට, අපේ ගාමිණී තිලකසිරි ගරු ඇමැතුමාට සහ ඔබතුමාට මාගේ අවංක ස්තූතිය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. ඒ වාගේම අපි අද කථා කරන විෂය දිහා බැලුවාම, මේ විෂයය ගැන මෙනෙහි කරන්න මේ සභාවේ මන්ත්‍රීවරු ඉතාම සීමිත ප්‍රමාණයක් ඉන්නේ. නමුත් මම සතුටු වෙනවා. මන්ත්‍රීවරු කෙසේ වෙතත්, ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයේ වගකිව යුතු නිලධාරීන් මෙම ස්ථානයේ රැඳී සිටින නිසා. මම මුලින්ම ඒ අයගේ අවධානය කෘෂිකර්ම විෂයය කෙරෙහි යොමු කරන්න කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම නියෝජනය කරන්නේ ගම්පහ දිස්ත්‍රික්කය. මම නියෝජනය කරන්නේ වත්තල ආසනය. වත්තල ආසනයේ කුඹුරු වගා කිරීම සඳහා ඇති බිම් ප්‍රමාණය මම හිතන්නේ අක්කර 200 ක් පමණ වෙනවා. නමුත් මේ අක්කර 200 ම මේ වනකොට පුරන් වෙමින් පවතින කාලයක තමයි අපි මේ සභාව අමතන්නේ. ඇත්ත වශයෙන්ම වී ගොවිතැනට මූලික තැන දෙනවා කිව්වාට, අද වත්තල ආසනයේ තිබෙන එකම කුඹුරු යාය, මහර වෙල්යාය අද වල් බිහි වෙලා පවතිනවා. ගරු ඇමැතිතුමාට මතක ඇති. මම ඔබතුමාව එක්කරගෙන ගිහිල්ලා පෙන්නුවා. ඒ කුඹුරු යායේ දැන් වැටකෙයියා ගස්, ඒ වාගේම වෙල්ආත්තා ගස් වැවිලා. මුතුරාජවෙල ගණනට දැන් ඒ ස්ථානයත් පත් වෙමින් පවතිනවා. ඒ නිසා පසුගිය දවස්වල ලංකාවේ ඉන්න කෘෂිකර්ම කොමසාරිස් ජෙනරාල්තුමා හම්බ වෙලා, මම යෝජනා කළා. මෙම ස්ථානවල වී වගා කරන්න බැරි නම් වෙනත් අතුරු බෝග වගා කරන්න අවසරය දෙන්නය කියලා. පොල් වැනි ස්ථිර භෝග නොවෙයි. එතුමා ඒ වෙලාවේම මට කිව්වා. ඔබතුමා ගිහිල්ලා ගම්පහ සහකාර ගොවිජන සේවා කොමසාරිස් හම්බ වෙන්න. හම්බ වෙලා 12, 14 හෝ 14, 12 යන වගන්තිය යටතේ පුරන් කුඹුරු අස්වද්දන්න බැරි නම්,

වෙනත් අතුරු භෝග වගා කරන්න පුළුවන් කියන නියෝගය චක්‍රලේඛයකින් නිකුත් කරලා තිබෙනවා. ඒ අනුව ක්‍රියාත්මක කරන්න කියලා. නමුත් මට කියන්න කනගාටුයි. මම දැනට මාස 05 කට විතර ඉස්සෙල්ලා ගම්පහ දිස්ත්‍රික්කය භාර සහකාර කොමසාරිස්තුමියන්ගෙන් ලිඛිතව ලිපියකින් ඉල්ලුවා, මේ ගැන උපදෙස් ලබා දෙන්නය කියලා. නමුත් අද මේ වනතුරු වෙනත් බෝග වගා කිරිම පිළිබඳව උපදෙසක් ලබා දුන්නේ නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම දකින විධියට, හේතුව තමයි අපේ ප්‍රදේශයේ ග්‍රාම සේවක කොට්ඨාශ 46 ට කෘෂි පර්යේෂණ නිලධාරීන් 46 ක් ඉන්නවා. වගා කළා, නොකළා කෘෂි නිලධාරීන් ප්‍රමාණයක් ඉන්නවා. නමුත් වත්තල ආසනයේ ඉන්න සියලුම කෘෂි නිලධාරීන් කිසිම වැඩක් කරන්නේ නැතුව ඒ අය දිනයට එනවා. ඒ දිනයට Office එකට ඇවිල්ලා අත්සන් කරනවා. ඒ රාජකාරියෙන් බැහැරව වෙනත් කටයුතු කරනවා මිසක් නියමිත රාජකාරියක් කරන්නේ නැහැ. අපි කිව්වොත් මේකේ වෙනත් බෝග වග කරන්න ඕනෑ කියලා. ඒකට කන් දෙන්නේම නැහැ. හේතුව වගා කළොත් එහෙම ඒ අයට වැඩ තියෙනවා. ඒගොල්ලෝ මේවා බලන්න ඕනෑ. කෘමිනාශක බෙහෙත් ඉසින හැටි කියලා දෙන්න ඕනෑ. මේ වගා කරන ප්‍රමිතිය කියලා දෙන්න ඕනෑ. ඒ අයට ඇවිල්ලා වගා විනාශවීම් බලන්න වෙනවා. ඒ අයට වැඩ වැඩි වෙනවා. මම හිතන විධියට මේ අය ඒවා බලන්නේ නැත්තේ, මේවා පුරන් වෙලා, කැලෑ බවට පත් වුණාට පස්සේ මුකුත් නැහැ නේ? ඒ අයට පිං පඩි ගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනී, ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ඇමැතිතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා. එක ගොවි නියාමක කෙනෙකුට කියන්න, වත්තල ආසනයේ තිබෙන අක්කර 200 ක් පමණ වන පුරන් වෙල් යායෙන් අක්කර 2 ක් හරි ඔබතුමා අපට දීලා තිබෙන පොතේ තිබෙන අලුත් බෝග, ඒ කියන්නේ කහවනු, ජප්පි, ගෝනබොරු, මසුරන්, හීනැටි, හැටදා වී, සුවඳැල්, කළු හීනැටි, සුදු මුරුංගා, කුරුළු තුඩ ඒ වාගේ අලුත් සහල් ජාති තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම හාල් මම අරගෙන කාලා තිබෙනවා. දේශීය හාල්. කිලෝ එකක් රුපියල් 250 ක් විතර වෙනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

පැරණි සාම්ප්‍රදායික සහල්.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

අඩු ගණනේ එක කෘෂි නිධාරියෙක් පර්චස් 10 ක්, අක්කර කාලක් අස්වැද්දුවොත් එක ආසනයක අක්කර 05 ක්වත් අස්වැද්දුවොත් ගොවීන් මේ ගැන ඉගෙන ගත්තොත් සියලුමගොවීන් මේ මුළු යායම අස්වද්දනවා. නමුත් මෙහෙම ක්‍රමවේදයක් නැහැ. ඇත්ත වශයෙන්ම කෘෂි පර්යේෂණ නිලධාරීන් මෙතුමාගේ යටතේ නොවෙයි ඉන්නේ. ඒ අය මහ ආණ්ඩුව යටතේ ඉන්නේ. ඒ අය වැඩ කරන්නේ ඒ අයට ඕනෑ විධියට. හැමෝම නොවෙයි. සමහර අය මේ ගැන උනන්දු වෙනවා. වත්තල ආසනය ගැන කථා කළොත්, ඒ අයට ඕනෑ නිකම් ඉන්න. කුඹුරු යාය පාළු වෙලා. අස්වද්දන විධියක් නැහැ සර්. ඒවා පුරන් වෙලා. ඒවායේ ගස් වැවිලා කියලා ගෙදරට වෙලා ඉන්නවා. හැබැයි, පඩිය ගන්නවා. මේ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්න ගරු ඇමැතිතුමනි.

ඒත් එක්කම ගරු ඇමැතිතුමනි, ඔබතුමාට දීලා තිබෙන මුදල් දිහා බැලුවාම මට හරි පුදුම හිතෙනවා. මුළු අවුරුද්දටම වියදම් කරන්න දීලා තිබෙන මුදල රුපියල් මිලියන 241 යි. හරියට බැලුවොත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මුදලට හොඳ කිරි හරක් ගත්තොත් 2000 යි ගන්න පුළුවන්. නියම කිරි හරක් ගත්තොත්. ඉතින් මේ කෘෂිකර්මය, පශු සම්පත, සත්ව නිෂ්පාදනය වැඩි කරන්න ඔක්කෝටම දීලා තිබෙන මුදල රුපියල් මිලයන 241 ක්. ඉතින් මේ ගැනත් අපි අවධානය යොමු කරන්න ඕනෑ. ඒ නිසා අපි මහ ආණ්ඩුවේ ගරු ඇමැතිතුමාට කියන්න කියලා ඉල්ලා සිටිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගිය අවුරුද්දේ මම ගිහිල්ලා කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ගෙනාවා ගම්පහ දිස්ත්‍රික්කයේ කුඩා වාරිමාර්ග ට්‍රැක්ටර් පැන්නුම් - එහෙම නැත්නම් වාරිමාර්ගවලට අයත් කුඩා දේවල් හදන්න කෝටි 05 කට වැඩි මුදලක් වෙන් කරලා තිබුණා. ඒ කෝටි 05 වැඩ මේ වනකොට කෙරුවා. නමුත් කෙරුවේ මහ ආණ්ඩුව යටතේ. මහ ආණ්ඩුවේ කෘෂි පර්යේෂණ නිලධාරීන්ට කියනවා. කෘෂි පර්යේෂණ නිලධාරීන් ගමේ හොර ගොවි සමිතියක් අල්ල ගන්නවා. ගොවි සමිතිය කරන්නේ නැහැ. ගොවි සමිතිය කොන්ත්‍රාත්කාරයෙකුට දෙනවා. කොන්ත්‍රාත්කාරයා වැඩ කරනවා. කොන්ත්‍රාත්කාරයා කොමිස් ගහ ගන්නවා. සමිතියට කීයක් හරි ඉතුරු වෙනවා. වැඩේ කෙරෙන්නෙත් නැහැ. සල්ලිත් අපතේ යනවා. වැඩ ගැන අධීක්ෂණය කරන කෙනෙකුත් නැහැ. ඒ වාගේම බස්නාහිර පළාත්

[ගරු ජානක සූරියබණ්ඩාර]

සභාවට වැඩකුත් නැහැ. ඒ නිසා මේ වාගේ සුළු වැඩවත් සුළු වාරිමාර්ග, සුළු ප්‍රතිසංස්කරණ වැඩ කරුණාකරලා ඔබතුමා අවුරුද්දේ මුල් කාලයේදීම කථා කරලා ඒවා බස්නාහිර පළාත් සභාවේ අධීක්ෂණය යටතේ කරන්න ගන්න. ලොකු මුදල් නොවෙයි. ගම්පහ දිස්ත්‍රික්කයේම තිබුණේ කෝටි 5 ද, 6 ද කොහෙද. ගංවතුරෙන් කැඩුණු වේලි හදන්න. අපි මේවාත් අරගෙන ගොවි සමිතිය ළඟට ගිහිල්ලා අපි මෙහෙමයි කරන්නේ, මෙහෙමයි කරන්නේ, කුඹුර අස්වද්දන්නේ කොහොමද කියලා අපි කථා කරමු. එහෙම නැතුව අපි බොරුවට මෙතැන කොපමණ කථා කළත්, සමහර වෙලාවට කෘෂි පර්යේෂණ නිලධාරීන් හිනා වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හරි ලොක්කෝ. කථා කරන්න බැහැ. කුඹුරු යායවල් ගොඩ කරන කොට කියන්නේ, අපට කරන්න දෙයක් නැහැ. මේවා ඉහළින් ආපු ඕඩර්ස්. අහිංසක මිනිහෙක් පර්චස් 10 ක් ගොඩ කරන්න ගියොත් තමන්ගේ හරකාගේ ගොමවලින් ඕවිට ගොඩ වෙනවා නම් - ගරු ඇමැතිතුමනි, ඔබතුමා ළඟට එහෙම කෙනෙක් ආවා නේද? පර්චස් 10 ක් ගොඩ කරන්න. මීහරක් 60 ක් විතර ඉන්නවා. පර්චස් 6 ක් විතර වැඩ කරලා රෑට ඒක ඇතුළට හරක් ටික දාගන්නවා. ගොම් බෙටි ගහලා නිකන් ගොඩ වෙනවා. ඕවිටක් තියෙන්න එපැයි ගොඩ කරගන්න. උන්ව බඳින්න. ඒකටත් ලෙඩේ අදිනවා. නමුත් අක්කර ගණන් ගොඩ කරනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

Highway එක පිටිපස්සේ ඔක්කෝම ගොඩ කරනවා.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගොඩ කරනවා. කවුරුත් නැහැ. ඒවාට ගොවිජන සේවා නැහැ. ගොවි පර්යේෂණ නිලධාරීන් කවුරුත් යන්නේ නැහැ. ඉතින් මේකට ගරු ජනාධිපතිතුමා මැදිහත් වෙන්න ඕනෑ. මැදිහත් වෙලා -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

අපිද ගොඩ කරන්නේ?

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

නැහැ, අපිත් ගොඩ කරන්නේ නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

කාගේ ආණ්ඩුවද?

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

අපි සියලු දෙනාගේම ආණ්ඩුව මේක. තමුන්නාන්සේලාගේත් ආණ්ඩුව. අපෙත් ආණ්ඩුව. ඔබතුමන්ලාට මේ ගැන කථා කරන්න විශේෂ වගකීමක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කරුණාකරලා ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමන්ලා හතර දෙනාම තම තමන්ට අයිති ආසනවලට යන්න. එකට එකතු වුණාම තමයි ප්‍රශ්නය. කරුණාකරලා යන්න. එතුමාට කථා කරන්න දෙන්න. ආදර්ශවත් වෙන්න. ආදර්ශවත් දේශපාලන පක්ෂයක අය නම් එහෙමයි.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම කෘෂි පර්යේෂණ නිලධාරීන් මොකද කරන්නේ? මොනවාද කරන්නේ? ඒගොල්ලෝ ගැන වැඩි අවධානයෙන් ඉඳලා, අඩු තරමේ බස්නාහිර පළාත් සභාවට අයිතියක් තිබෙනවා මාස 06 කට සැරයක්වත් මේ කෘෂි නිලධාරීන්ගෙන් වුණු කාර්ය භාරය මොකක්ද කියලා අපට වාර්තාවක් ගෙන්නගෙන බලන්න. ඒ අයිතිය ලබා ගන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සහයෝගය දක්වනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ විවාදයට සහාය දක්වනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

සහයෝගය දක්වන්න හතර දෙනාට තැන් හතරක් තිබෙනවා. එතැනට ගිහිල්ලයි සහයෝගය දක්වන්න ඕනෑ. මෙතැන කල්ලි ගැහිලා සභාව කඩාකප්පල් කරන්න ඉඩ දෙන්න බැහැ. තව එක පාරයි මම බලන්නේ. නැත්නම් මම මගේ බලය පාවිච්චි කරනවා.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට සත්ව නිෂ්පාදනය. සත්ව නිෂ්පාදනය දිහා බැලුවාම අපේ ගරු ඇමැතිතුමා ඇත්ත වශයෙන්ම මේ සත්ව නිෂ්පාදනය වැඩි කරන්න බොහොම උන්නඳු වෙනවා. ඒක මම හොඳාකාරවම දන්න නිසා උදාහරණයක් හැටියට කියන්නේ. මම මෙතුමාගෙන් ඉල්ලුවා, මට මේ අවුරුද්දේ වටු කුරුල්ලෝ හදන්න ව්‍යාපෘතියක් දෙන්න කියලා. අපි හැමදාම කුකුල්ලු, එළුවෝ, බල්ලෝ, හරක් හදනවා මිසක් අලුත් ව්‍යාපෘති හඳුන්වල දෙන්නේ නැහැ නේ? වටු කරුල්ලෝ ව්‍යාපෘතිය හදලා දෙන්න කියලා. පස්සේ මට ලක්ෂ 05 ක් වෙන් කරලා දුන්නා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දැන් ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරුවා. දැන් සත්තු හම්බ වෙනවා. එක දවසක වියදම ඇරලා රුපියල් 500 ක ආදායමක් ගන්න පුළුවන්. එක පවුලක් වෙනුවෙන් අපි රුපියල් 25,000 යි වැය කරන්න ඕනෑ. එක පවුලක් වෙනුවෙන් කූඩුවයි, සති තුනේ පැටව් 100 ක් දෙනවා. දවස් 45 න් බිත්තර දානවා. බිත්තර 60 ක් වැටෙනවාමයි. ඉතින් බිත්තරයක් රුපියල් 10/- යි. ඉතින් රුපියල් 600/- ක්. දවසකට රුපියල් 100/- ක කුකුල් කෑම කිලෝ එකක් යයි කෑමට. ඒ නිසා මම හෙට අනිද්දා පවුල් 25 කට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනවා. මේ ගරු ඇමැතිතුමා අලුතෙන් සොයාගත්තු දේවල්. ගිය අවුරුද්දේ වටු කුරුල්ලෝ හදලා නැහැ. මේ පොතේවත් නැහැ. ඒ නිසා මම කියන්නේ මේ ගැන අපි කථා නොකර ඉන්නේ නැතුව -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා හොඳ කථාවක් කරන්නේ. නමුත් කනගාටුවෙන් වුණත් කියන්න ඕනෑ තව තත්පර 45 ක් විතර තියෙන්නේ.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මම ඉල්ලා සිටිනවා මේ මන්ත්‍රීවරයෙකුට ලබන අවුරුද්දේ පවුල් 05 කට ඔක්කෝම එපා. මන්ත්‍රීවරු 100 ක් ඉන්නවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු ඇමැතිතුමාගෙන් විනාඩි 02 ක කාලයක් ඔබතුමාට ලැබෙනවා.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

මේ එක මන්ත්‍රීවරයෙකුට පවුල් 05 කට ඒ ව්‍යාපෘතිය කරන්න හදලා දෙන්න. පොඩි ඉඩ ප්‍රමාණයයි යන්නේ. වර්ග අඩි 25 යි. පැටවු 100 යි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු ඇමැතිතුමා ඒක හොඳ ව්‍යාපෘතියක්.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

තට්ටු තුනට ගැහුවාම ප්ලේට් එක ඇඳලා ටැප් එකට අල්ලලා හේදුවා. නැවත ප්ලේට් එකට දැම්මා. පැටවු එළියට ගන්නේ නැහැ. බිත්තර ගන්න විතරයි ඇතුළට අත දාන්නේ. කෑම දාන්නෙ එළියෙන්. වතුර දාන්නේ එළියෙන්. අපි කිව්වාම කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලබා දෙනවා. ඉතින් මම ඒ ව්‍යාපෘතිය හදලා ඉවරයි. හෙට අනිද්දා පැටව් බෙදා දෙනවා. අලුත් ව්‍යාපෘතියක්. ඒ ගෘහණියට අවුරුදු 1 ½ ක් යනකල් ගෙදර ඉඳගෙන රුපියල් 15,000 ක් හොයන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ස්තූතිවන්ත වෙනවා. ඒ වාගේම අපේ ඇමැතිතුමාට ඉදිරියේදී මේ වැඩ කටයුතු කරගෙන යන්න අපගේ පූර්ණ සහයෝගය ලබා දීමට පොරොන්දු වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 12.21]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා, ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමාගේ අමාත්‍යාංශය

[ගරු මහේෂ් අල්මේදා]

යටතේ අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම ගැන. විශේෂයෙන්ම හිටපු කෘෂිකර්ම ඇමැතිවරයෙක් මූලාසනයේ ඉන්න වෙලාවේ කථා කරන්න අවස්ථාව ලැබීම ගැනත් මම සතුටු වෙනවා. ඒ වාගේම ඉතාම සොඳුරු ඇමැතිවරයෙක්. බොහොම සෞන්දර්යයෙන්ම පිරුණු ඇමැතිවරයෙකුගේ අමාත්‍යාංශයේ කථා කරන්න ලැබීම ගැනත් සතුටු වෙනවා. එතුමා බොහොම කාර්යක්ෂම ඇමැතිවරයෙක්. වැඩ කරන ඇමැතිවරයෙක්. මම හිතන්නේ, බස්නාහිර පළාත් සභාවේ තිබෙන අමාත්‍යාංශ අතරින් බොහොම කාර්යක්ෂම අමාත්‍යාංශය තමයි මේ අමාත්‍යාංශය කියලා කියන්න පුළුවන්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ආදර්ශවත් ඇමැතිවරයෙක්. මොකද, අද දවසේ දිගටම මේ සභාවේ හිටියා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ආදර්ශවත් ඇමැතිවරයෙක්. පැය 24 වැඩ කරනවා. මම හිතන්නේ ඇමැතිවරයෙක් වුණාම එහෙම වැඩ කරන්න ඕනෑ. නැත්නම් මේ සේවාව ජනතාවට දෙන්න පුළුවන්කමක් නැහැ. අපේ බියගම මන්ත්‍රීතුමා කිව්වා වාගේ අමාත්‍යාංශයෙනුත් ඒ සහයෝගය හම්බ වෙනවා. අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ඉඳලා සියලු දෙනා බොහොම මිත්‍රශීලීයි. බොහොම කාර්යක්ෂම නිලධාරීන්. ඒ සියලු දෙනාගේ සහයෝගය මත මේ අමාත්‍යාංශය බොහොම කාර්යක්ෂමව යනවා. නමුත් මම පුංචි අඩුපාඩුවක් ගැන තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථා කරන්න හදන්නේ. විශේෂයෙන්ම මුලින්ම කියන්න ඕනෑ. අපි දන්න කාරණයක් තමයි රටේ රජ්ජුරුවෝ වෙලා ඉන්නේ, නායකයා වෙලා ඉන්නේ ගොවියෙකුගේ පුතෙක්. එතුමා පසුගිය කාලය පුරාම කිව්වා මේ රටේ කෘෂිකාර්මික සංවර්ධනය සිද්ධ කරන්න ඕනෑ කියලා. හැබැයි බස්නාහිර පළාතේ -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

රජ්ජුරුවෝ හිටියේ ඉස්සර.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

නැහැ මම කිව්වේ ගොවියෝ රජ්ජුරුවො නේ? ගොවි රජෙකුගේ පුතෙක්. ඒ නිසා එතුමා රජ කෙනෙක්. ගොවි රජෙක්ගේ පුතෙක්.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

රජා ගියා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

රජා තාම ගියේ නැහැ. රජා ආපහු එනවා. කලබල වෙන්න එපා. රජා ඉන්නවා. රජා ආපහු එනවා. එනකල් ඉවසගෙන ඉන්න. මම කියන්න හැදුවේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම කෘෂිකාර්මික සංවර්ධනයක් රටට අවශ්‍යයි කියලා කියන වෙලාවක, මේ අයවැයේ මුදල් කපලා අපේ ඇමැතිතුමාගේ සල්ලිත් විශාල ගණනක් කපලා දාලා තිබෙනවා. 2016 රුපියල් මිලියන 360, 2017 රුපියල් මිලියන 41 ක් කරලා. රුපියල් මිලියන 119 ක්ම කපලා දාලා. මේකේදී මම විශේෂයෙන්ම කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව ගැන. සත්ව නිෂ්පාදනය පිළිබඳව. මොකද, අපි ජීවත් වෙන්නේ අවිස්සාවේල්ල ආසනයේ. එය සත්ත්ව නිෂ්පාදනය බහුලව තිබෙන, සත්ත්ව නිෂ්පාදන ගොවීන් බහුලව ඉන්න ප්‍රදේශයක්. මේ ලබා දීලා තිබෙන මුළු මුදලින් රුපියල් මිලියන 52 යි සත්ත්ව නිෂ්පාදනය වෙනුවෙන් දීලා තිබෙන්නේ. ඒක ඉතාම අල්ප මුදලක්. වැඩ කරන ඇමැතිවරයෙකුට මීට වැඩිය සල්ලි දෙන්න ඕනෑ. හැබැයි, ඉතාම අඩු මුදලක් දීලා තිබෙන්නේ. ඉතින් මේ මුදලින් මේ දෙපාර්තමේන්තුව කළමනාකරණය කර ගන්නේ, කොහොමද? කියන ප්‍රශ්නය මට තිබෙනවා.

විශේෂයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සත්ව නිෂ්පාදනය වෙනුවෙන් වැඩ කරන්න පශු වෛද්‍ය කාර්යාල 32 ක් තිබෙනවා. පශු වෛද්‍ය නිලධාරීන් 47 ක් ඉන්නවා. සත්ත්ව සංවර්ධන උපදේශකවරු, LDI ලා 130 ක් ඉන්නවා. මේ LDI ලා 130 තමයි සත්ත්ව නිෂ්පාදනයෙන් පළාත සංවර්ධනය කරනවාද, නැද්ද කියන කාරණය තීන්දු කරන්නේ. හැබැයි ඉතාම කනගාටුවෙන් කියන්න ඕනෑ. මට තේරෙන විදියට අපේ පළාත් අධ්‍යක්ෂතුමා මේ LDI ලාගේ ප්‍රාණ ඇපකරුවෙක් වෙලා ඉන්නවා. මේ LDI ලාට

වෘත්තීය සංවිධානයක් තිබෙනවා. වෘත්තීය සමිතියක්. ඒ වෘත්තීය සමිතිය මෙහෙයවන්නේ ඉතාම කඩාකප්පල්කාරී දේශපාලන පක්ෂයක්. මේ සභාවෙත් කඩාකප්පල්කාරී වැඩේ කරන්නේ, ඒගොල්ලන් කියලා ඔබතුමා කිව්වා. ඒ නිසා මේ දේශපාලන පක්ෂය තමයි මේ වෘත්තීය සමිතිය මෙහෙය වන්නේ. මේ වෘත්තීය සමිතිය සත්ත්ව නිෂ්පාදනය ඉහළ දමන්න තිබෙන හැම තැනක්ම වහලා, ඒ අයගේ අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කරමින් වෘත්තීය අයිතිවාසිකම් භුක්ති විඳීම විතරයි කරන්නේ. මම මේකට උදාහරණයක් කියන්න ඕනෑ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ප්‍රධාන වශයෙන් මම ගව පාලනය පිළිබඳව කිව්වාම අපි දන්නවා, ගව පාලනයේ අලුත් සත්තු, හොඳ පැටවුන් බිහි කර ගන්නේ කෘතිම සිංචනය මගින් කියලා. 2016 වසරේ 18,691 ක් කෘතිම සිංචනය කරලා තිබෙනවා. 2015 දී 22,556 ක් කරලා තිබෙනවා. මේකෙන් 2016 දී පැටවු 5437 ක් බිහි කරගෙන තිබෙනවා. මේ කෘතිම සිංචන ක්‍රියාවලිය එහෙම් පිටින්ම කරන්නේ, සත්ත්ව සංවර්ධන උපදේශකවරු. මේ කෘතිම සිංචනය කරන කොට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි හැමෝම දන්නවා. සතෙක් ගැබ්බර වෙන කාලයක් තිබෙනවා. මේ කාලයට තමයි මේ කෘතිම සිංචන ක්‍රියාවලිය කරන්නට ඕනෑ. දැන් පාදුක්ක පශු වෛද්‍ය කාර්යාලයට අදාළව මේ කෘතිම සිංචනය කරන්න පුළුවන් LDI ලා 06 දෙනෙක් විතර මීට කාලයකට ඉස්සෙල්ලා හිටියා. දැන් අද ඉන්නේ එක්කෙනයි. මේ 130 න් කොස්ගම පශු වෛද්‍ය කාර්යාලයට ඉන්නේ, තව එක්කෙනෙක් විතරයි. මම දන්නේ නැහැ, මේ අයව බෙදලා තියෙන්නේ මොන විධියටද කියලා. මම ගරු ඇමැතිතුමාට කියනවා මේක හොයලා බලන්න කියලා. මේ වැඩ කරන නිලධාරියා සතුන් ගැබ් ගන්න කාලයට නොවෙයි, ගොවියෝ හම්බ වෙන්න එන්නේ. ගොවියෝ ගිහිල්ලා පශු වෛද්‍ය කාර්යාලයට කියනවා. ගොවියෝ ඈත දුෂ්කර ප්‍රදේශවල ඉඳලා බොහොම අමාරුවෙන් පශු වෛද්‍ය කාර්යාලයට ගිහිල්ලා, හම්බ වෙන්නේ. හම්බ වෙලා LDI ට කිව්වාම LDI ක්ෂේත්‍රයට එන්නේ සතා ගැබ් ගන්න කාලයට නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ LDI ලාට ආණ්ඩුවෙන් පඩි ගෙවනවා. මේ අයට ගොවියාගෙන් මුදල් ගන්න අයිතියක් නැහැ. හැබැයි, මේ එන හැම වාරයකදීම ඒ අය ගොවියාගෙන් මුදල් ගන්නවා. එක වතාවක් මේ සභා ඉන්න තැනට යන්න රුපියල් 800/- ක විතර මුදලක් අය කරනවා. සමහර වෙලාවට ගොවියෝ ඒ අයගේ වාහන වලින් තමයි මේ LDI ලාව අරගෙන ක්ෂේත්‍රයට එන්නේ. එදා සතා ගැබ් ගත්තේ නැත්නම් තව අවස්ථාවක් එනවා. ඊට පස්සේ තව අවස්ථාවක් එනවා. මේක හිතා මතා මේ LDI ලා කරන වැඩක්. සතා ගැබ් නොගන්නා කාලයට ඇවිල්ලා සතාව ගැබ් ගන්වන්න උත්සාහ කරනවා. සතා ගැබ් ගන්නේ නැහැ. නමුත් අර මුදල අරගෙන යනවා. අවස්ථා තුනකදී විතර එනවා. එතකොට සතා ගැබ් ගැන්වීම සඳහා අවශ්‍ය මේ කටයුත්ත කරන්න ගොවියෝ අවස්ථා තුනකදී තමන්ගේ අතින් මුදල් ගෙවන්න ඕනෑ.

ඉතින් මම අවස්ථා ගණනාවකදී කිව්වා, මේ කෘතිම සිංචනය කරන, පෞද්ගලිකව ඉගෙන ගත්තු අය ඉන්නවා. පේරාදෙණියෙන් අවශ්‍ය අධ්‍යාපනය ලබා ගත්තු අය ඉන්නවා. මම අවස්ථා ගණනාවකදී කිව්වා. දැන් මම අවුරුදු 02 ක් තිස්සේ ලිපි ලියනවා. මම ගරු ඇමැතිතුමාටත් කිව්වා. මම සත්ව නිෂ්පාදන පළාත් අධ්‍යක්ෂතුමාට කිව්වා. මේ අයට කෘතිම සිංචන කට්ටලයක් දෙන්න. ගම්වල ඉන්න නිසා ඒ අයට පුළුවන් මේ කටයුත්ත කරන්න කියලා. හැබැයි, ඒ කෘතිම සිංචන කට්ටලය දුන්නේ නැහැ. දුන්නේ නැත්තේ, මේ වෘත්තීය සමිතිය තදින් කියා සිටිනවා, පෞද්ගලිකව කිසි කෙනෙකුට මේ කෘතිම සිංචන කට්ටල දෙන්න එපාය කියලා. මේ සත්ත්ව නිෂ්පාදන භාර පළාත් අධ්‍යක්ෂතුමාව ප්‍රාණ ඇපයට තියාගෙන මේ අවස්ථාව නොදී ඉන්නවා. ඒ නිසා ගොවියන්ට තිබෙන අවස්ථාව උදා කර ගන්න බැරුව යනවා. ගොවියන්ට පහසුවෙන් ලබා ගන්න තිබෙන අවස්ථාව උදා කර ගන්න බැරුව යනවා. එහෙම කළාම වෙන්නේ, මේ සත්ව නිෂ්පාදනය ඉහළ යන්න තිබෙන අවස්ථාව නැති වෙලා යනවා. මේක බොරු කියලා කියනවා. ඔබතුමාට තේරෙනවා මේ මම කියන්නේ කා ගැනද කියලා. මොන වෘත්තීය සමිතිය ගැනද කියලා ඔබතුමාට තේරෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මුහුණ දිහා බැලුවාම තේරෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මුහුණ දිහා බැලුවාම තේරුම් ගන්න පුළුවන්කම තිබෙනවා. මේ වෘත්තීය සමිතිය බලහත්කාරය පාවිච්චි කරලා මේ වැඩේ කරන නිසා සත්ව නිෂ්පාදනය ඉහළ දැමීම බස්නාහිර පළාතේ ඉතාම අසීරු තත්ත්වයකට ගිහිල්ලා තිබෙනවා.

[ගරු මහේෂ් අල්මේදා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට කියන්න ඕනෑ. සත්තු ඉන්නවා. බස්නාහිර පළාතේ එළ ගවයේ 76,656 ක් ඉන්නවා. 76,656 ක්. ඉතින් මේ 76,656 පාවිච්චි කරලා කොයිතරම් ප්‍රමාණයක් අලුත් පැටව් බිහි කරන්න පුළුවන්ද? ඒ විතරක් නොවෙයි. අනෙක් සත්තුන්ගෙත් එහෙමයි. දැන් සූකර නිෂ්පාදනයට අවශ්‍ය කරන ඌරන්ගේ, ඒ වාගේම එළුවන්ගේ, මේ සියලු සත්ත්ව නිෂ්පාදන කටයුතු සංවර්ධනය කරන්න වගකීම පැවරිලා තිබෙන්නේ, මේ LDI ලාට. සත්ත්ව සංවර්ධන උපදේශකයින්ට. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා ඔබතුමා හරහා ගරු ඇමැතිතුමාට කියනවා, මේ සත්ත්ව සංවර්ධන උපදේශකයින්ගේ ක්‍රියාකාරීත්වය ගැන ඉතා සූක්ෂමව, ඉතා සමීපව හොයලා බලලා, ඒ අය ක්ෂේත්‍රයේ කටයුතුවලට යොදවන එක නියම විධියට කරන්න කියන කාරණය දැනුවත් කරනවා.

ඊත් එක්කම මම මතක් කරන්න ඕනෑ. මේ සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථාන පිහිටුවලා තිබෙනවා. දැන් මේ පුහුණු මධ්‍යස්ථාන දෙකයි පළාතේ තිබෙන්නේ. එකක් කොටදෙණියාවේ තිබෙනවා. එකක් හොරණ තිබෙනවා. ගරු ඇමැතිතුමා කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරන නිසා මම ඔබතුමා හරහා ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථානයක් කොළඹ දිස්ත්‍රික්කයේ අවිස්සාවේල්ල ආසනයේ තැනක පිහිටුවලා දෙන්න කියලා. අවිස්සාවේල්ල ආසනය ඇතුළේ පශු වෛද්‍ය මධ්‍යස්ථාන දෙකක් තිබෙනවා. මේ දෙකට සම්බන්ධව එක ස්ථානයක් පිහිටුවන්න පුළුවන්කම තිබෙනවා. ඇත්ත වශයෙන්ම, ඒ පුහුණු වැඩ සටහන් කළ යුතුව තිබෙනවා. එහෙම නැත්නම්, මේ තනිව කරන ගොවීන් පුහුණු කරන්න පුළුවන්කමක් නැහැ. මේ පුහුණු පාඨමාලා පිළිබඳව ඔබතුමාගේ පොතේ සඳහන් කරලා තිබෙන තොරතුරු අනුව, සූකර පුහුණු වැඩ සටහන් එකක්වත් මේ අවුරුද්දේ කරලා නැහැ. ගිය අවුරුද්දේ අටක්ද, දහයක්ද කළා කියලා මේ පොතේ සඳහන් වෙලා තිබෙනවා. නමුත් මේ අවුරුද්දට අදාළව එකම වැඩ සටහනක්වත් කරලා නැහැ. අනෙක් පුහුණු වැඩ සටහනුත් ගිය අවුරුද්දට සාපේක්ෂව සමස්තය අඩුවක් විධියට තමයි සඳහන් වෙලා තිබෙන්නේ. පුහුණු වැඩ සටහන් කෙරිලා නැහැ. ඒ නිසා පුද්ගලික අංශයේ ගොවීන්, ගෙවල්වල කරන අයට අදාළව පුහුණුව දෙන්නට ඕනෑ. ඒ නිසා ඒ පුහුණු වැඩ සටහන් - පුහුණුව ගැන අපි හැම වෙලාවේම කථා කරනවා. ඒ නිසා මේ වෙලාවේත් කථා කරන්න සිද්ධ වෙනවා. මේ පුහුණු වැඩ සටහන් සඳහා පුහුණු මධ්‍යස්ථානයක් කොළඹ දිස්ත්‍රික්කය වෙනුවෙන් අවිස්සාවේල්ල ආසනයේ පිහිටුවලා දෙන්න කියන ඉල්ලීමත් ගරු ඇමැතිතුමාගෙන් කරනවා.

ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාතේ ජනතාවගේ ප්‍රෝටීන් ඌනතාවයට මේ සත්ත්ව නිෂ්පාදනයෙන් ලැබෙන සහයෝගය අතිවිශාලයි. ඒ නිසා සත්ත්ව නිෂ්පාදන කටයුත්තට ඔබතුමාගේ වැඩි දායකත්වයක් දීලා, ඒ කටයුත්තේදී විශේෂයෙන් සත්ත්ව නිෂ්පාදනය භාරව ඉන්න පළාත් අධ්‍යක්ෂතුමා බොහොම හොඳ වෛද්‍යවරයෙක්. හැබැයි අර LDI ලාගේ ප්‍රාණ ඇපකරුවා වෙන්නේ නැතුව, මේ වෘත්තීය සමිතියේ, දේශපාලන පක්ෂයේ ප්‍රාණ ඇපකරුවා වෙන්නේ නැතුව මේ නිෂ්පාදනය වැඩි කරන්න ඔබතුමාගේ දායකත්වය වැඩියෙන් ලබලා දෙන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 12.31]

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශයට අදාළව මේ විවාදයේදී මා අමාත්‍යතුමාගේ විශේෂ අවධානයට යොමු කරන්න සූදානම් වන්නේ, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය පිළිබඳව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වනකොට අපේ රටේ කිරි නිෂ්පාදනය කරන්නේ 17% ක් පමණයි. හැබැයි 83% ක්ම විදේශ රටවලින් තමයි කිරි ආශ්‍රිත නිෂ්පාදන ගෙන්වන්නේ. ඒ ගෙන්වීමේදී අපි මේ කිරි ආශ්‍රිත නිෂ්පාදන ගෙන්වීමට රට තුළින් විදේස් රටවලට කෝටි 1200 ක් වියදම් කරනවා. ඒ නිසා අපි මේ කෝටි 1200 රට තුළ ඉතිරි කර ගන්නා රටක් හැටියටත්, බස්නාහිර පළාත් සභාව හැටියටත් වැඩ පිළිවෙළක් තිබෙනවාද කියන එක පිළිබඳව මට ගැටළුවක් තිබෙනවා. විශේෂයෙන්ම කියන්න ඕනෑ පසුගිය කාලය තුළ මම ඔබතුමාගේ විශේෂ අවධානයට යොමු කළා, මේ සත්ව පාලනයේ ප්‍රධාන ගැටළුවක් වෙලා තිබෙන ගව සොරකම පිළිබඳව. ඒකේදී අපි සමත් වෙලා නැහැ. ගොවියාට පොඩි හෝ සහනයක්

දීලා, මේ සත්ත්ව සොරකම පිළිබඳව මොකක් හෝ වැඩ පිළිවෙළක් හදලා, මේ සොරකම අඩුම ගාණනේ තාවකාලිකව හෝ නතර කිරීමට. එක දිගටම මේ ක්‍රියාවලිය සිදු වෙමින් යනවා. අගොස්තු 09 වැනිදා මමත්, අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාත් අහපු ප්‍රශ්නයට ඔබතුමා පශු වෛද්‍ය කාර්යාල මට්ටමින්උත්තර දෙනවා. පාදුක්ක පශු වෛද්‍ය කාර්යාලයේ සතුන් 60 කුත්, හොරණ පශු වෛද්‍ය කාර්යාලයේ සතුන් 35 කුත්, ඉංගිරිය පශු වෛද්‍ය කාර්යාලයේ සතුන් 22 කුත්, කොස්ගම පශු වෛද්‍ය කාර්යාලයේ සතුන් 21 කුත්, කඩුවෙල සතුන් 51 කුත් නැති වුණාය කියලා. ඇත්තටම මේ සතුන් නැති වන ප්‍රමාණය ඉතාම අල්ප වශයෙන්. කළුතර දිස්ත්‍රික්කයේ නැති වන ප්‍රමාණය ගත්තොත් මීට වැඩිය විශාල ප්‍රමාණයක් දෛනිකව සොරකමට ලක් වෙනවා.

ඒ වාගේම ගරු ඇමැතිතුමාගේ විශේෂ අවධානයට යොමු කරන්න මා උත්සාහ කරනවා. අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කෘතිම සිංචනය පිළිබඳව කිව්වා. කෘතිම සිංචනය සිදු කරන සත්ත්ව සංවර්ධන උපදේශකවරු පිළිබඳව. ඇත්තට ගත්තොත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට දැනගන්න ලැබුණා, බස්නාහිර පළාත තුළ මේ සත්ව සංවර්ධන උපදේශකවරු 43 දෙනෙකුගේ හිඟයක් තිබෙනවා කියලා. කළුතර දිස්ත්‍රික්කය තුළ 11 දෙනෙකුගේ හිඟයක් තිබෙනවා කියලා. ලබන අවුරුද්ද තුළ තවත් 12 දෙනෙක් විශ්‍රාම යන්න සූදානමින් සිටිනවා කියලා. එතකොට එතුමා කිව්වාට, විශාල ප්‍රමාණයක අඩුවක් තිබෙනවා. ඒ නිසා පුළුවන් තරම් ඉක්මණින් මේ සත්ත්ව සංවර්ධන උපදේශකවරු බඳවා ගැනීමටඅපි උත්සාහ කරන්න ඕනෑ. ඒ වාගේම තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගිය වසෙර්දී ඔබතුමා ඉදිරිපත් කළ මේ සංඛ්‍යා ලේඛන අනුව අපේ බස්නාහිර පළාත තුළ සතුන් 76,656 ක් ඉඳිද්දී, ගිය වසරේ සම්පූර්ණයෙන් කිරි නිෂ්පාදනය කරලා තිබෙන්නේ, මිලියන 23.64 යි. මේකේදී අපි දිනයක් ලෙස ගත්තොත් එහෙම දවසකට කිරි නිෂ්පාදනය කරලා තියෙන්නේ, ලීටර් 64,767 යි. හැබැයි අපේ බස්නාහිර පළාත තුළ සතුන් 76,656 ක් ඉන්නවා. එහෙම ඉඳිද්දී අපි කිරි නිෂ්පාදනය කරලා තිබෙන්නේ, ලීටර් 64,767 යි. එහෙම බැලුවොත් එහෙම 0.84 ක් තමයි අපි දවසකට කිරි නිෂ්පාදනය කරලා තිබෙන්නේ. මේ ප්‍රමාණය වැඩි කරන්න අපේ වැඩ පිළිවෙළක් තිබෙනවා නම් - අඩුම ගණනේ හොඳ සත්තු ඉන්නවා. කිරි ලීටර් 10 ක්, 15 ක්, 20 කට ආසන්නව කිරි දොවා ගන්න පුළුවන් සත්තු අපේ ප්‍රදේශයේ, බස්නාහිර පළාත තුළ ඉන්නවා. එවැනි සතුන් ප්‍රමාණයක් - මේ එළ ගවයෝ සංඛ්‍යාවෙන් මේ 76,656 තුළින් භාගයක්වත් කිරි ලීටර් 15 ක් දක්වා නිෂ්පාදනය වැඩි කරන්න හැකියාව තිබෙනවා නම්, අපට පුළුවන් බස්නාහිර පළාතේ මීට වැඩිය කිරි ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීමට.

ඒ වාගේම ගරු ඇමැතිතුමාගේ විශේෂ අවධානයට යොමු කරන්න ඕනෑ. විශේෂයෙන්ම මේ වසරේ ගත්තත්, මුල් මාස 10 තුළ ගත්තත් නිෂ්පාදන ක්‍රියාවලියේ වැඩිවීමක් සිදු වෙලා නැහැ. 2016 මාස දහයක් තුළ දශම දෙකක නිෂ්පාදන ක්‍රියාවලියක් තමයි වෙලා තිබෙන්නේ. ඒ වාගේම ඔබතුමා උපදේශක කාරක සභාවේදීත් අපට පෙරොන්දු වුණා, ගව සොරකම් පිළිබඳව කොරියාවෙන් RFIT කියන තාක්ෂණය හඳුන්වල දීලා, මේ සම්බන්ධව මැදිහත් වීමක් කරනවා කියලා. ඒ පිළිබඳවත් විශේෂ අවධානයක් යොමු කරන්නය කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම තමයි අපි ගත්තොත් එහෙම සත්ත්ව සංවර්ධන විෂයයට අදාළව, මේ පොතේ සඳහන් වන ආකාරයට, ගිය වසරේ වෙන් කරලා තිබෙන මුදල රුපියල් මිලියන 144.39 ක් වෙනවා. නමුත් 2014 දී සඳහන් වෙන්නේ, රුපියල් මිලියන 52 යි. මේ මුදල වියදම් කරලා, අපට ගිය වසරේ තරම් මුදල් ප්‍රමාණයක් නැතුව කොහොමද මේ සත්ත්ව සංවර්ධනය පැත්තෙන් කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි විශේෂයෙන්ම අපි මතක් කරන්න ඕනෑ, අද මේ වනකොට බස්නාහිර පළාත තුළ ඉඩම් ප්‍රමාණය විශාල වශයෙන් හිඟ වීමක් තිබෙනවා. විශේෂයෙන්ම ඉඩම් වෙන්දේසි කිරීම තුළ අද ඉඩම් කුඩා කුඩා ප්‍රමාණවලට කඩනවා. වෙන්දේසි කරනවා. ඒ නිසා අද ගොවීන්ට විශාල ගැටළුවක් මතු වෙලා තිබෙනවා. ඔවුන්ට ආහාර සැපයීමට තෘණ වගාව සඳහා තිබෙන ඉඩම් ප්‍රමාණය අඩු වීම. ඒ නිසා විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ. මේ හැම ගොවියාම උත්සාහ දරන්නේ, තෘණ වෙනුවට වැඩිපුර සාන්ද්‍ර ආහාර ප්‍රමාණයක් මේ සතුන්ට ලබා දෙන්න. අපි දන්නවා අද වෙළඳ පොළේ ගත්තොත් සාන්ද්‍ර ආහාර දිනෙන් දින, දිනෙන් දින අධික ලෙස මිල යෑම නිසා ගොවියාට ඒ නිෂ්පාදනයේදී තිබෙන ලාභය අඩු වෙමින් පවතිනවා.

[ගරු නන්දන පත්මකුමාර]

ඒ වාගේම තමයි කිරි නිෂ්පාදනය කිරීමේදී ගොවියාට ලැබෙන මිල පිළිබඳව අපි විශේෂ අවධානය යොමු කරන්න ඕනෑ. අපි දන්නවා. අද බස්නාහිර පළාත තුළ ගත්තොත් එහෙම, ඒ නිෂ්පාදනය කරන කිරි ටික ලබා ගන්න විශාල තරගකාරීත්වයක් තිබුණත්, ගොවියාට ලැබෙන මුදල ගත්තොත්, ඉතාම අඩු ප්‍රමාණයක් තමයි ලැබෙන්නේ. අපි බලාපොරොත්තු වුණා, මෙවර අයවැයේදී කිරි ගොවියාට කිරි සඳහා මේ වසරේදී විශේෂ මිලක් නියම කරයි කියලා. නමුත් අපි දැක්කේ නැහැ, කිරිවලට ඒ මිල වැඩි කිරීම සම්බන්ධව මැදිහත් වීමක් කරනවා. ඒ වාගේම අපි කොපමණ කිරි නිෂ්පාදනය කළත්, අපි වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. බස්නාහිර පළාත තුළ නිෂ්පාදනය වන කිරි ප්‍රමාණය දියර කිරි වශයෙන් අලෙවි කර ගන්න වැඩ පිළිවෙළක් සකස් කරලා - අඩුම ගණනේ පාසල් පද්ධතිය තුළ, එහෙම නැත්නම් පෙර පාසල් පද්ධතිය තුළ, එවැනි වැඩ පිළිවෙළක් හදලා දියත් කළොත් තමයි, අපට දියර කිරි නිෂ්පාදනය කරන ප්‍රමාණය ප්‍රචලිත කරලා ඔවුන් තුළ ආකල්පයක් හදන්න පුළුවන් වන්නේ. දියර කිරි ප්‍රචලිත කිරීමේ වැඩ සටහනක් හදා ගන්න ඕනෑ. එහෙම නැති වුණොත් අද සමාජය අතර ආකල්පයක් තිබෙනවා මේ දියර කිරි පරිභෝජනය කළොත් සෙම හැදෙනවා. විවිධ ලෙඩ රෝග මතු වෙනවා කියලා. ඒ නිසා එම ආකල්පය නැති කරන්න නම් ඔබතුමා මැදිහත් වෙලා අපේ පළාත් සභාව තුළ වෙනම වැඩ සටහනක් සකස් කරන්න වෙයි. මේ දියර කිරි ප්‍රචලිත කිරීමේ හා දරුවන් තුළ මේ තිබෙන ආකල්පය වෙනස් කිරීම සඳහා පාසල් මට්ටමින්, ගම් මට්මින්, එහෙම නැත්නම් පෙර පාසල් මට්ටමින් අපි මුදල් ආයෝජනය කරලා පුළුවන්කමක් තිබෙනවා නම් මම හිතනවා, එය හොඳ ක්‍රියාවලියක් කියලා.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. අපි ගත්තොත් එහෙම එළ ගව වාගේම තමයි මීගව නිෂ්පාදනයේදීත් ඔබතුමා ඉදිරිපත් කරලා තිබෙන පොතේ සංඛ්‍යා ලේඛන ගත්තොත් එහෙම, ගිය වසරට වැඩිය අඩු ප්‍රමාණයක් තමයි නිෂ්පාදන ක්‍රියාවලියේ සිදු වී තිබෙන්නේ. එළු නිෂ්පාදනය ගත්තත් එහෙමයි. මම දකින්නේ ගිය වසරට වැඩිය මුදල් ප්‍රමාණය අඩුයි. නිෂ්පාදන ක්‍රියාවලියේ යම් ප්‍රමාණයක අඩුවීමක් තිබෙන නිසා අපි මොකක් හරි විදේශ වැඩ පිළිවෙළක්, කෙටි හා දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් හදලා මේ වැඩ පිළිවෙළ ඉස්සරහාට යන විධියට අපේ නිලධාරී පිරිසත් සම්බන්ධ කරගෙන - ඔබතුමාට හොඳ නිලධාරීන් සංඛ්‍යාවක් ඉන්නවා. උදව් කරන්න නිලධාරීන් විශාල ප්‍රමාණයක් සැදී පැහැදී ඉන්නවා. අපි පසුගිය කාලයේ දැක්කා. ඔවුන්ගේ සහයෝගයත් අරගෙන, විශේෂයෙන්ම උපදේශක කාරක සභාවේ ඉන්න මන්ත්‍රීවරුන් මේ ක්ෂේත්‍රයට අදාළව නිතරම කථා කරනවා. මැදිහත් වෙනවා. යෝජනා ඉදිරිපත් කරනවා. ඒ නිසා ඒ සියලු දේවල් සම්බන්ධ කර ගනිමින් මේ බස්නාහිර පළාත තුළ විශේෂයෙන්ම සත්ව නිෂ්පාදනය, සෞඛ්‍ය විෂයයට අදාළව විශාල මැදිහත්වීමක් කරන්න හැකියාව ලැබුණොත් අපට පුළුවන්, බස්නාහිර පළාත තුළ හොඳ සත්ත්ව හා සෞඛ්‍ය නිෂ්පාදනයක් ක්‍රියාවලියකට දායකත්වය ලබා ගන්න.

ඒ වාගේම විශේෂයෙන්ම මම ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. පළාත් ඉඩම් කාර්යාලය පිළිබඳව ගැටළුවක් මතු වෙමින් තිබෙනවා කියලා මට දැන ගන්න ලැබුණා,විශේෂයෙන්ම කළුතරත් ගම්පහත් පළාත් ඉඩම් කාර්යාල ඉවත් කරන්න යම් සූදානම් තිබෙනවා කියලා. ඇත්ත වශයෙන්ම ගත්තොත් එහෙම, වෙනත් පළාත් සභා මේ පළාත් ඉඩම් කාර්යාල සවිමත් කරද්දී, අපි එහෙම ක්‍රියාවලියකට ගියොත් එහෙම ලොකු ගැටළුවක් මතු වෙයි. එම නිසා ඒ පිළිබඳව ඔබතුමාගේ විශේෂ අවධානයත් යොමු කරමින් ඉදිරි 2017 වර්ෂයේ දීර්ඝ කාලීන හා කෙටි කාලීන විශේෂ වැඩ පිළිවෙළක් හදලා මේ සත්ත්ව සංවර්ධන ක්ෂේත්‍රයට අදාළව බස්නාහිර පළාත තුළ ප්‍රගතියක් ගන්න නම්, ඒ වැඩ පිළිවෙළ නිසියාකාරව ක්‍රියාත්මක කරලා, පසුවිපරමක් කරලා ක්‍රියාත්මක කළොත් පමණයි අපට, මේ අදාළ තැන ඉලක්ක සහගත ජයග්‍රහණය කරන්න ලැබෙන්නේ. ඒ ගැන ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.41]

**ගරු පූජ්‍ය තෙබුවන පියනන්ද හිමි**
Hon. Rev. Thebuwana Piyananda Thero

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට අදහස් දක්වන්න මම ඉදිරිපත් වෙන්නේ ඉතාමත්ම සන්තෝෂයෙන්. මම මේ පළාත් සභාවට පත් වෙලා සහභාගී වන හයවැනි අයවැය විවාදයයි මේ. මම නියෝජනය කරන උපදේශක කාරක සභාව අයිති අමාත්‍යාංශය හැටියට, මේ අමාත්‍යාංශය පිළිබඳව දැන්

ඒ ඒ විෂයය පථයන්ට අදාළව මන්ත්‍රීවරු හුහක් දෙනෙක් අදහස් ඉදිරිපත් කළා. ඒ නිසා මම පොදු අදහසක් හැටියට යමක් කථා කරන්න කල්පනා කරනවා. පළාත් සභාවේ අමාත්‍යාංශවල ආහාර අමාත්‍යාංශය කියලා එකක් නැහැ. නමුත් ඒ වගකීම පැවරෙන්නේ මේ අමාත්‍යාංශයට. මේකට අයිති විෂයය පථයන්ගෙන් කෘෂිකර්ම, ධීවර, සත්ව නිෂ්පාදන මේ සියල්ලම ආහාර නිෂ්පාදනයට අදාළ අංශ. ඊට අමතරව ඉඩම් ගත්තත් එහෙමයි. ඒ නිසා බස්නාහිර පළාතට අවශ්‍ය කරන ආහාර නිෂ්පාදන ක්‍රියාවලියේ සැලකිය යුතු කාර්ය භාරයක් මේ අමාත්‍යාංශයට පැවරිලා තිබෙනවා. එතකොට මේකෙදී මට මතු කරන්න තිබෙන ප්‍රධානම කාරණය තමයි වර්තමානය වනකොට අපි ජීවත්වීම සඳහා ආහාර ගන්නවාද? මැරෙන්න ආහාර ගන්නවාද? කියන ප්‍රශ්නය අද අපේ සමාජය තුළ මතු වෙලා තිබෙන කාරණයක්.

මොකද, අද වැඩි දෙනෙක් කන දේවල් ගත්තත්, බොන දේවල් ගත්තත් ජීවත් වෙන්න බලපාන සාධකවලට වඩා, මැරෙන්න බලපාන සාධක අපි ගන්න ආහාරවල වැඩියි කියන එක බොහොම පැහැදිලියි. අපේ ප්‍රධාන ආහාරය බත්. ඒ ගත්තත්, අපි දන්නවා. නිෂ්පාදනයේදී වෙන්න පුළුවන්. වෙළඳාමේදී වෙන්න පුළුවන්. විවිධ වස විෂ කලවම් කරලා අපි වස කනවා. එළවළු බෝග පිළිබඳව ගත්තොත්, ඉතාම පැහැදිලිව අපි වස කනවා. ඒ වාගේම පළතුරු බෝග ගත්තත් එහෙමයි. අපි වස කනවා. ඒ නිසා අද අපි ගන්න ආහාර ජීවත් වීමට වඩා මැරෙන්නට බලපාන සාධක වැඩියි කියන එකයි මගේ කල්පනාව. ඒ නිසා මේ අමාත්‍යාංශයට සුවිශේෂී වගකීමක් පැවරිලා තිබෙනවා. මෙන්න මේ අභියෝගය හමුවේ බස්නාහිර පළාතේ, රටේ බහුතර ජනගහනයක් ජීවත් වන පළාතේ මිනිස්සුන්ට හොඳ ආහාරයක් ලබා ගන්න, හොඳ බත් ටිකක් කන්න, හොඳ එළවළුවක් කන්න, හොඳ පළතුරක් කන්න අවශ්‍ය කරන පසුබිම සකස් කිරීමේ වගකීම මේ අමාත්‍යාංශයට පැවරිලා තිබෙනවා. හැබැයි කනගාටුව තමයි. මම හිතන්නේ, 2012 ඉඳලා ගත්තාම මට තේරෙන විධියට මේ අවුරුද්ද තමයි මේ අමාත්‍යාංශයට අඩුම ප්‍රතිපාදනය ලැබිලා තිබෙන වර්ෂය. මම පැහැදිලිව චෝදනා කරනවා,මේ රජය විශේෂයෙන්ම වී ගොවිතැන කෙරෙහි ගොවියාගේ තිබෙන උනන්දුව අවම කිරීම සඳහා විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කරනවා කියන එක. ඒක අපට පැහැදිලියි. බස්නාහිර පළාතත් දැන් ඒ තත්ත්වයට හසු වෙලා තිබෙනවා. සංඛ්‍යා ලේඛන ගත්තාම අපට පැහැදිලියි. ගත වුණු වර්ෂ කිහිපය තුළ වී ගොවිතැන කොයිතරම් ප්‍රමාණයකින් අවප්‍රමාණයකට පත් වෙලා තිබෙනවාද කියන කාරණය. මේ ගැන විශේෂ අවධානයක් අපි යොමු කරන්න ඕනෑ. මොකද, අපේ රටේ මිනිස්සුන්ගේ ප්‍රධාන ආහාරය බත. ඉතින් ඒ නිසා අපි මෙන්න මේ අභියෝගය ජයග්‍රහණය කරන්න -විශේෂයෙන්ම ඇමැතිතුමාට අපි මතක් කරන්නට ඕනෑ. බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක තුන ගත්තාම විශේෂයෙන්ම කළුතර දිස්ත්‍රික්කය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන්නට ඕනෑ. මොකද, ගොවි බිම් වැඩි ප්‍රමාණයක් තිබෙන දිස්ත්‍රික්කය. ඉතින් ඒ නිසා මෙන්න මේ තත්ත්වය තුළ දැන් උදාහරණයකට ගත්තොත් එහෙම 2015, 2016 මහ කන්නය අරගත්තාම බලාපොරොත්තු වුණු වපසරිය හෙක්ටයාර් 24,621 ක්. නමුත් මේ ඉලක්කයට යන්න පුළුවන් වුණේ නැහැ. මේකෙන් 72% ක් තමයි මුදුන්පත් කර ගන්න පුළුවන්කම ලැබුණේ. ඉතින් ඒ නිසා මේක අභියෝගයක්. මේ අභියෝගය ඉදිරියේ අපි කොහොමද ක්‍රියාත්මක වෙන්නේ කියන එක පිළිබඳව කල්පනා කරලා බලන්න ඕනෑ.

ඊළඟට විශේෂයෙන්ම හාල් නිෂ්පාදනය පිළිබඳ කතන්දරයේදී අපට බොහොම පැහැදිලියි, මිනිස්සු අද ඉතාම සීඝ්‍රයෙන් ලෙඩ්ඩු බවට පත් වෙනවා. අද ජාතිය ලෙඩ්ඩු. අද ජාතියෙන් වැඩි ප්‍රමාණයක් ලෙඩ්ඩු. ඒ ලෙඩ්ඩු බවට පත් වෙන්න බලපාලා තිබෙන ප්‍රධානම කාරණය තමයි වැරැදි ආහාර පරිභෝජනයට ගැනීම. ඉතින් ඒ නිසා මේකේදී මේ අමාත්‍යාංශයට ලොකු කාර්ය භාරයක් පැවරෙනවා. දැන් අපි දන්නවා. අපේ ගම්බද ප්‍රදේශ ගත්තාම උදේ 5.30, 6.00 වනකොට හැම ගෙදරක් ළඟටම ඇවිල්ලා නලාව සද්ද කරනවා. චූන් පාන් කියලා කියන්නේ. මම දන්නේ නැහැ මොකක්ද ඒකට කියන්නේ කියලා. චූන් පාන් රථයට. පොඩි අය නින්දෙන් ඇහුරුණු ගමන් දෙමව්පියන්ට කරදර කරන්නේ, මේකෙන් කන්න. හවස 5.00, 5.30 සිට 6.00, 7.00 වනකල් මේක එනවා. දැන් කන්න ගෙදරට වස ගෙනැල්ලා දෙනවා. පාන් පිටි නිෂ්පාදන. දැන් අපට බැරිද අපේ අමාත්‍යාංශය හරහා මේකට යම් විකල්පයක් ඇති කරන්න. ඒ නිසා මම ඇමැතිතුමාට යෝජනා කරනවා. ගෙදරට ගිහිල්ලා බලෙන් පාන් පිටි කවන මේ කාරණය වෙනුවෙන් විකල්පයක් ලෙස, අපට හාල් පිටි නිෂ්පාදන එහෙම නැත්නම් අපේ වෙනත් දේශීය නිෂ්පාදන ඒ විධියට ගෙවල් ළඟට ගිහිල්ලා මිනිස්සුන්ට පරිභෝජනය කරන්න අවස්ථාව ලබා දෙනවා නම් වඩා හොඳයි. මම හිතනවා දැන්

[ගරු පූජ්‍ය තෙබුවන පියනන්ද හිමි]

කාරණය හුඟක් දෙනෙක් තේරුම් අරගෙන තිබෙනවා. කන්නේ වස කියන එක හුඟක් දෙනෙක් දන්නවා. දරු මල්ලෝ ලෙඩ වෙන්නේ. ජීවිතයේ අහපු නැති ලෙඩ රෝග හැදෙන්නේ මේ කන දේවල්වල වරද නිසයි කියන එක බොහෝ දෙනෙක් තේරුම් අරගෙන තිබෙනවා. නමුත් මේකට විකල්ප අඩුයි. විකල්ප අඩු නිසා ගේ ළඟට ගෙනැල්ලා දුන්නාම, වස වුණත් කමක් නැහැයි කියලා ඔහේ කනවා. ඉතින් අන්න ඒ නිසා එහෙම විකල්පයකට අපට යන්න පුළුවන්, ඉදිරි වර්ෂයේ එහෙම කල්පනා කරන්න පුළුවන් නම් මම හිතනවා ඉතාමත්ම වැදගත්. මිනිස්සු හුඟක් වෙලාවට ඒ තත්ත්වය තුළ අසරණ වෙලා තිබෙනවා.

ඒ වාගේම පුරන් කුඹුරු අස්වැද්දීම පිළිබඳව වචනයක් කියන්න ඕනෑ. මම සියයට සියයක් එහි සාර්ථකත්වය පිළිබඳව සෑහීමකට පත් වෙන්නේ නැහැ. මම දන්න හුඟක් පුරන් කුඹුරු, දීර්ඝ කාලයක් පුරන් වෙලා තිබුණු කුඹුරු අස්වැද්දුවා. මහ උත්සවයක් කරලා, මහ ආඩම්බරයට මේක කරනවා. විශාල වියදමක් කරනවා. නමුත් ඊට පස්සේ කන්නේ මේක නැවත පුරන් වෙලා. එහෙම පුරන් වුණු ස්ථාන ගණනාවක් තිබෙනවා. ඒ නිසා පුරන් කුඹුරු අස්වැද්දීම පිළිබඳව මීට වඩා විශේෂ අවධානයක් යොමු කරලා කටයුතු කරන්න කියන කාරණය මතක් කරනවා.

ඊළඟට විශේෂයෙන්ම ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් ප්‍රකාශයට පත් කරපු 2016, 2018 ආහාර නිෂ්පාදනය පිළිබඳව.ආහාර බෝග වගාව. දැන් ඇත්තටම ඒක රටට අවශ්‍ය ඉතාම වැදගත් දෙයක්. නමුත් හැමදාම කියන කාරණයක් තමයි මේවායේ බොහෝ දුරට තිබෙන්නේ, සංඛ්‍යා ලේඛන. හුඟක් දුරට තිබෙන්නේ සංඛ්‍යා ලේඛන. ඒ නිසා සංඛ්‍යා ලේඛනවලට වහල් නොවී ඇත්ත ගොවි බිම තුළ මේ දේ සිද්ධ වෙනවාද කියන එක අපි කල්පනා කරන්න ඕනෑ. මේක තමයි මේ ප්‍රශ්නයට තිබෙන පැහැදිලිම විසඳුම. හැම කෙනෙකුටම පුංචි හරි ගෙවත්තක් තිබෙනවා. නාගරික වුණත්. දැන් නාගරික බෝග ක්‍රම හරිගස්සලා තිබෙනවා. ඒ නිසා හැම කෙනෙකුටම අඩු ගාණේ තමන්ගේ ගෙවත්තේ එළවළු ටිකක් හදාගන්න පුළුවන් නම් මම හිතන්නේ, ඒක තමයි අද තිබෙන හොඳම විසඳුම. මිනස්සුන්ට මේ ආර්ථික අභියෝගයන්ට මුහුණ දෙන්න උනන්දු කරවන්න ඕනෑ. අපි දන්නවා, මේ කාලේ වනකොට අමුමිරිස් කිලෝ එකක් රුපියල් 1100/- යි. මිරිස් කරලක් ගෙනිහිල්ලා වෙන්දේසි කළා. මිනිස්සුන්ට ප්‍රශ්නයක්. රුපියල් 1100/- යි. නමුත් අපි මේ ආහාර බෝග වැඩ සටහන හරහා ගෙවත්තට යන්නේ. ගෙවත්ත හරියට සශ්‍රීක කර ගන්න මිනිස්සුන්ට අවබෝධයක් දුන්නොත්, ඒ වැඩේ ප්‍රායෝගිකව භූමිය තුළ සිද්ධ කළොත් එහෙම,මිනිස්සුන්ට ප්‍රශ්නයක් ඇති වෙන්න විධියක් නැහැ. වෙළඳ පොළේ කොපමණ අමු මිරිස් ගණන් ගියත් මිනිස්සුන්ට ප්‍රශ්නයක් නැහැ. ගස් 10 ක් සිටව ගත්තොත් ගෙදර අවශ්‍යතාවය සම්පූර්ණයි. ඉතින් ඒ නිසා මේ පිළිබඳව හුඟක් කරුණු කථා කරන්න තිබුණත්, විෂයය පථයකට කෙලින්ම අදාළ නැතුව මම කථා කළේ,ඔබතුමාගේ අවධානය විශේෂයෙන් යොමු කළ යුතු කාරණා පිළිබඳවයි. තෙරුවන් සරණයි.

[අ.භා. 12.50]

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය පිළිබඳ වැය ශීර්ෂය සම්බන්ධව තමයි අදහස් දක්වන්න මට අවස්ථාව ලැබිලා තිබෙන්නේ. මේ සභාව තුළ සත්ත්ව පාලනය සම්බන්ධව යම් සංවාදයකට යොමු වුණා. අද සත්ත්ව පාලනය සම්බන්ධව, විශේෂයෙන්ම කිරි ගොවි පාලනය සම්බන්ධව මුහුණ දෙන ප්‍රබලතම අභියෝගය බවට එක පැත්තකින් පත් වෙලා තිබෙනවා, සත්ව අභිජනනය කරලා ඉතාමත් හොඳ තත්ත්වයේ පැටවුන් ලබා ගැනීම සම්බන්ධයෙන් තිබෙන ගැටළුව. මේ සම්බන්ධව මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාත් අදහස් ප්‍රකාශ කළා. ඒ වාගේම නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමාත් මේ සම්බන්ධව අදහස් ප්‍රකාශ කළා. මේ පැටවුන් සම්බන්ධව ගොවියා මුහුණ දෙන අර්බුදයට තාක්ෂණික විසඳුමක අවශ්‍යතාවය තිබෙනවා. මේ තාක්ෂණික විසඳුමේදී කෘතිම සිංචනය අපට තිබෙන එක උත්තරයක්. හැබැයි අද මේ පශු සම්පත් අංශයේ භාවිතා කරන කෘතිම සිංචන වැඩ පිළිවෙළ බොහොම යල් පැන ගිය වැඩ පිළිවෙළක් බවට පත් වෙලා තිබෙනවා. LDI ලා මගින් මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න ගියාට පස්සේ ඉතාමත් නීරසයි. වැස්සි පැටව් සහ වසු පැටව් සියයට පනහ පනහ ඇති වෙන්නේ. අද ලෝකයේ දියුණු ක්‍රමවේද භාවිතා කරනවා. ලංකාවේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පශු වෛද්‍ය පීඨයේ

ආචාර්යවරයෙක් සොයාගෙන තිබෙනවා, ලෝක මට්ටමේ තිබෙන තාක්ෂණයත් එකතු කරලා සියයට සියයක්ම වැස්සි පැටවුන් හදන්න පුළුවන් කෘතීම සිංචන ක්‍රමවේදයක්. මේ මැෂින් එකට යන්නේ, කෝටි අටක් විතරයි. ඒ කෝටි අටේ මැෂින් එකෙන් කරන්නේ, අර ශුකාණු අරගෙන, Centrifugal Force හෙවත් කේන්ද්‍රාපසාරී එකකින් කරකවලා ශුකාණුවල තිබෙන ස්ත්‍රී බීජයි, පුරුෂ බීජයි වෙන් කර ගන්නවා. මේ වෙන් කරගත්තු ශුකාණු ටිකේ තිබෙන පුරුෂ බීජ වෙනම විකුණන්න පුළුවන් දියුණු රටක සත්ත්ව පාලනය සඳහා. විශේෂයෙන් මස් පිණිස සතුන් ඇති කරන රටවල්වල වස්සෝ හදන්න. ඒ වාගේම වැස්සියන්ගේ බීජ ටික අරගෙන ඒ බීජ ටික කෘතීම සිංචනයට යොදන්න පුළුවන්. හැබැයි මේ සඳහා තෝරා ගන්නා කිරි එළදෙන ඉතාමත් හොඳට Condition කරනවා කියන්නේ, දින හතරක් පහක් Condition කරලා ඒ තත්ත්වයේ යටතේ තමයි මේක කරන්න ඕනෑ. ඒ මැෂින් එක ලංකාවේම හදනවා නම් කෝටියක විතර වියදමින් හදන්න පුළුවන්කම තිබෙනවා. සතෙකුට වියදම් වෙන්නේ රුපියල් 50 යි.

අද මේක සියයට සියයක් සාර්ථකව වැලිමඩ ප්‍රදේශයේ ඔහු විසින් තෝරා ගත්තු තැන්වල පෞද්ගලිකව කරනවා. ඔහු ඕනෑම වෙලාවක සූදානම් රජයේ වැඩ පිළිවෙළකට අනුගත වෙලා කටයුතු කරන්න. ඔහුගේ නම ආචාර්ය බැසිල් ඇලෙක්සැන්ඩර්. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරයෙක් විධියට වැඩ කරන මේ බැසිල් ඇලෙක්සැන්ඩර් ආචාර්යතුමාට පුළුවන්කම තිබෙනවා සියයට සියයක්ම වැස්සි පැටවුන්ගෙන් මේ කෘතීම සිංචන සේවාව සපයන්න. මේ අවශ්‍ය වෙන්නේ පුහුණු ශිල්පීන් ටිකක්. LDI ලා බඳවාගෙන - ගිය සැරේ අයවැයේ කථා කරලා පැහැදිලි කරගෙන තිබෙනවා LDI මහත්වරු 45 ක පමණ ප්‍රමාණයක හිඟයක් පවතිනවා කියලා. මේක පියවන්න ඇමැතිතුමාට වැඩ කරන්න පුළුවන්කමක් නැහැ. ඒ සම්බන්ධව මධ්‍යම රජයෙන් මූල්‍යමය ප්‍රතිපාදන වෙන් කර ගන්න බැරිකමක් තිබෙනවා. මෙවරත් අයවැයට අදාළව තිබෙන ප්‍රතිපාදන විශාල ප්‍රමාණයක් කප්පාදු කරන්න සිද්ධ වෙලා තිබෙනවා. මධ්‍යම රජය මුහුණ දෙන මූල්‍ය අර්බුදය බරපතළ නම්, පළාත් සභාවට වෙන් කරන මූල්‍ය ප්‍රදාන කපා හැරීම සාධාරණයි. හැබැයි කෘෂිකර්ම අමාත්‍යාංශයේ ඇමැතිතුමා විසින් මාස 07 ක් තිස්සේ රාජගිරිය ප්‍රදේශයේ කුළියට ගොඩනැගිල්ලක් අරගෙන තිබෙනවා. මේ ගොඩනැගිල්ල කෝටි -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගොඩනැගිල්ල පැත්තට නොවෙයි, සත්ත්ව නිෂ්පාදනය පැත්තට එන්න කෝ?

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

සත්ව නිෂ්පාදනය පැත්තේ මෙතුමා මුහුණ දෙන අර්බුදය තමයි ඒ මුදල් මධ්‍යම ආණ්ඩුවෙන් කපා හැරීම. මධ්‍යම ආණ්ඩුවෙන් ඒ මුදල් කපා හරින්න සාධාරණ පදනමක් අපි පෙන්වන්න ඕනෑ. මෙන්න මේ හේතුව නිසයි මුදල් කපා හැරියේ කියලා. හැබැයි එහෙම පෙන්වන්නේ නැහැ. අනවශ්‍ය වියදම් විධියට මාසයකට කෝටි 02 ක වැඩි මුදල් ප්‍රමාණයක්.තවමත් මේ ගොඩනැගිල්ලට ගෙව්දිලා නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පක්ෂයේ මහ ලේකම් -

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

පක්ෂයේ මහ ලේකම් වුණත් කවුරු වුණත් කෘෂිකර්ම ඇමැති විධියට අපේ පළාත් සභාව විධියට ඔබතුමා කරන්න තිබෙන වැඩ ටිකට මූල්‍යමය ප්‍රතිපාදන කපා හරිනවා. හැබැයි තාක්ෂණික විසඳුමක් හොයලා මේ කිරි එළදෙනුන්ට ඉතාමත් හොඳ තත්ත්වයේ වැස්සි පැටවු නිර්මාණය කරන්න තිබෙන මිල අපට කප්පාදු කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒක නිසා ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. ඒ බැසිල් ඇලෙක්සැන්ඩර් මහත්තයාගේ තාක්ෂණය සාකච්ඡා කරලා ලබා ගන්න. මට අවශ්‍ය නම් දූරකථන අංකය දෙන්න පුළුවන්. ඒ අංකය පාවිච්චි කරලා එතුමා සමග සම්බන්ධීකරණය වෙලා ඒ නවීන තාක්ෂණයෙන් වැස්සි පැටව් ලබා දෙන්න පුළුවන්. මේ වනකොට ඔබතුමා දන්නවා ඇති කෘතීම සිංචන ක්‍රියාවලිය මගින් දහඅට දහස් ගණනක් තමයි කරන්නේ. ඒ ප්‍රමාණයෙන් ප්‍රතිඵල ලැබෙන්නේ, පන්දහස් ගණනක්. ඒක 28% යි. අර ක්‍රමයට අපි පරිවර්තනය වුණොත් සියයට සියයක්ම වැස්සි පැටව් ලබා ගන්න පුළුවන්කම ඇතියි කියලා මම විශ්වාස කරනවා.

ඊළඟ අවස්ථාව විධියට මම පෙන්වා දෙන්නේ, ඔබතුමා දිගින් දිගටම ඔබතුමාගේ පොත් පිංච තුළ පැහැදිලි කරලා තිබෙනවා, කාබනික කෘෂිකර්මාන්තයේ කාබනික පොහොර

[ ගරු අසෝක සපුමල් රන්වල ]

භාවිතාව සම්බන්ධව. මේ වනකොට රට තුළ කාබනික පොහොර උවමනාවත් එක්ක ගොඩනැගිලා තිබෙන තත්ත්වයත් තුළ, විශාල වශයෙන් කාබනික පොහොර නිෂ්පාදනය කරන්න නිෂ්පාදකයෝත්, හුදෙකලාව ගොවියෝත් යම් පරිශ්‍රමයක් දරනවා. එතකොට මේ පරිශ්‍රමය තුළ අපට වර්ගීකරණයක් කරන්න පුළුවන්. සරල විධියට ගොවියා හුදෙකලාව තම තමන්ගේ වගා බිමට යම් කාබනික ද්‍රව්‍යයක් එකතු කර ගැනීම. මේක කෙසේවත් වැරැදි නැහැ. තමන්ගේ කුඹුරට, තමන්ගේ වගා බිමට මොනතරම් විධියට කාබනික ද්‍රව්‍ය එකතු කර ගත්තත් ඒක අහිතකර තත්ත්වයක් නිර්මාණය වෙන්නේ නැහැ. දෙවැනි එක තමයි, නාගරික කසළ කොම්පෝස්ට් විධියට භාවිතා කිරීම. මේක අපද්‍රව්‍ය කළමනාකරණයත් එක්ක බැඳුණු එකක්. මේක ඉතාමත් සූක්ෂමව සහ ඉතාමත් අවදියෙන් කළ යුතු දෙයක්. මොකද, බැර ලෝහ සහ සෞඛ්‍ය ද්‍රව්‍ය ඒ කියන්නේ කෙමිකල් අපද්‍රව්‍ය එකතු වෙන්න පුළුවන්. ඒ වාගේම හැසාඩ් දේවල් එකතු වෙන්න පුළුවන්. ඒක නිසා නාගරික කසළ අපහරණයේදී ඒවා කොම්පෝස්ට් විධියට භාවිතා කරනවා නම්, මේ කොම්පෝස්ට් පැකට් එක්ක අරගෙන ගිහිල්ලා ගෙදර තිබෙන මල් බඳුනට දාගත්තොත් ඒක ඉතාමත් බරපතළ අපරාධයක්. පුංචි දරුවෝ පවා මේ පස් ටික අල්ලනවා. එම නිසා ඒ සම්බන්ධව ඉතාමත් දියුණු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. මේ නාගරික කසළ කොම්පෝස්ට් විධියට භාවිතා කරනවා නම්, ඒක තුළ බැර ලෝහ, ඒ වාගේම කෙමිකල් වේස්ට්, ඒ වාගේම හැසාඩ් වෙස්ට් තියෙනවාද නැද්ද කියන එක පිළිබඳව පසු විපරම් කරන්න වැඩ පිළිවෙළක් අවශ්‍යයි.

තුන්වැනි කාරණය විධියට තිබෙන්නේ, යම් ප්‍රමිතියක් ඇතිව, වට්ටෝරුවක් අනුව කාබනික පොහොර හදනවාද නැද්ද කියන කාරණය. මේ සම්බන්ධව වෙනම පසු විපරමක් කරන්න ඕනෑ. ඒ වට්ටෝරුව ප්‍රදර්ශනය කරන්න ඕනෑ. කුකුල් පොහොර මෙපමණයි. ගොම පොහොර මෙපමණයි. ත්‍රිෂීලියා මෙපමණයි. ජපන් ජබර මේ ප්‍රමාණය තිබෙනවා. ඇක්ටිවේටි කාබන් වාකොල් මේ වාගේ ප්‍රමාණයක් තිබෙනවා. දහයිය අළු මෙපමණ ප්‍රමාණයක් තිබෙනවා කියලා පාරිභෝගිකයාට ප්‍රදර්ශනය කරපු ආකාරයේ වට්ටෝරුවක් නිර්මාණය කරගන්න ඕනෑ. මේ විධියට සැකසූ වට්ටෝරුගත කාබනික පොහොර සියයට සියයක් ජීර්ණය වෙලා තිබෙනවාද නැද්ද කියන එක බලන්න වෙනවා. එතකොට ජීර්ණය වෙලා තිබුණොත්, ඒ කන්නයේදී නිසි පරිදි නිසි වෙලාවට ඒ පොහොර ටික මූල මණ්ඩලයෙන් උරා ගන්න පුළුවන්කම තිබෙනවා. මේකට විද්‍යානුකූලව කියන්නේ, ඒ ගිරි මූල ළඟින් උරා ගන්නා ක්‍රියාවලිය, රයිසොස්ෆීය ක්‍රියාවලිය යටතේ සිද්ධ වෙනවාද නැද්ද කියලා විද්‍යානුකූලව සහතික කිරීමේ ක්‍රමවේදයක් අපට තිබෙන්න ඕනෑ. මෙන්න මේ ක්‍රම විධියට හදන කාබනික පොහොර උරා ගැනීමේ ක්‍රමවේදයක් නිසි පරිදි අරගෙන දුන්නොත්, ගොවියා අධෛර්යමත් වෙන්නේ නැහැ. ගොවියාට වගකියන්න පුළුවන්, තමන්ගේ මේ කන්නයේදීම තමන් යොදවපු කාබනික ද්‍රව්‍ය ගහට උරා ගත්තාද නැද්ද කියන එක පිළිබඳව.

මේ සම්බන්ධව වැඩ පිළිවෙළක් නැත්නම්, නිකම්ම නිකන් අයාලේ යන විධියට කාබනික පොහොර හදලා අපි ගොවියාට දුන්නොත්, ගොවියා මේක දාලා සමහර විට අක්කරයකට කොට්ට 40 ක්, 50 ක් දානවා. මෙවැනි ප්‍රමාණයක් දාලා අසාර්ථක ප්‍රතිඵල ආවොත් ගොවීන් කියන්නේ, අනේ! මේ කාබනික පොහොර දාලා නම් හරි යන්නේ නැහැ. මේක අතහැරලා නැවත රසායනික පොහොර භාවිතා කරන්න හුරු වෙනවා. කාබනික පොහොරවල විරුද්ධ පදය කියන්නේ, අකාබනික පොහොර කියලා නොවෙයි. විරුද්ධ පදය සින්තටික් කෙමිකල්, කෙමිකල් පොහොර. කාබනික පොහොරවලට විරුද්ධ පදය විධියට තිබෙන්නේ අකාබනික පොහොර. ගෙන්දගම් වර්ග, ලුණු වර්ග, ඒ වාගේම ඩොලමයිට්, පොස්පේට් වාගේ අකාබනික ස්වභාවික ද්‍රව්‍ය යොදාගන්න පුළුවන්කම අපට තිබෙනවා නම් ඒක වෙනම ජීර්ණය කරලා biodegradable system එකකින් මේක මූල්‍ය මණ්ඩලයට දාගන්න පුළුවන්. හැබැයි, මෙහෙම ක්‍රමවේදයකට යන්න නම් දියුණු තාක්ෂණික වැඩ පිළිවෙළක් අපේ කාබනික කෘෂිකර්මාන්තයටත් අවශ්‍ය වෙනවා. ඒක සමහර විට සින්තටික් කෙමිකල් පොහොරවලට, කෘතිම රසායනික පොහොරවල පාවිච්චි කරන රසායනික ක්‍රියාවලියට වඩා එහාට ගිය දියුණු තාක්ෂණික ක්‍රමවේදයක් විය යුතුයි. හැබැයි මේ සියලු දේවල් කරන්න මෙතුමාට මේ අමාත්‍යාංශයේ මුදල් කප්පාදු නොකර මධ්‍යම රජයෙන් මුදල් දෙන්න ඕනෑ. මධ්‍යම රජය වගකීමට බැඳිලා නැහැ තමන්ට හිතු මතේ නිළියන්ගේ, නළුවන්ගේ තිබෙන ගොඩනැගිලි අරගෙන, කෝටි 07 කට වැඩි මුදල් ප්‍රමාණයක් - දැන් මාස 07 ක් තිස්සේ ගෙවලා තිබෙනවා.

ඒක නිසා අපි ඉල්ලා සිටින්නේ, කෘෂිකර්මාන්තයට ආදරයක් තිබෙනවා නම් බිම් මට්ටමේ කෘෂිකර්මාන්තයත් එක්ක බැඳුණු විශාල නිලධාරීන් ප්‍රමාණයක් - සත්ව පාලනයත් ඒ වාගේමයි.

අනෙක් පැත්තෙන් ගත්තාම මේ කෘෂිකර්මාන්තයත් එක්ක බැඳුණු තාක්ෂණික ක්‍රියාවලිය කරන්න තවත් පුංචි උදාහරණයක් කියන්නම්. මේ පොතේත් සඳහන් කරලා තිබෙනවා. ගියවර අයවැයේ යෝජනා සම්බන්ධව සැලකිලිමත් වෙලා, ඒවා මේ පොත් පිංචට ඇතුළත් කරන්න පවා කටයුතු කරලා තිබෙන්නේ. ඒවා සම්බන්ධව ඇමැතිතුමාට යම් ඇල්මක්, කැක්කුමක් තිබෙනවා මේවා කොහොමද ක්‍රියාත්මක කරන්නේ කියලා. මම කලින් වරත් මේ සම්බන්ධයෙන් පැහැදිලි කළා. හරක් හොකරම් කිරීම තමයි ගව පාලනයේදී තවමත් මුහුණ දෙන බරපතළ අර්බුදය. මේ සත්ත්ව පාලනයේදී මේ අර්බුදයට එකම විසඳුම, ලෝක පරිමාණයෙන් ගත්තත් තිබෙන එකම විසඳුම තමයි සත්තුන්ට අර චිප් එකක් හයි කරන එක. ඒ සම්බන්ධව මූල්‍යමය ප්‍රතිපාදන වෙන් කරන්න බැරුව වෙන්න ඇති ගිය අවුරුද්ද තුළ ඒක සාර්ථක කර ගන්න බැරි වෙලා තිබෙන්නේ. ඒක පොතේ සඳහන් කරලා තිබෙනවා. ඒකත් යම් සාධනීය ලක්ෂණයක්. පොතේ සඳහන් කළ පමණින් මේක කරන්න බැරි වෙන්නේ ඒ සම්බන්ධව මූල්‍යමය ප්‍රතිපාදන නොමැතිවීම නිසයි. ඒ නිසා මේ චිප් එක හයි කළාට පස්සේ තමන්ගේ සත්ව ගොවිපල වටේ යම් සීමාවකට පිටින් මේ සතා එළියට අරගෙන ගියොත් තමන්ගේ හැන්ඩ් ෆෝන් එකට පොඩි බීප්, බීප් ශබ්දයක් එනවා. එතකොට මේ සතා සොකරම් කරගෙන යනවා කියලා දැනගන්න පුළුවන්කම ලැබෙනවා. මේකට කෝටි ගණන් යන්නේ නැහැ. එක ඇමැතිවරයෙකුගේ වාහනයක මිලියන භාගයක් ඇති මේ නෙට් වර්ක් එකෙන් ලංකාවම ආවරණය කරන්න. එක සුඛෝපභෝගී වාහනයක භාගයක් ඇති මුළු ලංකාවේම මේ නෙට් වර්ක් එක ආවරණය කරන්න. ඒක මම වගකීමෙන් කියනවා. කොරියානු රජයේ එහෙම සමාගම් තිබෙනවා. මම හිතන්නේ, මෙතුමා ඒ සම්බන්ධයෙන් අධ්‍යයනයක් කරලා තිබෙනවා. අපි කඩිනමින් ගොවියා සුරක්ෂිත කිරීමට තමන්ගේ ජීවිත කාලය පුරා හදාගත්තු වැස්සි සොකරම් කරගෙන ගියාට පස්සේ, ආයිත් ඒ ගොවියාට ඇති වන තත්ත්වය පොඩ්ඩක් හිතලා බලන්න. තමන්ගේ වාහනයක් නැති වුණොත් ඒ වාහනය ආරක්ෂා කරන්න රජය කොතරම් ක්‍රම අනුගමනය කරලා තිබෙනවාද? ඒකට Number Plate එකක් දීලා, පොලීසියට දැනුම් දීලා, ළඟම තිබෙන පොලිස් ස්ථානයෙන් ඒක හොයා ගන්න පුළුවන් දියුණු ක්‍රම භාවිතා කරලා තිබෙනවා. හැබැයි කිරි ගොවියාට අපි ඒ සාධාරණය කරලා නැහැ. ලක්ෂයක් දෙකක් වටිනා ඉතාමත් අනගි වැස්සියක් නැති වුණාට පස්සේ, ගොවියා අසරණ වෙනවා. පොලීසියට ගියාට පස්සෙත් පොලීසියෙන් කියනවා ඕවා අපට හොයන්න බැහැ. ඕවා අරගෙන යන්නේ කවුද කියලා අපි දන්නේ නැහැ. සැකකාරයා කිව්වොත් හොයලා දෙන්නම් කියලා කියනවා. මෙන්න මෙවැනි බරපතළ අසාධාරණයකට, ඒ වාගේම බරපතළ බිඳ වැටීමකට ගොවියා පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම කිරි ගොවියා. මේ සම්බන්ධව අපි නිසි ක්‍රමවේදයන් අනුගමනය කළොත් ඉතාමත් කඩිනමින්, කල් යන්නේ නැතුව මාසයක් දෙකක් ඇතුළත ටෙන්ඩර් ක්‍රමයක් අනුගමනය කරලා යම් සමාගමක් තෝරාගෙන මේ චිප් එක ගෙනැල්ලා සතාගේ තැන්පත් කළොත් ගොවියාත් සුරක්ෂිත වෙනවා. තමන්ගේ කිරි වැස්සිත් සුරක්ෂිත කරගන්න පුළුවන්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ අවසාන විනාඩිය.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කාලයෙන් විනාඩියක කාලයක් ලබා දෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

අපේ දිවා ආහාරය නිසයි ප්‍රශ්නය.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මගින් ගරු ඇමැතිතුමාට ඉදිරිපත් කරනවා දිගින් දිගටම මේ බස්නාහිර පළාතේ තිබෙන කුඹුරු ඉඩම් ගොඩ කිරීම සම්බන්ධව. හැබැයි එක පැත්තකින් ඒ කුඹුරු ඉඩම් තවදුරටත් පුරන් වීම සම්බන්ධව ප්‍රදේශයේ ජනතාව තුළ මැසිවිලි ගණනාවක් තිබෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා අපේ අනෙක් මන්ත්‍රීතුමා කිව්වා එතුමාගෙන් කාලය දෙන්නම් කියලා. ඒ නිසා අවශ්‍ය නම් දිවා ආහාරයෙන් පස්සේ ඔබතුමාට නැවත කථාව පටන් ගන්න පුළුවන්. අවශ්‍ය නම් එහෙම අවස්ථාවක් දෙන්න පුළුවන්.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

හොඳයි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

එහෙම නම් බොහොම ස්තුතියි. දැන් මේ අවස්ථාවේදී දිවා ආහාරය සඳහා සභාව පස්වරු 02.00 දක්වා තාවකාලිකව අත්හිටුවනවා. හරියටම පස්වරු 02.00 නැවත සභාව ආරම්භ වන බැවින් සෑම ගරු මන්ත්‍රීවරයෙක්ම පස්වරු 02.00 වෙද්දී සභාවේ අසුන් ගන්නා හැටියට දැනුම් දෙනවා.

***ඊට අනුකූලව පූර්ණ කාරක සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් අ.භා. 02.00 ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යළිත් රැස් විය.***
*Accordingly the Committee of the Whole Council Suspended and. it resumed at 02.00 p.m. with Hon. Chairman in the Chair.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 02.01]

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ගරු සභාපතිතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මුලින්ම ඔබතුමාටත්, ගරු ඇමැතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම කෘෂිකර්ම අමාත්‍යාංශය වෙනුවෙන් අපේ ගරු ඇමැතිතුමා පසුගිය කාලය පුරාවටම මේ අමාත්‍යාංශය වඩාත් හොඳ, ක්‍රියාත්මක අමාත්‍යාංශයක් බවට පත් කරන්න විශාල උනන්දුවක් අරගෙන කටයුතු කළාය කියන එක අපි සතුටින් සඳහන් කරනවා. මොකද, එතුමා හැම මාසයකම උපදේශක කාරක සභාව නිසි විධියට රැස් කරවලා මන්ත්‍රීවරුන් එක්කත්, නිලධාරීන් එක්කත් ඉතාමත්ම සුහද විධියට තියෙන ගැටළු පිළිබඳව අදහස් හුවමාරු කරගෙන, තමන්ගේ විෂයය ක්ෂේත්‍රය කොහොමද පළාත් සභාව තුළ ශක්තිමත් කරන්නේ කියන කාරණාව පිළිබඳව වඩාත් උනන්දුවකින් කටයුතු කරපු ඇමැතිවරයෙක් හැටියට පෙන්වා දෙන්න කැමැතියි. අපි විශ්වාස කරනවා. එතුමා මේ වසර තුළදීත් ඒ උත්සාහය තවත් සාර්ථක වන විධියට සියලු දෙනාගේ සහයෝගය ඇතිව මේ අමාත්‍යාංශයේ කටයුතු ශක්තිමත් කරන්න කටයුතු කරාවිය කියන එක. බස්නාහිර පළාත තුළ ගත්තාම විශේෂයෙන්ම මම ජීවත් වන ප්‍රදේශය කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත ප්‍රදේශය. එම ප්‍රදේශය වඩාත් කෘෂිකර්මාන්තයට බර වුණු ජන ජීවිතයක් ගෙවන ඒ වාගේම විශාල වශයෙන් රජයේ ඉඩම්වල, ජනපදවල ජීවත් වන මිනිස්සු වාසය කරන ප්රදේශයක් වෙනවා.

ඒක නිසා කෘෂිකර්මාන්තය අපේ ප්‍රදේශවල ජනතාවගේ ජීවිතත් එක්ක එකට බැඳුණු දෙයක් හැටියට තමයි අපට විශේෂයෙන්ම සලකන්න පුළුවන් වෙන්නේ. විශේෂයෙන්ම අපේ ප්‍රදේශවල ජනතාව වී ගොවිතැන වෘත්තියක් හැටියට, නැත්නම් තමන්ගේ ප්‍රධාන ආදායම් මාර්ගය හැටියට යොදාගෙන කටයුතු නොකළත්, වී ගොවිතැන සෑම කෙනෙක්ම පාරම්පරිකව තමන්ට ලැබුණු අයිතියක් හැටියට, උරුමයක් හැටියට සලකලා වී ගොවිතැනේ යෙදෙනවා. ඒ වාගේම අනෙකුත් වගා කෙරෙහිත් විශේෂයෙන්ම යොමු වුණු ප්‍රදේශයක් හැටියට තමයි අපට සලකන්න පුළුවන් වෙන්නේ. ඒක නිසා කෘෂිකර්මාන්තය නඟා සිටුවන්න පුළුවන් වන ප්‍රමාණය, එය ශක්තිමත් කරන්න පුළුවන් වන ප්‍රමාණය අපේ ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නංවන්න විශේෂයෙන්ම හේතු වන නිසා මේ කෘෂිකර්මාන්තය අපේ ජීවිතවලට ඉතාමත් අදාළව වන විෂයයක් හැටියට සලකලයි අපි හැමදාමත් කටයුතු කරන්නේ කියන කාරණාව සඳහන් කරන්න ඕනෑ. පසුගිය අවුරුද්දට වඩා මේ අවුරුද්දේ කෘෂිකර්මාන්තය සහ ඒ අමාත්‍යාංශයට අදාළ අනෙකුත් ක්ෂේත්‍රයන් වෙනුවෙන් ලබා දීලා තිබෙන මුදල ප්‍රමාණවත් වෙනවාද කියන ගැටළුව අපට පවතිනවා. මොකද, 2020 වන කොට මේ රටේ ඒකපුද්ගල ආදායම

ඩොලර් 8000 ක මට්ටමකට යන ආර්ථිකයක් ගැන කථා කරන වෙලාවේ, ඒ වාගේම ස්වයං පෝෂිත රටක් බවට, ශක්තිමත් රටක් බවට ආර්ථිකය පැත්තෙන් ගොඩ නැඟෙන්න යන අවස්ථාවේ කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපායක් වුණු අපේ රටේ, අපේ ප්‍රදේශවල මේ ක්ෂේත්‍රය වඩාත් දියුණු කරන්න මීට වඩා වැඩි මුදලක් රජයෙන් ඒ වාගේම පළාත් සභා ප්‍රතිපාදනවලින් වෙන් විය යුතුයි කියන එක තමයි අපි විශේෂයෙන් සඳහන් කරන්නේ. මොකද, එහෙම වෙන් කරලා කටයුතු කළේ නැත්නම් මේ ක්ෂේත්‍රය වඩා දියුණු තැනකට ගෙන එන්න, ශක්තිමත් තැනකට ගෙන එන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒක නිසා අපි කනගාටු වෙනවා රටේ තිබෙන, පළාත් තුළ තිබෙන වඩාත් වැදගත් අමාත්‍යාංශයකට ප්‍රතිපාදන මුදල් වෙන් කිරීමේදී දක්වලා තිබෙන ඌණතාවය පිළිබඳව.

පසුගිය වසරේදී කෘෂිකර්මාන්තය නඟා සිටුවන්න අපේ ප්‍රදේශවල ගොවීන් අතරේ හෝග සහ බීජ බොහෝ දේ ලබා දෙන්න කටයුතු කළා. විශේෂයෙන්ම අලුත් යන්ත්‍රෝපකරණ වැනි දේ හඳුන්වලා දීලා වී ගොවිතැන වැනි දේ වඩාත් ඉක්මනින් කරන්න, වඩාත් පහසුවක් ඇති කරවන්න කටයුතු ආරම්භ කරලා තිබෙනවා කියන කාරණාව විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. ඒ වාගේම වරින් වර කෘෂි උපකරණ ලබා දීලා, ගොවීන්ව දිරිමත් කරන්න කටයුතු කළාය කියන කාරණාවත් විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. අද කෘෂිකර්මාන්තය පිළිබඳව කථා කරන කොට තිබෙන ප්‍රධානම ගැටළුවක් බවට පත් වෙලා තිබෙනවා, තරුණ පරම්පරාව, අලුත් ශ්‍රමිකයින් කෘෂිකර්මාන්තයට සොයා ගන්න තිබෙන අපහසුව. එය විශාල ගැටළුවක් බවට පත් වෙලා තිබෙනවා. අද තරුණ පරම්පරාව කෘෂිකර්මාන්තයට ඉදිරිපත් වන ප්‍රමාණය ඉතාමත්ම අඩුයි. ඒක නිසා මේ තරුණ පරම්පරාව අපි කොහොමද කෘෂිකර්මාන්තයට යොදා ගන්නේ?ඒ අයගේ ශ්‍රමය, හැකියාවන් කොහොමද කෘෂිකර්මාන්තයට යොදවා ගන්නේ කියන කාරණාව බරපතළ විදියට ප්‍රශ්නයකට, ගැටළුවකට යොමු වෙලා තිබෙනවා. ඒ නිසා මේ පිළිබඳව විශේෂ වැඩ පිළිවෙළක් ඇති කිරීම, අපේ වගකීමක් වෙනවා කියලා අපි විශ්වාස කරනවා. විශේෂයෙන්ම පසුගිය පළාත් සභා අයවැයේදීත් අපි සඳහන් කළා, ගොවීන්ට, ගොවිතැනේ යෙදෙන උදවියට, එය වෘත්තියක් හැටියට කරන්න පුළුවන් වටපිටාව සැකසෙන්න ඕනෑය කියලා. ඒ වාගේම ඒ අයට ඒ පිළිබඳව පිළිගැනීමක්, ගෞරවයක් ඇති වන විදියට ඒක වෘත්තියක් හැටියට සලකන්න පුළුවන් වෙන්න ඕනෑ. ඒ වාගේම අලුත් යන්ත්‍රෝපකරණ හඳුන්වලා දීලා, තාක්ෂණයත් එක්ක ගොවිතැන ඉදිරියට යන්න කටයුතු කළොත්, මේ ක්ෂේත්‍රයට අලුත් පරම්පරාව ඇතුල් කර ගන්න පුළුවන් වේවිය කියලා මා විශ්වාස කරනවා. විශේෂයෙන්ම හොඳ ආදායමක් ලබා ගන්න පුළුවන් තත්ත්වයක් ඇති කරන්න පුළුවන් නම් ඒ සඳහා ඔවුන් යොමු වෙනවා. අපි දැකලා තිබෙනවා. ලෝකයේ දියුණු රටවල්වල කෘෂිකර්මාන්තය වෙනුවෙන්, ගොවිතැන වෙනුවෙන් තරුණ පරම්පරාව ඇදෙනවා. ඒ අයට තමන්ගේ ජීවිතය පිළිබඳ විශ්වාසයක් තිබෙනවා. අනාගතය පිළිබඳව විශ්වාසයක් තිබෙනවා. හොඳ ආදායම් මාර්ගයක් වෙනවා. ඒක නිසා අපේ රටේත් ඒ තැන ඇති කරන්න ඕනෑය කියලා අපි කල්පනා කරනවා. ඒ වෙනුවෙන් විශේෂයෙන්ම අද රජය යෝජනා කරලා තිබෙනවා දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක්. අපි විශ්වාස කරනවා, මේ කෘෂිකර්මාන්තයේ යෙදෙන අයටත් දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් වැනි දේ ආරම්භ කරලා, ඒ තුළින් මේ අලුත් පරම්පරාව දිරිමත් කරවන්න අවශ්‍ය කටයුතු කරාවිය කියලා විශ්වාස කරනවා.

ඒ වාගේම තවත් තිබෙන විශාලම ගැටළුවක් තමයි අපේ ප්‍රදේශවල ජීවත් වන මිනිස්සු රජයේ ඉඩම්වල ජීවත් වෙන්නේ. ඒ මිනිස්සුන්ට තමන්ගේ ඉඩමේ අයිතිය පිළිබඳව කියන්න පුළුවන්කමක් නැහැ. ඔප්පුවක් නැහැ. අවුරුදු 50, 60 තිස්සේ පරම්පරා කිහිපයක් ජීවත් වන මිනිස්සු. ඒ මිනිස්සුන්ටත් ගහක කොළයක අයිතියක් නැහැ. බැංකුවකට ගිහිල්ලා ණය මුදලක් ලබා ගන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ. ඒ නිසා මේ ඉඩම්වල මායිම් ලකුණු කරලා, මිනුම් කටයුතු කරලා ඒ අයට ඉක්මණින් ඔප්පු ලබා දෙන්න ඒ අයට බලපත්‍ර ලබා දෙන්න වැඩ පිළිවෙළක් ඇති කරන්නය කියන එක විශේෂයෙන්ම අපි ඉල්ලා සිටිනවා. තවත් කරුණු බොහොමයක් කියන්න තිබුණත්, කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙන නිසා මේ කරුණු කෙරෙහි ගරු අමාත්‍යතුමා විශේෂ අවධානය යොමු කරනු ඇතැයි කියලා විශ්වාස කරමින්, ඉදිරි වර්ෂයේදී තවත් බොහෝ දේ කරන්නට ඉඩකඩ ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 02.10]

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, කාලය ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. මගේ උපදේශක කාරක සභාවේ ගරු ඇමතිතුමාගේ අමාත්‍යාංශයට අදාළව වචන කිහිපයක් කථා කරන්න ලැබීම වාසනාවක්. මොකද, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂයට පස්සේ, කථා කරන්න දෙයක් තිබෙන, කටක් ඇරලා කථා කරන්න පුළුවන්කමක් තිබෙන අමාත්‍යවරයෙකුගේ අමාත්‍යාංශයකට තිබෙන්නේ, ඔබතුමාගේ අමාත්‍යාංශය පමණයි. ඒ නිසා ඒ අමාත්‍යාංශය පිළිබඳව කථා කරන කොට මට ඉස්සෙල්ලා කථා කරපු අපේ හාමුදුරුවෝ, ඒ වාගේම අනෙකුත් කථිකයන්ගෙන් මේ සංඛ්‍යා ලේඛන - විශේෂයෙන් මගේ සහෝදර සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදී ඉදිරිපත් කරයි. ඒකේදී මේ සංඛ්‍යා ලේඛන ගණිත, මිණිත, ගුණිත වලින් තිබෙන අඩුපාඩුකම් පිළිබඳව මනා පැහැදිලි කිරීමක් කරයි. ඒ නිසා මම කල්පනා කරනවා - අපි මේ කෘෂිකර්මාන්තය පිළිබඳව, කෘෂිකර්ම අමාත්‍යාංශය පිළිබඳව මේ රටේ සෑම ජනතාවක්ම, සෑම මනුස්සයෙක්ම බද්ධ වුණු එකක්. ඒ හා එකට බැඳුණු අමාත්‍යාංශ විෂයයක් තමයි මේ කෘෂිකර්මාන්තය කියලා කියන්නේ.

දැන් ඈත ඉතිහාසයේ අපට නෑකම් කියන, අපි දන්න, අපි ආඩම්බරයෙන් කථා කරන, මහා පරාක්‍රමබාහු රජ්ජුරුවෝ, මහසෙන් රජ්ජුරුවෝ, ධාතුසේන රජ්ජුරුවෝ ජනතා හදවත්වල දෙවිවරු බවට පත් වුණේ මේ කෘෂිකර්මාන්තය නිසා. ඒ අය ජනතාවගේ දෙවියන් බවට පත් වුණා. මහසෙන් දෙවියෝ කියලා තවමත් මිනිස්සු කියන්නේ, කෘෂිකර්මාන්තයත් එක්ක බද්ධ වුණු ජන ජීවිතයට ඒ අය කරපු, කියපු කාර්යයන් නිසා. කෘෂිකර්මය කියන කාරණය ඒ තරමම මිනිස්සුන්ට බැඳුනු කාරණයක්. වාරි සහ වාපි කර්මාන්තය ලෝක ඉතිහාසයේ විශේෂ ප්‍රෞඪත්වයක් සහ මේ ශිෂ්ටාචාරයන් ඇතුළේ වෙනස්කමකට භාජනය වුණු සුවිශේෂී තැනක් ශ්‍රී ලංකාවට ලැබෙනවා,ඒ ශ්‍රී ලංකාවේ වාරි සහ වාපි කර්මාන්තය නිසා. ශ්‍රී ලංකාවේ වැවක අංග 22 ක් තිබෙනවා. ඒ අංග 22 න් අංග 7 ක් තමයි වැවක ප්‍රයෝජනයට ගන්නේ. නමුත් අද ශ්‍රී ලංකාවේ තිබෙන වැව්වල එදා මම කිව්ව රජවරු හදපු මේ වැව්වල, වැව් අමුණුවල, කුඩා වැව්වල, මහ වැව්වල මේ අංග හතවත් අද ක්‍රියාත්මක වෙන්නේ නැති තත්ත්වයට මේ කර්මාන්තය, මේ වටිනා කියන තත්ත්වය පහත වැටෙමින් එනවා. ඒ නිසා ලෝකයේ වෙනත් රටවලට වෙනස් වුණු ශිෂ්ටාචාරයකට තමයි අපි උරුමකම් කියන්නේ. ඒ ප්‍රෞඪත්වය රැඳිලා තිබෙන්නේ කෘෂිකර්මාන්තයත් එක්ක නම්, අපේ යුතුකමක්, වගකීමක් තිබෙනවා. බස්නාහිර පළාත වේවා. මහ ආණ්ඩුව වේවා. අනික් පළාත් වේවා. මේ අනික් හැම විෂයයක්ම බෙදලා වෙන් කරලා ගත්තාම මහා ආණ්ඩුවේ කාර්යභාරයයි, අපේ කාර්යභාරයයි කියලා දෙකොටසකට වෙන් කර ගන්න පුළුවන්කමක් තිබෙයි. හැබැයි, කෘෂිකර්මාන්තයේදී එහෙම වෙන් කරලා හඳුනා ගන්න පුළුවන් මායිම් රේඛාවක් සලකුණු කර ගන්න එක අමාරු කාරණයක්. මොකද, ඒ තරමටම ජනතාවගේ හදවත් එක්ක, ජන ජීවිතයත් එක්ක බද්ධ වුණු කාරණයක් බවට පත් වෙලා තිබෙනවා.

ඒ නිසා කෘෂිකර්මය දියුණු කරන්න අවශ්‍ය නම් මොනවාද අපි කරන්න ඕනෑ කියලා තමයි කල්පනා කරන්න ඕනෑ. ඒකට මේ පැරණි තාක්ෂණික ක්‍රමය කෘෂිකර්මය සඳහා මොන තරම් යොදා ගෙන තිබෙනවාද කියන එක කල්පනා කරලා, ඒ පැරණි තාක්ෂණයට නව තාක්ෂණය එකතු කරලා, තාක්ෂණික වශයෙන් මේ කර්මාන්තය දියුණු කළොත් තමයි මේ වර්තමාන පරම්පරාව මේ කර්මාන්තය කෙරෙහි ඇද ගන්නට, මේ කර්මාන්තයට ආදරය කරන, මේ කර්මාන්තයේ යෙදෙන පිරිසක් බවට පත් කර ගන්න පුළුවන්කම ලැබෙන්නේ. බලන්න අපේ බිසෝ කොටුව, ඒ වාගේම මඩ සොරොව්ව, කලා වැවේ ඉඳලා තිසා වැවට සැතපුම් 54 ක් දුර සැතපුමකට අඟලක බෑවුමක් ඇතිව යන වාරි කර්මාන්තයක් හැදුවේ මීට ඈත ඉතිහාසයේ හිටපු ඒ අය. ඒ නිසා එදා තිබුණු තාක්ෂණයවත් අද මේ කෘෂිකර්මාන්තය සඳහා යොදා ගන්නවාද කියන එක අපේ අමාත්‍යාංශයේ ඉඳලත් අපි රටක් හැටියටත්, මිනිස්සු හැටියටත් කල්පනා කරන්න ඕනෑ. ඒ නිසා මේ යල් පැන ගිය, මේ ඔළුවල තිබෙන වෙනස් වෙනස් අර්ථයන් වෙනුවට විද්‍යාත්මක පදනමක ඉඳලා මේ කෘෂිකර්මාන්තය දියුණු කරන්න කාලය අද එළඹිලා තිබෙනවාය කියන කාරණය මම සිහිපත් කරන්න ඕනෑ.

මේ ලාංකීය මිනිස්සුන්ගේ ජන ජීවිතය ගොඩ නැගිලා තිබෙන්නේ, කෘෂිකර්මාන්තය මත කියලා මම පටන් ගන්න කොට කිව්වා. මම එක උදාහරණයක් කියන්නම්. අපේ ගරු මන්ත්‍රීතුමා කථා කරද්දී කිව්වා, ගම්පහ දිස්ත්‍රික්කය

ගැන. ගම්පහ දිස්ත්‍රික්කයේ කෘෂිකර්මාන්තයේ යෙදෙන පවුල් සංඛ්‍යාව මේ කෘෂිකර්මාන්තයත් එක්කම බද්ධ වෙලා ජීවත් වන පවුල් සංඛ්‍යාව 172,176ක් වෙනවා. 2016 වර්ෂයේදී ඒ වගා කරන්න නියමිතව තිබුණු භූමි ප්‍රමාණය හෙක්ටයාර 17,068 ක් වෙනවා. හැබැයි, පසුගිය අවුරුද්දේ වගා කර නොමැති භූමි ප්‍රමාණය හෙක්ටයාර් 4265.01 ක් වෙනවා. ඒ නිසා මේක ක්‍රමිකව, ක්‍රම ක්‍රමයෙන් අවුරුද්දෙන් අවුරුද්දට වගා නොකරන කුඹුරු ඉඩම් ප්‍රමාණය වැඩි වෙනවා. මේ කොළඹ, ගම්පහ, කළුතර කියන අපේ පළාත ගත්තත්, සමස්තයක් හැටියට ලංකාව ගත්තත්, මේ කර්මාන්තයෙන් ගොවි ජනතාව ඈත් වෙන්නේ ඇයි කියන එක අපේ අමාත්‍යාංශය විධියට කල්පනා කරන්න ඕනෑ. ඒ නිසා මේ තත්ත්වයෙන් ඈත් වෙන්නේ ඇයි කියලා සොයන්න ඕනෑ. ගවේෂණය කරන්න ඕනෑ. සමීක්ෂණ, පරීක්ෂණ කරන්න ඕනෑ. ඒකට ප්‍රධානතම හේතුවක් තිබෙනවා. අද තමුන්නාන්සේලා අපි දන්න ඒ ගොවියාට අද මොකද වෙලා තිබෙන්නේ? ගොවියාගේ රත්තරන් බඩු ටික උකස් කඩේ. බැංකුවට ණය වෙලා. පොලී මුදලාලිට ණය වෙලා. අද කෘෂිකර්මාන්තයේ යෙදෙන උදවිය දරිද්‍රතාවයෙනුත් පල්ලෙහාටම වැටෙන පිරිස බවට පත් වෙලා තිබෙනවා. ඒකට විශාල හේතු රාශියක් ඇති. විශාල කාරණා රාශියක් ඇති. හැබැයි, ඒ හේතු කාරණා හඳුනාගෙන ඒවාට ප්‍රතිකර්ම යොදන එක අපේ අමාත්‍යාංශයේ වගකීම බව මෙන්ම, අපේ වැඩ කරලා පළපුරුද්ද තිබෙන, දැක පුරුද්ද තිබෙන, අත්දැකීම් තිබෙන අපේ අමාත්‍යතුමා ඇතුළු අපේ අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ කාර්යභාරය ද වෙනවා.

ඇමතිතුමාට ඉතාමත්ම වටින අමාත්‍යාංශ ලේකම්වරයෙක් ලැබිලා තිබෙනවා. හැම දෙනාටම ඇහුම්කන් දෙන, එසේ ඇහුම්කන් දීලා හොඳින් ඒ කටයුත්තේ යෙදෙන්න පුළුවන් ලේකම්වරයෙක් සහ නිලධාරීන් පිරිසක් අනෙක් අමාත්‍යාංශවලට සාපේක්ෂව කෘෂිකර්ම අමාත්‍යාංශයට ලැබිලා තිබෙනවා. ඒක අපේ ඇමතිතුමාට ලැබිලා තිබෙන වාසනාවක්. ඒ වාගේම ඇමතිතුමාත් ඒ විධියටම හැම දෙනාටම ඇහුම්කන් දීලා නියමිත කාල වකවානුවලට සෑම මාසයකම නියමිත කාල පරාසය අරගෙන කෘෂිකර්ම උපදේශක කාරක සභාව තියලා, ඒකේ දැනුම ලබා දෙන්නට අවශ්‍ය මග පෙන්වීම මන්ත්‍රීවරුන්ට සහ නිලධාරීන්ට ලබා දෙන වැඩ පිළිවෙළක් ඇතිව කෘෂිකර්ම අමාත්‍යාංශය දියත් කරනවා. අපේ සුභාශිංසන එතුමාට පළ කරනවා. මොකද, අනික් ඇමතිවරුත් එක්ක ගත්තාට පස්සේ එතුමාගේ මේ අමාත්‍යාංශය අඩි ගණනක් ඉස්සරහා ඉන්නවා. ඒ නිසා අපේ ස්තූතියක් විධියට අපි එතුමාට පළ කරනවා. ලැබුණු දෙයක් නම් නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

හවසට මොනාව් එකට එන්න කිව්වා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

විශේෂයෙන්ම අද ලංකාවේ ප්‍රධාන ජාවාරම් තුනක් තිබෙනවා. මේ ජාවාරම් තුන තමයි එකක් ආයුධ ජාවාරාම. අනික ඖෂධ ජාවාරම. අනික් එක බීජ ජාවාරම. මේ ජාවාරම් තුන ඇතුළේ, මේ වැය ශීර්ෂයට අදාළව බීජ ජාවාරම විශාල වශයෙන් අද ලංකාව වෙලා ගෙන තිබෙනවා. ආයුධ ජාවාරාම, ඖෂධ ජාවාරම, බීජ ජාවාරම තිබෙනවා. අද තමුන්නාන්සේලා අපි දන්නවා. පොළට ගිහිල්ලා වට්ටක්කා ගෙඩියක් අර ගන්න. වට්ටක්කා ගෙඩිය ඇතුළේ ඇට නැහැ. පොළට ගිහිල්ලා කොමඩු ගෙඩියක් අරගන්න. කොමඩු ගෙඩිය ඇතුළේ ඇට නැහැ. අද අරගෙන බලන්න. අද අපේ වැටකොළු ගහේ හැදෙන වැටකොළු කරල නැවත පැළ වෙන තැනක නැහැ. පතෝල කරල පැළ වෙන තැනක නැහැ. ඒ නිසා අපේ වගා බිම, කෘෂිකර්මාන්තය විවිධ බහු ජාතික සමාගම් විසින් විනාශ කරලා තිබෙනවා. හෙට දවසේ අපේය කියන අපේ භූමියත් නැති වන තැනට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ බීජ සම්බන්ධයෙන් තිබෙන මාෆියාව පරාජය කරන්න නම්, අපේ බීජ නිෂ්පාදනය කරන, බීජ සකස් කරන ආයතන, බීජ සකස් කරන එකට වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. ඒක වටිනා කියන සම්පතක් බවට පත් වේවි.

මේ කෘෂිකර්මාන්තය දියුණු කරන්න බලාපොරොත්තු වන මහ ආණ්ඩුව වේවා, අපේ මේ අමාත්‍යාංශය තුළ වේවා, එය වැදගත් කාර්යයක් බවට සලකලා මේ ජාවාරමෙන් මිනිස්සු මුදා ගන්න නම් මේ කටයුත්තට ප්‍රමුඛතාවයක් දෙන්නය කියන එක මම අපේ ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු අනෙකුත් නිලධාරීන්ගෙන් ඉල්ලා සිටිනවා. මේ බීජ සම්බන්ධයෙන් තිබෙන මාෆියාව බිඳ දමන්නට මොනවාද? කරන්නේ කියන කාරණය පිළිබඳව කල්පනා කරන්න. අද විදේශයෙන් එන බීජ වරායට එන කොට, රු. 4,000 ක් වන කිලෝ එකක්, වරායෙන් එළියට එන කොට වෙළඳ පොළේ රු. 44,000 ක් වෙනවා. දේශීය වට්ටක්කා ඇට ටිකක් පුළුවන් නම් සොයා ගන්න.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

යහපාලනය.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

අද යහපාලනය නොවෙයි. මම කියන්නේ නැහැ. මහින්ද මහත්තයාගේ ඇට පැළ කිරීමෙන් තමයි මේක වුණේ කියලා. ඒ නිසා මම මේ කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් තිබෙන ප්‍රධාන කාරණයක් ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි. මම කිව්වා, මේ කෘෂිකර්මාන්තයේදී යල් පැන ගිය, මේ ඔළුවල තිබෙන අදහස් තමයි වෙනස් කරන්න ඕනෑ. ආකල්ප තමයි වෙනස් කරන්න ඕනෑ. කෘෂිකර්මාන්තය තමයි අද ලංකාවේ ඔබතුමාගේ අමාත්‍යාංශය ගත්තත්, මේ ලංකාවේ වැඩියෙන්ම PHD උපාධිධාරීන් ඉන්න විෂය පථය අයත් වෙන්නේ මේ කෘෂිකර්මාන්තයට අදාළවයි. වැඩිම PHD උපාධිධාරීන් ප්‍රමාණයක් ඉන්නේ මේ කෘෂිකර්මාන්තයට අදාළව. ආචාර්ය උපාධිය තිබෙන උදවිය ඉන්නේ, මේ ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයට අදාළව. ශ්‍රී ලංකාවේ උපාධිධාරීන්ගේ සංඛ්‍යාගණනයන්වලට අනුව වැඩිම උපාධිධාරීන් සංඛ්‍යාවක් ඉන්නේ කෘෂිකර්මාන්තයට අදාළව. අසෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමා කථා කළා. මම හදවතින්ම සන්තෝෂ වෙනවා. එතුමාත් මේ ආචාර්ය උපාධියක් දරන තැනැත්තෙක්. මේ විෂය සම්බන්ධයෙන් අනුබද්ධ විෂයයන්වලට අදාළව. එතුමා හොඳ අදහස් ප්‍රමාණයක් කිව්වා. ඔබතුමාගේ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ අශෝක රන්වල ගරු මන්ත්‍රීතුමා නැතත් එතුමාගේ ආචාර්ය උපාධියත් එක්ක, එතුමා දුන්න අදහස් එක්ක මේ අමාත්‍යාංශයෙන් අපේ මන්ත්‍රීවරයෙකුගේ සේවය ලබා ගැනීමට ඔබතුමාට අවස්ථාවක් ලැබෙනවාය කියලා මම විපක්ෂය වුණත්, ජනතා විමුක්ති පෙරමුණ වුණත් මම මේ කෘෂිකර්මාන්තයට තිබෙන ආදරය නිසා මම ගරු ඇමතිතුමාට යෝජනා කරන්න කැමැතියි. විශේෂයෙන් එහෙම කරන කොට මේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමන්ලාව අයින් කරලා තියා ගන්නත් ඔබතුමා පරිස්සම් වෙන්න ඕනෑ.

**ගරු ලලන්ත ගුණසේකර**
Hon. Lalantha Gunasekera

ඒ ඔබතුමා තනිවම මොනාව් එකට යන්න නේ? ඒක හරියන්නේ නැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඒවා කරන කොට මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමන්ලාව අයින් කරලා තියන්න වග බලා ගත්තේ නැත්නම්, තමුන්නාන්සේට වෙන්නේත් ගමේ ගොවියාට වුණා වාගේ තමුන්නාන්සේගේ අමාත්‍යාංශය උකසට තියන්නයි. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ වැඩ පිළිවෙළට ජාතික වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. ඒ වාගේම සැලැස්මක් තිබෙන්න ඕනෑ. ඒ ජාතික වැඩ පිළිවෙළයි, සැලැස්මයි එක්ක ගත්තාට පස්සේ, අද අපේ හාමුදුරුවෝ කථා කරද්දී කිව්වා, පසුගිය අවුරුදුවල මේ කාලය වන කොට මිරිස් කරලේ වටිනාකම කීයද කියලා. සමහර කාලවලට දෙහි ගෙඩියේ වටිනාකමත් ඒ තරම්මයි අපේ හාමුදුරුවනේ. ඒ විධියට ගත්තාට පස්සේ, ඇයි?මෙහෙම දේවල් වෙන්නේ. සමහරු වෙළඳපොළ අගය කිරීමක් නැතිව, වෙළඳපොළ, පාරිභෝගිකයා සහ නිෂ්පාදකයා අතර නියමිත සැලැස්මක් නැතිම විෂයයක් තමයි කෘෂිකර්මාන්තය කියලා කියන්නේ. දැන් බලන්න. අවුරුදු කාලේට රතිඤ්ඤා වැඩිපුර හදනවා. අවුරුදු කාලෙට වැඩිපුර ඇඳුම් මහනවා. හැබැයි, අනික් මාසවලදී රතිඤ්ඤා හදන්නේ නැහැ. රතිඤ්ඤා හදන්නේ අවුරුදු කාලෙට, නත්තල් කාලෙට වාගේ කාලවලට විතරයි. ඒ නිසා මේ නිෂ්පාදකයා සහ වෙළඳපොළ අතර තිබෙන ගනුදෙනුව කෘෂිකර්මාන්තයේදී ඒ තරම් වැටහීමකින් තොරව කටයුතු කරන පාටක් නැහැ. පසුගිය අවුරුද්දේ මිරිස්වලට ඉල්ලුමක් තිබුණා නම්, මේ අවුරුද්දෙත් මිරිස් වවනවා. මේකට ප්‍රතිකර්මයක් තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ඉස්සෙල්ලා පුංචි පවුලක් ගමක රැඳිලා තිබුණේ හරක බාන එක්ක. ඒ හරකා බාන එක්ක කිරි සම්පතත් තිබුණා. ඒ වාගේම පසට, ජලයට, ජෛව විවිධත්වයට ආදරය කරන මිනිස්සු පිරිසක් ගමේ හිටියා. ගෙදර හිටියා. තමන්ගේ වත්තේ, කොටුවේ තමන්ට ඕනෑ එළවළු ටික හදා ගත්ත පවුලක් තිබුණා. කුටුම්භයක් තිබුණා. ඒක ඇතුළේ හරකා බාන හිටියා. තමන්ගේ පවුලට ඕනෑ කිරි ටික ගත්තා. එළවළු ටික හදා ගත්තා. වවා ගත්තා. මේ පරිසරයට ආදරය කරන ජන ජීවිතයක් ගොඩ නැගුනේ කෘෂිකර්මාන්තයත් එක්ක. ඒ නිසා අද ඒක ජනතාවගෙන් ඈත් වෙලා ගිහිල්ලා තිබෙනවා. නැවත වතාවක් මේවා ගම්වල ඇති කරලා, ඒවාට ආකල්පමය වශයෙන් වෙනසක් හදන්න ඕනෑ. මිනිස්සුන්ගේ සිත් සතන් තුළට මේ කෘෂිකර්මාන්තය පිළිබඳ පණිවුඩය නිවැරදි තාක්ෂණයත් එක්ක, විද්‍යාත්මක දැනුමත් එක්ක අරගෙන

ගියොත් එහෙම, අර පවුල නැවත හදන්න පුළුවන්කම තිබෙනවා. උදේට වැඳලා කුඹුරට ගිය මිනිස්සු පිරිසක් අපේ රටේ ඉන්නේ. අද ඒ මිනිස්සු ගොවිතැනෙන් ඈත් වෙලා තිබෙනවා. ඕනෑ නැති කම නිසා නොවෙයි. නිසි මග පෙන්වීමක් නැතිකම නිසා සහ ආකල්පමය වෙනසක් ඇති කරන්න ඕනෑ නිසා. මේක ව්‍යාපාරික කෘෂිකර්මාන්තය බවට පත් වුණා. ඒක ව්‍යාපාරික කෘෂිකර්මාන්තය සහ ගෘහාශ්‍රිත කෘෂිකර්මය කියන අංග දෙකම තේරුම් අරගෙන මේ අංග දෙකත් එක්ක කටයුතු කරන්න මේ අමාත්‍යාංශයට හැකියාවක් තිබෙන්න ඕනෑ.

ඊළඟ කාරණාව තමයි පලතුරු වගාව. අපේ ගමක ඉස්සර ගෙවත්තේ තිබුණා අනෝදා ගහ, වැලි ආතා ගහ, වෙරළු ගහ. අද ඒවා ගමක ගෙදරක තිබෙනවා ද?අද නැහැ. පලතුරු වගාව - සෞඛ්‍ය අමාත්‍යාංශයේ දත්තයන්ට අනුව හැම මනුස්සයෙක්ම නිවැරදි සෞඛ්‍ය පුරුද්දක් විධියට දවසකට පලතුරු ග්‍රෑම් 200 ක් කන්න ඕනෑ. අද ඒ හැකියාව නැහැ. අපට පිටරටින් එන පලතුරුවල තිබෙන්නේ වස විෂ. ඇපල්වල වස විෂ වර්ග 20 ක් තිබෙනවාය කියලා සඳහන් වෙලා තිබෙනවා. ඒ නිසා ගමේ ගෙදර පලතුරු ගම්මාන හදන්න පුළුවන් නම් දේශගුණික, පාරිසරික විපර්යාස අනුව කොළඹ, කළුතර, ගම්පහ ගම් බෙදා ගෙන එක ගමක අනෝදා ගම්මානය. අනික් ගම මැංගුස්. කළුතර මැංගුස් තියෙන්නේ. අද ගත්තොත් කළුතර මැංගුස් නැහැ. මැංගුස් කළුතරට එන්නේ පිටරින්. අද නාවල අන්නාසි නැහැ. ඒ අන්නාසි පිටරටින් එන්නේ. මේ නිසා මේ විධියට පලතුරු වර්ග පිළිබඳව යම් අවබෝධයක් ඇති කරන්න ඕනෑය කියලා මම විශ්වාස කරනවා. ඒ වාගේම තමයි අස්වනු නෙලීම පිළිබඳව. ලාංකීය ගොවියාට අස්වනු නෙලීම, අස්වනු ප්‍රවාහනය පිළිබඳව අවබෝධයක් නැහැ. විශාල ප්‍රමාණයක්ප්‍රවාහනයේදී නැති වෙනවා. අස්වනු නෙලීමේදී අද තවමත් අඹ ගෙඩිය කඩන්නේ, කෙක්කේ අගට ගොට්ටක් ගැට ගහලා. ඒ නිසා මම මේ කාරණා කිව්වා. මම තව එක කාරණයක් කියනවා. සත්ව පාලනය පිළිබඳව කථාවක් කියලා මගේ කථාව අවසන් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට නියමිත කාලය අවසන්. තවත් කාලය දෙන්න විධියක් නැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

සහෝදරයන් දෙන්නෙක් එකතු වෙලා හරකෙක් ගෙනාවා. ඒ ගෙනාපු හරකා සහෝදරයෝ දෙන්නා බෙදා ගත්තා. මීට අවුරුද්දකුත් මාස කිහිපයකට ඉස්සෙල්ලා හරකෙක් ගෙනවා. ඒ ගෙනාපු හරකා සහෝදරයෝ දෙන්නා බෙදා ගත්තා. බෙදා ගත්තාට පස්සේ කිව්වා, මට දීපන් ඉස්සරහා පැත්ත. උඹ ගනින් පස්ස පැත්ත කියලා. (බාධා කිරීම්) දැන් අපට හම්බ වුණා ඉස්සරහා පැත්ත. අපි දැන් හරකාට කවනවා. පොවනවා. පුන්නක්කු ඔක්කොම දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න. කාලය අවසන්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

පස්ස පැත්ත ගත්ත තමුන්නාන්සේලා එකතු වෙලා. දැන් තමුන්නාන්සේලා ගොම ටික ගන්නවා. කිරි ටික ගන්නවා. අපි දැන් (බාධා කිරීම්) 2017 අවුරුද්දේ මේ හරකාගේ පස්ස මේ පැත්තට හරවලා, බෙල්ල ඔය පැත්තට හරවනවා. ඔබතුමාගේ වැය ශීර්ෂයට අපේ සහයෝගය දෙනවා කියමින් මගේ කථාව අවසන් කරනවා. බෙහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මෙහෙම කිව්වාට සමාවෙන්න. මූලාසනයෙන් වෙලාව අවසන් කිව්වාම කථාව අවසන් කරන්න. මේ වෙලාවේ හරකාගේ පස්සයි ඉස්සරහායි ගැන කථා කරන්න එපා. අපට කාලය මදි වෙලා ඉන්නේ. මීළඟට උපුල් මහේන්ද්‍ර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[අ.භා. 02.26]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු සභාපතිතුමනි, මම අපේ ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද, එතුමා මා හඳුනාගෙන මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන්. මම කනගාටුව ප්‍රකාශ කරනවා. මම පළාත් පාලන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව නියෝජනය කරන්නේ. මම මේ පළාත් සභාවට හැම දවසකම

පැමිණෙන මන්ත්‍රීවරයෙක්. ඒ වාගේම මම හැම උපදේශක කාරක සභාවකටම එන කෙනෙක්. මම එදා කිව්වා, මේ පළාත් සභාව සුදු අලියෙක් කියන එක ගමට යන පණිවුඩය නැති කරන්න, උත්සාහ කරන මන්ත්‍රීවරයෙක් මම. නමුත් මට පළාත් පාලන විෂයේදී මගේ කාලය ලැබුණේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට කාලය ලබා දීලා තිබෙනවා. විනාඩි 15 ක් දීලා තිබෙනවා.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

මුල් අවස්ථාව මට නොලැබීම සම්බන්ධයෙන් මගේ කනගාටුව ප්‍රකාශ කරන්න ඕනෑ. එතකොට යම් යම් අවස්ථාවල අපේ සභාය බලාපොරොත්තු වන වෙලාවට අපිත් ඒ අනුව තමයි මේ සභාවේ කටයුතු කරන්නේ කියලත් මම පැහැදිලිව කියන්න ඕනෑ. යම් අවස්ථාවල ඒ අවස්ථාව උදාවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පළාත් පාලන උපදේශක කාරක සභාවේ නැහැ නේද?

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

විශේෂයෙන් අපි අගය කරනවා, අපේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට වචනයක් හරි කථා කරන්න අවස්ථාව ලැබීම සම්බන්ධව. ඇත්තටම මම අගය කරන්නේ, මම මේ පළාත් සභාවට නවක මන්ත්‍රීවරයෙක් වශයෙන් ආවාට පස්සේ අපට තිබෙනවා විවිධ වූ අමාත්‍යාංශ. ඒ අමාත්‍යාංශවලින් අපි තෝරා ගත්තා - එතුමාට ඒ වන කොට කලා කටයුතු අමාත්‍යාංශයත් තිබුණා. සංස්කෘති විෂයත් තිබුණා. මම මේ පළාත් සභාව නියෝජනය කරන්න, ගමක් නියෝජනය කරමින් තමයි ආවේ. ඒ නිසා ඒ ගමේ තිබෙන පණිවුඩය පළාත් සභාවට ගේන්න තිබෙන හොඳම තැන තමයි කෘෂිකර්ම, ගොවිජන සේවා හා කලා කටයුතු අමාත්‍යාංශය. නමුත් ඒක යම් ප්‍රමාණයකින් වෙනස් වුණා. කෘෂිකර්මය කියන්නේ අපට අදාළ දෙයක්. අපේ ගැමිකම, ගමේ කම, සංස්කෘතිය ගොඩ නැගෙන තැන. ඒ අමාත්‍යාංශයට යම් හෝ සහයෝගයක් ලබා දෙමින් කටයුතු කරන්නට ලැබීම මම භාග්‍යයක් කොට සලකනවා.

විශේෂයෙන් අපි ඇමතිතුමාව අගය කරන්න ඕනෑ. එතුමා නිරන්තරයෙන් උපදේශක කාරක සභා තියනවා. අපි මේ උපදේශක කාරක සභාව වෙනුනෝ තෙල් බිඳක්වත් පුච්චලා නැහැ. අපි මේ සභාවට ඇවිල්ලා යන කොට පල්ලෙහා දෙවැනි තට්ටුවේ රැස්වීම සංවිධානය කරලා තිබෙනවා. කෑම ටික ලැබෙනවා. නියමිත වෙලාවට රැස්වීම පටන් අරගෙන ඒ කටයුත්ත හමාර කරනවා. අපේ යෝජනා අදහස්වලට ඇහුම්කන් දෙනවා. ඊට පස්සේ සතියක් විතර යන කොට අපට ඒ අදාළ නිලධාරීන් කියනවා, අපි ගෙනාපු යෝජනාව මොකක්ද කියලා බලන්න. එතුමා හොඳ ආදර්ශයක් මේ සභාවට දීලා තිබෙන්නේ. මේ වාගේ තමයි ඇමතිවරයෙක් වැඩ කරන්න ඕනෑ. මේක තමයි අපේ තිබෙන කාර්යභාරය. දක්ෂතාවයක් තිබෙනවා නම්, ඒක හඳුනාගන්නට ඕනෑ. ඒකට කැමැත්ත තිබෙන මන්ත්‍රීවරුන් ඒකරාශී කර ගෙන මේ කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් හොඳ පණිවුඩයක් මේ පළාත් සභාවට ලබා දෙනවා. මාස 12 ට උපදේශක කාරක සභා 12 ක් තියලා, ආදර්ශයක් දුන්නා. ඒ පිළිබඳව ගරු අමාත්‍යතුමාට සහ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයට අපේ ගෞරවය පුද කරන්නට ඕනෑ.

ඒ වාගේම තමයි ඇමතිතුමා ඉන්නේ හෝමාගම. මම ඉන්නේ අත්තනගල්ලේ. ලේකම්තුමා ඉන්නේ තවත් ප්‍රදේශයක. අපේ මේ සබඳතා යම් කාලයක බිඳ වැටෙන්න පුළුවන්. ඇමතිතුමා අපේ සභාවේ නොමැති වෙන්න පුළුවන්. මම නොමැති වෙන්න පුළුවන්. ලේකම්තුමා විශ්‍රාම යන්න පුළුවන්. හැබැයි, මේ අමාත්‍යාංශයෙන් අපේ ජීවිතවලට යම් යම් දේවල් එකතු කළා.

අපි ඇවිල්ලා මෙතැන මහා හයියෙන් කථා කරනවා. අහවල් දේ දන්නවා. මේ දේ දන්නවා. කෘෂිකර්මය කියන්නේ මේකයි කියනවා. අවසානයේ අපි දන්න දෙයක් නැහැ. ගරු ඇමතිතුමාට පින් සිද්ධ වෙන්න අපි අවස්ථා තුනකට සහභාගී වුණා. ගරු සභාපතිතුමනි, අවස්ථා තිහිපයකදීම එතුමා දේශීය වශයෙන් අපව ස්ථාන

කිහිපයකට අරගෙන ගියා. අරගෙන ගියාමයි අපි දැන ගත්තේ අපි දන්න දේවල් මොනවාද කියලා. මේ තැන්වල තමයි මේ කාර්යයන් සිද්ධ වෙන්නේ. අපි පර්යේෂණ ආයතනවලට ගියා. බීජ වගා කරන තැන්වලට ගියා. ගබඩා කරන ස්ථානවලට ගියා. විවිධ සතුන් බලන්න ගියා. ඒ වාගේම අපි සතුන්ගේ ජාන අරගෙන සතුන් බෝ කරන විධිය බලන්න ගියා. එතකොට මේ වාගේ අපේ ජීවිතයට අත්දැකීම් ගණනාවක් එකතු වුණා. අද අපි ගමට යනවා. ගමේ ගිහිල්ලා දවසට රැස්වීම් තුන හතර තියමින් යන දවස් මේ. අපට ගියාම කථා කරන්න බොහෝ දේ තිබුණා. පොල් ගහ දැක්කාම පොල්ගහේ තුන්වන අත්තට කරන්න ඕනෑ මොකක්ද? පැලයක් දැක්කා නම් පර්යේෂණ ආයතනයට ගිහිල්ලා දෙන්න ඕනෑ පැලයේ කොයි කොලයද? පසේ සෞඛ්‍ය පිළිබඳව කටයුතු කරන්නේ අපි මොන විධියටද? අපි පොහොර දාන්න පෙර,මොන විධියටද කටයුතු කරන්නට ඕනෑ? අපි යූරියාම දානවාද? ඇමෝනියාම දානවාද? එහෙම නැත්නම් මොකද කරන්නේ? ගරු ඇමතිතුමා යම් යම් සංචාර සඳහා අපව එක්කා ගෙන ගියාම මේ සියල්ල පිළිබඳව අවබෝධයක් අපට ලැබුණා. කවුරු හරි හිතුවා නම් මේ සංචාර යන කොට හොඳට බොයි. හොඳට කයි. හොඳට නිදාගෙන ඉඳලා විනෝද වෙලා එයි කියලා. එහෙම දෙයක් වුණේ නැහැ. නිදහසේවත් ඉන්න අපට වෙලාව මදි වුණා. ඒ තරමට ස්ථාන ගොනු කරලා, ගරු අමාත්‍යතුමා, ලේකම්තුමා, කාර්ය මණ්ඩලය, එතුමාගේ පෞද්ගලික ලේකම්තුමා ඇතුව ඒ නිසි ආකාර පුහුණුවක් ලබා දුන්නා. අපේ අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා කියන කොට, කොළඹ වරායේ මේ මේ ගණන් බීජ කියලා කියන කොට මට හිතුනා එදා මන්ත්‍රීතුමා නොගියාද කියලා. අපි නම් ලංකාවේ බීජ හදනවා දැක්කා. බීජ සුරක්ෂිත කරනවා දැක්කා. බීජ ගබඩා කරනවා දැක්කා. බීජ කොහොමද නෙලන්නේ. ඒ වෙනුවෙන් කටයුතු කරන්නේ කොහොමද? ඒවා කටයුතු කරන ආකාරයත් අපි දැක්කා. මේවා යම් ප්‍රමාණයකට මේ රටේ -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

දැක්කා CIC එකේ. අපේ කෘෂිකර්මාන්තයේ නොවෙයි.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

කොහොම හරි ලංකාවේ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කෘතිම සිංචනය දැක්කා නේද?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

දැක්කා. මේ දවස්වල හරකෙක් හොයනවා. ඔබතුමාටත් පුළුවන් දායක වෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. මට නොවෙයි ඔබතුමාට පුළුවන්.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

එදා ඩමියක් තිබුණේ.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

මේ හරහා හොඳ පණිවුඩයක් ලැබුණා. ඒ නිසා මම ඒ සියලු කාරණා අගය කරනවා. ඉදිරියටත් අපේ කෘෂිකර්ම ඇමතිතුමා මොකක් හරි දෙයකට එන්න කිව්වා නම්, ඇවිල්ලා සම්බන්ධ වෙලා, ජීවිතයට යමක් අත්දැකීමක් ලබා ගන්න පුළුවන් තැනක් කියන එක මම කියන්නට ඕනෑ. ඒ අනුව තමයි ඊයේ දවසේ මම දැක්කා පළාත් සභා රැස්වීමේදී අපේ මන්ත්‍රීවරයෙක් කිව්වා, කොස් පැල දහස් ගණනක් හිටවලා තිබෙනවා කිව්වාට පෙළක් මන්ත්‍රීතුමන්ලා දැක්කේවත් නැහැයි කියලා. මම දැක්කෙත් නැහැ, කොස්පැළ දහස් ගණනක් හිටෙව්වාට. නමුත් මම කියන්නේ, ඕනෑම අමාත්‍යවරයෙකුට යම් සංකල්පයක් හිතේ පහළ වුණා නම්, ඒ තමයි දේශපාලන අධිකාරියේ තිබෙන්නා වූ දේශපාලඥයා සතු හැකියාව. ඔහුට සංකල්ප තිබෙන්නට ඕනෑ. නව දැක්මක් තිබෙන්නට ඕනෑ. ඔහුට යම් යම් කුසලතා පරිපූර්ණභාවයක් තිබෙන්නට ඕනෑ. තමන්ට දේශපාලන වශයෙන් මහජනතාවගේ අදහස් එක්ක එන කොට, මෙන්න මේ සංකල්පය නිලධාරියාටත් කියන්න ඕනෑ. නිලධාරියා තමයි ආවරණය කරන්නේ. එතැන තමයි නෛතික රාමුව හදන්නේ. එතුමාට කොස් පැළ දස ලක්ෂයක් හිටවන්න ඕනෑ වුණාම එතුමා තමන්ගේ අමාත්‍යාංශයට කියන කොට - මේ වන කොට කොස් පැළ විශාල ප්‍රමාණයක් හිටවලා ඇති. අපටත් ලබන වර්ෂය වන

[ ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ]

කොට ලැබෙයි කියලා විශ්වාසය තිබෙනවා. ඒ නිසා හැම වැඩ සටහනක්ම සංවිධානය කරන්නේ අවුරුදු ගණනකට. එක පැයකින්, දෙකකින්, මාසයකින් කරන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා එතුමා යම් යම් සංකල්ප ගණනාවක් හඳුන්වා දීලා තිබෙනවා. අපි සතුටු වෙනවා. අපේ අත්තනගල්ල ආසනයේ වප් මඟුල් දෙකකට එතුමා ගියා. ඒ වප් මඟුලක් කියලා කියන්නේ අපේ නව පිබිදීමක්. අවුරුදු 25 ක් 30 ක් වැඩ කරලා නැති කුඹුරු යායකට ගිහිල්ලා, ඒ වප් මඟුල පවත්වන කොට අපේ ගමේ තිබෙන සංස්කෘතිය ගොඩ නැඟුනා. අපේ ගමේ පොල් තෙල් පහන හැඳුවේ ගමේ වැඩිහිටියෝ ඇවිල්ලා. ගොවියාගේ තිබෙන සංකල්ප අපි එතැන දැක්කා. ගමේ කාන්තාවන්ගේ යම් යම් හැකියාවන් අපි දැක්කා. මෙය සංවිධානය කරලා ඒ වප් මඟුල් හරහා ලොකු පණිවුඩයක් ලබා දුන්නා. ඒ නිසා මේ කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා විශාල කාර්යයක් කරනවා. ඒ වාගේම මම ඇමතිතුමාට උපදේශක කාරක සභාවේදී යෝජනා කරන්න හිටියා, මේ ගොවිජන සේවා කියන කෑල්ල අයින් කරලා දැම්මා නම් ඉවරයිනේ? බොරුවට ඒක තියා ගන්න උවමනාවක් නැහැ නේ? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් තිබෙනවා. අපි ලේකම්තුමාට කිව්වා. මේ සංශෝධනය අනුව ගොවි ජන සේවා කියන එක අපට අයිති කාර්යයක්. අපේ වගකීමක්. මේක අපට මධ්‍යම රජය ලබා නොදෙනවා නම්, නැවත ව්‍යවස්ථා සංශෝධනයක් ඉදිරිපත් කරලා, පළාත් සභාව සතු මේ බලය උදුරා ගෙන ඉන්නවා නම්, හංගාගෙන ඉන්නවා නම්, නොදෙනවා නම් මේක ගන්න කටයුතු කරන්න. එහෙම නැතිව අපට ඇළ තිබෙනවා. නියර තිබෙනවා. කුඹුර තිබෙනවා. මේවායේ යම් යම් සීමාවන් තුළ තමයි අපට කටයුතු කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි මේවා පිළිබඳව කටයුතු කරන්න කියලා මේ අයවැයේදී ප්‍රකාශ කරනවා.

ඒ වාගේම තමයි කෘෂිකර්ම ගොවිපලවල්. අපට වල්පිට ගොවිපලක් තිබෙනවා. කොටදෙනියාවේ ගොවිපලක් තිබෙනවා. අපි ඒවාට ගියා. මහා වතු තිබෙනවා මිසක් මේවා යම් සශ්‍රීකතාවයෙන් තිබෙන්නට ඇති. 1970 – 1977 කාලයේ මේ රටේ කෘෂිකර්මය තුළ විප්ලවයක් ඇති වුණා. මේවා සක්‍රීය වෙලා තිබෙන්නට ඇති. හැබැයි, මේ රටේ වෙළඳපොළ ආර්ථිකයක් හඳුන්වලා දුන්නා. විවෘත ආර්ථික ක්‍රමයත් එක්ක මේවා ක්‍රමානුකූලව බිඳ වැටිලා මේ වන කොට අභාවයට යමින් තිබෙන යුගයක නැවත මේ උපදේශක කාරක සභාවේ ගත් තීන්දුව හා ගරු අමාත්‍යතුමාගේ ප්‍රවේශය හරහා නැවත මේක පණ ගැන්වෙමින් පවතිනවා. මේක ලේසියෙන් කරන්න පුළුවන් දෙයක් නොවෙයි. මේ අවුරුද්ද තුළ කරන්න පුළුවන් දෙයක් නොවෙයි. අවුරුදු ගණනාවක් යන කොට මෙතැන හවබෝග ටික වැවෙන්නට ඕනෑ. එතැන යම්කිසි කාර්ය මණ්ඩලයක් ස්ථාපිත වෙන්නට ඕනෑ. එතැන කෘෂිකර්මාන්තයට අදාළව සතුන්,ප්‍රීෂියන්, ජර්සින්වර්ගයේ හරකෙක් වෙන්න පුළුවන්. කිරි එළදෙනක් වෙන්න පුළුවන්. එළුවෙක් වෙන්න පුළුවන්. කුකුළෙක් වෙන්න පුළුවන්. ඌරෙක් වෙන්න පුළුවන්. ඒවා ක්‍රමානුකූලව ගොඩ නගන්නට ඕනෑ. එතුමාගේ අමාත්‍යාංශය හරහා මේක නිවැරදි කරන්න එතුමා යම් උත්සාහයක් අරගෙන තිබෙනවා. ගොවිපලක් කියන්නේ, මෙන්න මේකයි. මෙන්න මේ ගොවිපලේ අපට පුංචි කාලයේ ඉගැන්නුවා, යම් යම් ක්‍රමවේදයන්. හරක් හදන පැත්තේ ඊළඟ වතාවේ මොනවාද වගා කරන්නේ? වගා කරපු අතර හරකා මාරු කරන්නේ කොහොමද? ඒ වාගේ යම් යම් කෘෂිකර්ම උපක්‍රම තිබුණා. මම හිතන්නේ, මේවා පිළිබඳව ගරු අමාත්‍යතුමා ඉදිරි කාලයේදී කටයුතු කරයි.

ඒ වාගේම මේ කෘෂිකර්මය කියන කොට අපේ ජන ජීවිතය බලන්නට ඕනෑ. ජන ජීවිතය ගොඩ නැගෙන්නේ කෘෂිකර්මයත් එක්ක. කෘෂිකර්මයට අදාළව තමයි මේ රටේ සංස්කෘතිය ගොඩ නැගිලා තිබෙන්නේ. ඉතින් මම ඇමතිතමාටත්, ඊයේ පෙරෙයිදා දවසක ලේකම්තුමාටත් ගිහිල්ලා කිව්වා, ලේකම්තුමා අපට පුළුවන් නම් මේ ජන වහර පිළිබඳව කථා කරන්න. එතුමන්ලාට අපි උපදේශක කාරක සභාවේදී කිව්වාම, එතුමන්ලා තීන්දුවක් ගත්තා. සම්ප්‍රදායානුකූල කෘෂිකර්මාන්තයෙන් බැහැර වෙලා මේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පවත්වාගෙන යන්න පුළුවන්කමක් නැහැ. ගමේ මිනිහාට කෘෂිකර්මය කියන කොට, අපි අභිබවා යමින් කෘෂිකර්මය ඔවුන්ට තිබෙනවා. ඒ අභිබවා යන දැනුම මොකක්ද? ඒ තමයි සම්ප්‍රදාය. මේ සම්ප්‍රදායෙන් බැහැර වෙලා මේ කෘෂිකර්මාන්තය දියුණු කරන්න බැහැ. ඒ නිසා ඇමතිතුමා පොතක් මුද්‍රණය කළා. කෘෂිකර්මාන්තයේ සම්ප්‍රදාය මෙන්න මේකයි කියලා. කෙම්, මිනිස්සුන්ගේ විවිධ වතාවත් පිළිබඳව පොතක් නිර්මාණය කළා. මම එවකට වැඩි යමක් වශයෙන් ඇමතිතුමාටත්, ලේකම්තුමාටත් මතක් කළේ, අපට පුළුවන් නම්, ගොවි සංවිධාන, ගොවියා සම්බන්ධ කරලා අපේ ජන

ජීවිතයේ තිබුණු ගැමි සංස්කෘතිය නැවත ගොඩ නගන්න.කවිය කියන්නේ මොකක්ද? හිටවන කවිය කියන්නේ මොකක්ද? නාට්‍ය කියන්නේ මොකක්ද? අද පෙර පාසලකට ගියත් පෙර පාසලේ වේදිකාවේ තිබෙන්නේ, මේ ගමේ සංස්කෘතිය. ඒ නිසා නැවත මේ ජන සමාජය ගොඩ නගන්න නම්, නිර්ව්‍යාජ මිනිස්සු මේ සමාජයේ ගොඩ නගන්න පුළුවන්කම ලැබෙනවා. රසාස්වාදනය පිළිබඳව මිනිස්සුන්ට හැඟීම ඇති වෙනවා. මේ රටේ යම් යම් කාර්යයන් සඳහා මේක මහා උපකාරයක් වෙයි කියන විශ්වාසය මම පළ කරනවා.

ඒ වාගේම ගරු ඇමතිතුමනි, අපි හැම කෙනෙක්ම අධ්‍යාපනය මේ පළාත් සභාවේ මුඛ්‍ය කාර්යය කර ගන්නවා. අධ්‍යාපනය පිළිබඳව ගන්න කොට කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා අපට යම් යම් කටයුතු කිරීමේ හැකියාව තිබෙනවා. ඒ කියන්නේ අපි ගත්තා නම් පරිසර පොත. ඒ පොතේ තිබෙන කරුණු කාරණා ගණනාවක් තිබෙන්නේ, මේ කෘෂිකර්මාන්තයට අදාළ දේවල්. අද දරුවා පැළෑටිය හඳුනන්නේ නැහැ. ශාකය හඳුනන්නේ නැහැ. කමත් භාෂාව දන්නේ නැහැ. යම් යම් මෙවලම් දන්නේ නැහැ. ඒ නිසා අපි ඔබතුමාට යෝජනා කරලා තිබෙනවා, අපේ ප්‍රදේශයට මේ කෘෂිකර්මාන්තයට අදාළව යම් හෝ කෞතුකාගාරයක ස්වභාවයේ එකක් ආරම්භ කරන්න. කෘෂිකර්ම ප්‍රදර්ශන තියන්න. ඒ වාගේම වගා ප්‍රදර්ශන පවත්වන්න. අපේ දරුවන්ගේ පුංචි මනසට මේවා ඇතුළත් කර ගන්න අපට අවශ්‍යතාවයක් තිබෙනවා. ඒ අවශ්‍යතාවයත් එක්ක කටයුතු කරන්නය කියලා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ ගැන කටයුතු කරන්න. ඒ වාගේම මේ අමාත්‍යාංශය සුවිශාල සේවයක් කරනවා. ඉඩම් අමාත්‍යාංශය ගන්න කොට මහා කටයුතු ගොඩක් කෙරෙනවා.

අපි දන්නවා, මේ ඉඩම් බෙදා දීලා තිබෙන්නේ, සාමාන්‍ය ජනතාවට. ඉඩම බෙදන්නේ, ප්ලෑන් එකක් අතට අරගෙන. ඒ සැලැස්ම අනුව බෙදන කොට පාර දාලා තිබෙනවා. පාර හරහා තිබෙන්නේ මහා පර්වතයක්. මේ ඉඩම් දුන්න මිනිහාට යන්න පාරක් තොටක් නැහැ. මහා කඳු මුදුනක්. සිතියම කියන්නේ කඩදාසියක් නිසා මෙහේ ඉන්න කෙනෙකුට ඒ ගැන අවබෝධයක් නැහැ. ඒ නිසා මේ ඉඩම් ජනපද සම්බන්ධයෙන් කටයුතු කරන කොට වගකීමෙන් කටයුතු කරන්න ඕනෑ. මිනිස්සුන්ගේ ජන ජීවිතය ගොඩ නගන්නට ඕනෑ. මිනිස්සුන්ගේ මාර්ග පද්ධතිය ගොඩ නගන්නට ඕනෑ. නිවාස පද්ධතිය හදන්නට ඕනෑ. ඔප්පුව ලබා දෙන්නට ඕනෑ. ඔවුන්ගේ දුවා දරුවන්ට ඒවා පවරන්න ඕනෑ. මෙන්න මේ කරුණු සලකා බලන්න. ඒ අනුව ඉඩම් අමාත්‍යාංශය විශාල කාර්යභාරයක් කරනවා. හිටපු කොමසාරිස්තුමියත් කටයුතු කළා. දැනට සිටින කොමසාරිස්තුමාත් ඒ කටයුත්ත කරන කොට අමාත්‍යාංශ ලේකම්තුමා හරහා ඒ කාර්යයත් කරලා දෙන්නය කියලා මම ඉතාම නිහතමානීව ඉල්ලා සිටිනවා.

ඒ වාගේම අපි හැම කෙනාම බලන්නේ පාසලට යන්න. අපේ මහ ඇමතිතුමාගේ අමාත්‍යාංශය ගත්තොත් අපි කසළ බඳුන් ටික අරගෙන පාසලට යන්නේ. සන අපද්‍රව්‍ය පිළිබඳව වැඩ සටහන් අරගෙන පාසලට යන්නේ. පිවිතුරු පාසල් කියනවා. පරිසර වැඩ සටහන් කියනවා. අපි විවිධ වැඩ සටහන් හදනවා. මේ පාසලට යන්න හැම මන්ත්‍රීවරයාම ලොකු කැමැත්තක් දක්වනවා. ඒ නිසා මේ බස්නාහිර පළාත් සභාව කියන්නේ, මහ අමැතිතුමාගේ සිට ගන්න කොට ජාලයක්. මේ ජාලය අපි හඳුනාගන්නට ඕනෑ. අපට අධ්‍යාපන ඇමතිතුමාගෙන් බැහැරව කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා පාසලට යන්න වටපිටාව ඇති වෙලා තිබෙනවා. අපට පුළුවන් කෘෂිකර්ම පිළිබඳ ඒ ආශ්‍රිත ගුරුවරුන්ව යම් දැනුවත් කිරීම් කරන්න. පාසලට කෘෂිකර්ම උපකරණ ලබා දෙන්න පුළුවන්. කොම්පෝස්ට් පොහොර හදන්නේ කොහොමද? ඒවා භාවිතා කරන්නේ කොහොමද? පාසල් අතර කෘෂිකර්ම තරඟ පවත්වන්න පුළුවන්. දරුවන් කොහොමද මේ කෘෂිකර්මාන්තයට සම්බන්ධ කර ගන්නේ? අධ්‍යාපන වැය ශීර්ෂය පමණක් නොවෙයි. පාසලේ වට පිටාව පිළිබඳ දැණුම. ඒ හරහා කටයුතු කරන්න පුළුවන්කම තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයටත් මේ කෘෂිකර්මාන්තයට සම්බන්ධ වෙන්න පුළුවන්.

බහු ජාතික සමාගම් පණිවිඩයක් දෙනවා, වෙලට බහින්න එපා. මී උණ හැදෙනවා. එතකොට ජනතාව භය වෙනවා කුඹුරට බහින්න. මී උණ හැදෙනවා. මරණයට පත් වෙනවා. ඒ නිසා සෞඛ්‍ය අමාත්‍යාංශයට පුළුවන් කෘෂිකර්ම අමාත්‍යාංශයට බද්ධ වෙලා ජනතාව දැනුවත් කරන්න. කුඹුරට බහින්නට පෙර ගමේ PHI මහත්තයා හමු වෙන්න. MOH කාර්යාලයට යන්න. මෙන්න මේ විධියට තමන්ගේ උපදෙස් ටික ඔවුන් අතර දැනුවත් කරලා, කුඹුරට යන කොට මෙන්න මේ කටයුතු කළොත් ඔබට මේ මී උණ වැළඳෙන්නේ නැහැයි කියලා දැනුවත් කළ හැකියි. ඒ නිසා අපේ කුඹුරු පුරන් වීම සඳහා මහා

[ ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ]

පරිමාණයේ යම් යම් යටි කුමන්ත්‍රණ තිබෙන නිසා මේවා පිළිබඳව අපි අවබෝධයක් අරගෙන කටයුතු කරන්න ඕනෑ.

මේ පළාත් සභා තිබෙන්නේ, මහ ඇමතිතුමා වෙනම කටයුතු කරන්නවත්, කෘෂිකර්ම ඇමතිතුමා වෙනම කටයුතු කරන්නවත්, එහෙම නැත්නම් සෞඛ්‍ය ඇමතිතුමා වෙනම කටයුතු කරන්නවත් නොවෙයි. මේ ජාලය අපි හඳුනාගෙන පළාත තුළ දියුණුවක් ඇති කරන්න ඕනෑ. මේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ඇමතිතුමා හැමට ආදර්ශයක් දෙනවා. අපි ගැනත් සොයලා බලනවා. අපට අවශ්‍ය වැඩ ටිකත් කරලා දෙනවා. ඒ වාගේම අපට දැනුම ලබා දෙනවා. ඒ අනුව මේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට අදාළ වැය ශීර්ෂය කථා කරන්න බැරි වුණත්, මේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට කථා කරන්න ලැබීම භාග්‍යයක් කොට සලකනවා. මීට වඩා වෙලාව තිබුණා නම් තවත් කථා කිරීමට හැකියාව තිබෙනවා. වෙලාව අවසන් නිසා මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Hector Bethmage M.P.C took the Chair*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. ඔබතුමාට විනාඩි 09 ක් තිබෙනවා.

[අ.භා. 02.43]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන්නේ මේක දෛවෝපගත අවස්ථාවක්. මේ පළාත් සභාවේ හිටපු කෘෂිකර්ම ඇමතිවරයෙක් මූලාසනාරූඪ වෙලා ඉන්න වෙලාවේ ගාමිණී තිලකසිරි කෘෂිකර්ම අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව සන්තෝෂ වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාත්, කෘෂිකර්ම ඇමතිතුමාත්, මමත් අපි තුන් දෙනාම 1991 දී ප්‍රාදේශීය සභා සභාපතිවරු හැටියට බොහොම සමීපව, කිට්ටුවෙන්ම, කල්‍යාණ මිත්‍රයෝ හැටියට ආශ්‍රය කරපු තුන් දෙනෙක්. අදත් එහෙමයි. ඒ නිසා මෙය හොඳ අවස්ථාවක්. මම විශේෂයෙන්ම ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමාට සුබ පතනවා. පාර්ලිමේන්තුවේත් හිටපු මන්ත්‍රීවරයෙක් හැටියට, බොහොම අත්දැකීම් බහුල ඇමතිවරයෙක් හැටියට මේ අමාත්‍යාංශය ඉතාමත් සාර්ථකව එතුමාට කර ගන්න ලැබිලා තිබෙනවා. ඒ සඳහා ඉතාමත්ම හොඳ ලේකම්වරයෙක් සහ හොඳ කාර්ය මණ්ඩලයක් එතුමාට ලැබී තිබෙනවා. මම එහෙම කියන්නේ, එතුමාගේ අමාත්‍යාංශයට ගිහිල්ලා, මොනවා හරි කාරණයක් පිළිබඳව කටයුතු කරන්න ගියාම, ඒ අවස්ථාවේ ඒ නිලධාරීන් නොසිටියත් දුරකථනයෙන් හරි කථා කරලා ඒ අවශ්‍යතාවය අපට සම්පූර්ණ කරලා දෙනවා. එහෙම අවස්ථා බොහොම විරල වී තිබෙන්නේ, අනික් ඒවාත් එක්ක සංසන්දනය කරන කොටයි. ඒ නිසා එතුමා ඒ අතින් බොහොම වාසනාවන්තයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා තමන්ට ලැබෙන ඒ සීමිත මුදල ඉතාමත්ම පරිස්සමෙන් එතුමා පරිහරණය කරලා, මේ පළාත් සභාවට අසීමිත දායාදයන් කරනවා. ඒ නිසා මම එතුමාට යෝජනාවක් කරන්න කැමැතියි. මේ පළාත් සභාවට මේ අමාත්‍යාංශය බොහොම වටිනා අමාත්‍යාංශයක්. මේ අමාත්‍යාංශයෙන් ඉතාමත්ම වැදගත් කාර්යයක්, මේ රටට, මේ පළාත් සභාවට කරන්න පුළුවන්. ඒ නිසා රේඛීය අමාත්‍යාංශය හරහා, මධ්‍යම රජයේ රේඛීය අමාත්‍යාංශයත් එක්ක බද්ධ වෙලා යම් කිසි කාර්යයක නිරත වෙනවා නම්, මීට වඩා විපුල ප්‍රයෝජන ගන්න පුළුවන්. එහෙම ගන්න අවස්ථාවක් තිබෙනවා. අද එතුමා නියෝජනය කරන දේශපාලන පක්ෂය දිහා බැලුවාම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්වරයා තමයි දුමින්ද දිසානායක ගරු ඇමතිතුමා. එතුමා නියෝජනය කරන්නේත්, කෘෂිකර්ම අමාත්‍යාංශය. ඒ වාගේම තමයි ගාමිණී තිලකසිරි අමාත්‍යතුමාට තිබෙන තවත් කොටසක් තමයි ධීවර අමාත්‍යාංශය. පොදු ජන එක්සත් පෙරමුණේ මහ ලේකම් මහින්ද අමරවීර මහත්තයා තමයි ධීවර ඇමතිතුමා. එතකොට මේ තිබෙන සහ සම්බන්ධතාවය මම

හිතන්නේ, වැඩිපුර ප්‍රයෝජන ගන්න පුළුවන්. සම්බන්ධ වෙලා වැඩ කරනවා නම්. රේඛීය අමාත්‍යාංශයෙන් මේ පළාත් සභාවට ලබා ගන්න පුළුවන් විශාල ආධාර ප්‍රමාණයක් අරගෙන, මේ පළාත් සභාවට ඒක සම්බන්ධ කර ගන්න, මේ පළාත් සභාවේ මුදල්වල යම්කිසි අඩුපාඩුවක් තිබෙනවා නම්,මේ පළාත් සභාවේ තිබෙන කටයුතුවලට මධ්‍යම රජයෙන් ගන්න පුළුවන් උපකාර අරගෙන මේකට සම්බන්ධ කර ගෙන එහෙම උදව්වක් ගන්න පුළුවන් නම් මම හිතනවා, මීට වඩා විපුල ප්‍රයෝජන ගන්න පුළුවන් කියලා.

ඒ සමගම ඉඩම් අමාත්‍යාංශයත් ඔබතුමාට තිබෙනවා. ඉඩම් අමාත්‍යාංශයේ ඒ තරම් ලොකු කාර්යභාරයක් කරන්න නැහැ. නමුත් ඉඩම් බෙදා දීමේදී සහ ඔප්පු ලබා දීමේදීත් මම නියෝජනය කරන එක්සත් ජාතික පක්ෂයේ ජෝන් අමරතුංග මැතිතුමා තමයි ඉඩම් අමාත්‍යවරයා. බොහෝසෙයින් සම්බන්ධව කටයුතු කරනවා. ඔබතුමාත් එක්කත් බොහොම සම්බන්ධයි. ඒ නිසා ඔබතුමා ඒ අතින් බොහොම වාසනාවන්තයි. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ පළාත් සභාවේ යම්කිසි මුදල් අඩුපාඩුවක් තිබෙනවා නම් - දැන් බලන්න අධ්‍යාපන අමාත්‍යාංශයේ මුදල් කැපුවා කියලා ප්‍රශ්නයක් තිබෙනවා. රේඛීය අමාත්‍යාංශයේ ඉන්න අධ්‍යාපන ඇමතිතුමා මේ පළාත් සභාවට මොන තරම් මුදල් සම්භාරයක් දීලා තිබෙනවාද? ඒ නිසා ඒ ගැන කවුරුත් කථා කරන්නේ නැහැනේ? ඒ නිසා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් මේ පළාත් සභාවට මුදල් දෙනවා වාගේම මේ පළාත් සභාවටත් කෘෂිකර්ම අමාත්‍යාංශයෙන්, ධීවර අමාත්‍යාංශයෙන් මේ පළාත් සභාවට ගන්න පුළුවන් මුදල් ප්‍රමාණයක් අරගන්න. ඒවා අරගෙන, මේ පළාත් සභාවේ මේ තිබෙන යෝජනා - මම දැක්කා ඔබතුමා යෝජනා ගොඩක් දාලා තිබෙනවා. කරන්න තිබෙන දේවල් පිළිබඳව. මේකේ තිබෙනවා, විසිතුරු මත්ස්‍ය ගොවිපලවල් සංවර්ධනය කිරීම. මිරිදිය කිවුල් දිය මත්ස්‍ය ගොවිපල ඇති කිරීම හා සංවර්ධනය කිරීම. හැබැයි, මේවාට කොපමණ මුදල් ප්‍රමාණයක් වියදම් වෙනවාද? කොහේද මේවා කරන්නේ? කොහොමද සැලසුම් කරන්නේ? කියන එක පිළිබඳව විස්තරයක් නැහැ.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

උපදේශක කාරක සභාවේදී කිව්වා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

උපදේශක කාරක සභාවේදී කිව්වාට මේ පොතේ නැහැ. ඒ නිසා ඒවා මේ පොතට සීමා වෙයිද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. ඒ නිසා ඒ පිළිබඳව සැලසුමක් හදන්න. ඒකට කොපමණ මුදලක් යනවාද? කොහේද මේවා කරන්නේ? විශේෂයෙන්ම අපි පසුගිය කාලවලදැක්කා අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමන්ලා ඇවිල්ලා අපේ පැත්තේ තිබෙන විශාල වැව්වල එහෙම මිරිදිය මත්ස්‍යයින් බෝ කළා. ඒක හොඳ ව්‍යාපාරයක්. හැබැයි, ඒවා එක පාරටම නතර වුණා. දැන් කරන්නේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

යහපාලනය ආවා. ඒකයි.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

යහපාලනය ආවා නොවෙයි. ඒවා කරපු කාලයක් තිබුණා. ඒවා හොඳ ව්‍යාපෘති. ඒවා ඒ එක්කම නතර වුණා. ඉතින් ඒ නිසා ඒවා කරන්න ඕනෑ. ඒවා කළ යුතු දේවල්. අද උදේ මම කථාවක් අහගෙන හිටියා. ජානක සූරියබණ්ඩාර ගරු මන්ත්‍රීතුමා කථා කරන කොට එතුමා කිව්වා, අර වටු කුරුල්ලන් ඇති කිරීම පිළිබඳව. ඉතා හොඳ ව්‍යාපෘතියක්. අඩු ඉඩ ප්‍රමාණයකින් වැඩි ලාභයක් ගන්න පුළුවන් ව්‍යාපෘතියක්. කවුරුවත් ඒ ගැන කථා කළේ නැහැ. ඒවා කරන්න ඕනෑ. හැමෝම කථා කරන්නේ කුකුල් පැටව් ටික ගන්නේ කොහොමද? කිරි හරකා ගන්නේ කොහොමද? තාරාවෝ ටිකක් ඇති කර ගන්නේ කොහොමද? කියලා. ගන්නවා. එතැනින් ඉවරයි. හැබැයි, මේවා ගම්වල ක්‍රියාත්මක කරන කොට මේ ගෙවිලියොත් එකතු කර ගෙන සමාජ හදන්න ඕනෑ. සමිති හදන්න ඕනෑ. වැඩිදියුණු කරන්න ඕනෑ. අපේ පළාත් ඇත්තටම වේගයෙන් නාගරිකකරණය ඇති වන පළාත්. අපේ පළාත්වල මම හිතන්නේ වත්තල, ජා-ඇළ වාගේ ප්‍රදේශවල, මීගමුව වාගේ ප්‍රදේශවල කවුරුත් වී වගාවට යොමු වෙන්නේ නැහැ. දැන් ගිහිල්ලා බලන්න අවසරයෙන් හෝ අනවසරයෙන් කොපමණ ඉඩම් ගොඩ කරලා තිබෙනවාද කියලා. අවසරයෙන් හෝ අනවසරයෙන්. වී වගා කරන්න ඉඩම් නැහැ. වී වගා කරන්න තරුණයෝ කුඹුරට බහින්නේ නැත්නම්, ඒවායේ වෙනත් බෝග වගා කරන්න කටයුතු

[ ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා ]

සලසන්න ඕනෑ. එළවළු වගා කරන්න පුළුවන්. දැන් අපේ පළාත්වල බෝපිටිය, පමුණුව වාගේ පැතිවල තිබෙනවා, කුරුකුලාව. ජානක මන්ත්‍රීතුමන්ලාගේ ගෙවල් පැත්තේ එහෙම ඇන්තූරියම් වගාව බොහොම සරුවට තිබෙනවා. මෙන්න මේවා දියුණු කරන්න ඕනෑ. ඒ සඳහා ඒ පළාත් හරියට නිශ්චිත වශයෙන් හඳුනාගෙන, විශේෂයෙන් කාන්තාවන් ඒකරාශී කර ගෙන අපට කරන්න පුළුවන්. ග්‍රාම සේවක කොට්ඨාශ මට්ටමින් ඒ සමාජ ඇති කරන්න. ඒ සඳහා ප්‍රතිපාදන ලබා දෙනවා නම්, උපදෙස් දෙනවා නම්, නියාමනය කරනවා නම් අපට පුළුවන් ග්‍රාම සේවා වසම් මට්ටමෙන් ඒ සඳහා උවමනාකරන සමිති සමාගම් පිහිටුවලා, මේ එළඹෙන 2017 වර්ෂයේදී ඔබතුමාට නියාමක ව්‍යාපෘතියක් විධියට මම ඒ සටහන කරන්නම්. ඔබතුමාට මම ස්තුතිවන්ත වෙනවා. මේ කොස්පැළ ව්‍යාපෘතියක් ගැන කිව්වා. කොස්පැළකොපමණක්ද හිටවනවා කියලා. මම හිතන්නේ, මේ පළාත් සභාවේ ඉන්න මන්ත්‍රීවරු 104 දෙනාගෙන් මම වෙන්න ඇති ඉස්සෙල්ලාම ඔබතුමාගෙන් ඒ උපකාරය ගත්තේ. ඔබතුමාගෙන් මම ඉල්ලීමක් කළා. වත්තල අධ්‍යාපන කොට්ඨාශයේ තිබෙනවා විද්‍යාල 23 ක්. ඒ විද්‍යාල 23 න් එකම පැළයක්වත් හිටුවන්න බැරි ඉස්කෝල හයක් තිබෙනවා. එකම පැළයක්වත් හිටවන්න බැහැ. නමුත් ඔබතුමා මට කොස්පැළ 250 ක් දුන්නා. ඔබතුමා ඇවිල්ලා, ඇලපිටිවල චන්ද්‍රවංශ විද්‍යාලයේ අපි ඒ කොස් පැළ ව්‍යාපෘතිය ආරම්භ කළා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අපට හම්බ වුණේ නැහැ නේ?

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඉල්ලන්න ඕනෑ දෙන්න. එතුමා බොහොම කාරුණිකව එතැනට ඇවිල්ලා, උත්සවයක් තියලා, අපි ඒ කොස්පැළ ව්‍යාපෘතිය ආරම්භ කළා. ඒක කළේ පාසලත් එක්ක සම්බන්ධ වෙලා. පාසලත් එක්ක සම්බන්ධ වෙන්නේ දරුවන්ට -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

යහපාලනය.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

යහපාලනය තමයි. අධ්‍යාපනය දෙන ගමන්ම දරුවන්ටත් උගන්වන්න ඕනෑ කොහොමද මේ කොස් පැළයක තිබෙන වටිනාකම. වගාවේ තිබෙන වටිනාකම. ඒ නිසා මේවා තනිවම කරන්න බැහැ. අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ක බද්ධ වෙන්න ඕනෑ. ඒකයි මම කිව්වේ. මේ පළාත් සභාවේ තිබෙන අමාත්‍යාංශ පහත් එක්කම සහ සම්බන්ධතාවය ඇති කරන්න ඕනෑ. මේවා හුදෙකලාව කරන්න හොඳ නැහැ. කෘෂිකර්ම අමාත්‍යාංශය වෙනම යන්න හොඳ නැහැ. ධීවර අමාත්‍යාංශය වෙනම යන්න හොඳ නැහැ. අධ්‍යාපන අමාත්‍යාංශය වෙනම යන්න හොඳ නැහැ. මේවාත් එක්ක සම්බන්ධ වෙලා ගියාම තමයි මේ පළාත් සභාවක තිබෙන වටිනාකම හරියට තේරුම් අරන් යන්න පුළුවන්. මම අපේ ගෙදරට ආවොත් පෙන්වන්නම්, එදා හෙක්ටර් බෙත්මගේ මැතිතුමා කෘෂිකර්ම ඇමතිවරයා වශයෙන් ඉන්න කොට ගෙදරට ගිහිල්ලා මේ හැම පළාත් සභා මන්ත්‍රීවරයෙකුටම රඹුටන් පැළයක් බෙදුවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

නෝනාට දුන්නේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

නෝනාට තමයි දුන්නේ. ඒ නෝනා අද ජීවතුන් අතර නැති වුණත්, ඒ නෝනා ඒක හරි තැන හිටෙව්වා. බොහොම හොඳට සත්කාර කළා. හැමදාම එතැනට ගියාම මට තමුන්නාන්සේව මතක් වෙනවා. ඒවා කළා. ඇත්තටම ඒවා අපි ආදරයෙන් සිහිපත් කරන දේවල්. අඩු ගණනේ අපි මේ සභාවේ නොසිට කවදාහරි ගෙදර නිකම් ඉන්න කොට වුණත් කියන්න පුළුවන්. මේක අපට හෙක්ටර් බෙත්මගේ මැතිතුමා කෘෂිකර්ම ඇමතිවරයා හැටියට ඉන්න කාලයේ අපේ ගෙදර ගෙනැල්ලා හිටවපු පැළයක් කියලා. මම මේ කියන්නේ හිනාවට භාජනය කරන්න ඕනෑ කාරණා නොවෙයි.

අපේ කාෂිකර්ම ඇමතිතුමාට මම නැවත වතාවක් කියනවා. දැන් පසුගිය දවස්වල මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමන්ලා ඉතාමත්ම හොඳට ඒ ව්‍යාපෘතිය කර ගෙන කියා. අපේ පළාත්වල තමයි මේ මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ඉතාම හොඳට කරන්න පුළුවන්. ඒ සඳහා

ඒ තිබෙන ස්ථාන හොඳට හඳුනාගන්න ඕනෑ. විශේෂයෙන්ම උස්වැටකෙයියාව වෙරළ තීරයේ ඒ ධීවරයෝ දැල් ගොඩට ඇදපුවාම නිකම් ගස් යට ඉඳගෙන තමයි ඒ දැල් බේරන්නේ. ඒ නිසා ඒගොල්ලන්ට නිදහසේ ඒක කරන්න හොඳ ස්ථානයක් හදලා දෙන්නය කියලා තමුන්නාන්සේගේ මාර්ගයෙන් ඉල්ලා සිටිනවා. අපේ ප්‍රදේශයේ තිබෙන කුඩා ඇළ වේලි ටිකට උවමනා කරන ඇළ වේලි ටික සකස් කරලා දෙන්නය කියලා ඉල්ලීමක් කරනවා. ගරු ඇමතිතුමාට අපේ සහයෝගය ලබා දෙනවාය කියන එක ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඒ කාලේ මන්ත්‍රීතුමන්ලාගේ නෝනලා ටික මට ස්තුති කළා. කිසිම මන්ත්‍රීවරයෙක්මට ස්තුති කළේ නැහැ. මීළඟට ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[අ.භා. 02.52]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය පිළිබඳව කථා කරන්න මට අවස්ථාව ලබා දීම පිළිබඳව සතුටු වෙනවා. පැහැදිලිවම අපි මතක් කරන්න ඕනෑ. වෙලාව අඩු නිසා මම මේකේ සංඛ්‍යා ලේඛන ගැන කියන්න යන්නේ නැහැ. අපට දීලා තිබෙන පොත්පත්වල මේ මුදල් වෙන් වුණු ආකාරයසඳහන් වෙලා තිබෙනවා. අපි ඇත්තටම කනගාටු වෙනවා. කෘෂිකාර්මික රටක් හැටියට, කෘෂිකාර්මික පළාතක් හැටියට මේ මුදල් ප්‍රමාණය මේ අමාත්‍යාංශයට මේ විධියට අඩු වීම පිළිබඳව අපේ කනගාටුව පළ කරනවා. ඒ කෙසේ වෙතත් අපි දන්නවා, අපේ කෘෂිකර්ම අමාත්‍යතුමා තිබෙන මුදලින් උපරිම වැඩ ගන්න කෙනෙක්. ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ. මේ මුදල් නැති වුණත්, මේ මුදල් නැතිව කරන්න පුළුවන් වැඩ ගොඩක් මේ කාෂිකර්ම අමාත්‍යාංශය තුළ තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පශු සම්පත් අමාත්‍යාංශයගත්තාම ගොඩක් වෙලාවට අපේ ප්‍රදේශවල තමන්ගේ ගවයාට ලෙඩක් දුකක් හැදුනාම, පණිවුඩය දුන්නාට ගවයා මැරෙනකල් ඒ වෛද්‍යවරයාට එන්න විධියක් නැහැ. වෛද්‍යවරයා එන්නේ නැහැ. මොකක්ද මේකට හේතුව කියලාමේ ගැන අපි විමසුවා. විමසුවාම,මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගොඩක් වෙලාවට එන්න පහසුකම් මදී. අපේ ආසන ගත්තාම පශු වෛද්‍ය කාර්යාලයයි ඒ ප්‍රදේශයි අතර දුර ප්‍රමාණය හැතැප්ම ගණනක දුර ප්‍රමාණයක් තිබෙනවා. ඒ නිසා මේ ගවයන් ටික ආරක්ෂා කර ගැනීමට ඒ පශු වෛද්‍යවරුන්ට පහසුවෙන් ඒ ගවයන් අයිතිකරුවන් කථා කරන ඒ ස්ථානවලට, ඒ නිවෙස්වලට යන්න පහසුකම් සලසා දෙන්නය කියලා මම ඉල්ලා සිටිනවා. මම මීට පෙර අවස්ථා කිහිපයකදීම අයවැය විවාදයේදී කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ කථා කරන කොට මේ පිළිබඳව මතක් කළා. මම ඉල්ලා සිටින්නේ, අඩුම ගණනේ මේ අයට මේ පශු වෛද්‍ය කාර්යාලයකට ත්‍රීරෝද රථයක් හා ඒ ත්‍රීරෝද රථයට රියදුරෙක් ලබා දෙන්න. ලබා දුන්නොත් මම හිතනවා, ගොඩක් වෙලාවට අපේ ගවයන් ලොකු ප්‍රමාණයක් අපට බේරා ගන්න පුළුවන්කම තිබෙනවා. පුංචි ලෙඩවලින් ගවයෝ මැරිලා යනවා.

එහෙම මතක් කරන ගමන්ම මම කියන්න කැමැතියි. අපි මේ මන්ත්‍රීවරුන් කථා කරන කොට අහගෙන හිටියාම, හැම ගොවි ජන සේවා මධ්‍යස්ථානයකම කෘෂිකර්ම උපදේශකවරු එක්කෙනෙකුට, දෙන්නෙකුට වැඩි ප්‍රමාණයක් ඉන්නවා. අඩුම ගණනේ දෙදෙනෙකුවත් ඉන්නවා. හුඟාක් වෙලාවට අපි දකිනවා. ගමේ ගොවියා කෘෂිකර්ම උපදේශකවරයා කොයි වෙලාවේද ඉන්නේ කියලා ගොඩක්වෙලාවට දන්නේ නැහැ. සමහර විට හොඳ අය ඉන්නවා. හොඳ අය බොහොම ස්වල්ප දෙනයි ඉන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අයට දුරකථන ඇමතුමක් දුන්නාම සමහර කෘෂිකර්ම උපදේශකවරු ඉන්නවා, ඒ මොහොතේම ගිහිල්ලා ඒක බලලා කටයුතු කරනවා. පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාත් මේක කිව්වා. එතුමා කිව්වා, මේ කෘෂිකර්ම උපදේශකවරුන්ට පැළයක ලෙඩක් තිබෙනවාය කියලා කිව්වොත්, පැළය ගලවාගෙන එන්න කියනවා කියලා. අන්න එහෙම කෘෂිකර්ම උපදේශකවරු මටත් හමු වෙලා තිබෙනවා. අපේ ප්‍රදේශයේත් එහෙම අය ඉන්නවා. මෙන්න මේවා නවතින්න ඕනෑ. මේ කෘෂිකර්ම උපදේශකවරුන්ට මේවාට වියදම් යන්නේ නැහැ. මේ ජනතාවගේ සල්ලිවලින් තමයි මේගොල්ලෝ නඩත්තු වෙන්නේ. ඒ නිසා ඒ අවබෝධය දෙන්න ඕනෑ. ඒ අවබෝධය තිබෙනවා නම්, කවදාවත් ගොවියෙකුට

ඒ කථාව කියන්නේ නැහැ. අනික් එක මම ඉල්ලන දේ තමයි. අපි සැරින් සැරේට ඉල්ලනවා, කෘෂිකර්ම උපදේශකවරයා ඉන්න තැන, ඉන්න වෙලාව මොකක්ද කියන එක සටහනක් කරලා තියන්නය කියලා. ඒක අමාත්‍යාංශයෙන් දැනුම් දුන්නාට පස්සේ පුංචි කොල කැබැල්ලක, කාටවත් පෙනෙන්නේ නැති තැනක සමහර තැන්වල ගහනවා. ඒ නිසා මම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මාර්ගයෙන් ඉල්ලා සිටිනවා, අමාත්‍යාංශය හරහා මේක දැනුවත් කරන්නය කියලා. අඩුම වශයෙන් අමාත්‍යාංශයෙන් හදලා යවන්න කෘෂිකර්ම උපදේශකවරු ඉන්න ඕනෑ වෙලාව දන්වලා. ඒක හොඳට පෙනෙන තැනක දාන්න කියන්න. ඒත් එක්කම මම කියන්නේ, ක්ෂණිකව අමතන්න පුළුවන් දුරකථන අංකයක් ඒකේ සටහන් කරන්න. එයා හිටියේ නැත්නම්, ඒ ගොවියාට දැනුම් දෙන්න. ගමේ ගොවියා කියන්නේ, එහෙම ලොකු දැනුම් තේරුම් තිබෙන කෙනෙක් නොවෙයි. අඩුම ගණනේ දුරකථන අංකය දාන්න ඒ වෙලාවේ හිටියේ නැත්නම්, අපව අමතන්න කියලා. ගොවියාගේ සහනය සඳහා අන්න එහෙම ක්‍රමවේදයක් හදන්න. ඒවාට වියදම් යන ඒවා නොවෙයි. ඒ නිසා ඒ වාගේ වැඩ පිළිවෙළකට ගියොත් එහෙම ඒවා ගොවියාට ලොකු සහනයක් වෙන දේවල්.

ඒත් එක්කම ගරු සභාපතිතුමනි, අපි මේ ලෙඩ රෝග ගැන කථා කරනවා. අපි සියලුම මන්ත්‍රීවරු මාසයකට මළ ගෙවල් තිහ හතළිහකට යනවා. ඕනෑම කෙනෙක් යනවා. හැබැයි, අපි මළ ගෙවල් තිහකට විතර ගියොත් විස්සක් විතර අපේ අය මැරෙන්නේ එක්කෝ පිළිකාවකින්. නැත්නම් හෘදයාබාධයකින්. නැත්නම් සීනි කියයි. මේ වාගේ දේවල්වලින් තමයි වැඩි ප්‍රමාණයක් මැරෙන්නේ. සාමාන්‍ය විධියට මැරෙන්නේ බොහොම අතලොස්සයි. මේකට ප්‍රධාන හේතුව අපි දකින විධියට මේ වස විස කෑම. ඒ නිසා මම ගරු සභාපතිතුමා මාර්ගයෙන් ඉල්ලා සිටින්නේ, එකම දෙයයි. බස්නාහිර පළාතේ අපි ආදර්ශයක් වෙන්න. මම ඊයේ පෙරෙයිදා අනුරාධපුරයේ මගේ හිතවතෙකුගේ ගෙදරකට ගියා. ගියාම, ඒ ගෙදර ගහේ තිබුණු අඹ ගැට ටික පවා කඩලා. මම ඇහුවා, කවුද මේ ගැටත් එකක් කඩා ගෙන ගියේ කියලා. එතකොට කිව්වා, ඕගොල්ලන්ගේ කොළඹ ප්‍රදේශයෙන්ම තමයි ඇවිල්ලා අරගෙන යන්නේ කියලා. එහේ ගිහිල්ලා ගහම ගන්නවා. ඊට පස්සේ ගැටත් එක්ක කඩා ගෙන ඇවිත් බෙහෙත් ගහලා ඉදවලා තමයි බස්නාහිර පළාතේ ජනතාවට කන්න දෙන්නේ. ඒ නිසා මේවාට වියදම් යන්නේ නැහැ. පුළුවන් නම් බස්නාහිර පළාතේ මේ ගේන පලතුරු වර්ගවලට බෙහෙත් ගහන එක නවත්වන්න වැඩ පිළිවෙළක් හදන්නය කියන ඉල්ලීම කරනවා. මේකට වැඩ පිළිවෙළක් හදන්න. ඒක ඉතාමත් හොඳ දෙයක්.

ඒ වාගේම මම අවසාන වශයෙන් ඉල්ලා සිටින්නේ, මම මේ දිනවල පෙර පාසල් ගුරුවරුන්ට පුහුණුවක් ලබා දෙනවා. පෙර පාසල් ගෙවත්ත සංවර්ධනය කරන්න. ඒ වෙලාවේදී අපි දැකපු දේවල් තිබුණා. අඹේපුස්ස වාගේ පුහුණු ආයතනවලට ගියාම ඒවායේ ලොකු අඩුපාඩු තිබෙනවා. ඒ ඉන්න සේවක ප්‍රමාණයට ඒවා කර ගෙන යන්න බැරි තත්ත්වයක් තිබෙනවා. ඒ ගෙවත්ත නඩත්තු කර ගෙන යන්න බැරි තත්ත්වයක් තිබෙනවා. ඒ නිසා ඒවා හරියට ආදායම් උත්පාදනය කර ගන්න නම් ඒ අවශ්‍ය කම්කරු ප්‍රමාණය, ඒ අවශ්‍ය පහසුකම් ටික ලබා දෙන්නය කියන ගෞරවනීය ඉල්ලීම කරනවා. ඒත් එක්කම මම ගරු ඇමතිතුමාට වාගේම අමාත්‍යාංශයේ ලේකම්තුමාටත්, ඒ නිලධාරී මණ්ඩලයටත් ස්තුතිවන්ත වෙනවා. මොකද, මම දැන් එන කොටත් හිතුනා, හැන්සාඩ් වාර්තා වුණාට පස්සේ කවුද මේවා කියවන්නේ කියලා. හැබැයි, අපේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්තුමා මේ හැම කෙනෙක්ම කරන කථාවල ඒ අවශ්‍ය තොරතුරු එතුමා සටහනක් දා ගන්නවා. ඒ මම දැක්ක දෙයක්. ඒ නිසා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්තුමාටත්, ඒ නිලධාරී මණ්ඩලයටත් මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගිය අයවැයේ සම්පිණ්ඩනයකුත් මේ පොත් පිංචේ සඳහන් කරලා තිබෙනවා. ඒක වැදගත්.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඔව්. ඇත්තටම ඒක තමයි වෙන්න ඕනෑ. මම කියන්නේ, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්තුමා සියලුම අමාත්‍යාංශවලට ආදර්ශයක් කියන එක මතක් කරනවා. මේ ඇමතිතුමාට තව තවත් මේ මන්ත්‍රීවරුන්ගේ අදහස් ක්‍රියාත්මක කරන්න ශක්තිය, ධෛර්යය ලැබෙන්නය කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 03.00]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය ලබා දීම පිළිබඳව ස්තූතිවන්ත වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඊයේ රාත්‍රියේ පසුගිය වසරේ අපේ අයවැය විවාදයේ කෘෂිකර්ම අමාත්‍යාංශය හා සම්බන්ධයෙන් වන හැන්සාඩ් වාර්තා සියල්ල කියෙව්වා. ඒ කියවලා ඉවර වෙලා අපේ ගරු ඇමතිතුමා අපට ලබා දී තිබෙන වාර්ෂික වාර්තාව පරිශීලනය කළා. ඊයේ රාත්‍රියේම මම ඇමතිතුමාට ඒ ගැන කථා කළා. ඇත්තටම සතුටු වෙන්න ඕනෑ. පසුගිය වසරේදී කථා කළ කාරණා බොහොමයක් එතුමා සැලකිල්ලට අරගෙන තිබෙනවා කියලා මට පෙනී ගියා. මුලින්ම මේ සභාව නියෝජනය කරන ජනතා හඬ ගැන සැලකිල්ල දක්වලා, ඒ යෝජනා බහුතරයක් තමන්ගේ කර ගෙන, ඒවා ක්‍රියාත්මක කරන්න අපේ ගරු ඇමතිතුමා ගනු ලැබූ පියවර මා අගය කරනවා. ඇත්ත වශයෙන්ම අපි ඇමතිවරයෙකුගෙන් බලාපොරොත්තු විය යුත්තේත් ඒකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රතුමනි, අපි ඉතිහාසය දිහා හැරිලා බැලුවොත්, මේ ශ්‍රී ලංකා භූමියේ මානව ශේෂ මුලින්ම හමු වුණේ, බස්නාහිර පළාතෙන්. ඒ කියන්නේ ආදීතම මානවයාගේ ශේෂ හමු වුණේ, බස්නාහිර පළාතෙන් බව. අපි කවුරුත් දන්නවා. ඒකෙන් තේරෙන්නේ මොකක්ද? මේ පොළොවේ ජනාවාස බිහි වුණේ, ඉස්සෙල්ලාම බස්නාහිර පළාතෙන් බවයි. හැබැයි, අපේ රට දිහා හැරිලා බැලුවොත්, ජාතික ආර්ථිකයෙන් කෘෂිකර්මයේ කොටස වෙලාතිබෙන්නේ, 14% යි. ඒකෙනුත් අපි බස්නාහිර පළාත දිහා බැලුවාම කවර හෝ හේතුවක් නිසා අපේ දායකත්වය, කෘෂිකර්මයට දක්වන අපේ දායකත්වය එන්න එන්න අඩු වෙලා තිබෙනවා. ඒකේ තවත් අවාසනාවන්ත පැත්ත තමයි, අපේ අමැතිතුමාගේ මේ වාර්ෂික වාර්තාව බැලුවාම පේනවා. පසුගිය අවුරුදු හය දිහා හැරිලා බැලුවාම විශාල වශයෙන් කෘෂිකර්මය හා සම්බන්ධ එතුමාගේ අමාත්‍යාංශයට ලැබිලා තිබෙන මුදල් ප්‍රතිපාදන අඩු වෙලා තිබෙනවා. ගොඩක් දුර යන්න ඕනෑ නැහැ. පසුගිය වසර හා සන්සන්දනය කරන කොට 50% කටත් වඩා අඩු වෙලා. ඊට පස්සේ මම බැලුවා මෙතුමාගේ ආදායම්. කොහොමද?මේ අමාත්‍යාංශයෙන් ආදායම් උපයන්න බලාපොරොත්තු වෙන්නේ කියලා. මේ ආදායම් ඉපයීම දිහා බැලුවාම, ආදායම් විස්තරය කියවලා බැලුවාම අපට පේනවා, සංකේත යටතේ කෘෂිකර්ම කටයුතු, සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය කටයුතු සඳහා අපි බලාපොරොත්තු වෙනවා, මිලියන 8.5 ක සහ මිලියන 9.5 ක ආදායමක්. ඒ ආදායම ප්‍රමාණවත් නැහැ අපට. එහෙම නම් අපට කෘෂිකර්ම කටයුතු සඳහා විශාල වැයක් දරන්න වෙනවා. මොකද, මෙතුමාගේ වැඩ පිළිවෙළ දිහා බැලුවාම ඇත්තටම ඉතාම වටිනා සහ බස්නාහිර පළාතට ගැලපෙන, ඒ පළාතේ තිබෙන වෙනස්කම් සියල්ල තේරුම් අරගෙන, කළුතර දිස්ත්‍රික්කයේත්, කොළඹ දිස්ත්‍රික්යේත්, ගම්පහ දිස්ත්‍රික්කයේත් ඒ වෙනස්කම් තේරුම් අරගෙන ඒ සියල්ලට ගැලපෙන ලෙස ඉදිරි වැඩ පිළිවෙළ සකස් කරලා තිබෙනවා. මේ ආදායම් පිළිබඳව වාර්තා කියවලා බලන කොටකෘෂිකර්ම කටයුතු සඳහා ප්‍රමාණවත් ප්‍රඥප්ති සහායක් තිබෙනවාද කියලා දැන් මේකේදී අපට සලකා බලන්නට වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කෘෂිකර්මාන්තය දිහා හැරිලා බලන කොට අපට විශාල විදේශ හා දේශීය වෙළඳපළක්තිබෙන බව දැනෙනවා. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ, අපට ප්‍රමාණවත් ප්‍රඥප්ති මේ සම්බන්ධයෙන් නිර්මාණය කර ගන්න පුළුවන් වෙලාද තිබෙන්නේ කියන කාරණයයි. 1988 පළාත් සභා ක්‍රමය ස්ථාපිත කරන කොට අපට ප්‍රඥප්ති එකක්වත් තිබුණේ නැහැ. මුල්ම ප්‍රඥප්තිය එන්නේ 1989 දී. 1990 තමයි ප්‍රඥප්ති සකස් කිරීමේදී ඉහළම අගයක් පෙන්වන්නේ. මම හිතන්නේ, අපේ ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරු දන්නවා. ඒක ආයිත් 1993 සිට පල්ලෙහාට වැටෙනවා. අපි කරලා තිබෙන්නේ, එදා වේල පිරිමහගන්න ප්‍රඥප්ති සකස් කරපු එක විතරයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම නැතිව අපේ මේ පළාත් සභාව හරහා මේ පළාත් සභාවට ආදායම් ලැබෙන ප්‍රඥප්ති සකස් කිරීම කෙරෙහි අපි පසුකාලීනව අවධානය යොමු කරලා නැහැ. හැබැයි, අපි දන්නවා. පළාත් සභාවල සමගාමී ලැයිස්තුව කල්පනා කරලා බැලුවොත් මේ ලැයිස්තුව ඇතුළේ සමහර විෂයයන් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව හා සාකච්ඡා කරලා, පාර්ලිමේන්තුවෙන් විමසලා ප්‍රඥප්ති විශාල ප්‍රමාණයක් සකස් කිරීමේ ඉඩ ප්‍රස්තාව තිබෙනවා. ඒ නිසා මම අපේ ගාමිණී තිලකසිරි කෘෂිකර්ම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්න කැමැතියි. ඔබතුමාට තවත් ආදායම් ඉපයීම සඳහා ගොඩක් ප්‍රඥප්ති සකස් කර ගැනීමට ඉඩ ප්‍රස්ථා තිබෙන බව පෙනී යනවා. ඒ නිසා ඒ කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන්නය කියලා ඔබතුමාගෙන් මේ වෙලාවේ ඉල්ලා සිටින්න කැමැතියි.

[ ගරු සුසිල් කිඳෙල්පිටිය]

ඒ වාගේම එතුමාගේ මේ වැඩ සටහන ඇතුළේ මේ අවුරුද්දේ කෘෂිකාර්මික කටයුතු සඳහා රුපියල් මිලියන 70 ක්, ඒ වාගේම වාරිමාර්ග කටයුතු සඳහා රුපියල් මිලියන 60 ක්, ඒ වාගේම සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සඳහා රුපියල් මිලියන 52 ක්. මේ විෂයයන් අතර අන්‍යෝන්‍ය සම්බන්ධයක් තිබෙනවා. දැන් මෙතුමාගේ මේ ප්‍රධාන කාර්යයන් දිහා හැරිලා බැලුවාම එකක්, එතුමා මේ කාෂිකර්මයට, ඒ වාගේම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කටයුතුවලට, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට, වාරිමාර්ග දෙපාර්තමේන්තුවට හා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව කියලා. මේ විෂයන් වෙන වෙනම බැලුවාම, එතුමාගේ මේ වැඩ සටහන ඇතුළේ තිබෙනවා, විෂයයන් අතරේ එකිනෙක සම්බන්ධයක්. ගැලපීමක් තිබෙනවා. එතුමාගේ මේ වැඩ සටහන් විශ්ලේෂණය කරලා බැලුවාම,මේක එකිනෙක හා සම්බන්ධයි. ඒ නිසා එතුමා බලාපොරොත්තු වෙනවා, විශේෂයෙන්ම කෘෂිකර්මය හා සම්බන්ධයෙන් තිබෙන අධ්‍යාපනය දියුණු කරන්න. පසුගිය කාලයේ එතුමා ගත් පියවර ගැන අපට පැහැදීමක් තිබෙනවා. ඒ නිසා ඒ කටයුතු අඩාල නොකර කෘෂිකර්මය පිළිබඳව අධ්‍යාපනය වැඩි කරන්න ඕනෑ. මේක ගැන තිබෙන වැරදි මත ඉවත් කරන්න ඕනෑ. තරුණ කොටස් කෘෂිකර්මයට නැඹුරු කර ගැනීමේ වැඩ සටහන් ලේසියෙන් කරන්න පුළුවන්. ඒකට තාක්ෂණය විශාල වශයෙන් අද ලෝකය පුරා තිබෙනවා. ඒ නිසා නවීන තාක්ෂණය හඳුන්වා දෙමින් ගරු මන්ත්‍රීතුමනි, මේ කෘෂිකර්මය නගරයේ දියුණු කරන්න විශාල වැඩ කොටසක් කිරීමේ බලාපොරොත්තුවක් එතුමා තුළ තිබෙනවා කියලා මේ වැඩ සටහනෙන් පේනවා. ඒ නිසා එම වැඩ සටහන් කර ගෙන යන්න අපේ උපරිම සහාය දෙනවා. මම එතුමාගේ උපදේශක කාරක සභාවේ සාමාජිකයෙකු නොවුණත් එතුමාගේ මේ වැඩ සටහන ගැන අගය කරන්න ඕනෑය කියලා මම විශ්වාස කරනවා. ඒ වාගේම සුළු වාරිමාර්ග ක්‍රම. මම ගරු ඇමතිතුමාට කථා කළා. මටත් ඕනෑ, මම උපන් ප්‍රදේශයේ කොළොන්නාවේ කුඹුරක් වගා කරන්න කියලා. එතුමා කිව්වා, හොඳයි මල්ලියේ කුඹුරක් හොයා ගනින් කිව්වා. එහෙමයි කිව්වේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මල්ලියේ කියලා කියන්නේ නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔව්. එහෙම තමයි කියන්නේ. මගේ රත්තරන් මල්ලියේ. මම දන්නේ නැහැ බටර් ගාන්නද කියලා. මගේ රත්නරන් මල්ලියේ, සුදු මල්ලියේ, ඉඩමක් සොයා ගනින් කිව්වා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සුදු කොහේද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එහෙම කිව්වාම, සුද්දන්ට තද වෙනවා ඇති. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉඩමක් සොයන්න සැහෙන මහන්සි වුණා. ඉඩමක් සොයා ගත්තා. අපේ ඇමතිතුමාටත් මම කිව්වා. ඉඩමක් සොයා ගත්තා. නමුත් ප්‍රශ්නය මොකක්ද? මේ ඉඩමට වතුර එන්න ක්‍රමයක් නැහැ. කොළොන්නාවේ තිබුණු සියලුම ඇළ මාර්ග ටික - මේ කුඹුරු වගා කරන ඉඩම්. මම කැලණි නදිය ආශ්‍රිතව ජීවත් වන කෙනෙක්. ඒ ආශ්‍රිත ප්‍රදේශ ඉස්සර වෙනම භූමියක්. ඒක ඉතිහාසයේ වෙනම රාජධානියක් වාගේ තිබුණු ප්‍රදේශයක්. නමුත් ඒ භූමියේ තිබුණු සියලුම වාරිමාර්ග, ජලය ගලාගෙන යන මාර්ග සියල්ලම ගොඩ කරලා මේ ප්‍රාදේශීය දේශපාලඥයෝ විසින් විකුණලා දාලා හමාරයි. ඒ ඉඩම්වලට වතුර එන්න ක්‍රමයක් නැහැ. ඒ නිසා තමයි මේ කෘෂිකර්ම අමාත්‍යාංශයට යම් මුදලක් අවශ්‍යයි කියන එක. අපි වවන්න ඉඩම් තෝරා ගත්තාට මදී. ඊට වඩා අපට තිබෙනවා, සුළු වාරිමාර්ග ක්‍රම දියුණු කරන්න. ඒ නිසා ඒකට විශාල මුදල් ප්‍රමාණයක් අවශ්‍ය වෙනවා. මම එතුමාගෙන් ඉල්ලා සිටියා, මේකේ මෙහෙම ප්‍රශ්නයක් තිබෙනවා. අපි ඉඩම් තෝරා ගත්තාට වැඩක් නැහැ. ඒ නිසා ඒකට අවශ්‍ය ඉඩකඩ සපුරා ගන්න ඕනෑය කියලා.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමාට මේ ගැනත් මම යම් අදහසක් දෙන්න ඕනෑය කියලා හිතුවා. දැන් අපි කොම්පෝස්ට් හදනවා. අපේ කොම්පෝස්ට් හදන තැන් විශාල ප්‍රමාණයක් තිබෙනවා. නමුත් සමහර තැන්වල ඒ කොම්පෝස්ට් ටික විකුණා ගන්න විධියක් නැහැ. දැන් කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් යම් ප්‍රමාණයකට මේකට මැදිහත් වෙනවා නම් - අපි දැන් දිගටම විශාල වශයෙන් ගෙවතු වගා

කරනවා. ඒ පිළිබඳව පුහුණුව ලබා දෙනවා. මල් වගා කරනවා. පලතුරු වගා කරනවා. ඒ නිසා කෘෂිකර්ම අමාත්‍යාංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යම් ප්‍රමාණයකට මැදිහත් වෙනවා නම්, ගරු ඇමතිතුමනි, අපට විකුණා ගන්න බැරි කොම්පෝස්ට් පොහොර ටික විකුණ ගන්නා වැඩ පිළිවෙළක්, ඒ අපිත් එක්ක සම්බන්ධ වෙලා, අපේ ප්‍රාදේශීය සභා එක්ක සම්බන්ධ වෙලා වැඩ සටහනක් සකස් කරන්න පුළුවන් නම්, දෙපැත්තටම ආදායම් ලබන වැඩ පිළිවෙළක් ඇති කර ගන්න පුළුවන් කියලා මා දැඩි ලෙස විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් එක කාරණයක් මතක් කරන්න ඕනෑ. මේ ඉඩම් පිළිබඳ ප්‍රශ්නය. අපි දැන් දන්නවා. පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ සාමාජිකයෙකු විධියට අපි දකිනවා, සමහර ඉඩම්වල බරපතළ ප්‍රශ්න තිබෙනවා. සමහර ඉඩම් බදු දීලා තිබෙනවා. ඒ බදු එන්නේ නැහැ. සමහර ඉඩම් අතුරුදහන්. බදු ගන්නෙත් නැහැ. ඉඩම ගැන සොයන කොට එහෙම ඉඩමකුත් නැහැ. නිලධාරීන් ඇවිල්ලා අපට කියනවා, එහෙම ඉඩමක් සොයා ගන්න නැහැ නේ කියලා. ඉඩමත් අතුරුදහන්. ඒ නිසා මේවා නිරවුල් කරන්න ඕනෑ. පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ කටයුතු මීට වඩා කාර්යක්ෂම කිරීමේ අවශ්‍යතාවය පෙනී යනවා. ඒ නිසා එවැනි ඉඩම් තිබෙනවා නම් සොයලා - මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලන්නේ, එවැනි ඉඩම් අපේ ගරු මන්ත්‍රීවරු හරහා කෘෂිකාර්මික වශයෙන් සංවර්ධනය කිරීමේ යම් වැඩ සටහනක් පටන් ගත්තොත් මීට වඩා දෙයක් අපට කරන්න පුළුවන් කියලා බලාපොරොත්තු වෙනවා. බොහොම ස්තූතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මේ අවස්ථාවේදී ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [හෙක්ටර් බෙත්මගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Presiding Member [Mr. Hector Bethmage M.P.C] left the Chair and Hon. Lalith Ellawala M.P.C took the Chair*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට කෝකිලා හර්ෂනී ගරු මන්ත්‍රීතුමියට අවස්ථාව ලබා දෙනවා.

[අ.භා. 03.12]

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්ම, ඉඩම්, වාර්මාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය, ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන මෙම අමාත්‍යාංශය යටතේ අද මේ විවාදයට එක් වීමට ලැබීම මම ලද භාග්‍යයක් කියලා මම හිතනවා. බස්නාහිර පළාත් සභාවේ බොහෝ දෙනෙක් අධ්‍යාපනයට ආදරය කරන කොට, මන්ත්‍රීවරියක් හැටියට හැමදාම මම වැඩිපුර ආදරය කරන්නේ කෘෂිකර්ම විෂයයට. මොකද, මම විශ්වාස කරනවා මේක බත් කන මිනිස්සු ජීවත් වන රටක්. අධ්‍යාපනය අපට වැදගත් වාගේම අනික් පැත්තෙන් අපට ප්‍රධානම අවශ්‍යතාවය වන්නේ ආහාර. ඒ නිසා රටක ආහාර නිෂ්පාදනයේදී අපි කෘෂිකර්මාන්තයට ලබා දෙන දායකත්වය තුළ තමයි ඒ රට ස්වයංපෝෂිතභාවයට පත් වෙන්නේ. එහෙම පත් වෙන්නේ නැති ආර්ථිකයක් අපේ රටේ බිහි වුණොත් අපි විදේශයන්ට ගැති වන ආර්ථිකයක් බවට පත් වෙනවා. මෙයින් මිදෙන්න නම් අපි කෘෂිකර්මාන්තය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන්න ඕනෑය කියන එක තමයි මගේ පෞද්ගලික මතය හා විශ්වාසය.

විශේෂයෙන්ම ගරු කෘෂිකර්ම අමාත්‍යතුමා ඉතා දක්ෂ, ඒ වාගේම මන්ත්‍රීවරුන්ට ඇහුම්කන් දෙන, ඒ වාගේම මන්ත්‍රීවරුන් එක්ක සහයෝගයෙන් කටයුතු කරන අමාත්‍යවරයෙකු හැටියට බොහොම ආඩම්බරයකින් මේ වැය ශීර්ෂයට සම්බන්ධ වුණත්, එක පැත්තකින් අද රටේ කෘෂිකර්මාන්තයට සිදු වන ව්‍යසනය දිහා අරගෙන බලන කොට එක පැත්තකින් මන්ත්‍රීවරියක් හැටියට මට විශාල දුකක් දැනෙනවා. මොකද, මේ රටේ 29% ක් ජනගහනය ජීවත් වෙන්නේ 6% ක ඉඩම් ප්‍රමාණයකින් යුත් මේ බස්නාහිර පළාත් සභාවේ. මේ බස්නාහිර පළාතේ කෘෂිකර්මාන්තයට තිබෙන ඉඩකඩ ඒ භූමි ප්‍රමාණය ඉතාමත් සීමිතයි. හැබැයි, ගරු ඇමතිතුමාත්, ඒ වාගේම මන්ත්‍රී

[ ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන]

කණ්ඩායමත්, ලේකම්තුමා ඇතුළු නිලධාරීනුත් මේ සීමිත ඉඩකඩ තුළ අති විශාල ජනගහනයක් එක්ක මේ කෘෂිකර්මාන්තය නගා සිටුවන්න, විශාල වැඩ පිළිවෙළක් කරන්න උත්සාහ කරනවා. හැබැයි, අපට කෘෂිකර්මාන්තය නගා සිටුවන්න රජයෙන් සහයෝගය ලැබෙන්නේ මොන විධියටද කියන කාරණාව ගැන මතක් කරද්දී, මම විශ්වාස කරනවා, රජය මීට වඩා වැඩි අවධානයක් කාෂිකර්මාන්තය කෙරෙහි යොමු කරන්න ඕනෑය කියලා. අද මේ වන කොට මහ කන්නය පටන් අරන් තිබෙනවා. සාමාන්‍යයෙන් මහ කන්නය පටන් ගන්නේ සැප්තැම්බර්, ඔක්තෝබර් මාසවල. නොවැම්බර් මාසේ වෙන කොට වපුරලා ඉවරයි. සැප්තැම්බර් මාසේ වෙන කොට මිනිස්සු මඩ පොහොර ටික ගහන්න බලාගෙන ඉන්නේ. මෙවර වැස්සේ ප්‍රමාදය නිසා නොවැම්බර්වල පටන් ගත්තා. දැන් මඩ පෙහොර ගහන්න ඕනෑ කාලය පහු වෙලා ඉවරයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මිනිස්සු බලාපොරොත්තුවෙන් ඉන්නේ ඊළඟට පැළ වලට අවශ්‍ය පොහොර ටික ගහන්න. හැබැයි, අපට පැළවලට ගහන පොහොර ටිකත් රජයේ සහනාධාර ලැබෙන ක්‍රමවේදයත් අනුව අද වන කොටත් ගොවියා අතට ඒවා පත් වෙලා නැහැ. ඒ විතරක් නොවෙයි. මම විශ්වාස කරනවා, ජනවාරි මාසේ වෙන කොටබණ්ඩි පොහොර ගහන්න වෙනවා. බණ්ඩි ටික එනකොට බණ්ඩි ටික ගහන්නවත් - මේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ, මේ රජයේ වැඩ පිළිවෙළ තුළ අද ගොවියාට බණ්ඩි ටිකටවත් පොහොර ටික ගහ ගන්න මුදල් ප්‍රතිපාදන, එහෙමත් නැත්න්ම සහනාධාරය ලැබෙයිද කියන සැකය අප තුළ තිබෙනවා.

මම ගරු අමාත්‍යතුමාට ගියවර පළාත් සභාවේ අයවැය යෝජනාවලදීත් ඉදිරිපත් කිරීමක් කළා. මධ්‍යම රජයේ සහයෝගය අරගෙන මේ පොහොර සහනාධාරය තුළ අඩුම තරමින් බස්නාහිර පළාත් සභාවේ පොහොර ටිකවත් අවශ්‍ය වෙලාවට ගොවියන්ට යන ක්‍රමවේදයක් සකස් කරන්නය කියලා. ගරු අමාත්‍යතුමාගෙන් මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඔබතුමා මැදිහත් වෙලා අපේ පළාතේවත් ගොවියන්ට සිදු වන මේ අසාධාරණය නිවැරදි කරන්න කටයුතු කරන්න. මොකද, පොහොර සහනාධාරය ලැබෙන කොට ගොයම් කපලත් ඉවර වෙන මට්ටමක් තමයි දැනට තිබෙන්නේ. ඒ නිසා අවශ්‍යතාවය තිබෙන වෙලාවේදී ඒ අවශ්‍ය සහනාධාරය දෙන්න ඕනෑ. නැත්නම් මොන තරම් NVQ පාඨමාලා කළත්, මොන තරම් කෘෂිකර්මාන්තයට මිනිස්සු යොමු කර ගන්න හැදුවත් මේ අමාරුවෙන් කර ගෙන යන ගොවියාවත් අපි රැක ගත්තේ නැත්නම්, මේ ගොවියා විනාශ වෙලා ගියොත් අපට කන්න ටිකත් නැතිව මැරිලා යයි.

අපේ මේ රට සෝමාලියාවක්, ඉතියෝපියාවක් වෙන්න ඕනෑ නැහැ. ඉතාමත් සහලින් ස්වයංපෝෂිත කරන්න පුළුවන් ආර්ථිකයක් අපේ අතීතයේ තිබුණා. අපේ අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා කිව්වා, රජවරුන්ගේ කාලයේ සිට අපේ රට සහලින් ස්වයං පෝෂිත වෙලා කොතැනටද ආවේ කියලා. හැබැයි, සෝමාලියාවකට, ඉතියෝපියාවකට යන්න මේ රටේ ජනතාව ලැහැස්ති නැහැ. ඉතාමත් දක්ෂ අමාත්‍යවරයෙක් හැටියට මම ඔබතුමාගෙන් ඉල්ලනවා. ලබන අයවැය කථා කරද්දීවත් මේ සඳහා වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා. ඔබතුමාට ඒ සඳහා හැකියාව තිබෙනවා. මොකද, ඔබතුමාගේ සහ අපේ පක්ෂයේ ලේකම්තුමා තමයි රේඛීය කෘෂිකර්ම අමාත්‍යාංශයේ අමාත්‍යවරයා හැටියට ඉන්නේ. මේක මගේ පළමුවන සහ ප්‍රමුඛම කාරණාව වන කොට, අනික් පැත්තෙන් මම විශ්වාස කරනවා අමාත්‍යතුමාත්, ඒ වාගේම අමාත්‍යතුමාගේ කාර්ය මණ්ඩලයත් ඉතා දැවැන්ත මෙහෙයක් මේ කෘෂිකර්මාන්තය නගා සිටුවන්න කරනවා. බස්නාහිර පළාත් සභාව වාගේ පළාත් සභාවක කෘෂිකර්මාන්තයට මිනිස්සු යොමු කරවන එක ඒ තරම් ලෙහෙසි කටයුත්තක් නොවෙයි.

ගරු අමාත්‍යතුමනි, මන්ත්‍රීවරු හැටියට අපි අද මෙතැනට ගෙන යෝජනා පිළිබඳව - අනික් අමාත්‍යවරු ගැන මම දොස් කියනවා නොවෙයි. එතුමා අපේ යෝජනාවලට පයින් ගැසුවේ නැහැ. එතුමාගේ මේ වාර්ෂික අයවැය පොත අරගෙන බලන කොට අපි ගිය වසරේ අයවැය විවාදයේදී දුන් යෝජනා - මම බලාපොරොත්තු වුණේ නැහැ. එතුමා මගේ යෝජනාවලට ඇහුම්කන් දීලා, මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරයි කියලා. නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමියගේ යෝජනාව, අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව, මේ සියල්ල එතුමා එකට කැටි කර ගෙන අද වන කොට, ඒ ව්‍යාපෘති ගම්වල ක්‍රියාත්මක කරන්න පටන් අරන් තිබෙනවා.

ඒ වාගේම මම අද අයවැය විවාදයට සම්බන්ධ වන නිසා මම කෘෂි පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන්ට ඊයේ හවස

කථා කළා, මොනවාද? ඕගොල්ලන්ගේ තිබෙන අඩුපාඩු කියලා. ඒ අය කිව්වා, මේ පැළැටි ලැබෙන කොට නියමිත වැස්ස තිබෙන කාලයට ලැබුණා නම් මීට වඩා හොඳයි කියන එක පිළිබඳවඅපේ ඇමතිතුමාව දැනුවත් කරන්නය කියලා. ඔබතුමාගේ කොස් පැළ ලක්ෂයේ ව්‍යාපෘතිය හැම තැනම මේ වන කොට ක්‍රියාත්මක වෙනවා. මගේ ආසනයේත් ක්‍රියාත්මක වෙනවා. හැබැයි, ගරු ඇමතිතුමනි, මේ පිළිබඳව ගරු මන්ත්‍රීතුමන්ලා දැනුවත් වෙලා නැහැ. ඒ නිසා මේ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න. ඔබතුමාගෙන් කොස් පැළ විතරක් නොවෙයි. මේ වන කොට දෙහි පැළ යනවා. ඇට පැකට් ලබා දෙනවා. දැවැන්ත වැඩ පිළිවෙළක්. ඒ විතරක් නොවෙයි. ඔබතුමාගේ අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් හා මග පෙන්වීම යටතේ මේ වන කොට කාන්තාවන් 20 දෙනෙක් හදලා, ගම් මට්ටමේ කාන්තා සංවිධාන පිහිටුවමින් යනවා. හැබැයි, ගරු මන්ත්‍රීතුමන්ලා මේ පිළිබඳව දැනුවත් වෙලා නැහැ. ඒ නිසා මන්ත්‍රීවරුන් සහ කෘෂි පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන්ගේ තිබෙන සම්බන්ධතාවය මීට වඩා වැඩි කරන්න කටයුතු කරන්නය කියන ඉල්ලීම මම ඔබතුමාගෙන් කරනවා. ඔබතුමා දක්ෂ අමාත්‍යවරයෙක්. ඔබතුමාට ඒ දේ කරන්න පුළුවන්.

ඒ වාගේම ගරු ඇමතිතුමාට හොඳ ලේකම්වරයෙක් ඉන්නවා. මේ කථාව අහගෙන ඉන්න කොට මම හිතුවා, ගාමිණී තිලකසිරි අමාත්‍යතුමා තමයි වාසනාවන්තම අමාත්‍යවරයා කියලා. හැම මන්ත්‍රීවරයෙක්ම ගරු අමාත්‍යතුමාට අමතරව ලේකම්තුමා ගැන කථා කළා. කථා කළ යුතුයි. මොකද, ඇමතිතුමා ගෙනියන යෝජනා ටික එතැනින් ක්‍රියාත්මක වෙන්නේ. ලේකම්තුමා දක්ෂ නැත්නම් ඒ යෝජනා ටික කුණු කූඩයට යනවා. අද වන කොට කෘෂි සමාජ පිහිටුවනවා වාගේම කාන්තා ගෙවතු, ඒ වාගේම වස විෂ නැති ආහාර නිෂ්පාදනයට දැවැන්ත ප්‍රමුඛතාවයක් අද ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන්ම වස විධ නැති සහල් නිෂ්පාදනය. ඒ වාගේම ගෙවත්ත තුළ වගා කිරීම් ආදී සියල්ල. මේ සියල්ල සඳහා ඔබතුමාගේ අමාත්‍යාංශයේ නිලධාරීන් යොමු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම කාන්තාවක් හැටියට මේ වස විෂ නැති ආහාර ගැන කථා කරන කොට මම හිතනවා, අපි හැම කෙනෙක්ම අපේ දරු පැටවුන්ට ආදරෙයි. අපි හැම කෙනෙක්ම බලන්නේ, සෞඛ්‍ය සම්පන්න දරු පැටියෙක් බිහි කර ගන්න. අපි පුංචි කාලයේ අපේ ගෙවත්තට ගිහින් බැලුවත්, අර මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපට කොස් ගහක් තිබුණා. දෙල් ගහක් තිබුණා. අඹ ගහක් තිබුණා. අපට පේර ගහක් තිබුණා. ජම්බු ගහක්, නාරං ගහක් තිබුණා. අද අපට මේ සියලුම පලතුරු ගන්න සිද්ධ වෙලා තිබෙන්නේ, කඩෙන්. ඒ නිසා අපේ ගමේ ඉන්න ජනතාව වස විෂ නැති ආහාර පිළිබඳව දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් සැදිය යුතුයි කියලා මම විශ්වාස කරනවා. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. එක පැත්තකින් ඔබතුමා මේ සහනාධාර දෙන ගමන්ම ආදර්ශ ගෙවතු 500 ක් මේ බස්නාහිර පළාත තුළ හදන්න ඔබතුමා කටයුතු කරන්න. එක පැත්තකින් ඒක ඔබතුමාගේ අමාත්‍යාංශය විතරක් නොවෙයි. මේ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය එකතු කර ගන්න. ගමේ ඉන්න ජනතාවට ලෙඩ රෝගවලින් වැළකෙන්න පුළුවන් ක්‍රමවේදය කියලා දෙන කොට ඒ අය මීට වඩා කටයුතු කරන්න පෙළඹේවි.

ඒ එක්කම මගේ අවසාන ඉල්ලීම. මෙතැන ගරු ප්‍රධාන අමාත්‍යතුමා නැති වුණත්, ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමාව දැනුවත් කරන්න. කෘෂිකර්මාන්තයට ලබා දී තිබෙන මුදල ඉතාමත් සීමිතයි. කෘෂිකර්මාන්තයට වෙන් වන මුදලින් අද හරි අඩක් කපලා දාලා. ඇමතිතුමා දක්ෂයි. වැඩ කරන්න පුළුවන්. මන්ත්‍රී කණ්ඩායම කැමැත්තෙන් ඉන්නවා, කෘෂිකර්ම අමාත්‍යාංශයත් එක්ක එකතු වෙන්න. හැබැයි, එතුමාගේ තටු ටිකත් කපලා දාලා. තටු කපන්න එපා. කෘෂිකර්මාන්තය කියන්නේ, අපේ රටට අවශ්‍ය දෙයක්. කෘෂිකර්මාන්තය නැත්නම් අපි හැමෝගේම ජීවිත ඉවරයි. ඒ නිසා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් මම ඉල්ලා සිටිනවා, තටු කපන්නේ නැතිව කෘෂිකර්ම අමාත්‍යාංශයට මීට වඩා වැඩි මුදලක් ලබා දීලා, මේ බස්නාහිර පළාත තුළ අමාරුවෙන් කර ගෙන යන කෘෂිකර්මාන්තය ශක්තිමත්ව කරන්න කටයුතු කරන්න ඉඩ දෙන්නය කියන ඉල්ලීමත් කරමින්, ගරු අමාත්‍යතුමාටත් ඒ වාගේම අපට නිරතුරුව සහයෝගය දෙන ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ගරු අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයටත් මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරද්දී මන්ත්‍රීවරු හැටියට අපි සියලු දෙනාම එකතු කර ගනිමින් කරන කටයුත්තට ස්තුතිවන්ත වෙමින් ගරු අමාත්‍යතුමාට කෘෂිකර්ම අමාත්‍යාංශය තුළ වඩාත් හොඳ ඵලදායීලෙස තවත් සේවය කරන්න අවස්ථාව ලැබේවායි කියලා සුභාශිංසනය කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 03.20]

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපේ ගාමිණී තිලකසිරි ගරු ඇමතිතුමාටස්තුතිවන්ත වෙනවා. මොකද, අපි උපදේශක කාරක සභාවේවත් නැහැ. නමුත් එතුමා අපට මේ විවාදයට එක් වෙන්න අවස්ථාවක් දීලා තිබෙනවා. විශේෂයෙන්ම කෘෂිකර්ම, ඉඩම්, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය, ගොවිජන සංවර්ධන අමාත්‍යාංශයේ ශීර්ෂ අංක 117. 118, 119 හා 120 කියන වැය ශීර්ෂයන් සම්බන්ධව සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන්න මේ අවස්ථාවේදී බලාපොරොත්තු වෙනවා. මොකද, හැමෝම කථා කරන නිසා. ඊට පෙර මම කියන්න ඕනෑ. මොකද, අපි දන්නවා, මේ රට තුළ නිෂ්පාදිත ආර්ථිකයක් ඇති කරන්නේ නැතිව රට දියුණු කරන්න පුළුවන්කමක් නැහැ. නමුත් අපි කනගාටුවෙන් අපේ බස්නාහිර පළාතේ කෘෂිකර්මය සඳහාත්, එතුමාට අදාළ අනෙක් විෂයයන් සඳහාත් වෙන් කරලා තිබෙන මුදල දිහා බැලුවාම, බොහොම ශෝචනීය තත්ත්වයක් තිබෙන්නේ. ඒ නිසා අපි ඒ පිළිබඳව කනගාටු වෙනවා. ඒ වාගේම එතුමාට ලැබුණු මුදලින් පසුගිය 2016 වර්ෂය තුළ විශේෂයෙන්ම පාසල් දරුවන්ගේ කෘෂිකර්මය නගා සිටුවීම සඳහා විශාල කැප කිරීමක් කළා. ඒක අපි දකින්නේ, රටට කරන ආයෝජනයක් හැටියට. රටේ අනාගතය වෙනුවෙන් කෘෂිකර්මය දියුණු කරන්න, එතුමා ගත් ලොකු උත්සාහයක් හැටියට අපි දකිනවා. ඒ වාගේම නවීන තාක්ෂණය පාවිච්චි කරන්න එතුමා කටයුතු කරලා තිබෙනවා. ඒකත් ඉතාමත්ම වැදගත්. අපි දැක්කා, අර පැළ සිටුවන මැෂින් එක එහෙම ගෙනැල්ලා එතුමා විශාල උත්සාහයක් දරනවා, ඵලදායී විධියට අස්වැන්න ලබා ගන්න වැඩ කටයුතු කරන්න. ඒ පිළිබඳව අපි සතුටු වෙනවා.

ඒ වාගේම කියන්න ඕනෑ. මම හිතන්නේ, ටෙලි නාට්‍යයක වුණත් රඟපාන්න පුළුවන් මුහුණක් තමයි ගරු ඇමතිතුමාගේ තිබෙන්නේ. ඒ වාගේම තමයි එතුමා මේ පළාත් සභාව තුළ බොහොම සමඟිය ගොඩ නගන අමාත්‍යවරයෙක්. හැමෝමත් එක්ක සුහදව, ඇඟට ගන්නේ නැතිව වැඩ කරන දක්ෂ ඇමතිවරයෙක්. එතුමාට ගැලපෙන ලේකම්තුමෙකුත් ඉන්නවා. නිලධාරී මණ්ඩලයකුත් ඉන්නවා. ඉතාම අපි සතුටු වෙනවා. බොහොම සමඟියෙන් එක මිටියට වැඩ කරනවා. හැම දෙයක් පිළිබඳව සොයලා බලලා කටයුතු කරනවා. පසු විපරම් කරමින්, වැඩක් කිව්වාම අපට මතකයි ගෙදර යන කොට වැඩේ සිද්ධ වෙලා. ඒ තරම් ඉක්මණින් වැඩ කරන අමාත්‍යවරයෙකු හැටියට එතුමාටත්, ඒ ලේකම්තුමා ඇතුළු නිලධාරී මණ්ඩලයටත් මගේ ස්තුතිය පුද කරනවා.

විශේෂයෙන්ම මුළු අයවැයෙන් 0.5% යි මෙතුමාට වෙන් වෙලා තිබෙන්නේ. 2015 සත්‍ය වියදමට වඩා 2017 ඇස්තමේන්තුව මිලියන 48 ක වැඩි වීමක් තිබෙනවා. 17% කින් වැඩි කරලා තිබෙනවා. 2016 ඇස්තමේන්තුවට වඩා 2017 ඇස්තමේන්තුව රුපියල් මිලියන 105 ක අඩු වීමක් තිබෙනවා. 24% කින් අඩු කරලා තිබෙන්නේ. ඒ වාගේම පුනරාවර්තන වියදම 2015 සත්‍ය වියදමට වඩා 2017 ඇස්තමේන්තුව රුපියල් මිලියන 10 ක වැඩි වීමක්, 17% කින් වැඩි කරලා තිබෙනවා. 2016 ඇස්තමේන්තු වියදමට වඩා 2017 ඇස්තමේන්තුව රුපියල් මිලියන 5 ක වැඩි වීමක්, 8% කින් වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම ප්‍රාග්ධන වියදම්වල විශාල අඩු වීමක් තිබෙනවා. 2016 ඇස්තමේන්තු වියදමට වඩා 2017 ඇස්තමේන්තුව රුපියල් මිලියන 110 කින් අඩු කරලා තිබෙනවා. 30% කින් අඩු කරලා තිබෙනවා. ඒක බොහොම කනගාටුදායක තත්ත්වයක්. ඒ වාගේම කියන්නට ඕනෑ. මෙතුමාට වෙන් වෙලා තිබෙන රුපියල් මිලියන 241 න් PDG වශයෙන් සභා ආදායම සංවර්ධන කාර්යයන් සඳහා යෙදවුම්වලට රුපියල් මිලියන 200 යි වෙන් වෙලා තිබෙන්නේ. මේ පළාතේ මන්ත්‍රීවරු 104 ක් ඉන්නවා. මේ රුපියල් මිලියන 200 න් තමයි එතුමාට හැමෝටම උදව් කරන්න වෙලා තිබෙන්නේ. ඒ වාගේම PSDG වලින් රුපියල් මිලියන 15 යි කෘෂිකර්මයට වෙන් වෙලා තිබෙන්නේ. මේ රටේ දැවැන්ත කෘෂිකර්ම සංවර්ධනයක් බලාපොරෝත්තු වන රජයක් හැටියට, පළාතක් හැටියට, එතුමාට PSDG වලින්, රජයෙන් ලබා දෙන ප්‍රදානවලින් ලබා දෙන මුදල්වලින් රුපියල් මිලියන 15 යි වෙන් වෙලා තිබෙන්නේ.

ඒ වාගේම ඉඩම්. ඉඩම් විෂය සඳහා එතුමාට වෙන් වෙලා තිබෙන්නේ, PSDG වලින් රුපියල් මිලියන එකයි. එක මිලියනයයි වෙන් වෙලා තිබෙන්නේ. ඒ වාගේම වාරිමාර්ගවලට මුදල් වෙන් වෙලා නැහැ. ඒ වාගේම ධීවර විෂය සඳහා රුපියල් මිලියන 3 යි වෙන් වෙලා තිබෙන්නේ. ඒ වාගේම සත්ව නිෂ්පාදන හා සෞඛ්‍යයට රුපියල් මිලියන 12 යි වෙන් වෙලා තිබෙන්නේ. ඒ වාගේම ගොවි ජන

සංවර්ධනයට මුදල් වෙන් වෙලා නැහැ. මේ විධියට එතුමාට ඒ විෂය සම්බන්ධව විශාල අසාධාරණයක් සිද්ධ කරලා තිබෙනවාය කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම කෘෂිකර්ම විෂය පිළිබඳව කථා කළාම, අපි දන්නවා, වර්තමානයේ කෘෂිකර්ම අංශය මගින් දළ දේශීය නිෂ්පාදනයට ඇති දායකත්වය 9.86% යි. ඒක කෘෂිකර්මයේ යෙදෙන සේවා නියුක්තියන් හැටියට බලන කොට 33% ක් වෙනවා. ඒ වාගේම ගරු ඇමතිතුමනි, බස්නාහිර පළාතේ බිත්තර වී පිළිබඳව ගැටළුවක් තිබෙනවා. බස්නාහිර පළාතේ කුඹුරු අස්වැද්දීමට බිත්තර වී බුසල් 121,800 ක් අවශ්‍යයි. නමුත් අපට බිත්තර වී හැටියට ලැබෙන්නේ බුසල් 68,600 ක් විතරයි. ඒ වාගේම රබර් නිෂ්පාදනයේ 2011 ට සාපේක්ෂව අඩු වීමක් වෙලා තිබෙනවා. 2011 දී කිලෝ ග්‍රෑම් මිලියන 188 ක් නිෂ්පාදනය කළා. නමුත් 2015 වන කොට මේක මිලියන 88 ට අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම විශේෂයෙන්ම පලතුරු වගාව පිළිබඳව බස්නාහිර පළාත පිළිබඳව සතුටු වෙන්න පුළුවන්. මොකද, ජාතික පලතුරු නිෂ්පාදනය තුළ අන්නාසිවලින් 35% ක දායකත්වයක් ලබා දෙනවා. ඒ වාගේම රඹුටන්වලින් 32% ක දායකත්වයක් ලබා දෙනවා. නමුත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අයවැය ප්‍රකාශය තුළ රුපියල් මිලියන 30 ක් වෙන් කරලා දෙනවා කියලා තිබුණාට, එතුමාට වෙන් කරලා තිබෙන්නේ, රුපියල් මිලියන 15 ක් විතරයි.

ඒ වාගේම සත්ත්ව නිෂ්පාදන කටයුතු සඳහා 2017 ප්‍රධාන අමාත්‍යතුමාගේ අයවැය ලේඛනය අනුව එතුමාගේ සාකච්ඡාවේදී කියවුණා, රුපියල් මිලියන 293 ක් ලබා දෙනවාය කියලා. මම ගොඩක් සතුටු වුණා. නමුත් මම ලේකම්තුමා එක්ක ගිහිල්ලා කථා කළාට පස්සේ එතුමාට වෙන් කරලා තිබෙන්නේ, රුපියල් මිලියන 12 ක් විතරයි.

ඒ වාගේම ඉඩම්. වාර්ෂික බදු ඉඩම් ආදායම රුපියල් මිලියන 1000 ත් 1200 ත් අතර බලාපොරොත්තු වෙනවා. නමුත් මේ වන කොට රුපියල් මිලියන 132 යි ලැබෙන්නේ. නමුත් වර්තමානයේ හිඟ ආදායම විතරක් රුපියල් මිලියන 1250 ක් තිබෙනවා. ඉඩම් බදු දීපු අය නව තක්සේරු කරන්න මුදල් වෙන් කරන්න පුළුවන්කමක් ලැබිලා නැහැ. ඒ වාගේම අපි දන්නවා. තක්සේරු කිරීම සඳහා මුදල් අවශ්‍ය වෙනවා. ඒ වාගේම නීති කටයුතු සඳහා මුදල් අවශ්‍ය වෙනවා. නමුත් මෙපමණ අඩු මුදලක් වෙන් කිරීම තුළ ඒ ඉඩම්වලින් ලබා ගන්නා වූ ආදායම 2017 ට අහිමි කරලා තිබෙනවා.

ඒ වාගේම මත්ස්‍ය නිෂ්පාදනය පිළිබඳව. වර්තමානයේ ජාතික මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 535,000 ක් වන අතර, අප පළාතේ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 86,000 ක් වෙනවා. මේක ජාතික නිෂ්පාදනයෙන් 16% ක් වෙනවා. නමුත් ධීවර අමාත්‍යාංශයට අපේ ඇමතිතුමාට ඔරු දෙන්න, නැත්නම් බෝට්ටු දෙන්න, එන්ජින් දෙන්න මේ සියල්ල දෙන්න මිලියන තුනයි වෙන් කරලා තිබෙන්නේ. ඒක ලොකු අසාධාරණයක් හැටියට අපි දකිනවා. ඒ වාගේම වාරිමාර්ග කටයුතු සඳහා සුළු වාරිමාර්ග, අමුණු, කුඩා වැව්, අමුණු, මාර්ග ඉදි කිරීම්, ප්‍රතිසංස්කරණ, පැති බැමි මේ සියල්ලටම සත පහක්වත් වෙන් කරලා නැහැ. මේ විධියට දැවැන්ත අසාධාරණයක් කෘෂිකර්ම අමාත්‍යතුමාට කරලා තිබෙන බව මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ඒ නිසා ගරු ඇමැතිතුමා බලාපොරොත්තු වෙනවා, එතුමාට දීලා තිබෙන මුදල ඉතාමත්ම සැලසුම් සහගතව, අපේ සියලුම පළාත් සභා මන්ත්‍රීවරුන්ට ඵලදායී විධියට ලබා දෙන්න. ඒ වාගේම එතුමාගේ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු නිලධාරීන් ඒ පිළිබඳව විශේෂයෙන්ම හොඳින් අපි සියලු දෙනාටම ඵලදායී වන විධියට මේ කටයුතු බෙදා දෙන්න කටයුතු කරයි කියන දැඩි විශ්වාසය තිබෙනවා. ඒ නිසා එතුමාගේ අමාත්‍යාංශයේ සෑම කටයුත්තකටම, සෑම උපදේශක කාරක සභාවකටම අපේ පූර්ණ සහයෝගය, දායකත්වය ලබා දෙමින්, එතුමා යන ගමනට පූර්ණ ආශිර්වාදය පතනවා. එතුමාට අපි පූර්ණ සහයෝගය මේ පළාත් සභාව තුළ ලබා දෙන්න කටයුතු කරනවාය කියලා කියමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 03.29]

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය, ගොවි ජන සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍ය ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමාටපළමුව අපි ස්තුතිවන්ත වෙනවා. මොකද, එතුමාගේ අමාත්‍යාංශය තුළ උපදේශක කාරක සභාවේ

[ ගරු නිරෝෂා අතුකෝරළ]

වසර දෙකහමාරක් මම රැඳී සිට විශාල අත්දැකීම් ප්‍රමාණයක් සහ මගේ ජීවිතයට නොදැකපු යම් යම් ස්ථානවලට ගිහිල්ලා අපි විශාල අවබෝධයක් මේ රටේ කෘෂිකර්මය ගැන ලබා ගත්තා. ඒ නිසා විශේෂයෙන්ම එතුමාට ස්තුතිවන්ත වෙනවා ඒ අවස්ථාව අපට ලබා දීම ගැන. ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමාගේ ජාතික ආහාර නිෂ්පාදනයට මේ රටේ මුල් තැන දී තිබෙන යුගයක, අපේ පළාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යාංශයට මුදල්, ගිය වසරට වඩා මිලියන 23 ක් අඩුවෙන් ලබා දීම ගැන ඉතාමත් කනගාටුවට පත් වෙනවා. මොකද, ඒකට ප්‍රධානම හේතුව. අද අපට තිබෙනවා, තුන් බිය කියලා එකක්. ඉස්සර ඉන්දියාවේ තිබුණා මේ තුන් බිය. දැන් ලංකාවේ තිබෙනවා මේ තුන් බිය. මොකක්ද ඒ තුන් බිය. ඒ තුන් බිය තමයි දියවැඩියාව, හෘද රෝග, පිළිකාව. මේ රෝග තුන නිසා අපි හැම කෙනෙක්ම ඉන්නේ ඉතාමත් භයෙන්. ඒ වාගේම අද විශාල ප්‍රමාණයකට මේ රෝග වැළඳී තිබෙනවා. ඒකට හේතුව, 80% ක්ම, අපි ගන්නා ආහාරවලින් තමයි අපට මේ බෝ නොවන රෝග වැළඳෙන්න හේතුව. එතකොට අපි ගන්නා ආහාර. එදා අපේ රටේ මෙවැනි රෝග තිබුණේ නැහැ. අපි පුංචි කාලේ පිළිකාවක් කියලා එකක් අහලවත් තිබුණේ නැහැ. ඒත් ඉතාමත් කලාතුරකින්. හෘද රෝග ඉතාමත් කලාතුරකින්. නමුත් දැන් ඇහුවොත් හිටපු ගමන් මැරිලා. හිටපු ගමන් හෘද රෝග. ඇයි අපට හැදෙන්නේ?

අද රෝග හැදෙන්න ප්‍රධානම හේතුවක් තමයි ජාන බීජ. දෙමුහුන් බීජ සහ Chemical පොහොර. මේ Chemical පොහොර සහ ජාන බීජ භාවිතයෙන් අපි නොදැනුවත්වම අපේ ශරීරයට විශාල විෂ ඇතුළත් වීම නිසා මේ රෝග ඇති වන බව අද සොයා ගෙන තිබෙනවා. අපි මේකට මොකක්ද කරන්නේ? අපි මේකට විසඳුමක් සොයන්න අවශ්‍යයි. ඒ විසඳුම සොයන්න නම් දේශීය බීජ නිෂ්පාදනය වැඩි කළ යුතුයි. අනිවාර්යයෙන් අපි වැඩි මුදලක් වෙන් කරලා, ඒ දේශීය බීජ නිෂ්පාදනය කළ යුතුයි. එදා අපේ ගෙවල්වල ගස් ලබු ගෙඩියක් කාලා ඇට ටික එළියට දැම්මාම ඉබේම ඒ ඇටවලින් ගස්ලබු ගස් පැළ වෙනවා. ඒ වාගේම වත්තේ කොස් පැළ, දෙල් පැළ, පලතුරු පැළ තිබෙනවා. අපි ආතා ගෙඩියක් කෑවාම ඒකේ ඇට ටික එළියට විසි කළාම, ඒ ඇට ටික පැල වෙනවා. අද ගස්ලබු ගෙඩිය ලස්සනට තිබෙනවා. ඇට නැහැ. ඉදිලා, එබෙන්නේ නැහැ. මේ ඔක්කොම බහු ජාතික සමාගම් තීරණය කරන්නේ අපට බත් ද, පලතුරු ද, තණකොළ ද කන්න දෙන්නේ කියලා. මොකද, අපේ දේශීය බීජ සියලු දේවල් අතට අරගෙන තිබෙන්නේ අද බහු ජාතික සමාගම්. මොකද, අපට මේ බීජවල අයිතිය නැහැ. ගොඩක් බීජවල. ඉතින් අපි ගොඩක් වගා කරන්නේ, බහු ජාතික සමාගම්වලින් අපට ලබා දෙන බීජ. ඉතින් අපි කෘෂිකාර්මික රටක් විධියට මේකෙන් මිදෙන්න නම් අනිවාර්යයෙන්ම දේශීය බීජ ප්‍රවර්ධන වැඩ සටහන් අපේ රට තුළ ක්‍රියාත්මක කළ යුතුයි. ඒ නිසා අපේ ඇමතිතුමාගෙන් අපි ඉල්ලා සිටිනවා. ඔබතුමාගේ අවධානය දේශීය බීජ නිෂ්පාදනයට ලබා දෙන්නය කියන ඉල්ලීම. ඒ වාගේම කෘෂි සේවා අධිකාරියට අපි විශේෂ ස්තුතියක් දෙන්න ඕනෑ. මොකද, මමත් ගිය අවුරුද්දේත් උපදේශක කාරක සභාව තුළ හැමදාම කථා කළ දෙයක් තමයි පුරන් කුඹුරු වගා කිරීම සහ දේශීය බීජ වගා කිරීම. දේශීය පලතුරු වගා කිරීම. ගිය අවුරුද්ද තුළ එවැනි ව්‍යාපෘති කිහිපයක් කර ගෙන දේශීය බීජ ගොවීන්ට දීලා මේ වන කොට බීජ නිෂ්පාදනයට යම් අඩිතාලමක් ඔවුන් ලබා දීලා තිබෙනවා. ඒ නිසා අපි විශේෂ ස්තුතියක් කෘෂි සේවා අධිකාරියට ලබා දෙනවා.

ඒ වාගේම තව තිබෙන දෙයක් තමයි මේ රටේ මල් වගාව ගැන කථා කළොත්, විශේෂයෙන්ම මමත් මල් වගාකරුවෙකු විධියට අපි ඕකිඩ් වාගේ මල් ගේන්නේ පිටරටින්. අපේ රටට ඇති වන ප්‍රමාණයටවත් අපට ඒ වගාවල් කර ගන්න බැරි වෙලා තිබෙනවා. කෘෂි සේවා අධිකාරිය තුළින් ගෘහස්ථ කාන්තාවන්ට මේ ඕකිඩ් වගාව හඳුන්වා දීලා විශේෂ ණය පහසුකම් හෝ ලබා දීලා, පැළ ලබා දීලා - අපි දන්නවා, අඹේපුස්ස ෆාම් එකේ තිබෙනවා, බීජ නිෂ්පාදන මධ්‍යස්ථානයක්. ටිෂූ කල්චර් පැළ නිෂ්පාදන මධ්‍යස්ථානයක්. ඉතින් ඒවා මාර්ගයෙන් අපි අද පැළ ගේන්නේ පිටරටින්. බැංකොක්වලින් පැල ගේන්නේ. ලංකාව තුළ මේ ඕකිඩ් පැල නිෂ්පාදනය ප්‍රවර්ධනය කර ගෙන ගෙවල්වල ඉන්න කාන්තාවන්ට ස්වයං රැකියාවක් විධියට මේක ප්‍රවර්ධනය කරන්න පුළුවන් නම් ඉතාමත් වටිනා ස්වයං රැකියාවක්. මොකද, මේකේ ආදායම මම හොඳට දන්නවා. මම ඕකිඩ් වගාකරුවෙකු විධියට යෝජනා කරනවා, මේ ඕකිඩ් වගාව ප්‍රවර්ධනය කරන වැඩ සටහනක් ඉදිරියේදී කර ගෙන යන්නය කියන එක. මම පසුගිය 2016 වර්ෂයේ අයවැයේදීත් මේ ඉල්ලීම ඔබතුමාගෙන් කළා. ඒ වාගේම අපි නිලධාරීන්ගෙන් ඉල්ලා සිටිනවා, AC කාමරවල ඉඳගෙන තීරණ ගන්න එපා. අපි තීරණ ගන්න කොට ගොවියන්ගේ ප්‍රශ්න, විශේෂයෙන්ම වී

ගොවිතැන, හෝග වගාව, පලතුරු වගාව, ඒ වාගේම එළවළු වගාවට සම්බන්ධ ඒ ගොවියොත් එක්ක සාකච්ඡා කරලා තීරණ ගන්න. ඒ ගොවියන්ට උපකරණ දෙන කොට දැන් අපි උදැල්ල දෙන්න ඕනෑ ගොවියාට, අවශ්‍ය උදැල්ල උපකරණය දෙන්න ඕනෑ.AC කාමරවල ඉඳගෙන තීරණය කරන්න එපා මෙන්න මේ උදැල්ලයි හරි යන්නේ, මේ බීජ එකයි හරියන්නේ කියන එක. හැම තිස්සේම අපට අවශ්‍ය වෙලා තිබෙනවා, ගොවියොත් එක්ක සාරවත් සංවාදයක්. මොකද, මේ කෘෂිකර්මය නිෂ්පාදනය කරන්න නම්, ඒ ක්ෂේත්‍රවල ඉන්න ගොවියන් එක්ක අපි මේ ගැන සාකච්ඡා කළ යුතුයි. අවාසනාව කියන්නේ, මෙවැනි සාකච්ඡා අපේ රටේ ඉතාමත් අඩුයි. ඒ නිසා මහජන නියෝජිතයෙකු විධියට නිලධාරීන්ගෙන් ඉතාමත් ඕනෑකමින් ඉල්ලා සිටිනවා. මොකද, නිලධාරීන්ගේ වගකීම් ඉතාමත් අඩුයි. ඒකට හේතුව, කොහොමත් නිලධාරීන්ට අවුරුදු 22 ක් විතර ඉන්න පුළුවන්. මහජන නියෝජිතයෝ විධියට අපි අනිවාර්යයෙන්ම අවුරුදු පහෙන් නැවත යන්න ඕනෑ ඒගොල්ලන් ළඟට. මේ ප්‍රශ්නවලට අපි මුහුණ දිය යුතුයි. ඒ නිසා මහජන නියෝජිතයන්ගේ යෝජනාවලට ඇහුම්කන් දීලා, මේ නිලධාරීන් ඒ අයත් එක්ක සාකච්ඡා කරනවා නම්, ඉතාමත්ම වටිනවාය කියන එක අපි මේ නිලධාරීන්ගෙන් ඉල්ලා සිටිනවා. අපේ ඇමතිතුමාගේ නිලධාරී මණ්ඩලය ඉතාමත් හොඳයි. නරකක් නොවෙයි කියන්නේ. තරහා වෙන්න එපා. වැඩක් නම් නොකර දීලා ඉන්න එපා. අඩුපාඩුවක් තිබෙනවා. ඒක හදාගෙන අපේ නිලධාරීන් ඒ ක්ෂේත්‍රවල ඉන්න අයත් එක්ක සාකච්ඡා කරලා, මේවාට විසඳුමක් ලබා දෙන්න. ඒ වාගේම මන්ත්‍රීවරු විධියට අපට වැඩක් දෙන්න. මම ඉල්ලුවා පුරන් කුඹුරු වගා කරලා දෙන්න. මම මගේ ප්‍රදේශයේ අධීක්ෂණය කරන්නම්. මම බලන්නම්. පලතුරු ගම්මාන හදනවා නම් අපට වැඩක් දෙන්න. අපිත් මේ මහජනතාවගෙන් පඩි අරගෙන මෙතැන ඉන්නේ. මෙතැනට ඇවිල්ලා පුටුව රත් කරන්න විතරක් නොවෙයි. ඒ නිසා අමාත්‍යාංශවලින් අපට වැඩක් ලබා දෙන්නය කියන එක අපි අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටිනවා. මම සතුටු වෙනවා. අපේ අමාත්‍යාංශයෙන් වැඩ නොකරනවා නොවෙයි. ගොඩක් වැඩ කරනවා. අපට තව වැඩ කොටසක් ලබා දෙන්නය කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම ගරු ඇමතිතුමාගෙන් තව දෙයක් අපි ඉල්ලා සිටින්න ඕනෑ. අපේ රට ආර්ථික ඉලක්කයට යන්න නම් අපේ නිලධාරීන් සහ මේ කෘෂි ක්ෂේත්‍රයට අයිති සියලු අයට දිය යුතු බලවේග තුනක් තිබෙනවා. ඒ බලවේග තුන තමයි දැනුම. වෙනස් වීමට ඇති කැමැත්ත. ගෝලීයකරණයට, තරඟයට මුහුණ දීම. මෙන්න මේ තුන නිලධාරීන්ට, අපට සහ මේ ක්ෂේත්‍රවල ඉන්න සියලු දෙනාට උගන්වන්න ඕනෑ. මොකද, අපි සමහර සාම්ප්‍රදායික ක්‍රමවලින් මිදිලා මේ දියුණුවත් එක්ක ඉස්සරහාට යා යුතුයි. ඉතින් අපි වෙනස් වෙන්න නම්, ආර්ථිකය ශක්තිමත් කරන්න නම්, අනිවාර්යයෙන්ම මේ බලවේග තුන පිළිබඳ දැනුවත් කරන්න ඕනෑ. අපෙත් අඩුපාඩු තිබෙනවා. හැම කෙනෙකුගේම තිබෙනවා. අපේ ඇඟට මේක දෙන්න ඕනෑ. අපි වැඩ කරන්න ඕනෑ. මොකද, මේ අපි හැම කෙනෙක්ම රජයේ නිලධාරීන් ඇතුළු අපි සියලු දෙනා මහජනතාව ගෙවන බදුවලින් පඩි අරගෙන ඉන්න පිරිසක්. ඒ නිසා ඒකට සාධාරණය කරන්න නම්, ඒ සියලු දෙනාව ශක්තිමත් කළ යුතුයි කියන එක මම කියනවා. තවත් අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න තිබුණත්, කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙන නිසා ඒ ගැන කනගාටු වෙනවා. අපේ කෘෂිකර්ම ඇමතිතුමාට අපේ සතුට පළ කරනවා. අපි හැම දේකින්ම එතුමාට සහයෝගය දෙනවා. මොකද, මේ රටට අත්‍යවශ්‍ය කාර්යයක්, සංවර්ධනයක් කරන පුළුවන් අංශයක් කෘෂිකර්මය කියන්නේ. ඉතින් අපි ඒකට දෙන්න පුළුවන් උපරිම සහයෝගය එතුමාට ලබා දෙන බව පොරොන්දු වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [ලලිත් එල්ලාවල මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Presiding Member [Mr. Lalith Ellawala M.P.C] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියට අවස්ථාව. ඔබතුමියට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 03.41]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ගාමිණීතිලකසිරි ගරු අමාත්‍යතුමාගේ විෂය පථය ගැන කථා කරද්දී මට තත්ත්පරයට 120 ක් වචන කියන්න වෙනවා. මොකද, කාලය මදී. ඒ නිසා, පළමුකොටම මම සඳහන් කරන්න ඕනෑ මේ වාරි ක්ෂේත්‍රය ගැන. කාල වේලාව අනුව මම අනික් සියල්ලම කථා කරන්න යන්නේ නැහැ. මම පළමුකොටම ඔබතුමාට සහ ඔබතුමාගේ අමාත්‍යාංශයේ නිලධාරීන්ට මගේ ප්‍රශංසාව හිමි කරනවා. මම ලිඛිතව දැනුම් දුන්නා, මුළු පළාතෙන්ම මට වාරි කටයුතු අධීක්ෂණය කරන්න බැරි වුණත්, අපේ කටාන කොට්ඨාශයේ අපේ කුඹුරුවලට වතුර සපයන ඇළ මාර්ග වාගේම අනෙකුත් සියලු ඇළ මාර්ගයන් නිරීක්ෂණය සඳහා ඉල්ලීමක් කරනු ලැබුවා. ඒ නිලධාරීන් සියලු දෙනාම නිසි කාල වේලාවට පැමිණිලා, අපිත් එක්ක නිරීක්ෂණ චාරිකාවක යෙදුණා. ඒ කරලා ඉතාමත් වෙහෙස මහන්සියෙන් වැදගත් වාර්තාවක් සපයලා තිබෙනවා. ඒ වාගේම බස්නාහිර පළාත් සභාව ගත්තොත් සමස්ත වශයෙන්ම මේ නිලධාරීන්ගේ කටයුතු ඉතා ප්‍රශස්ත මට්ටමක පවතිනවා. මම හිතන්නේ, කලාතුරකින් එක්කෙනෙකුගේ දෙන්නෙකුගේ අඩුපාඩු තිබුණත්. විශේෂයෙන්ම ඒ ඉංජිනේරු මහත්වරු සියලු දෙනාම ඒ නිරීක්ෂණය කරපු තත්ත්වයක් තමයි, මේ සංවර්ධන කටයුතු කිරීමේදී වගා කටයුතු කිරීමේදී, ඇළ මාර්ග පිළිසකර කිරීමේදී මේ හා සම්බන්ධ වන කිසිම ගැසට් පත්‍රයක් හෝ සැලසුමක් මේ ආයතනවල තිබුණේ නැහැ. ඒ නිලධාරීන්ට ඒ වාර්තා සපයන්න, ඒ අවශ්‍ය කරන සැලසුම් සොයන කොට ඒ ආයතනවල ඒවා නැති බව තමයි මටත් දැනුම් දුන්නේ.

ඒ නිසා විශේෂයෙන් මම ගරු ඇමතිතුමාට කියනවා. අපි වාර්ෂිකව මේ ඇළ මාර්ග පිළිසකර කිරීමට මුදල් වෙන් කරනවා. එක අවුරුද්දක කපනවා. ආපහු මේක වැහිලා කියලා නැවත සැරයක් කපනවා. එතකොට මේ රජයේ මුදල් විවිධ ආකාරයෙන් අපේ අතින් වියදම් වෙනවා මිසක්, මේ ඇළ මාර්ග අපි සකස් කිරීමක් සිදු කළොත් දෙපැත්ත බැඳලා හරියට මැනලා ගැසට් කිරීමක් කරලා, ඉවුරු දෙපස සලකුණක් යොදලා - දැන් මහා මාර්ග ගත්තොත් RDA කියලා බෝඩ් එකක් තිබෙනවා. එතැනින් මෙහාට බිල්ඩින් එකක් හදන්න බැහැ. එවැනි ක්‍රමවේදයක්. පළාත් සභාවට අයිති පුංචි වාරි ක්ෂේත්‍රයට සම්බන්ධ ස්ථානවල අපි එහෙම කළොත් අඩු වශයෙන් එවැනි සලකුණක් තිබෙන තැනක් කඩලා බිඳලා විනාශ කළොත් අපට ඒ සම්බන්ධයෙන් නීති පියවරකට හරි යන්න පුළුවන්. පුද්ගලයෙකුට පැමිණිලි කරන්න පුළුවන්. දැන් සමහර ස්ථාන තිබෙනවා. අපි දැක්කා. එක පර්චස් එකක් ගොඩ කර ගත්තොත් ලක්ෂ 50 ක් විතර වටිනවා. ඉතින් කිසිම කථාවක් නැතිව මේ පර්චස් එක ගොඩ කර ගන්නවා. ඒ නිසා ඒ ඉවුරු දෙපස කිසිම ආරක්ෂිත තත්ත්වයක් නැහැ.

ඒ නිසා අපි වගාව ගැන, කෘෂිකර්මය ගැන ඉස්සරහාට කථා කරනවා නම්, අනෙකුත් සියලු දේ පැත්තකින් තියෙද්දී ප්‍රධාන වශයෙන්ම ජලය නැතිව වගාවක් කරන්න බැහැ. ඒ ජලය එන මාර්ගය අපට පැහැදිලිව තිබෙන්න ඕනෑ. දැන් අපේ ප්‍රදේශය ගත්තොත්, උඩංගහ ප්‍රදේශයේ කුඹුරු සියල්ලම අපේ ඇමතිතුමාත් දන්නවා. ඒ කුඹුරු ටික වේලිලා ගිහිල්ලා. කුඹුරට එන ඇළ මාර්ගයත් වැලි, මැටිවලට කපලා ඉවරයි. මේ ගැන පරීක්ෂණයක්කරන්න කියලා මම කීප වතාවක් ලිඛිතව දැනුම් දුන්නා. ඇළ මාර්ගය සොයා ගන්න බැහැ. දෙපැත්තේ ගම් දෙකේ මායිමත් නැහැ. ඒ නිසාම තමයි මම මේ නිරීක්ෂණ චාරිකාව සංවිධානය කළේ. ඒ නිලධාරීන් විශාල උද්යෝගයකින් කටයුතු කළා. විශේෂයෙන්ම අව්වේ බැහැ ගෙන හැම තැන්වල අව්වේ කරවෙමින් ගිහිල්ලා වැදගත් විධියට ඒ කටයුත්ත කළා. ඒ ගැන මගේ ප්‍රශංසාව හිමි වෙනවා. නමුත් අපි ඒ කරපු කර්තව්‍යයේ වටිනාකම තමයි මේක මැනලා ගැසට් කිරීමක් කරන්න ඕනෑ. ඒ කටයුත්ත අවසන් කළේ නැත්නම් ඒකේ ප්‍රතිඵලයක් වෙන්නේ නැහැ. මේ ක්‍රියාදාමය අපේ ආසනයට විතරක් නොවෙයි. අනෙකුත් සියලුම ආසනවලට අඩු වශයෙන් ගංගා, ඇළ දොළ උතුරන අවස්ථාවලදී ගම ඇතුළට වතුර ඒම වැළැක්වීමට ක්‍රමෝපායන් පද්ධතියක් තිබෙන්න ඕනෑ. ඒ කියන්නේ, ඒවා වහන්න අරින්න පුළුවන් විධියක් තිබෙන්න ඕනෑ. නැත්නම් එකපාරට ඇවිල්ලා යට වෙනවා. කවුරුවත් දන්නේ නැහැ. ඒ නිසා ඒ ඇළ මාර්ගය වැසීමේ පද්ධතියක් අපේ නැහැ. මම මේ දැකපු දේවල්. මම පෞද්ගලිකව නිරීක්ෂණය කරපු අඩුපාඩු මම මේ සටහන් කර ගෙන තිබෙන්නේ. මේවාට වැඩි වියදමක් යන්නේ නැහැ. නමුත් අපි මේක කළොත් රජයට විශාල වියදමක් අඩු වෙනවා. ඒක කරන්න තිබෙන්නේ පොඩි වැඩ කොටසක්. ඒ වාගේම තමයි දැනට මේ ඉදි කිරීම් කරලා තිබෙන දේවල් සම්බන්ධයෙන් අපි ළඟ තිබෙනවා

ගම් සිතියම්. පැරණි ගම් සිතියම් අරගෙන නිරීක්ෂණයක් කරන්න පුළුවන්. ඒ ගම් සිතියම්වලින් අපට අනාවරණය කර ගන්න පුළුවන් කොපමණ ප්‍රදේශයක් මේ ඇළ මාර්ගයට අයිතිද කියලා. අද හෙට තිබෙන පිඹුරුපත් අරගෙන විසි කළත්, ඒ ෆයිල් ඉස්සුවත් මේ පැරණි ගම් සිතියම් කාටවත් වෙනස් කරන්න බැහැ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

ඊට අමතරව මම දැක්ක දෙයක් තමයි මේ අපේ කෘෂි නිෂ්පාදන සහ පලතුරු, ඒ වාගේම මේ ධීවර නිෂ්පාදන කල් තබා ගැනීම. කිසිම කල් තබා ගැනීමේ ක්‍රමයක් නැහැ. අපි අද මාළු අල්ලනවා. විකුණා ගන්න බැරි වුණොත් පොඩි මාළු ටික අහක යනවා. ලොකු මාළු ටික ෆ්‍රිජ් එකට දානවා. නමුත් මේකට පුළුවන් කර්මාන්ත ශාලාවක් ඉදි කරලා, අලුත් ක්‍රමවේදයන් හඳුන්වා දීලා, විශේෂයෙන්ම අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් වන, වෙනත් උගත් අය කරන රැකියාවලට යන්න බැරි වන තරුණ පිරිසට යම්කිසි කර්මාන්ත ශාලාවක් ඉදි කරලා, මේක මාස හයකටවත් කල් තියා ගන්න පුළුවන් ක්‍රමයක්. දැන් අපි දැක්කා රුපියල් දෙකකට තක්කාලි සමහර වෙලාවට විකුණා ගන්න බැරිව අහක දානවා. වල් අලින්ට කන්න දෙනවා. මම පසුගිය අයවැය විවාදයේදීත් මේ ගැන මතක් කළා. ඇයි අපට මාස හයකට තියා ගන්න ක්‍රමවේදයක් හදා ගන්න බැරි. මාස හයකට කන්නය අවසන් වෙනවා. ඊළඟ කන්නයේදී ඒ ටික පාවිච්චි කරන්න පුළුවන්. මේ දෙහිවලටත් එක කාලයකට රුපියල් දාහට යනවා. අමු මිරිස් කිලෝ එක දාහට යනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් අමාත්‍යතුමාගේ විශේෂ අවධානය යොමු කරනවා. ඒ විශේෂ ප්‍රයෝජනයක් තිබෙන දේවල්. රටට ආර්ථිකයට ශක්තියක් වෙන දෙයක්. මේ ගැනත් අවධානය යොමු කරන්නය කියනවා. අපේ වාරිමාර්ග ටික ආරක්ෂා කර ගන්න නැවතත් අවධානය යොමු කරන්නය කියමින්, ඔබතුමාට අයවැය සම්මත කර ගෙන ඉදිරියටත් සාර්ථකව වැඩ කටයුතු කරන්න ආශිර්වාදය ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 03.46]

**ගරු සමන්මලී සකලසූරිය**
Hon. Samanmalee Sakalasooriya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය, ගොවිජන සංවර්ධන කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වෙනුවෙන් කථා කිරීමට, මට අවස්ථාව ලබා දීම පිළිබඳව විශේෂයෙන්ම ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමාට මගේ විශේෂ ස්තුතිය මේ වෙලාවේ පුද කරන්නට කැමැතියි. ප්‍රථමයෙන්ම මේ වකවානුව තුළදී අපි දකින ප්‍රධාන කාරණාවක් තමයි අපේ රටේ කෘෂිකර්මාන්තය තුළ බිඳ වැටීමක් පවතිනවා. ඒ විතරක් නොවෙයි. මේ බිඳ වැටීම ඇති කිරීමට අපි දන්නේ නැහැ මොන බලවේගයන් ක්‍රියාත්මක වෙනවාද කියලා. විශේෂයෙන්ම අපේ ගොවීන්ට අතහිත දෙනවා වෙනුවට ඔවුන්ගේ සහනාධාර කප්පාදුවට ලක් කරලා තිබෙනවා. ඔවුන්ව දිරි ගන්වනවා වෙනුවට ඔවුන්ට මේ ගොවිතැන එපා වන විධියට අපේ රජයන් ක්‍රියාත්මක වන අයුරු තමයි අපි දකින්නේ. විශේෂයෙන්ම කෘෂි ආර්ථිකයක් තිබුණු රටක් විධියට, කෘෂිකර්මාන්තයෙන් ඉස්සරහාට යන්න පුළුවන් භූමියක් තිබෙන, ඒ ඥානයක් තිබුණු විශේෂයෙන්ම ශ්‍රමයක් තිබෙන රටක් විධියට අපට මෙලෙස කෘෂිකර්මාන්තයේ කඩා වැටීම මම හිතන්නේ, අපේ සමස්ත ආර්ථිකයටම විශාල මරු පහරක් විධියට තමයි අපට දකින්න තිබෙන්නේ. ඒ නිසා මේ වන කොට බස්නාහිර පළාත් සභාවේ ලබන වර්ෂය සඳහා වෙන් වෙලා තිබෙන මුදල් ප්‍රමාණය දිහා වුණත් බැලුවාම, එහි කප්පාදුවක් දක්නට ලැබෙනවා. සමස්තයක් විධියට මුදල් නැහැයි කියලා කිව්වත් අපි දකිනවා, අද වන කොට රට තුළ අපේ කෘෂිකර්මාන්තයට, ගොවිජනතාවට මහත් සේ අතහිත දීම වෙනුවට ඔවුන්ව ආපස්සට ඇද දැමීමක් සිදුවන අයුරු අපි දකිනවා. එය ඉතාමත්ම අභාග්‍යයක් බව කියන්න කැමැතියි.

විශේෂයෙන්ම වී ගොවියා දිහා බැලුවොත් ඔවුන්ට පොරොන්දු වුණු මිල වෙනුවට, ඉතාමත්ම පහළ මිලක් තමයි අද ඔවුන්ට ලබා දෙන්නේ. මම අහගෙන හිටියා. කෝකිලා හර්ෂනී ගරු මන්ත්‍රීතුමිය කථා කළා. මමත් අපේ ආසනය තුළ ඉන්න කු.ප.නි.ස මහත්වරුන්ට, මහත්මීන්ට කථා කළා. ඔවුනුත් කියන එකම දේ තමයි ගොවියාට අවශ්‍ය වෙලාවට ඒ සහනාධාරය ලබා නොදීම තුළ ඔවුන් අපහසුතාවයට පත් වන බව. ඒ නිසා අපි විශේෂයෙන්ම ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. මේ සහනාධාර ඔවුන්ට අවශ්‍ය වෙලාවට අතට යනවා නම්, ඔවුන්ට ඔවුන්ගේ ගොවිතැන කර ගෙන යාමට එය මහත්සේ පිටුවහලක් වේවි කියන එක. මොකද, වෙනත් රැකියාවක් කරන්නට ඔවුන් ඔවුන්ගේ ජීවිතයේ පුරුදු වෙලා නැහැ. ඔවුන් නිසා තමයි

[ ගරු සමන්මලී සකලසූරිය]

අපේ බත රැකිලා තිබෙන්නේ. අපේ ගොවි ජනතාව අපි රැක ගත්තේ නැත්නම් ඉතා නුදුරු අනාගතයේදීම අති මහත් බහුතර සහල් ප්‍රමාණයක් පිටරටින් ආනයනය කිරීමට අපට සිදු වේවි. පොල් වුණත් අපට පිටරටින් ආනයනය කරන්න සිදු වේවි. අන්න ඒ ස්ථානයට අපේ ලංකාව ගෙනයන්න එපාය කියලා විශේෂයෙන්ම අපේ නායකයින්ගෙන් අපි ඉල්ලන්න කැමැතියි.

ඒත් එක්කම මට විනාඩි පහක කාලයක් ලැබිලා තිබෙන නිසා මට හැම විෂයයක් පිළිබඳවම කථා කරන්න හැකියාවක් නැහැ. විශේෂයෙන්ම ඔබතුමාගේ මේ වාර්ෂික වාර්තාව තුළ අපි දැක්කා ලේකම්තුමාගේ පණිවුඩයේදී

> *"2016 වසර දක්වා ආදර්ශ ගොවිපලක් වශයෙන් පැවති කොටදෙනියාව සත්ව පාලන පුහුණු මධ්‍යස්ථානය, අභිජනන ගොවිපලක් ලෙස මෙම වර්ෂයේදී වැඩි දියුණු කරන ලදී."*

විශේෂයෙන්ම මේ මගේ ආසනයේ පවතින ගොවිපලක්. එදා සිට මම පොඩි කාලයේ සිටම දකින ගොවිපලක්. ඉතින් මෙවැනි තත්ත්වයකට එය නගා සිටුවීමට කටයුතු කිරීම පිළිබඳව අමාත්‍යතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. මෙවැනි අමාත්‍යාංශයකට විශේෂයෙන්ම දැක්මක් ඇතිව කටයුතු කරනවා නම් ඔහේ කරන්නන් වාලේ කරන්නේ නැතිව ගිය වසරේ කළා, ඒ නිසා මේ අවුරුද්දෙත් කරනවා කියන අදහසකින් නැතිව, දැක්මක් ඇතිව යම්කිසි සංකල්ප ඔලුවට අරගෙන අනික් අයගේ අදහස්, විශේෂයෙන්ම මේ විෂයයන් පිළිබඳව සිටින විශේෂඥයින්ගේ අදහස් වෙන්න පුළුවන්. මේ හැම දෙනාගේම අදහස් කැටි කර ගෙන දැක්මක් ඇතිව ඔබතුමා මේ අමාත්‍යාංශය කර ගෙන යෑම පිළිබඳවත්, ඒත් එක්කම ඔබතුමාට ශක්තියක් වෙමින් මේ ඉන්න මන්ත්‍රීවරුන්ටත් ශක්තියක් වෙමින් ඉතාමත්ම ප්‍රශංසනීය මට්ටමේ කාර්යභාරයක් ඉටු කරන ඒ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් අපි අපේ සුභාශිංසන එකතු කරනවා.

ඒ වාගේම මේ වාර්තාවේ මම තවත් තැනක දැක්කා, ඔබතුමන්ලා සඳහන් කරලා තිබෙනවා, ධීවර ක්ෂේත්‍රය පිළිබඳව. ධීවර කර්මාන්තය පිළිබඳව ගැටළු රාශියක් හඳුනාගෙන තිබුණා. එහි හඳුනාගත් එක ගැටළුවක් විධියට මම දැක්කා ඔවුන්ට ශිල්පීය දැණුම - මේ ධීවර ක්ෂේත්‍රය ඉස්සරහාට කර ගෙන යන්නට අවශ්‍ය ශිල්පීය ඥානයේ අඩුභාවයක් තිබෙනවාය කියලා. මම පසුගිය අගෝස්තු 20 වැනිදා අපේ ගම්පහ දිස්ත්‍රික්කයේ ජා-ඇළ පමුණුගම ප්‍රදේශයේ පැවති උත්සවයකට සහභාගී වුණා. එය සුවිශේෂී උත්සවයක්. 1956 දී තමයි ශ්‍රී ලංකාවේ පළමුවැනි බහුදින යාත්‍රා ගැඹුරු මුහුදට දියත් කරපු වැඩ සටහන ආරම්භ වෙලා තිබුණේ. ඒ කාලේ, 1956 ඒ පළමුවැනි කණ්ඩායමේ කෙනෙකු තවමත් ජීවත් වෙනවා. ඔහු ඒ යාත්‍රාව දියඹට දියත් කරලා, අවුරුදු 50 සැමරුම පසුගිය අගෝස්තු 20 වැනිදා පැවැත්වුවා. ඔහු ප්‍රකාශ කළා, රටවල් එකසිය ගණනකට වැඩි රටවල් ප්‍රමාණයකට ඔහු අදටත් ඔහුගේ ශිල්පීය ඥානය බෙදා දෙනවාය කියලා. ඔබතුමන්ලා කියනවා නම්, අද වන කොට අපට ශිල්පීය ඥානය සොයා ගන්න තැනක් නැහැ, කෙනෙක් නැහැයි කියලා. මම හිතන්නේ අපි ඒ කැප්ටන් ජයකොඩි වැනි කෙනෙක් මානව සම්පතක් විධියට යොදා ගත්තොත් ඔහු අද වන කොට නිල නොලත් තානාපතිවරයකු විධියට රටවල් එකසිය ගණනකට වැඩි ප්‍රමාණයක් එක්ක කටයුතු කරමින් ඔහුගේ ධීවර කර්මාන්තය පිළිබඳව තිබෙන ශිල්පීය ඥානය බෙදා හදා ගන්නවා. ඉතින් මෙවැනි අයව අප පාවිච්චි කළොත් මම හිතන්නේ, මේ අපේ රට වටේම තිබෙන සාගරයේ තිබෙන මත්ස්‍ය සම්පත පිළිබඳව අපි ඇස් පියාගෙන ඉන්නේ. මෙවැනි මත්ස්‍ය සම්පතක් තිබෙන රටවල් දිහා බැලුවාම, ඔවුන්ගේ දියුණුව බැලුවාම, ඒ ධීවර කර්මාන්තයේ දියුණුව දිහා බැලුවාම ශ්‍රී ලංකාව ඉන්නේ කොපමණ පුංචි තැනකද කියලා අපට හිතෙනවා. ඉතින් මෙවැනි අයගේ අත්දැකීම්, මෙවැනි අයගේ ඥානය යොදා ගෙන අපට ලබන වර්ෂය තුළ ඔබතුමන්ලාට ඔහුගෙන් ප්‍රයෝජනයක් ගන්න පුළුවන් නම් හොඳයි. ඔහුව අගය කිරීම කෙසේ වෙතත් ඔහුගේ තිබෙන ඒ ඥානය අපට පාවිච්චියට අරගෙන එවැනි පුද්ගලයින් යොදා ගෙන අඩුම තරමින් බස්නාහිර පළාත තුළවත් ධීවර කර්මානය නගා සිටුවන්න පුළුවන් නම්, සාම්ප්‍රදායික ක්‍රමයන්ගෙන් ඔබ්බට ගිහිල්ලා, මෙවැනි අයගෙන් තව තවත් ඥානය එකතු කරගෙන, ඔබතුමන්ලා තව තවත් විද්වතුන් එකතු කර ගෙන අලුත් සංකල්පයන් ඔස්සේ මේ ධීවර කර්මාන්තය තව අඩියක් ඉස්සරහාට තැබුවොතින් මම හිතන්නේ, එය ඔබතුමා අපේ සමස්ත ආර්ථිකයටම එකතු කරන ලොකු තල්ලුවක් කියලයි.

ඒ නිසා මේ විධියට ගත්තොතින් ඔබතුමාගේවිෂය පථය අනෙකුත් අමාත්‍යාංශවල විෂය පථ එක්ක ගත්තාම සීමිත වෙන්න පුළුවන්. නමුත් කෘෂිකර්මය, වාරිමාර්ග ඒ වාගේම

ධීවර කියන ඒ විෂය පථ තුන දිහා බැලුවාම ඔබතුමාට ඉතාමත්ම භාරදූර කර්තව්‍යයක් තිබෙනවා. විශේෂයෙන්ම අපේ ආර්ථිකයට ඍජුව දායක වීමේ හැකියාවක් ඔබතුමාට තිබෙනවා. ඒ නිසා මම විශ්වාස කරනවා. ගරු අමාත්‍යතුමා මේ වන තෙක් එතුමාට ලැබී තිබෙන මේ විෂයය පථයන් ඉතාමත් ප්‍රශංසනීය ආකාරයෙන්, එතුමාට හැකි අයුරින් කර ගෙන යාමට උත්සුක වුණා. ඒ පිළිබඳව අපේ ගෞරවය එතුමාට එකතු කරනවා.

ඒත් එක්කම මේ අවස්ථාවට අදාළ නැති වුණත්, වෙන කථාවක් - මම මේ අයවැය තුළදී කථා නොකිරීම නිසා මම අමතර වචන කිහිපයක් එකතු කරන්න කැමැතියි. විශේෂයෙන්ම බස්නාහිර පළාත් සභාව තුළ අපි පළාත් සභා ක්‍රමය නියෝජනය කරනවා. මේ වන කොට ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව ලොකු කථාවක් ඇති වෙලා තිබෙනවා. මහජන මන්ත්‍රීවරියක්, මහජන නියෝජිතවරියක් විධියට මේ බස්නාහිර පළාත් සභාව තුළ මා කියා සිටින්නට කැමැතියි. විශේෂයෙන්ම ව්‍යවස්ථාව තුළදී පළාත් සභාවන්ට විශාල බලයක් බෙදා දෙනවාය කියලා. විශාල බලයක් විමධ්‍යගත කරනවාය කියලා ලොකු කැරට් අලයක් පෙන්වලා, ඒ කැරට් අලය ඉස්සරහාට තියලා අපිව රවට්ටාගන්න හැදුවාට රට බෙදන ඒ කැරට් අලයට අපි අහු වෙන්නේ නැහැයි කියන එකත් මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. මොකද, පළාත් සභාවකට වඩා වැඩි බලයක් ලැබෙනවා නම්, මම හිතන්නේ අපි වුණත් කැමැති වෙයි. නමුත් අපි පළාත් සභාවක් විධියට මේ දිහා සමස්ත වශයෙන් බැලුවොතින් - මම හිතන්නේ, අපි බලන්නට ඕනෑ බලය විමධ්‍යගත කරන කොට පළාත් සභාව කියන තැනට බලය ලැබෙනවාද? ඒ තුළින් රට - (බාධා කිරීමක්) එදා සිටම අපි මෙතැන හිටියා. ඒ නිසා බලය විමධ්‍යගත කළාට කමක් නැහැ. පළාත් සභාවට බලය ලැබුණත් කමක් නැහැ. රට බෙදන්න එපාය කියන එකත් පළාත් සභා නියෝජිතවරියක් විධියට මේ අවස්ථාවේදී ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 03.56]

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තූතිවන්ත වෙනවා. විශේෂයෙන්ම ඉතාමත් කෙටි කාලයක් තුළ මට මගේ කොටස සම්පිණ්ඩනය කරන්න වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මම නැගී සිටියේ, ගරු ඇමතිතුමාගේ මේ පොත කියවාගෙන යන කොට මේකේ තිබෙනවා,

*"නාගරිකකරණය හා කාර්මිකකරණය හමුවේ බස්නාහිර පළාත තුළ කෘෂිකර්මාන්තය සැබෑ ලෙසම වර්තමානය වන විට අභියෝගයට ලක් වෙමින් පවතී. සීමිත ඉඩකඩ තුළ කෘෂිකර්මාන්තය සිදු කිරීම සඳහා ජනතාවගේ නැඹුරු කිරීම මේ අනුව කාලීන අවශ්‍යතාවයකි."* මම එතැනින් පටන් ගන්න ලැහැස්තියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ත්‍රිකුණාමල සංචාරයේදී මම හිතන්නේ, අපේ අමාත්‍යාංශ කථිකාවතේදී මම යෝජනාවක් කළා. අපේ වර්තමාන රටේ පමණක් නොවෙයි, ලෝකය ගත්තොත් ජල ගෝලය 2/3 ක ප්‍රමාණයක් තිබෙනවා. භූමි ප්‍රමාණය තිබෙන්නේ 1/3 යි. ඒක ලංකාවටත් ඒ ආකාරයි. බස්නාහිර පළාතටත් ඒ ආකාරයි. මම ගරු අමාත්‍යතුමාට යෝජනාවක් කළා, අලුත් ක්‍රමවේදයක් තුළ කෘෂිකර්මාන්තය දියුණු කරන්නට අවශ්‍ය යම්කිසි ක්‍රමවේදාත්මක ක්‍රමවේදයක් පිළිබඳව. එතැනදී මම යෝජනා කළා. අපි දන්නවා, අපේ ප්‍රදේශ විශේෂයෙන්ම මහර ආසනය, කැලණිය ආසනය, බියගම ආසනය, වත්තල ආසනය, ඒ වාගේම මීගමුව. ඒ විතරක් නොවෙයි බස්නාහිර පළාතේ අනෙකුත් දිස්ත්‍රික්වල තිබෙන ජලය ආශ්‍රිත ප්‍රදේශවල - විශේෂයෙන්ම අද භූමිය ඉතාමත්ම වේගයෙන් ක්ෂය වී ගෙන යනවා. ජනතාවගේ වර්ධනය හා සංවර්ධන කටයුතුත් එක්ක. අපි මොනවා කිව්වත්, කෘෂිකර්මාන්තය කර ගෙන යන්න තිබෙන ඉඩකඩ පිළිබඳ ප්‍රශ්නයක් මේ රටේ තිබෙනවා. භූමිය පිළිබඳ ප්‍රශ්නයක්. කෘෂිකර්මාන්තය ජනතාවට ගැලපෙන විධියට දියුණු කර ගේන්නට මාධ්‍යයක් සොයා ගත යුතුයි. අපි පාරවල්වල යනකොට දකිනවා. ගමේ ඉන්නකොට දකිනවා. විශාල රුස්ස කොස්ගස් තිබෙනවා. රුස්ස දෙල් ගස් තිබෙනවා. අපි මේවාට පොහොර දාන්නේ නැහැ. වතුර දාන්නේ නැහැ. නමුත් විශාල ලෙස මේවායෙන් ඵලදාව ලැබෙනවා. අපට මෙයින් ගම්‍ය වන එක කාරණයක් තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අපි දන්නවා, අපි මේ පැළ ජනතාවට, ජාතියට, පරිසරයට ඵලය ලබා දුන්නාට අපි මේ එකකටවත් පොහොර දාන්නේ නැහැ. අපි නයිට්‍රජන්, පොස්පරස්, පොටෑසියම් මේවාට කිසි දවසක දාන්නේ නැහැ. නමුත් විශාල ආහාර ප්‍රමාණයක් මේ විශාල ගස්වල නිෂ්පාදනය

[ ගරු ප්‍රදීප් පෙරේරා]

වෙනවා. එහෙම නම් මෙහි අන්තර්ගතය තුළ යම්කිසි සත්‍යයක් තිබෙන බව පේනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නවා. ශාකයක පත්‍රයක් වතුර ලබා ගන්නේ, පත්‍රය යට තිබෙන පූටිකා ආධාරයෙන්. එහෙම නම් අපට ජල පෘෂ්ටය මත කෘෂිකර්ම ක්‍රමවේදයක් මේ රටේ ඇති කරන්නට පුළුවන්කම තිබෙනවා. මම යෝජනා කරනවා, ගරු කෘෂිකර්ම අමාත්‍යතුමනි, ඔබතුමාගේ ඊළඟ අවුරුද්දේ කෘෂිකර්ම සංවර්ධන සැලැස්මට මේ කටයුත්ත පරීක්ෂණ පියවරක් විධියට කරන්නය කියලා. මම උදාහරණයක් විධියට කිව්වොත්, අපි හිතමු පාවෙන ජල පෘෂ්ටය මත - තමුන්නාන්සේලා නියෝජනය කරන මීගමුව ප්‍රදේශයේ විශාල කලපු ප්‍රමාණයක් තිබෙනවා. ඒ විතරක් නොවෙයි. විශාල ජල ගංගා, ඇළ වේලි, ඔයවල්, වැව් අමුණු අපේ ගම්බිම්වල තිබෙනවා. ඒ වාගේම ජලය එකතු වුණු ස්ථාන තිබෙනවා. මේ ස්ථානවල පාවෙන වගා ක්‍රමවේද - මේවා අපි පරීක්ෂණ මට්ටමින් කරලා තිබෙනවා. මම යුධ හමුදාවේ නිලධාරියෙකු වශයෙන් තුවාල වෙලා සිටි කාලයේ මහඉලුක්පල්ලම පර්යේෂණාගාරය අසළ කඳවුරක තමයි ඒ කාලයේ ජීවත් වුණේ. ඒ කාලයේදී අපි කෘෂි විද්‍යාඥයින් එකතු කර ගෙන මේ ක්‍රමවේදය රටට හඳුන්වා දෙන්න විශාල උත්සාහයක යෙදුණා. ඒ නිසා මම ඉල්ලා සිටිනවා. මම ඒක ලිඛිතව ගරු ඇමතිතුමාට දෙන්න සූදානම්. ඒ සියලු දේවල්. මේ අයවැයේ ඔබතුමාට මුදල් නැති බව, සියලු දෙනාගේම කථා අහගෙන ඉන්න කොට අපට පේනවා. අපට දැනෙනවා. ඔබතුමාට බොහොම අමාරුවෙන් තමයි රටට කන්න දෙන්න තිබෙන මේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු කරන්න වෙන්නේ. වඩා වැදගත් අමාත්‍යාංශයක්. නමුත් මුදල් ප්‍රශ්නයක් ඔබතුමාට තිබෙන බව අපට පැහැදිලියි. නමුත් ගරු අමාත්‍යතුමනි, මේවා කළ යුතු දේවල්. භූමිය සමඟ ගැටෙන්නට අපට සිද්ධ වෙලා තිබෙනවා.

මේ නිසා මම ඔබතුමාට කාරුණිකව මතක් කරලා දෙනවා, මේක බොහොම තැටි ආකාරයෙන් - අපි උදාහරණයක් වශයෙන් කියමු, ගොටුකොළ වගාවක් දැම්මා කියලා. ගංගා ආශ්‍රිතව, ඇළ දොල ආශ්‍රිතව පා වෙන ක්‍රමවේදයන් තුළ ගොටුකොළ වගාවක් දාලා, අක්කර සීයක්, අක්කර දහයක් මේ පළාත් සභා බල ප්‍රදේශය තුළ හදා ගන්න පුළුවන් වුණොත් ඒක ගොවි බිමක් නොවෙයිද? ඒක අලුත් කෘෂිකර්ම ක්‍රමවේදයක් නොවෙයිද? විශාල රුස්ස ගස් මහ පොළොවේ හිටවලා ඒවායේ ඵල ප්‍රයෝජනය ගන්න කොට ඉතා කුඩා ඵල ලබා දෙන මිරිස් ගසේ, බණ්ඩක්කා ගසේ, වම්බටු ගසේ සිට මේ පා වෙන ක්‍රමවේදය කෘෂිකර්මාන්තය තුළ කර ගෙන යන්නට හැකියාව තිබෙනවා. අපි දැක්කා, ගියවර පළාත් සභාවේදී අපේ හිටපු කෘෂිකර්ම ඇමති උදය ගම්මන්පිල මැතිතුමා ඉතා සාර්ථක නාගරික කෘෂිකර්ම ක්‍රමවේදයන් හඳුන්වලා දුන්නා. ඒ හා සමාන වූ ක්‍රමවේදයක් තමයි මම මේ ඔබතුමාට යෝජනා කරන්නේ. ඒ නිසා අපේ වර්තමාන භූමි තත්ත්වයත් එක්කමම මෙය ඉතාමත්ම කාලෝචිතයි කියලා හිතනවා.

ඒ වාගේම ගරු ඇමතිතුමනි, අපේ රටේ අද රසායනික පොහොරවලට පුරුදු වෙලා ඉන්නවා. අපි ගසකට රසායන පොහොර දාන්නේ ඇයි. අපට ගහ වැඩියෙන් හදා ගන්න ඕනෑ වුණාම, අපි රසායනික පොහොර දානවා. මම මේ කියන ක්‍රමවේදය තුළරසායනික පොහොර අවශ්‍ය නැහැ. රසායනික පොහොර අනවශ්‍යව, ජලය දාන්නේ නැතිව, කාබනික පොහොර පමණක් දමන පොහොර දාන්නේ නැතිව ශාකයේ ඵල ප්‍රයෝජන ජනතාවට ලබා දීමේ ක්‍රමවේදයක් මගේ මේ යෝජනාව තුළ අන්තර්ගත වෙනවා. ඒ නිසා මේ පිළිබඳව කෘෂිකර්ම උපදේශක කාරක සභාවත්, ඒ වාගේම අමාත්‍යාංශයේ සිටින උගත් බුද්ධිමත් නිලධාරීන් මේ පිළිබඳව ඉතාමත් දීර්ඝ ලෙස කටයුතු සොයා බලන්න. මේක සංවර්ධනය කර ගෙන පියවරින් පියවර ඉදිරියට අරගෙන, කර ගෙන යන්නට අවස්ථාව දෙන්නය කියලා මම බොහොම ගෞරවයෙන් නිලධාරීන් සියලු දෙනාගෙනුත්, ගරු ඇමතිතුමාගෙනුත් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම ගරු ඇමතිතුමාට සුභ පතනවා. එතුමාට අපේ ගෞරවය පුද කර සිටිනවා. එතුමා ඉතාමත්ම හොඳ නිහතමානී අමාත්‍යවරයෙක්. ඔබතුමාට බටර් ගානවා නොවෙයි. ඇත්ත කථාව ඒකයි. එතුමා ළඟට ගියාම එතුමාගේ නිහතමානීත්වයට, එතුමාගේ තනතුරට ආඩම්බර නොවී එතුමා දක්වන ජනතා සේවයට මගේ ගෞරවනීය ස්තුතිය මා නියෝජනය කරන සමස්ත ජනතාව වෙනුවෙන් පුද කර සිටිනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 04.03]

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ඇත්ත වශයෙන්ම සතුටු වෙනවා, මුළු මනුෂ්‍ය සමුදායටම කන්න දෙන්න පුළුවන් අමාත්‍යාංශයක් වන කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයේදී කථාවක් කිරීමට අවස්ථාවක් ලැබීම ගැන. බස්නාහිර පළාත් සභාවේ මම හිතන්නේ අපි අවුරුදු 26 ක් සම්පූර්ණ වෙනවා. අද සභාවේ මේ අමාත්‍යාංශය පිළිබඳව කථා වෙනවා, මේ මුදල් ප්‍රමාණය අරන් බැලුවාම බොහොම කනගාටුදායක තත්ත්වයක් හැටියට. අපි කවුරුත් පිළිගන්නවා. නමුත් අමාත්‍යතුමනි, අපට මධ්‍යම රජයත් එක්ක මේ රටේ ජනතාවට කන්න දෙන්න තිබෙන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයේදී අඩුපාඩුවක් තිබෙනවා නම්, සටන් කරලා හරි, එහෙම නැත්නම් සාකච්ඡා මාර්ගයෙන් හරි නැවතත් ඒ මුදල් ලබා ගත යුතුයි.ඒ සඳහා අපි ඉදිරියට යන්න ඕනෑ. නැතිව අපි රජය මුදල් කැපුවාද? එහෙම නැත්නම් මෙහෙම දෙයක් සිද්ධ වුණා කියා පුන පුනා කථා කරන එක නොවෙයි, විය යුත්තේ. ඒ අඩු වන මුදල කොපමණද? ඒ මුදල අපි මධ්‍යම රජයෙන් ඉල්ලා ගත යුතුයි කියලයි මම නම් සඳහන් කරන්නේ.

ඒ නිසා ගරු අමැතිතුමාගෙන් මම ඉල්ලීමක් කරන්නේ ඒ සටනට බහින්න. නොදී ඉන්නේ නැහැ. මේ රටේ කෘෂිකර්මය දියුණු කරනවා පමණක් නොවෙයි, ආහාර නිෂ්පාදනයෙන් විදේශ රටවලටත් අදත් අපනයනය කරන රටක් හැටියට, දියුණු කරන්න පුළුවන් රටක් කියන එක, මේ අවස්ථාවේදී මම මතක් කළ යුතු වෙනවා. ඒ වාගේම සෞඛ්‍ය හිතකර පරිසර හිතකාමී වැවිලි අපි වගා කළ යුතු වෙනවා. පාඩුව අඩු කරන, ලාභය වැඩි කරන ක්‍රමවේද අපි හඳුන්වා දෙන්නට වෙනවා. මම හිතන්නේ, ගොවියාට කුලයක් ලබා දෙමින් පාරම්පරික ගොවි රටක් හැටියට හඳුන්වාදෙන මේ ශ්‍රී ලංකාව කුලයත් එක්ක ගොවිකමත් කරන මේ රටේ අද නවීන ක්‍රමවේදයත් එක්ක අනිකුත් ව්‍යාපාර අරගෙන බැලුවාම, කොණ්ඩය කපන ක්ෂේත්‍රයටත්, අනෙකුත් ජනතාව එකතු වෙනවා. ඒකත් අද හැඩයක් හැටියට පත් වෙලා තිබෙන කාලයක කෘෂිකර්මය නවීන පන්නයෙන් නොගිය නිසා තමයි අද ජනතාව කෘෂිකර්මයෙන් ඈත් වන තත්ත්වයකට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි බස්නාහිර පළාත් සභාවෙන්වත් ආදර්ශයක් විය යුතු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ට්‍රැක්ටර් යන්ත්‍ර, අලුත් යන්ත්‍රෝපකරණ, අඩු පොලියට හරි ලබා දෙන්නට කටයුතු කරලා ඒ කෘෂිකර්මාන්තයේ සංවර්ධන කටයුතු කරන්නට අවස්ථාවක් ලබා දිය යුතුයි. ඒ වාගේම 2017 අයවැයේදී බොහොම පැහැදිලිව සඳහන් කරනවා, නිෂ්පාදන සැකසීම, දිරි ගැන්වීමට වැඩ සටහන් ස්ථාන 35 ක් වැඩි දියුණු කිරීම. ඒ වාගේම දියර කිරි පරිභෝජනය ප්‍රචලිත කර ගෙන පාසල් සිසු දරුවන් දැනුවත් කිරීම් වැඩ සටහන් 51 ක් සඳහන් වෙලා තිබෙනවාය කියලා. පලතුරු ගත්තාම රඹුටන්, අන්නාසි, වැල් දොඩම්, කෙසෙල් වැනි දේවලුත් ප්‍රචලික කිරීමේ වැඩ සටහන් දියත් කරලා තිබුණත් අද රට වටේ මාළු ගැන විතරක් අපි කථා කරනවා. හැබැයි, මේ ඇල්ගී වැනි මුහුදු ජීවීන් - චීන රට අරන් බැලුවාම චීන ග්‍රාස් කියලා මුළු ලෝකයටම කන්න දෙනවා මුහුදෙන් ගන්න කෑම ජාතියක්. Nutrition එහෙම නැත්නම් පෝෂණය වැඩි කෑම මේ මුහුද තුළ තිබෙනවා. මම හිතන්නේ, අපේ අපේ පළාත් සභාවේ නොවෙයි. මුළු රටේම, මධ්‍යම රජයවත් ඒ පිළිබඳව වැඩ පිළිවෙළක් දියත් කරලා නැහැයි කියන එක කනගාටුවෙන් හරි මතක් කරන්නට ඕනෑ. ඒ නිසා මම එම අමාත්‍යාංශයේ ලේකම්තුමාට දැනුම් දෙනවා. මේ මුහුදු ජීවීන් ගැන. ඒ කියන්නේ කෑමට ගන්නා මාළු පමණක් නොවෙයි, ඒ මුහුදු ජීවීන් ගැනත් හඳුන්වාදීමක් කළ යුතුයි. මේ සභාවේ, එහෙම නැනම් මේ රටේ ඉන්න අය දැකලත් නැති කෑම තිබෙනවා. ලෝකයේ අපිත් දැකලා නැති කෑම වර්ග ගොඩක් තිබෙනවා. මුහුදෙන් ගන්නා මේ කෑම ටික, සී වීඩ්. සී ෆුඩ් ඒ නිසා ගරු අමාත්‍යතුමනි, මේවාත් හඳුන්වාදීමක් කළ යුතු වෙනවා. ඔබතුමාගේ ඉදිරි වැඩ සටහන් තුළ මෙවැනි කාර්යයන් ඉටු වෙන්න ඕනෑය කියලා මම බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ධීවර ව්‍යාපාරය අරන් බැලුවාම මම හිතන්නේ, මම පළාත් සභා මන්ත්‍රීවරයෙකු හැටියට විසි දැල් දෙකකට සීමා වුණු මන්ත්‍රීවරයෙක්. බේරුවල නියෝජනය කරන්නේ. ඔබතුමා නොවෙයි. හිටපු අමාත්‍යතුමා විසි දැල් දෙකක් දුන්නා. මගේ ඉතිහාසයේ අවුරුදු දෙකහමාරටම විසි දැල් දෙකක් එක්ක, බේරුවල ධීවර ජනතාවත් එක්ක දේශපාලනය කරන්න හම්බ වුණු එක ගැන මගේ කනගාටුවත් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න වෙනවා.

[ ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බේරුවල ධීවර වරාය තමයි ලංකාවේ දෙවැනි විශාලතම මාළු ප්‍රමාණයක් අල්ලන ධීවර වරාය. ත්‍රිකුණාමලය වරාය විශාලත්වයෙන් වැඩි වුණත් ත්‍රිකුණාමලය වරායට වැඩියෙන් මාළු අල්ලන ධීවර වරාය තමයි බේරුවල ධීවර වරාය. හැබැයි, මම කනගාටු වෙනවා. ඒ වාගේම මම ප්‍රශංසා කරනවා' මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා ධීවර අමාත්‍යවරයා වශයෙන් සිටි කාලයේ බේරුවල ධීවර වරාය සංවර්ධනය කළා. 2002 දී එක්සත් ජාතික පක්ෂ රජය තුළ නැවතත් ධීවර වරාය විශාල පරිවර්තනයක් ඇති කරමින්, අද ඒ ධීවර වරාය වැඩි දියුණු කරන්නට අවස්ථාවක් උදා වුණා. මම හිතන්නේ, වත්මන් ධීවර අමාත්‍යතුමාගෙන් මම ඉල්ලා සිටිනවා. බස්නාහිර පළාතේ බේරුවල මැතිවරණ කොට්ඨාශය ගැන විශේෂ අවධානයක් යොමු කරන්න. ඒ වාගේම බේරුවල, කළුතර, පානදුර ප්‍රදේශයේ බෙල්ට් එක ගැනත් විශේෂ අවධානයක් යොමු කරන්න කියලා මම ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ මිලියන තුන හතර ගැන හිතන්න එපා. ගරු අමාත්‍යතුමනි, ඔබට අවශ්‍ය මුදල කොපමණද? ඔබතුමාට මුදල් අමාත්‍යතුමා හරහා ගිහිල්ලා ඒක ලබා ගන්න පුළුවන් කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරනවා. මේ රටේ සංවර්ධනය දකින සෑම මොහොතකම ඒ මුදල් ලබා ගත යුතු වෙනවා. ඒ නිසා ඒ ගැන දුක් වෙන්නට එපා. ලේකම්තුමා දක්ෂ නම්, ඔබතුමා දක්ෂ නම් ඒ මුදල් බස්නාහිර පළාත් සභාවට ගලාගෙන එන්නට මාර්ගය කපන්න පුළුවන් කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

ඒ වාගේම සත්ව නිෂ්පාදනය ගැන බලන කොට ගවයින්, මී හරක් සහ එළුවන් ගැන සංඛ්‍යා ලේඛන අනුව සඳහන් වෙලා තිබෙනවා, එළුවන්, මී හරක් සහ ගවයින් 120,000 ක් ඉන්නවාය කියලා. මම හිතන්නේ, මේ සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරලා ඇත්තේ, ඍජුවම ගෙවල්වල තිබෙන ඒවා එකතු කරලාද නැද්ද කියන එක මම දන්නේ නැහැ. නමුත් කිරි ලීටර මිලියන 31 ක් බස්නාහිර පළාත මේ රටට ලබා දෙනවා. හැබැයි, කිලි ලීටර මිලියන 31 ක් ලබා දෙන කොට මේ සභාවේ මේ කිරි ටික කොහොමද අපි එකතු කරන්නේ. මේ කිරි ටික කොහොමද අපි ජනතාව අතර පරිහරනය කරන්නට ලබා දෙන්නේ කියන එක කිසිම වැඩ පිළිවෙළක් නැහැයි කියන එකත් මේ අවස්ථාවේදී මම කනගාටුවෙන් මතක් කළ යුතු වෙනවා.

ඒ වාගේම 2016 වසරට රුපියල් මිලියන 104.39 ක් මේ අමාත්‍යාංශයට වැය කරලා, මේ සත්ව නිෂ්පාදනයට පමණක් වියදම් කරපු මුදල අද 92% කින් කප්පාදු කරලා, රුපියල් මිලියන 55 කට බස්සලා තිබෙනවා. මේවා බෙදලා ගණන් හදලා බැලුවාම කිරි ලීටරය - මම හිතන්නේ පඩි නඩි බෙදන්නවත් මේ මුදල ප්‍රමාණවත් නැති කොට මේක කිරි ගවයින් හරහා බෙදලා බැලුවා නම් රු. 2.30 ක ප්‍රමාණයක් තමයි මේ රුපියල් මිලියන 144 තිබෙන කාලයේත් වියදම් වෙලා තිබෙන්නේ. එහෙම නම් රුපියල් මිලියන 55 කට බස්සනවා නම්, මේ ගෞරවනීය සභාව මධ්‍යම රජයට අණ කළ යුත්තේ - මේ රටේ ජනතාවට කන්න දෙන්න තිබෙන අමාත්‍යාංශය. මේ රටේ කන්න දෙන එළවළු ටික, මේ කුඹුරු ටික, ධීවර ව්‍යාපාරයේ නියැලෙන අයගේ ආර්ථිකය නගා සිටුවන්නේ කොහොමද කියලා තර්ක කළ යුතු වෙනවා. ඒ නිසා මේවා අපි කථා කරලා විසඳගන්න පුළුවන් කාරණා වෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පක්ෂ පාට භේදයක් නැහැ. අපි ඒකමතිකව තීන්දු කරලා හමාරයි බස්නාහිර පළාත් සභාවේ අයවැයේදී සහයෝගය දෙන බව. මධ්‍යම රජයත් එක්ක සාකච්ඡා කරලා අරෙහෙන් කැපුවා, මෙහෙන් කැපුවා කියලා කියන්නේ නැතිව, කපපු දේ නැවතත් ඉල්ලා ගෙන ඊටත් වඩා මුදලක් ලබා ගෙන ඉදිරි 2017 වසරේදී සාරවත් භූමිය සංවර්ධනය කරලා මේ රටේ අනාගතය වෙනුවෙන් කෘෂිකර්මය නගා සිටුවලා, අනෙකුත් අමාත්‍යාංශ ධීවර, සත්ව නිෂ්පාදන ඇතුළු සියලුම අමාත්‍යාංශ හරහා ගරු අමාත්‍යතුමා සතු ඉඩම් අමාත්‍යාංශයේ වැඩ පිළිවෙළත් දියත් කරන්නට මේ බස්නාහිර පළාත් සභාවේ තිබන හිඟ බද්ද කෝටි 150 ක්. ඒ හිඟ බදු ලබා ගෙන මේ සංවර්ධන කටයුතු කරන්න පුළුවන් කියන එක ගරු අමාත්‍යතුමාට අවධාරණය කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට යසපාල කෝරළගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමාට අවස්ථාව ලබා දෙනවා. ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 04.16]

**ගරු යසපාල කෝරළගේ -** නියෝජ්‍ය සභාපතිතුමා
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය, සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශය යටතේ අදහස් දැක්වීමට විනාඩි කිහිපයක් හරි ලැබීම පිළිබඳව මම බොහොමත්ම සතුටු වෙනවා. මේ සභාව පුරාම ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා වර්තමාන කෘෂිකර්ම අමාත්‍යවරයා ගෙන යන වැඩ පිළිවෙළ පිළිබඳව බොහොම ප්‍රශංසාවට ලක් කළා. ඒ එක්කම මම අහගෙන හිටියා. සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමා දිගින් දිගටම පෙන්වා දුන්නා, කෘෂිකර්ම අමාත්‍යාංශයට ඉතාමත්ම සුළු මුදලක් ලැබිලා තිබෙන්නේ. මේ මුදල තුළ අපි බලාපොරොත්තු වන අලුත් වැඩ සටහන් ක්‍රියාත්මක කරන්න බොහොම අපහසු වෙනවාය කියන එක පිළිබඳව. කෙසේ වෙතත් අපේ වර්තමාන කෘෂිකර්ම අමාත්‍ය ගාමිණී තිලකසිරි මැතිතුමා ඉතාම පලපුරුදු සහ දක්ෂ අමාත්‍යවරයෙක් වශයෙන් පසුගිය කාල සීමාව තුළදී අපි දැක්කා, එතුමා ආණ්ඩු පක්ෂයේ විපක්ෂයේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාව ඒකරාශී කර ගෙන, ලේකම්තුමා ඇතුළු නිලධාරී මණ්ඩලයේ සියලු දෙනා ඒකරාශී කර ගෙන කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් බස්නාහිර පළාත් සභාවට ඉතාම සාර්ථක ප්‍රතිඵලයක් ලබා දෙන්න උත්සාහ කළ අයුරු.

සියලු අමාත්‍යාංශ එක්ක බලන කොට කෘෂිකර්ම අමාත්‍යාංශය තමයි මම හිතන්නේ, වැඩිම උපදේශක කාරක සභා සංඛ්‍යාවක් පැවැත්වුවේ. ඒ හැම උපදේශක කාරක සභාවේදීම ගරු ඇමැතිවරයා උත්සාහ වුණා, මන්ත්‍රීවරුන්ගේ අදහස් මොනවාද? මේ හරහා මොනවාද අලුත් දේවල් මේ ක්ෂේත්‍රය තුළ හඳුන්වා දෙන්න පුළුවන් කියන එක පිළිබඳව. ඒ විතරක් නොවෙයි. ඇමැතිවරයා උත්සාහ වුණා, ගරු ඇමැතිතුමා ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාව ප්‍රායෝගිකව ඒ කෘෂිකර්ම මධ්‍යස්ථානවලට එක්කගෙන ගිහිල්ලා මහා විශාල දැවැන්ත ගොවිපළවල්වලට එක්කගෙන ගිහිල්ලා සත්ත්ව නිෂ්පාදනය සහ කෘෂිකර්ම නිෂ්පාදනය නගා සිටුවීමට අලුත් අදහස් සහ අලුත් මත මේ සභාව තුළට ගෙනෙන්න එතුමා පසුගිය කාලයේ උත්සාහ වුණා. ඒවායේ ප්‍රතිඵල වශයෙන් තමයි අද මම හිතන්නේ කෘෂිකර්ම අමාත්‍යවරයාට, ඒ අමාත්‍යාංශයට, ඒ නිලධාරි මණ්ඩලයට මේ ආකාරයේ ප්‍රශංසා හිමි වන්නේ. නැත්නම් මෙපමණ අඩු මුදල් ප්‍රමාණයකින් වැඩ කරගෙන යන කොට මන්ත්‍රීවරු අතර මතබේද ඇති වෙනවා. අමාත්‍යාංශවල මත බේද ඇති වෙනවා. ඒ සියල්ලක් පසක දාලා ඇමැතිවරයාත් එක්ක අලුත් දෙයක් කරන්න ඕනෑය කියන තීන්දුවක සියලු දෙනා ඉන්නේ, ඒක නිසා කියලයි මම හිතන්නේ.

මට මතකයි, ගොවි පොළවල් බලන්න ගිය අවස්ථාවේ අපි බොහොම කථා බහකට ලං වුණා. කෘතිම සිංචන වැඩ සටහන. මම හිතන්නේ ගරු ඇමැතිතුමා දැකලා තිබුණෙත් නැහැ. අපි දැකලා තිබුණෙත් නැහැ. එළියට ඇවිල්ලා ගරු ඇමැතිතුමා කිව්වා, මහා සත්ත්ව හිංසාවක් නේ මල්ලි මේ කරන්නේ කියලා. සතුන්ගේ අයිතිවාසිකම නැති කරන්නේ කියන එක පිළිබඳව කිව්වා. අපි මීට කලින් දැකලා තිබුණේ නැහැ. ඒක නිසා අලුත් දේවල් පෙන්නලා, විනෝදය ලබා ගන්න වාගේම ඒ පිළිබඳව අධ්‍යයනය කරන්න අවස්ථාවල් සැලසුවා. ඒ නිසා මම විශ්වාස කරනවා. බස්නාහිර පළාත් සභාවේ ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා අලුත් දේවල් හදන්න වැඩ පිළිවෙළක් 2017 අවුරුද්දේ ගෙනෙයි කියලා. එතුමා වගා පැත්ත ගැන බැලුවා. එක දෙයක් හරි කරලා පෙන්වන්න ඕනෑය කියලා. ලක්ෂ 05 ක් කොස් පැළ වගා කරන්න ඕනෑය කියලා යම්කිසි අරමුණක් ඇතිව අද ඒ වැඩ සටහන මහා විශාල ආකාරයෙන් දියත් කරගෙන යනවා. ඒ වාගේම මම ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමාට කියනවා. පුළුවන් නම් අර ඒ සත්ත්ව ගොවිපළ පැත්ත බැලුවාම හොඳ සතුන් මේ බස්නාහිර පළාතට හඳුන්වා දෙන්න. කුකුළන් වෙන්න පුළුවන්. ඌරන් වෙන්න පුළුවන්. එළුවන් වෙන්න පුළුවන්. හරක් වෙන්න පුළුවන්. ඒ සියලු දේවල් යම් කෙනෙකුට ඇවිල්ලා බලන්න පුළුවන් මට්ටමේ, වෙනත් පළාත්වල ඉන්න ගොවීන්ට බස්නාහිර පළාතේ සත්ත්ව ගොවිපල බලන්න යනවා කියලා ඇවිල්ලා බලන්න පුළුවන් මට්ටමේ හොඳ සාර්ථක සතුන් ඉන්න හොඳ සත්ත්ව ගොවිපළක් සහ ඒ වාගේම බස්නාහිර පළාත් සභාවේ අන්න අපි අහවල් ගොවිපළ බලන්න යනවා.

පළාත් සභාවෙන් ගෙනියන ගොවිපළ බලන්න යනවා කියලා බලන්න පුළුවන් හොඳ ගොවිපළක් නිර්මාණය කරන්න ඔබතුමාට ශක්තිය, ධෛර්යය වාසනාව ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

ඒ එක්කම අපේ හැම ග්‍රාමසේවා වසමකම කෘෂිකර්ම නිලධාරී මහත්මයෙක් ඉන්නවා. එතුමාගේ සේවය මම හිතනවා, ගරු ඇමැතිතුමනි අපි අරගන්නේ නැහැ. ගොවීන්ට ලබා දෙන්නේ නැහැ. ඒ අයව මීට වඩා ශක්තිමත් කිරීමක් කරලා, මීට වඩා දැනුවත් කිරීමේ වැඩ සටහනක් බස්නාහිර පළාත් සභාව තුළින් කරන්න ලැහැස්ති වෙනවා නම්, වැඩ පිළිවෙළක් සකස් කරනවා නම් බොහොම හොඳයි කියන එකත් මම ප්‍රකාශ කරනවා. ඒ එක්කම හැම ගමකම කෘෂිකර්ම නිලධාරී මහත්මයෙක් ඉන්නවා නම් ඒ කෘෂිකර්ම නිලධාරී මහත්මයාගේ නිවස, එහෙම නැත්නම් එයාගේ කාර්යාලය කෘෂිකර්ම කාර්යාලයක් බවට පත් වෙන්න ඕනෑ. ඒ හැම ග්‍රාමසේවා වසමකම එතකොට කෘෂිකර්ම උපදේශක කාර්යාලයක් තිබෙනවා. එලෙස කාර්යාලයක් බවට පත් කරගෙන යන්න, ඒ අය ශක්තිමත් කරන්න, ඒ අයට අවශ්‍ය කරන සම්පත් ලබා දෙන්න මධ්‍යම රජයත් එක්ක එකතු වෙලා හරි වැඩ පිළිවෙළක් ගෙනි යන්න කියන ඉල්ලීම මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ තුළින් මේ ක්ෂේත්‍රය තුළට අලුත් දෙයක් ලබා දෙන්න අපට පුළුවන්කමක් වෙයි.

මම ගිය 2016 අවුරුද්දේපෙන්වා දුන්නා.අපි ලොකු කුඩා ගොවීන් වෙන්න පුළුවන්. නැත්නම් රජයේ උසස් නිලධාරීන් වෙන්න පුළුවන්. ව්‍යාපාරිකයන් වෙන්න පුළුවන්. මේ අපි හැම කෙනෙක්ම කැමැතියි, අපේ දෑතින් ගහක් හිටවලා, නැත්නම් වගාවක් ඇති කරලා, ඒකේ එලදාවක් අරගෙන ආහාරයට ගන්න. ඒ නිසා ම ගිය අවුරුද්දේ පෙන්නලා දුන්නා, අපේ ගෙවතු වගා ක්‍රමයක් සකස් කරන්න. මේ සෑම කෘෂිකර්ම නිලධාරී මහත්මයෙකුටම යම් අමතර ආදායමක් එන ක්‍රමයක් මම හඳුන්වලා දුන්නා. යම් ගෙදරක තිබෙන්නේ පර්චස් 01 ක් වෙන්න පුළුවන්. පර්චස් 02 වෙන්න පුළුවන්. නැත්නම් පර්චස් 05 ක්, 06 ක් වෙන්න පුළුවන්. මහා විශාල ගොවිපළවල් ගැන නොවෙයි මම මේ කථා කරන්නේ. තමන්ගේ ගෙවත්තේ ඒ තිබෙන ඉඩකඩ සීමාව මත වගාවක් ඇති කරන්න යම් Package එකක් හදන්නය කියලා. මම බොහොමත්ම ස්තුතිවන්ත වෙනවා. අපේ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂතුමා එවැනි Package තුනක් හරි ගස්සලා අපට එව්වා. මෙන්න මේ පැළ සංඛ්‍යාව, මෙන්න මේ ඉඩ ප්‍රමාණය මත මෙන්න මේ ආකාරයෙන් වගා කරන්න රුපියල් 10,000/- යි යන්නේ. මෙන්න මේ පර්චස් ප්‍රමාණය මත මෙන්න මේ පැළ ප්‍රමාණය අඩි ප්‍රමාණයක් කරා ගෙනියන්න මෙන්න මෙහෙමයි කියලා Package තුනක් එව්වා. මම ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ගරු ඇමැතිතුමනි, ඒ Package එක ක්‍රියාත්මක කරන්න, ඒ කුඩා ගෙවතු ටික ක්‍රියාත්මක කරන්න මේ 2017 අවුරුද්දේ මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිපාදනවලින් සීමාවක් ඇතිව එකම මන්ත්‍රීවරයෙකුට අඩුම ගණනේ ගෙවතු තුනක්වත් හරි ගස්ස ගන්න මුදල් වෙන් කිරීමේ හැකියාව මේ අයවැය තුළින් සකස් කිරීමේ අවස්ථාව ඔබතුමාට පෙන්වා දෙනවා. මන්ත්‍රීවරු සියලු දෙනාම එහෙම කළාට පස්සේ, මන්ත්‍රීවරුන් ඒ ලබා දෙන ගොවිපළවල් අතර, කුඩා ගෙවතු අතර තරගයක් ඇති කරලා ඒ අය තව තවත් දිරි ගැන්වීමේ වැඩ පිළිවෙළක් සකස් කරන්න පුළුවන්කමක් ඇති වෙයි කියලා මා විශ්වාස කරමින්, ඔබතුමන් මේ සියලු ගරු මන්ත්‍රීවරුන් එක්ක, විශේෂයෙන්ම ලේකම්තුමා ඇතුළු නිලධාරී මණ්ඩලයත් එක්ක, කෘෂිකර්ම අධ්‍යක්ෂතුමන් එක්ක, මේ ගෙනියන සුහදශීලී කෘෂිකර්ම දැවැන්ත වැඩ සටහනට අපේ සුභ පැතුම්, අපේ ආශිර්වාදය, අපේ සහයෝගය ලබා දෙනවා කියන එක ප්‍රකාශ කරමින්, ඔබතුමා ගෙනි යන වැඩ පිළිවෙළට බොහොමත්ම ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 14 ක කාලයක් තිබෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, මගේ විනාඩි 14 න් විනාඩි 07 ක් අපේ හිටපු සෞඛ්‍ය අමාත්‍ය නිශාන්ත වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට ලබා දෙන්නය කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මම හතක් කථා කරනවා. එතුමා හතක් කථා කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමාවෙන්න. ඔබතුමාට විනාඩි 10 ක් තිබෙනවා. සුමිත් විජයමුණි ද සොයිසා ගරු මන්ත්‍රීතුමාට විනාඩි 04 ක් දෙන්නය කියලා ගරු ඇමැතිතුමා ඉල්ලීමක් කරලා තිබෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මගේ වෙලාවෙන් භාගයක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට එතකොට විනාඩි පහයි ගන්න පුළුවන් වන්නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

හරි. පහක් ඇති. එතුමාට පහක් දෙන්න. මට පහක් දෙන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

එතුමාට දීලා ඉන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සුමිත් විජයමුණි ද සොයිසා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා. ඔබතුමා වෙලාවටම කථාව අවසන් කරන්න.

[අ.භා. 04.26]

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි, අපේ පළාත් සභාව තුළ පාර්ලිමේන්තුව නියෝජනය කළ අතේ ඇඟිලි ගණනට නියෝජනය වන මන්ත්‍රීවරුන් අතරින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් විධියට හිටපු ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා ඒ අත්දැකීම් එක්ක ඔක්තෝබර් 31 වැනිදා වන විට ස්වකීය අමාත්‍යාංශයේ ඉහළම ප්‍රගතිය වාර්තා කරපු ඇමැතිවරයා විධියට තමයිමා දකින්නේ. මා එසේ කියන්නේ, අපට ඔක්තෝබර් 31 වැනිදා ත්‍රිකුණාමලයේදී දුන්නු අමාත්‍යාංශ ලේකම් බලධාරී ව්‍යාපෘතින්, පළාත් නිශ්චිත ව්‍යාපෘතින්, සංවර්ධන ප්‍රදාන සහ තුලිත සංවර්ධන මේ සෑම ප්‍රතිපාදනවල භෞතික සහ මූල්‍ය ප්‍රගතිය ඉහළ ස්ථානයකට ගෙන ගියා වාගේම නොවැම්බර් 01 වැනිදා වන විටත් සියයට අසූ ගණන්වලට ප්‍රගතිය වාර්තා කරලා තිබෙනවා කියන එකත් ආඩම්බරයෙන් යුතුව මේ මොහොතේ මතක් කරනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, අපේ පළාත තුළ වී වගාවේ ඵලදායීතාවය වී බුසලට බුසල් 68 යි. මේ වී බුසලට බුසල් 68 ක් අඩුම තරමින් බුසල් 80 ක් දක්වා 2017 වසරේ වර්ධනය කර ගැනීමේ උපාය මාර්ග වෙත අපි යොමු විය යුතුයි.

ගරු සභාපතිතුමනි, මෙය බුසලට 99 ක් දක්වා අද දකුණු පළාත් සභාව ඉදිරියට ගෙන ගිහින් තිබෙනවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, පශු වෛද්‍ය කාර්යාල දෙකක්, ගොවිජන සේවා මධ්‍යස්ථාන දෙකක් නියෝජනය වන කොළඹ දිස්ත්‍රික්කයේ මා නියෝජනය කරන ආසනය,කෘෂිකාර්මික ප්‍රදේශය හෝමාගමත් සමඟ අරගෙන බැලුවාම වාගේම ඉතාම ද්වන්ධ ලෙස, කුරිරු ලෙස කැලණි ගඟේ පීඩාව විඳිනවා කියන එකත් මේ මොහොතේ මතක් කරන්න ඕනෑ. කැලණි ගඟෙන්, කළු ගඟෙන්, දඬු ගඟෙන් විශාල කෘෂි හානියක් සිද්ධ වෙනවා. මේ කෘෂි හානියට උපාය උපක්‍රම මධ්‍යම රජයේ වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශයත් සමඟ එක්ව දේශගුණික බලපෑම් අවම කිරීමේ ක්‍රිප් කියන ව්‍යාපෘතියත් සමඟ පළාත් සභාව වඩාත් අර්ථවත් තැනකට ගෙන යන්නට අපට පුළුවන්කම තිබෙනවා කියන එක මේ මොහොතේ ගරු ඇමැතිතුමාගේ අවධානය සඳහා යොමු කරනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, සමස්ත රටේම රඹුටන් සහ අන්නාසි වගාවේ යෝධයා වන්නේ බස්නාහිර පළාත් සභාව. බස්නාහිර පළාත් සභාව සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තය වාගේම එවැනි ආර්ථික භව භෝග වෙනුවෙන් උපාය උපක්‍රමිකව වෙනස්ව, ගොවි බිම් වඩාත් අර්ථවත් ලෙස තරුණ ගොවීන් ග්‍රහණය කර ගැනීමේ උපාය මාර්ගවලට එක් විය යුතුයි කියන විශ්වාසයේත් අපි ඉන්නවා. ඒ බවත් මතක් කරමින්,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මම ඔබතුමා හරහා ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා. අපේ පළාතේ සත්ත්ව නිෂ්පාදනයේ යෝධයෝ, ඒ වාගේම සත්ත්ව නිෂ්පාදනයට ඉඩකඩ, ඒ වාගේම කෘෂි කර්මාන්තයට ඉඩකඩ තිබෙන අපේ ප්‍රදේශය මුල් කරගෙන කෘෂිකාර්මික පුහුණු පාසලක - සමස්ත දිස්ත්‍රික්ක තුනටම මැදි වෙලා තිබෙන, එක පැත්තකින් සියනෑ කෝරළය, තව පැත්තකින් කළුතර යන්න පුළුවන් මාර්ග ප්‍රවේශයන් තිබෙන, මාර්ග මරමස්ථානයක් වුණු සීතාවක ප්‍රදේශයේ අංග සම්පූර්ණකෘෂිකර්මපාසලක්බිහි කරන්න 2017 වසරේ ප්‍රතිපාදන වෙන් කරන්නය කියන ඉල්ලීමත් කරමින්, තවත් එක් කරුණක් විතරක් කියන්න අවස්ථාව ඉල්ලා සිටිනවා. මෑතකදී මී උණ නිසා අපේ ආසනයේ සාම්ප්‍රදායික ගොවියෙක් මිය යනවා. මේ ගොවියාගේ ජීවිත වටිනාකම අපේ ජීවිත වාගේ දහස් ගණනක් වෙන්න පුළුවන්. මේ මී උණින් ගොවි බිමට, කුඹුරට පය තබන ගොවියා ආරක්ෂා කරන්න සෞඛ්‍ය අමාත්‍යාංශයත් සමඟ කෘෂි පර්යේෂණ නිලධාරීනුත් සමඟ එක්ව ඒකාබද්ධ ව්‍යාපෘතියකින් මේ සාම්ප්‍රදායික ගොවියාගේ ජීවිත ආරක්ෂා කරගන්න වැඩ පිළිවෙළකට කෘෂිකර්ම අමාත්‍යාංශයේ අවධානය යොමු විය යුතුයි කියන එක මතක් කරමින් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථාව අවසන් කරන්න. කාලය පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ඔබතුමා හදිසියේ කාලය ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 04.31]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ගරු සභාපතිතුමනි, අපේ ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා කියන්නේ මේ සභාවේ ඉන්න පරිණත, ඒ වාගේම අත්දැකීම් බහුල ඇමැතිවරයෙක්. එතුමා වෙනුවෙන් වචන ස්වල්පයක් කථා කිරීමේ අවශ්‍යතාවයක් තිබුණා. නමුත් වේලාව පිළිබඳව ගැටලුවක් තිබෙන නිසා විපක්ෂයේ අපේ කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා මට විනාඩි 05 ක කාලයක් ලබා දුන්නා. මට ඒ වෙලාව ලබා දීම සම්බන්ධයෙන් පළමුවෙන්ම මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. අපේ ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා මේ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ සුවිශාල සේවයක් ඉෂ්ට කරමින් තිබෙනවා. නමුත් පැහැදිලිවම කියන්න ඕනෑ. අද අපේ අතිගරු ජනාධිපතිතුමාත්, ඒ වාගේම ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් ඉතා පැහැදිලිව මේ රටේ කෘෂි ප්‍රතිපත්තියේ ව්‍යුහාත්මක වෙනසක් කරන්න අද යෝජනා කරලා තිබෙනවා. ඒ අනුව අපේ කෘෂි කර්මාන්තයේ අද අපට වස විසෙන් තොර ගොවි තැනකට මේ රටේ කෘෂිකර්මාන්තය ගෙන යන්න අවශ්‍ය වෙලා තිබෙනවා. එයයි අපේ ජාතික ප්‍රතිපත්තිය බවට පත් වෙලා තිබෙන්නේ. ඇතැමුන් ප්‍රකාශ කරනවා, අද අපේ රටේ සහල් හිඟයක් ඇති වෙමින් තිබෙනවා. වී වගාව අනතුරට වැටිලා කියලා. නමුත් පැහැදිලිව කියන්න ඕනෑ. අද මේ රටේ සහල් අතිරික්තයක් තිබෙනවා. අපි සහල් වලින් ස්වයං පෝෂිත වෙලා තිබෙන්නේ. ඒ වාගේම අපි බඩඉරිඟු වලින් ස්වයං පෝෂිත වෙලා තිබෙන්නේ. ඒ වාගේම එළවළුවලින් සහ පළතුරුවලින් ස්වයං පෝෂිත වන්න අද අපට අවශ්‍යයි. වසරකට අපි මිලියන 2000 කට ආසන්න ප්‍රමාණයක් මුදල් පිටරට යනවා. ඒ මොකටද? විශේෂයෙන්ම අපි කියන්න ඕනෑ, මේ බස්නාහිර පළාතේ තමයි විශාලම මධ්‍යම පන්තියක් ඉන්නේ. මේ මධ්‍යම පන්තියේ පරිභෝජනයට පළතුරු සඳහා, විශේෂයෙන්ම ඇපල්, ඒ වාගේම කහ දොඩම්, මිදි වැනි දේ ගෙන ඒම සඳහා වර්ෂයකට අපට මිලියන 2000 ක මුදලක් වෙන් කරන්න සිදු වෙලා තිබෙනවා. ඒ නිසා බස්නාහිර පළාත තුළ අපේ කෘෂි ප්‍රතිපත්තියේ පැහැදිලි ප්‍රතිපත්තිමය වෙනසක් අවශ්‍යයි. ව්‍යුහාත්මක වෙනසක් අවශ්‍යයි. වස විසෙන් තොර ගොවි තැනකට මේ රට ගෙනි යන්න ඕනෑ. එහිදී විශේෂයෙන්ම මේ රසායනික ගොවිතැනේ සිට කාබනික ගොවිතැනට අපේ කෘෂි ප්‍රතිපත්තිය වෙනස් විය යුතුව තිබෙනවා. ඒ සම්බන්ධයෙන් මේ සභාව ඇතුළේ විශේෂඥයින් ඉන්නවා. අපේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙක් ඉන්නවා. එතුමාට මේ පිළිබඳව විශේෂඥ භාවයක් තිබෙනවා. අපි ඉල්ලා සිටින්න කැමැතියි, එතුමාගෙනුත් මේ පිළිබඳව දැනුමක්, අවබෝධයක් ලබා ගන්නය කියලා.

ඒ වාගේම විශේෂයෙන්ම අපි කියන්න ඕනෑ. අද අපේ මහ පොළව විෂ වෙනවා කියන්නේ, ජලය විෂ වෙනවා කියන්නේ අනිවාර්යයෙන්ම ආහාර විෂ වෙනවා කියන

එකයි. ඒ නිසා අපි පැහැදිලිව ප්‍රකාශ කරන්න ඕනෑ. අපේ කෘෂි ප්‍රතිපත්තිය අද වෙනස් විය යුතුව තිබෙනවා. එතැනදී අද බස්නාහිර පළාතේ ප්‍රධාන වශයෙන්ම තුන් බියක් පැතිරී යමින් තිබෙනවා. එදා විශාල මහනුවර තිබුණු තුන් බිය තමයි අද බස්නාහිර පළාත තුළ තිබෙන්නේ. මොකක්ද මේ තුන් බිය කියලා කියන්නේ? අද පිළිකාව, දියවැඩියාව, හෘද රෝග තමයි වසංගතයක් විධියට මුළු බස්නාහිර පළාත පුරාම පැතිරී යමින් තිබෙන්නේ. එහෙමනම් මේකට අපේ ආහාර ප්‍රතිපත්තිය, අපේ කෘෂි ප්‍රතිපත්තිය, අපේ ජල ප්‍රතිපත්තිය, පස පිළිබඳව අපේ ප්‍රතිපත්තිය අනිවාර්යයෙන්ම මෙයට බලපානවා. ඒ නිසා ගරු ඇමැතිතුමනි, අපේ කෘෂි ප්‍රතිපත්තිය වෙනස් කළ යුතුව තිබෙනවා. මෙතෙක් කලක් තිබුණේ, රසායනික කෘෂි ප්‍රතිපත්තියක්. රසායනික ගොවිතැනට තමයි ප්‍රමුඛත්වය ලබා දුන්නේ. ඒ නිසා දැන් අපි මෙය වෙනස් කළ යුතුව තිබෙනවා. කාබනික ගොවිතැනට, ධාර්මික ගොවිතැනට, ඒ වාගේම පරිසර හිතකාමී ගොවිතැනකට මේ රට ගෙන යා යුතුව තිබෙනවා. ඒ තුළින් විතරයි අපි බලාපොරොත්තු වන "ආරෝග්‍යා පරමා ලාභා - සන්තුට්ඨී පරමං ධනං" කියන ඒ ප්‍රතිපත්තියට මේ රට ගෙනි යන්න පුළුවන් වන්නේ. සතුටින් ජීවත් වන, ඒ වාගේම හොඳ සෞඛ්‍ය තත්ත්වයෙන් ජීවත්වන ජනතාවක් අපට බිහි කරන්න පුළුවන් වන්නේ. අද ජනාධිපතිතුමාගේ ප්‍රධානම ජාතික වැඩ සටහන බවට පත් වෙලා තිබෙන්නේ වස විසෙන් තොර ගොවිතැනක්. ඒක නිසා සමහර කෘෂි විශේෂඥයින් අද යෝජනා කරනවා, නැවත වතාවක් මේ රසායානික ගොවිතැනට යන්න ඕනෑය කියලා. සමහරු අද ග්ලයිකොපේස්ට් වෙනුවෙන් පෙනී සිටිනවා.

ඒ වාගේම අපි කියන්න ඕනෑ. විශ්ව විද්‍යාලවල ඉන්න ආචාර්ය, මහාචාර්යවරු, විශ්ව විද්‍යාලවල කෘෂිකර්ම පීඨවල ඉන්න අය අද ඉදිරිපත් වෙලා තිබෙනවා, මේ වස විෂ නැවත වතාවක් අපේ ගොවිතැනට අවශ්‍යායි කියලා. ඒ නිසා අපි කියන්න ඕනෑ, අද ලෝකය පුරාම ග්ලයිකොපේස්ට් තහනම් කරමින් තිබෙනවා. අද වකුගඩු රෝගයට ප්‍රධාන වශයෙන් හේතු වෙලා තිබෙන්නේ, මේ කාරණය. ඒ නිසා අනාගතයේදී බස්නාහිර පළාතටත් මේ අනතුර එල්ල වෙන්න පුළුවන්. ඒ නිසා ගරු කෘෂිකර්ම ඇමැතිතුමා ඇතුළු, එතුමාගේ මේ කෘෂි ප්‍රතිපත්තිය තුළට අපියෝජනා කරන්න කැමැතියි. කරුණාකරලා අනාගතයේදී කාබනික ගොවිතැන සඳහා මේ රට යොමු කිරීම සඳහා බස්නාහිර පළාත තුළින් ඒකට අවශ්‍ය කරන ශක්තිය ලබා දෙන්නය කියන ඉල්ලීම කරමින්, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 04.36]

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, අපේ හිතවත් ගරු අමාත්‍ය ගාමිණී තිලකසිරි මැතිතුමාගේ අමාත්‍යාංශය යටතේ වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මම ඉතාමත් සතුටු වෙනවා. ගරු සභාපතිතුමනි, අපේ කෘෂිකර්ම අමාත්‍යාංශයට PSDG, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන වෙන් කිරීමේ වාර්තාවේ සඳහන් කරලා තිබෙන්නේ ඉතාමත්ම අඩු මුදලක්. ඉතාමත්ම අවශ්‍ය කාර්යයක් සඳහා 2017 වසරේදී මේ මුදල් ප්‍රතිපාදන වෙන් කිරීමේදී ඔබතුමාට ලැබිලා තිබෙන්නේ අඩු මුදලක්. ගරු සභාපතිතුමනි, ගරු අමාත්‍යතුමාගේ දක්ෂතාවය මත අපි දන්නවා, එතුමාගේ උපදේශක කාරක සභාවේ ඉන්න සියලුම ගරු මන්ත්‍රීවරු 20 දෙනයි, ඒ විසි දෙනා සමඟ එකතු වෙලා ඔබතුමාට මේ කෘෂි කර්මාන්තය ශක්තිමත් කරන්න, වාරිමාර්ග සංවර්ධනය කරන්න, ඒ වාගේම සත්ත්ව නිෂ්පාදන වැඩ සටහන ක්‍රියාත්මක කරන්න ඉතාමත් හොඳ ලේකම්වරු ඇතුළු පළාත් රාජ්‍ය සේවාවේ නිලධාරීන් විශාල සංඛ්‍යාවක් සිටිනවා. ඒකෙන් මම දන්නවා, ගරු අමාත්‍යතුමා මේ වැඩ සටහන ක්‍රියාත්මක කරන්න ඉතාමත් සැලසුම් සහගතව සකස් කරගෙන යනවා කියලා.

ගරු සභාපතිතුමනි, අපට මධ්‍යම ආණ්ඩුවෙන් ලබා දෙන මූල්‍ය ප්‍රතිපාදන වැඩි කර ගැනීම සඳහා බස්නාහිර පළාතේ මූල්‍ය කළමනාකරණය පිළිබඳව ආදායම් වැඩි කර ගැනීමේ වාර්තාවක් අපේ මේ පොතට ඇතුළත් කරලා තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශයට හිඟ ඉඩම් බදු මුදල් පමණක් මිලියන 1820 ක් අය කර ගැනීමට තිබෙනවා. මිලියන 1820 ක් ඔබතුමාගේ අමාත්‍යාංශයට හිඟ ඉඩම් බදු මුදල් සඳහා ලබා ගන්න තිබෙනවා. අනික් පැත්තෙන් පළාත් සභාවට අයත් ඉඩම් පිළිබඳව ආදායම් වැඩි කර ගැනීමේ ක්‍රියා මාර්ගයක් අපට පෙන්නුම් කරලා තිබෙනවා. පළාත් සභාවට අයත් ඉඩම් බදු දීම. මෙන්න මේ ඉඩම් බදු දීම ඒ ඉඩම්වල බදු මුදල් අය කර ගැනීම ක්‍රියාත්මක කළොත් මම හිතන්නේ ඔබතුමාගේ අමාත්‍යාංශය 2017 වසරට අපට ලබා දීලා තිබෙන මූල්‍ය ප්‍රතිපාදනවලට වැඩිය විශාල වැඩ කොටසක් කරන්න පුළුවන්කමක් ඇති වෙයි කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

[ ගරු කිත්සිරි කහටපිටිය]

ඊළඟට ගරු සභාපතිතුමනි, මම ඉතාමසතුටු වෙනවා, ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමාගේ මධ්‍යම ආණ්ඩුවේ ජාතික ආහාර නිෂ්පාදන වැඩ සටහනට ඇතුළත් වන ආකාරයට එතුමා මේ පළාත් සභාවේ කොස් පැළ ලක්ෂ 10 ක් සිටුවීමේ ව්‍යාපෘතියක් -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ලක්ෂ 05 යි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ලක්ෂ 05 ක් සිටුවීමේ ව්‍යාපෘතියක් එතුමා ආරම්භ කළා. එහෙමනම් අන්න ඒ ජාතික ආහාර නිෂ්පාදන වැඩ සටහන ක්‍රියාත්මක කරවීමේදී එතුමා ඒ අරගත්ත තීරණය ක්‍රියාත්මක කරන කොට අපි දන්නවා, ඒ ජාතික ආහාර නිෂ්පාදන වැඩ සටහන යටතේ මේ පළාතේ ජනතාවට - එක පුද්ගලයෙකුට දිනකට පළතුරු ග්‍රෑම් 100 ක් ආහාරය සඳහා අවශ්‍යයි. ඒක ජාතික ආහාර නිෂ්පාදන වැඩ සටහනේ දත්ත ලේඛනවල සඳහන් කරලා තිබෙන කාරණයක්. අපි දන්නවා, මෙතුමා ඒ වැඩ සටහනට අනුගාමීව අපේ පළාත් සභාවේ ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා පළාත් කෘෂිකර්ම උපදේශක මහත්වරුන් එයට අනුයුක්ත කරලා තිබෙනවා. ඒ අනුයුක්ත කරපු කෘෂිකර්ම නිලධාරී මහත්වරුන්ට අලුත් තාක්ෂණය උපයෝගී කරගෙන ගොවියා උදැල්ල කරේ තියාගෙන, ඒ වාගේම අමුඩ ලේන්සුව ඇඳගෙන කුඹුරු කොටන යුගය වෙනස් කරන්න එතුමා ඒ දිස්ත්‍රික් මට්ටමේ ඉන්න කෘෂිකර්ම නිලධාරීන්ට අලුත් මෙවලම් කට්ටල ලබා දීලා තිබෙනවා. පරිගණක යන්ත්‍ර, ලැප්ටොප් යන්ත්‍ර ඒ සියල්ලක්ම ලබා දීලා මෙතුමා බලාපොරොත්තු වන්නේ අලුත් තාක්ෂණයත් එක්ක කෘෂිකර්මාන්තය කොයි ආකාරයට ගෙනි යන්න වැඩ කටයුතු කරනවාද කියන එක එතුමා සැලසුම් කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, එතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන විශේෂ කර්තව්‍යයක් තමයි ඉඩම් ඔප්පු අයිතිය ලබා දීමේ වැඩ පිළිවෙළ. ඒ ඉඩම් ඔප්පු අයිතිය ලබා දීමේදී කළුතර දිස්ත්‍රික්කයේ විතරක් විශාල ඉඩම් ප්‍රමාණයක් තිබෙනවා, ලියකියවිලිවලට විතරක් සීමා වෙලා. ඒ ඉඩම් හිමියන්ට නියම අයිතිය ලැබෙන්නේ නැති ක්‍රමවේදයක් තිබෙනවා. ඒ අනුව ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා 2017 වර්ෂයේදී ඉඩම් ඔප්පු ලක්ෂ 20 ක් ඒ ගොවි ජනතාවට, ඉඩම් නොමැති ජනතාවට, කොළයට විතරක් සීමා වෙලා තිබෙන ඉඩම්වල අයිතිය ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න ඉලක්කය වෙලා තිබෙනවා. එහෙමනම් ගරු ඇමැතිතුමනි, ඔබතුමා ඒ අවබෝධය අරගෙන මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ වැඩ සටහනින් අපට පුළුවන්කම ඇති වෙලා තිබෙනවා - ඉඩම් ප්‍රඥප්තිය අපි හදලා තිබෙනවා. ඒ ඉඩම් ප්‍රඥප්තිය යටතේ අපට ලබා දෙන්න තිබෙන ඒ පහසුකම් ටික අපට ලබා දීමේදී, අපට අඩුවක් තිබෙන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථාව අවසන් කරන්න. නැත්නම් ගරු ඇමැතිතුමාට අසාධාරණයක් සිදු වෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ නියෝගය මත එහෙම නම් මම නවතිනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තුතියි. මම එහෙම කිව්වාට සමාවෙන්න. මොකද, ගරු ඇමැතිතුමාට විනාඩි 30 ක් තිබුණා. එතුමාගේ විනාඩි 30 දැන් 20 ට බැස්සා. 20 නුත් දැන් තවත් අඩු වෙලා. ගරු ඇමැතිතුමාට මම ආරාධනා කරනවා, ඔබතුමාගේ කථාව ඉදිරිපත් කිරීමට. ඔබතුමාට විනාඩි 16 ක කාලයක් තිබෙනවා. තවත් හතරක් අඩු වුණා.

[අ.භා. 04.44]

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා**
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, මගේ හිතවත් පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු ගණනාවක්ම අදහස් ප්‍රකාශ කිරීම් කළා. ඒ සියලු දෙනාටම මම ප්‍රථයෙන්ම -මොකද, කථාව අවසානයේ වෙලාව නැති වන කොට අමතක වෙනවා. මම ස්තුතිවන්ත වෙනවා. ආණ්ඩු පක්ෂයේත්, ප්‍රති පක්ෂයේත් සියලුම ගරු මන්ත්‍රීවරු මගේ අමාත්‍යාංශය පිළිබඳව විවිධ අදහස් මතු කරමින්, ඉදිරි

අනාගතයේදී කෘෂිකර්මාන්තය දියුණු කරන්නට කුමන ආකාරයකින් කටයුතු කළ යුතුද කියන ආකාරය පිළිබඳව තමුන්නාන්සේලා මාව දැනුවත් කිරීම පිළිබඳව මම යළිත් ස්තුතිවන්ත වෙනවා. මන්ත්‍රීවරු ගණනාවක්ම කථා කළත්, අපේ රොයිස් විජිත ප්‍රනාන්දු ගරු මන්ත්‍රීවරයා ඉල්ලීමක් කළා. එතුමාගේ කථාවේදීම සඳහන් කළා, මම මේ කථා කරන දේවල් පිළිබඳව මට පිළිතුරු කථාවේදී උත්තර දෙන්නය කියලා. ගරු සභාපතිතුමනි, මගේ වේලාව පිළිබඳව සලකා බලලා මම ආරධනා කරනවා, තමුන්නාන්සේ මගේ උපදේශක කාරක සභාවේ ඉන්න මන්ත්‍රීවරයෙක්. දැන් පැමිණීම නම් ටිකක් අඩුයි. ඒ නිසා මම ඉල්ලා සිටිනවා, ඊළඟ වර්ෂයේ පැවැත්වෙන උපදේශක කාරක සභාවට කාරුණිකව පැමිණෙන්න. මේ සියලුම ප්‍රශ්න ටික අපට කථා කරන්නට පුළුවන්. ඒ සම්බන්ධයෙන් මම කනගාටු වෙනවා.

ඊළඟට මගේ හිතවත් අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමා ඉතාම වැදගත් කාරණා කිහිපයක් සඳහන් කළා. ඒ කාරණා පිළිබඳව සම්පූර්ණයෙන් මගේ අවධානය යොමු වෙලා තිබෙනවා. ඔබතුමා අර යම් ආචාර්ය මහත්මයෙකුගේ දුරකථන අංකයක් දුන්නා. මම මේ මොහොතේම ලේකම්තුමා යොදවා කථා කළා. බලනකොට අපේ ලේකම්තුමාගේ සමකාලීන අධ්‍යාපන මිත්‍රයෙක් මම හිතන්නේ. ඒ නිසා ඒ කටයුත්ත අපට කරගන්න පුළුවන්කම ලැබෙයි. ඔබතුමා මා වෙත දැනුම් දුන් සියලුම කාරණා කෙරෙහි මගේ විශේෂ අවධානය යොමු කරනවා කියන එක ගරු සභාපතිතුමා මාර්ගයෙන් මම පවසා සිටිනවා. ඒ නිසා සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ කථාවලට පිළිතුරු දීමට නොහැකි වුණත් මගේ අමාත්‍යාංශය යටතේ පවතින විෂයයන් පිළිබඳව ඉතාමත්ම කෙටියෙන් වුණත් මට පොඩි පැහැදිලි කිරීමක් කරන්න සිද්ධ වෙලා තිබෙනවා.

පළමුවෙන්ම වාරිමාර්ග අමාත්‍යාංශය ගත්තොත් මම පසුගිය අයවැය ලේඛනය අවස්ථාවේදීත් කිව්වා, මේ වාරිමාර්ගවලට ලක්ෂ දෙක තුන මුදල් වෙන් කිරීම් කරනවා. ස්කැවේටර් යන්ත්‍රයට පමණක් ඒ වටිනාකමෙන් භාගයක්ම දෙන්න වෙනවා. එතකොට අර වෙන් කරන මුදලෙන් හරි ප්‍රතිලාභයක් ලබා ගන්න පුළුවන්කමක් නැහැයි කියලා. ඒ නිසා මම සතුටු වෙනවා. මම එදා තමුන්නාන්සේලාට පොරොන්දු වුණු පරිදි, දැන් මේ වන කොට ටෙන්ඩර් කෝල් කරලා තිබෙන්නේ. මගේ ඉල්ලීම අනුව ගරු ප්‍රධාන අමාත්‍යතුමා පරිපූරකයෙන් මට මිලියන 55 ක් දුන්නා. ඒ මිලියන 55 න් මිලියන 32 ක්ම වෙන් කෙරුවේ ස්කැවේටර් යන්ත්‍ර සහ බාච් මිලදී ගැනීම සඳහායි. ඒ මිලියන 32 න් දැන් තුනක්ම ගත්තාම දිස්ත්‍රික්ක තුනටම වෙන් කරලා තමුන්නාන්සේලාගේ වාරිමාර්ග කටයුතු කරන්න ඉතාමත්ම පහසුවක් වෙනවා. 50% ක්ම යම්කිසි ප්‍රතිලාභයක් මත කරගන්න පුළුවන්කම ලැබෙනවා. එය මම තමුන්නාන්සේලාට සඳහන් කරනවා.

ඒ වාගේම කැස්බෑව මැතිවරණ කොට්ඨාශය නියෝජනය කරන එක මන්ත්‍රීතුමයි ඉන්නේ. පසුගිය කාලසීමාව තුළ මගේ අමාත්‍යාංශයට අයිති කැස්බෑව වැව කියන්නේ, සුන්දර තැනක පිහිටලා තිබෙන වැවක්. ඒකේ ඇළිදන මංතීරු සකස් කිරීම සඳහා මම මිලියන ගණනාවක් ප්‍රතිපාදන වෙන් කළා. ඒ සියලුම වැඩ කටයුතු අවසන් වෙලා තිබෙනවා. මේ මාසයේ අන්තිම වන කොට ඒ අයිතියත් අපට පවරාගෙන - ඒ ඉඩම්වල අයිතිය අල්ල ගන්න විශාල මහන්සියක් ගත්තා. මොකද, වටපිට ජනතාව අල්ලගෙන සිටියා. ඒ සියලු දේවල් නිදහස් කරගෙන ඒ මංතීරු ටික සකස් කරලා දැන් ජනතා අයිතියට පවරන්නට යථා කාලයේදී ලැබෙනවා කියන එකත් මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. බස්නාහිර පළාතේ වාරිමාර්ග සපයන බිම් ප්‍රමාණය වැඩිදියුණු කිරීම, අමුණු ඉදි කිරීම. ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති යටතේ අමුණු 26 ක් මම සංවර්ධනය කරලා තිබෙනවා. කුඹුරු හෙක්ටයාර් 3999 කට වාරි ජලය සැපයීමට හැකි වෙලා තිබෙනවා. මේ වසරේ පළාත තුළ වැව් තුනක් සංවර්ධනය කරලා තිබෙනවා. කුඹුරු හෙක්ටයාර් 40.47 කට වාරි ජලය සැපයීමට මම කටයුතු කරලා තිබෙනවා කියන එකත් සඳහන් කරන්න ඕනෑ.

ඒ වාගේම ඊට පසුව තිබෙන ප්‍රධානම ප්‍රශ්නයක් තමයි, ඉඩම් ගැටලුව. ඉඩම් ප්‍රශ්නය සම්බන්ධයෙන් තමයි ගරු සභාපතිතුමනි, අද සියලුම ගරු මන්ත්‍රීවරු අදහස් ප්‍රකාශ කෙරුවේ. ඒ පිළිබඳව මම දැනුම් දීමක් කළ යුතුයි. ගරු සභාපතිතුමනි, මේක මටත් තිබුණු ඔළුවේ කැක්කුමක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර මොහොතකට නිශ්ශබ්ද වන්න. ගරු ඇමැතිතුමාට නිදහසේ කථා කරන්න දෙන්න. බාධා කරන්න එපා. අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු තමයි එතුමාට බාධා කිරීම් කරන්නේ. පුටු හරවාගෙන වෙන වෙන සාකච්ඡා කරනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නිශ්ශබ්ද වන්න.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, ඉඩම් විෂයය පිළිබඳව මම තමුන්නාන්සේ වෙත මේ කරුණු පැහැදිලි කළ යුතුමයි. මම විශ්වාස කරනවා, සියලුම ගරු මන්ත්‍රීවරුන් මේ පිළිබඳව අවධානය යොමු කරයි කියලා. මේ වන කොට ගරු සභාපතිතුමනි, ගුවන්විදුලි සංස්ථාවෙන් රුපියල් මිලියන 1019 ක් ගන්න තිබෙනවා. ස්වාධීන රූපවාහිනියෙන් රුපියල් මිලියන 12 ක් තිබෙනවා. දැන් මේවා රජයේ ආයතනවලින් ලැබෙන්න තිබෙන මුදල්. ඇහුවාම කියනවා, අපට මුදල් වෙන් වෙලා නැහැයි කියලා. අපට දෙන්න ක්‍රමයක් නැහැයි කියනවා. ගරු සභාපතිතුමනි, කවදාවක්වත් මේවා ලැබෙන්නේ නැහැ. ඒ නිසා මම බලාපොරොත්තු වෙනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමාත් එක්කත් මම කථා කළා. මේවා ලැබෙන මානයක්වත් නැහැ. දෙන්න බැහැයි කියන එකමයි කියන්නේ. ඒ නිසා නීති මාර්ගයෙන් හරි කටයුතු කරලා මේ මුදල් ලබා ගැනීමට ගරු ප්‍රධාන අමාත්‍යතුමාත් සමඟ සාකච්ඡා කරලා තීන්දුවක්, තීරණයක් මට ගන්න සිද්ධ වෙනවා. එතකොට විශේෂයෙන්ම මම සඳහන් කරන්න ඕනෑ, එයිටි ක්ලබ්. ඒකේ මිලියන 32 ක් තිබෙනවා. මම අපේ ගිණුම් කාරක සභාවේ ගරු සභාපතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා. ඒ අධ්‍යක්ෂ මහතුන්ටත් මම ඒ අයත් එක්ක සාකච්ඡා වාර කිහිපයක්ම පැවැත් වූවා. සාකච්ඡා වාර කිහිපයක්ම පැවැත්වීමෙන් පසු මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. 2017 ජනවාරි සිට මාසික වාරිකය රුපියල් එක් ලක්ෂ පනස් දාහකින් වැඩි කරලා තිබෙනවා. ඒ අනුව ඒ මුදලයි, පරණ මුදලයි එකතු කරලා ලක්ෂ පහකට කිට්ටු මුදලක් මාස් පතා ලැබෙනවා. ඒ තීන්දු තීරණ අරගෙන තිබෙන්නේ මම ගිණුම් කාරක සභාවත් එක්ක සාකච්ඡා කරලා. ඒ අනුව ඒ ක්‍රමයට ගියොත් ඒ මුදල අවුරුදු දෙකයි මාස 11 ක් ඇතුළත මට පියවා ගන්න පුළුවන්කම ලැබෙනවා කියන එකත් මම සඳහන් කරන්න ඕනෑ. ඊට පසුව තිබෙන ප්‍රශ්නය තමයි, ඔර්ටස් ක්ලබ්. ඔටර්ස් ක්ලබ් එකෙන් පසුගිය දවස්වල ඇවිල්ලා මුදල් වගයක් තැන්පත් කරලා ගියා. ඒ අයත් කියනවා, ඉදිරි කාලය තුළදී මේ මුදල් ටික දෙන්න උත්සාහ කරනවා කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔටර්ස් ක්ලබ් එකේ ගණන කීයද?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ඔටර්ස් ක්ලබ් එකේ මිලියන 53 යි. ඒ නිසා මේක තමයි මේ ඉඩම්වල තිබෙන ගැටලුව. ඒ නිසා මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. මේ පිළිබඳව හැමදාම කථා කළත්, අදහස් යෝජනා කළත් මම මේ පිළිබඳව විශේෂයෙන්ම කටයුතු කරනවා කියන එක සඳහන් කරනවා. මොකද මට උපදේශක කාරක සභාවේදී එක මන්ත්‍රීවරයෙක් හෝ කථා කරලා හැමදාම මේ ප්‍රශ්නය මට නගනවා. ඒ නිසා මේ මුදල් ටික ලබා ගැනීම සඳහා මම මේ වෙනුවෙන් විශාල කැපවීමකින් වැඩ කටයුතු කරනවා.

ඊට පසුව ගරු සභාපතිතුමනි, අපි කෘෂිකර්මාන්තය ගැන කථා කරන කොට 2015 ඔක්තෝබර් මාසයේ 08 වැනිදා අතිගරු ජනාධිපතිතුමා කිලිනොච්චි ප්‍රදේශයෙන් ආරම්භ කරපු ජාතික ආහාර නිෂ්පාදන වැඩ සටහන. මේ ජාතික ආහාර නිෂ්පාදන වැඩ සටහන යටතේ මුළු ශ්‍රී ලංකාවම ස්වයං පෝෂිත ශ්‍රී ලංකාවක් බවට පත් කරන්නට එතුමා ගන්නා වූ උත්සාහය වෙනුවෙන් බස්නාහිර පළාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යවරයා හැටියට ඒ කාරණාව වෙනුවෙන් මම විශාල කැපවීමක් කරන්න කටයුතු කරනවා. මම ඒ කටයුත්තේදී ජනාධිපතිතුමාට මගේ විෂයයටත් අමතරව ගරු සභාපතිතුමා දන්නවා. අර ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා, පසුගිය කාලයේ මිරිස් කිලෝ එක රුපියල් 1200/- ට ගියා. අමු මිරිස්. දෙහි මිලත් ඒ වාගේ ගියා. නමුත් ගරු සභාපතිතුමනි, මම කියන්න කැමැතියි. මම හැමදාම කොහේ හරි රැස්වීමකට ගියාම මම කියන්නේ, කෘෂිකර්ම රැස්වීමකට ගියම මම දන්වන්නේ, අඩු තරමින් මිරිස් ගස් පහක් හයක්වත් වවා ගන්න බැරි මිනිස්සු අපේ ලංකාව තුළ ඉන්නේ. අද අපි අධ්‍යාපනය ගැන කථා කරනවා. සෞඛ්‍යය ගැන කථා කරනවා. මංමාවත් ගැන කථා කරනවා. කෘෂිකර්මය ගැන කථා කරන මිනිහෙක් උත්සවයකදී හැරෙන්න, දකින්නවත් හම්බ වෙන්නේ නැහැ. හැබැයි, ගරු සභාපතිතුමනි අපට කවදා හෝ මේ විෂයයන්වලට දෙවැනි තැන දීලා පළමුවැනි විෂයය බවට අපට පත් කරන්න සිද්ධ වෙන්නේ කෘෂිකර්මාන්තය. කෘෂි කර්මාන්තය අතින් අපි පහළට ගියොත්, මේ ශ්‍රී ලංකාවට අත්වන ඉරණම පිළිබඳව නැවත කියන්න

දෙයක් නැහැ. මම කනගාටු වෙනවා. මම PSDG ගැන බැලුවාම මිලියන 41 යි. මම මේ පිළිබඳව ආණ්ඩුවට තර්ජනය කරන්නවත්, බණින්නවත් යන්නේ නැහැ. මම කනාගටු වෙනවා. බස්නාහිර පළාත කියන්නේ, විශාලම පළාත් සභාව. ජනගහනයෙන්, භූමි ප්‍රමාණයෙන් විශාලම පළාත් සභාව. මන්ත්‍රීවරු 104 දෙනෙක් ඉන්න පළාත් සභාව. මේ කෘෂිකර්මාන්තය කෙරෙහි මට විවිධ යෝජනා අදහස් අනන්ත අප්‍රමාණ එනවා. ගරු සභාපතිතුමනි, මම කොහොමද මේවා ඉෂ්ට කරන්නේ? මේ බස්නාහිර පළාත් සභාව තුළ කෘෂි කර්මාන්ත කටයුතු කොයිතරම් කරන්න තිබෙනවාද? බොහාම කැමැත්තකින් මම සඳහන් කරන්න ඕනෑ. මේ මිනිස් ශ්‍රමය ගැන කථා කළා. කෘෂි කර්මාන්තය කිරීමේදී මිනිස් ශ්‍රමය ඉතාමත්ම අත්‍යවශ්‍ය වෙලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මම පසුගිය දවස්වල යන්ත්‍රානුසාරයෙන් පැළ සිටුවන යන්ත්‍ර හයක් දෙපාරකට දිස්ත්‍රික්ක තුනට ගෙනැල්ලා දුන්නා. මේ යන්ත්‍රයක වටිනාකම මේ මන්ත්‍රීවරු හත් අට දෙනෙක් දන්නවා. සෑම දිස්ත්‍රික්කයකටම මම යන්ත්‍රානුසාරයෙන් පැළ සිටුවන යන්ත්‍රයක් ලබා දුන්නා. ඒ යන්ත්‍රයක වටිනාකම රුපියල් ලක්ෂ 05 යි. මම සියලුම ගරු මන්ත්‍රීවරුන්ට කියනවා, හැකියාවක් තිබෙනවා නම්, කෘෂි කර්මාන්තයට ආදරයක් දක්වනවා නම්, 2017 ලැබෙන ප්‍රතිපාදනවලින් රුපියල් ලක්ෂ පහක් වෙන් කරලා ගොවි සංවිධාන හතරකට එක යන්ත්‍රයක් ලබා දීමට කටයුතු කරනවා නම් ඒකෙන් විශාල සේවයක් ඇති වෙනවා කියන එකයි මම දකින්නේ. ගරු සභාපතිතුමනි, අක්කරයක පැළ සිටුවන්න මිනිස්සු පහළොස් දෙනෙක් ගත්තොත් රුපියල් 1500/- ගණනේ ගත්තත් විශාල මුදලක් යනවා. රුපියල් 4000/- ක් වැනි මුදලකින් මුළු දවසම පුරාම අක්කර 2 ½ ක් පමණ පැළ සිටුවීමේ යන්ත්‍රයෙන් ඒ කටයුත්ත කරන්න පුළුවන්. ඒ නිසා මේ තුළින් යම්කිසි මිනිහෙකුට රැකියාවක් ලබා දීලා, අපේ ගොවි සංවිධානයකට මේ යන්ත්‍රයක් ලබා දීලා ඉදිරියේදී යන්ත්‍රානුසාරයෙන් මේ වැඩ කටයුතු කරන්න අපට සිද්ධ වෙනවා. අද මිනිස්සු නැහැ. මොනතරම් මේ අදහස් ප්‍රකාශ කළත් ගොවියාගේ දරුවා කැමැති නැහැ ඒ වෘත්තියට යවන්න. ඇත්ත මේකයි. මොන තාක්ෂණය, මොන දේ තිබුණත් කම්කරුවෙක් කැමැතිද තමන්ගේ දරුවා කම්කරු තනතුරේ තියාගන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

රු.4000/- කට

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

අක්කර 2 ½ක් දවසකට කරන්න පුළුවන් කියලා මම කිව්වේ. ගොවි සංවිධාන හතරකට වාගේ එකක් තියාගන්න දුන්නාම - ගරු සභාපතිතුමනි, හැම තිස්සේම කියන කථාවක් තමයි ගොවියාගේ පුතා ගොවියෙක් වෙන්නේ නැහැයි කියන එක. කිසිම ගොවියෙක් කැමැති නැහැ, තමන්ගේ පුතා ඒ තනතුරේ තියන්න. වෙලේ තියන්න කැමැති නැහැ. ගොයම් පාගන්න කැමැති නැහැ. මොකද, තමන්ගේ දරුවාට කොහොම හරි අධ්‍යාපනයක් ලබා දීලා ශිෂ්‍යත්වයෙන් පාස් කරගෙන, ජාතික පාසලකට ගිහින් විශ්ව විද්‍යාලයට යවලා ඉංජිනේරුවරයෙක් කරන්න උත්සාහ ගන්නේ. හිරේ ඉන්න හිරකාරයන් පවා ගෙදර දරුවාට උගන්වන්න ලැහැස්ති වෙනවා. එක්තරා ප්‍රමාණයකට - මම කියනවා, ගොවි දෙමව්පියන්ගේ දරුවන් මේ කටයුත්තට සහභාගි නොවුණත්, ලෝකයේ මුළු රටවල් දිහා බැලුවාම මිනිස්සු නොවෙයි, මේ ඒවායේ වැඩ කරන්නේ. මුළු ලෝකයේ රටවල් හැම කෙනෙක්ම මේ කෘෂිකර්මාන්ත කටයුතු කරන්නේ, වැඩ කරන්නේ යන්ත්‍රානුසාරයෙන් තමයි.

ගරු සභාපතිතුමනි, මම කියන්න කැමැතියි. පසුගිය දවස්වල මේ පිළිබඳ ප්‍රශ්නයේදී සියලුම ගරු මන්ත්‍රීවරුන්ට මම ලියුමක් යැව්වා. කෘෂිකර්මය පුහුණු කිරීමට මේ වයස ප්‍රමාණය තිබෙන දරුවන් ප්‍රමාණයක් එකතු කරන්නය කියලා. බොහොම කනගාටු වෙනවා. කිසි කෙනෙක් ආවේ නැහැ. කළුතර දිස්ත්‍රික්කයෙන් 56 දෙනෙක් ආවා. උත්සවයක් තියලා මාස 06 ක පුහුණුවක් දීලා ඒකත් ගන්න බැලුවා. ගන්න බැලුවාම මොකද වුණේ? ගරු සභාපතිතුමනි, දැන් සොයලා බැලුවාම 56 දැන් 30 ට බැහැලා. 26 ක් ගිහිල්ලා. ඒ අය බලාපොරොත්තු වන්නේ ගරු සභාපතිතුමනි, මෙතැන ඉගෙන ගෙන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ රැකියාවක් ලබා ගන්න බලාපොරොත්තු වෙනවා. ඉතින් ඒක අපට කරන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා ඒ අය එන්නේ නැහැ. මේක බරපතළ ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් දෙන්න පුළුවන්.

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා**
Hon. Gamini Thilakasiri - Minister

විනාඩි යයි. ගරු සභාපතිතුමනි, මම කථා කළ යුතු දේවල් බොහොමයක් තිබෙනවා. මම විනාඩි දෙකක් බලාපොරොත්තු වුණා. මට ඒක නැති වුණා. ඒ ගැන මම කනගාටු වෙන්නේ නැහැ. හැබැයි, මට ස්තුතියක් කරන්න තත්ත්පරයක් දෙන්න. මගේ ප්‍රධාන අමාත්‍යතුමා, මගේ සියලු මැති ඇමැතිවරු, මන්ත්‍රීවරු සියලු දෙනාම, සභා ලේකම්තුමා, තමුන්නාන්සේ, ඒ වාගේම අමාත්‍යාංශයේ ලේකම්තුමා, ප්‍රධාන ලේකම්තුමා, මගේ නිලධාරීන් සියලු දෙනා, මගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට සියලු දෙනාටම මගේ ස්තුතිය මම මේ අවස්ථාවේදී පුද කරනවා. විශේෂයෙන්ම සභා කටයුතු ලේකම්තුමා පිළිබඳව මම වේලාසන කථා කළා. සියලුම දෙනාට ස්තුතිවන්ත වෙමින් මගේ කාලය සොරා ගත්තා. විනාඩි 16 යි ලැබුණේ. තමුන්නාන්සේලාට බොහොම ස්තුතියි.

***අ.භා. 04.59 ට, අංක 106, 117, 118, 119 හා 120 යන ශීර්ෂ පිළිබඳ සාකච්ඡාව අවසාන විය.***
*Discussion on the Expenditure Head Nos 106, 117, 118, 119 and 120 concluded at 04.59 p.m.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය, ගොවිජන සංවර්ධන අමාත්‍යාංශයීය වැය ශීර්ෂයන් වන ශීර්ෂ අංක 106, 117, 118, 119 හා 120 යන වැය ශීර්ෂයන් පිළිබඳ විවාදය මෙයින් අවසන් වෙනවා. ඒ වාගේම මම සන්තෝෂ වෙනවා. විපක්ෂයේ සහ ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා රාශියක් ඉතාමත් හරවත් දේශන පැවැත් වුවා. ඒ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට මම ස්තුතිවන්ත වෙනවා. මෙම වැය ශීර්ෂයන් සම්බන්ධව සභාවේ බෙදීමක් තිබෙනවාද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

නැහැ.

***ඊට අනුකූලව,***

***ශීර්ෂ අංක 106 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*The question of the amount stated in Head No. 106 was proposed and adopted.*

***ශීර්ෂ අංක 117 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*The question of the amount stated in Head No. 117 was proposed and adopted.*

***ශීර්ෂ අංක 118 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*The question of the amount stated in Head No. 118 was proposed and adopted.*

***ශීර්ෂ අංක 119 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*The question of the amount stated in Head No. 119 was proposed and adopted.*

***ශීර්ෂ අංක 120 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*The question of the amount stated in Head No. 120 was proposed and adopted.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ගරු මන්ත්‍රීතුමන්ලා මොහොතක් රැඳී සිටින්න. ගරු සභා නායකතුමා මට කාලය පොඩ්ඩක් දික් කරලා දෙන්න.

# රීති අංක 30 යටතේ යෝජනාව
## MOTION UNDER RULE NO : 30

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, *"දැන් සභාවේ කාලය විනාඩි 05 කින් දීර්ඝ කළ යුතු යැයි"* යෝජනා කර සිටිනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

***පූර්ණ කාරක සභාව නැවත පළාත් සභා තත්ත්වයට පත් කිරීම.***
*THE PROVINCIAL COUNCIL RESUMED.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී සභාව පූර්ණ කාරක සභා අවස්ථාවෙන් සභා අවස්ථාවට පත් වෙනවා.

***ඊට අනුකූලව අ.භා. 05.01 ට පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් විය.***
*Accordingly at 05.01 p.m. the Provincial Council resolved itself into a committee of the whole Council.*

**[පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය ]**
[Progress of the whole council]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අද දවසේ ප්‍රගතිය. ගරු සභා නායකතුමා විසින් මට කාලය දීර්ඝ කරලා දුන්නා. ඒ පිළිබඳව ස්තූතිවන්ත වෙනවා. ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු සහ ජලසම්පාදන, ජලාපවාහන,සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය වැය ශීර්ෂයන් සම්බන්ධ, 104, 109, 110, 111 හා 112 යන වැය ශීර්ෂයන් පිළිබඳ විවාදය ඊයේ දවසේ මධ්‍යහන 12.00 ට ආරම්භ වෙලා, ඊයේ සවස 05.00 ට අවසන් වුණා. නැවත අද පෙරවරුවේ 09.15 ට ආරම්භ වී පෙරවරු 11.00 ට විවාදය අවසන් වුණා. මම ඉතාම සන්තෝෂ වෙනවා. මමත් අවුරුදු 13 කට ආසන්න කාලයක් මූලාසනයේ සිටිය මන්ත්‍රීවරයෙක්. පළමු වතාවට තමයි, අයවැය අවස්ථාවකදී බෙදීමක් නොමැතිව මට මතක හැටියට සභා සම්මත වුණේ. ඉස්සර තිබුණා. මෑත කාලයේ සම්මත වූ සභා සම්මත වීම බව මම සලකනවා.

විශේෂයෙන් අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ වැය ශීර්ෂ ඒ වාගේම ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමාගේ වැය ශීර්ෂ බෙදීමකින් තොරව සම්මත වුණා. කවුරුත් බෙදීමක් ඉල්លුවේ නැහැ. කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා ඒකයි විශේෂය. කලින් සාකච්ඡාවලදී බෙදීමක් ඉල්ලලා තිබුණා. මේ දෙකේදීම බෙදීමක් ඉල්ලුවේ නැහැ. ඒක ඉතාම ඓතිහාසික සිද්ධියක්. මන්ත්‍රීතුමන්ලා මේක අපි හැමෝම හිතන්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂයේ සහයෝගය තිබෙනවා කියලා මේක අපි හිතන්න ගියොත් එහෙම බරපතළ ප්‍රශ්නයක් වෙනවා. එහෙම හිතන්න එපා. එතුමාට අගමැතිතුමා සහයෝගයක් දුන්නා. සමහරවිට ජනාධිපතිතුමාගේ ඉල්ලීම මත වෙන්න ඇති. යහපාලනයත් එක්ක වෙන්න ඇති සහයෝගය ලබා දෙන්නේ. ඒ නිසා අපි හැම කෙනෙක්ම මේක හිතන්නට වෙනවා. අපි යන ගමන. අපේ පළාත් සභාවේ දියුණුව, පළාත් සභාවේ සංවර්ධනය වෙනුවෙන් අපි හැමෝම එකට වැඩ කරන්න ඕනෑ. මගේ මතය ඒකයි. ඒ පිළිබඳව මම විශේෂයෙන්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමා තරුණ ප්‍රධාන අමාත්‍යවරයෙක්. නවක අමාත්‍යවරයෙක්. එතුමා පළාත් සභාවේ කිසිම තනතුරක් දරලා නැහැ. මුල් වතාවට තමයි එතුමා මේ පළාත් සභාවේ මහ ඇමති තනතුර ලබාගෙන අද හැමෝගෙම සහාය ලබා ගෙන පළාත් සභාව තුළ දැවැන්ත මෙහෙයක් ඉටු කරනවා. එතුමා ඇතුළු සියලු දෙනාටම මගේ ස්තූතිය පුද කර සිටිනවා.

ඒ වාගේම සතුටුදායක නිවේදනයක් මට කරන්න තිබෙනවා. ඒකත් ගරු මහ ඇමැතිතුමාගෙම එකක්. එතුමා බලාපොරොත්තු වෙනවා, අර සම්ප්‍රදායික උත්සවය මේ මස 15 වැනිදා,

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සුහද හමුව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සුහද හමුව මේ මාසයේ 15 වැනිදා රාජගිරිය, නාවල, කොස්වත්ත පාර, අංක 166 ඔපියුලන්ට් රිවර් ජේස්ට් හෝටලයේදී රාත්‍රී 07.00 ට පැවැත් වෙනවා. ගිය සැරේ තිබුණෙත් එතැනමයි. ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන් ආරධනා කරනවා,. ඒ අවස්ථාවට සියලු අමාත්‍යවරුන්ට, විපක්ෂ නායකතුමා ඇතුළු සියලුම ධූර ධාරීන්ටත්, සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාටත් මන්ත්‍රීතුමියන්ලාටත් ආරාධනා කරනවා, එම වටිනා අවස්ථාවට සහභාගිවන ලෙසට. ගරු මහ ඇමැතිතුමා තවත් ඉල්ලීමක් කළා. ප්‍රධාන ලේකම්තුමා ඇතුළු සියලුම අමාත්‍යාංශ නිලධාරීන්ටත්, සභා ලේකම්තුමා ඇතුළු සභා ලේකම් කාර්යාලයේ සියලුම කාර්ය මණ්ඩලයට එතුමා ආරාධනා කරනවා ඒ අවස්ථාවට සහභාගි වෙන්න කියලා. ඒ අනුව අද දවසේ න්‍යාය පත්‍රයේ වැඩ කටයුතු මෙයින් අවසන් වෙනවා.

# කල් තැබීම
# ADJOURNMENT

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 05.05 ට, 2016 දෙසැම්බර් මස 09 වන දින පූ.භා. 09.00 වන තෙක් කල් ගියේය.***
*Accordingly, the Provincial Council was adjourned at 05.05 p.m till 09.00 a.m, on 09.12.2016*